80 වන කාණ්ඩය
5 වන කලාපය
(I වන කොටස)

5 . අඟහරුවාද
1968 අගෝස්තු 13

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

**(අශෝධිත පිටපත)**

### අන්තර්ගත ප්‍රධාන කරුණු

**1968 අගෝස්තු 12 වන සඳුදා**

[වැඩ කටයුතු ඉදිරියට ගෙන යාම]

**විසර්ජන පනත් කෙටුම්පත, (1968-69)** [තුන්වන වෙන් කළ දිනය]

දෙවන වර කියවීම—විවාදය කල් තබන ලදී.

---

**1968 අගෝස්තු 13 වන අඟහරුවාදා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**විසර්ජන පනත් කෙටුම්පත, (1968-69)** [හතරවන වෙන් කළ දිනය]

දෙවන වර කියවීම—විවාදය ඉදිරියට ගෙන යන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 80
இல. 5
(பகுதி I)

செவ்வாய்க்கிழமை
13 ஒகஸ்ட் 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

(பிழை திருத்தப்படாதது)

பிரதான உள்ளடக்கம்

திங்கட்கிழமை, 12 ஒகஸ்ட் 1968

[நிகழ்ச்சித் தொடர்]

ஒதுக்கீட்டு மசோதா, 1968–69 [ஒதுக்கப்பட்ட மூன்றும் நாள்]

இரண்டாம் மதிப்பு—விவாதம் ஒத்திவைக்கப்பட்டது

---

செவ்வாய்க்கிழமை, 13 ஒகஸ்ட் 1968

வினாக்களுக்கு வாய்மூல விடைகள்

ஒதுக்கீட்டு மசோதா, 1968–69 [ஒதுக்கப்பட்ட நான்காம் நாள்]

இரண்டாம் மதிப்பு—விவாதம் தொடர்கிறது

---

**Volume 80**
**No. 5**
**(Part I)**

**Tuesday**
**13th August 1968**

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

**(Uncorrected)**

PRINCIPAL CONTENTS

**Monday, 12th August 1968**

[*Continuation of Proceedings*]

APPROPRIATION BILL, 1968-69 [Third Allotted Day]

Second Reading—Debate adjourned

---

**Tuesday, 13th August 1968**

ORAL ANSWERS TO QUESTIONS

APPROPRIATION BILL, 1968-69 [Fourth Allotted Day]

Debate continued

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

## House of Representatives

**1968 අගෝස්තු 12 වන සඳුදා**

திங்கட்கிழமை 12, ஓகஸ்ட் 1968

*Monday, 12th August 1968*

[1968 අගෝස්තු 12 වන සඳුදා නිල වාර්තාවේ 778 වන තීරයේ සිට ඉතිරි වැඩ කටයුතු]

1968 ஓகஸ்ட் 12, திங்கட்கிழமை அதிகார அறிக்கை 778 ஆம் பத்தியிலிருந்து நிகழ்ச்சித் தொடர்.]

[*Continuation of Proceedings from Col. 778 of* OFFICIAL REPORT *for Monday, 12th August 1968.*]

## විසර්ජන පනත් කෙටුම්පත, 1968-69

*ஒதுக்கீட்டு மசோதா, 1968-69*

APPROPRIATION BILL, 1968-69

අ. භා. 4.26

**බී. එච්. බණ්ඩාර මයා.** (බදුල්ල)
*(திரு. பி. எச். பண்டார—பதுளை)*
**(Mr. B. H. Bandara—Badulla)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය ලේඛනය පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ ඒ ගැන මේ රටේ පවතින සැලකිල්ල මොන අන්දමේ එකක්දැයි මේ ගරු සභාව දෙසත් ගැලරිය දෙසත් බැලුවාම පැහැදිලිවම පෙනී යනවා ඇති. පත් කරන ලද මන්ත්‍රීනුත් ඇතුළුව, මේ ගරු සභාව අමතන මාත් ඇතුළුව, මේ සභා ගර්භය තුළ දැන් සිටින්නේ මහ ජන මන්ත්‍රීවරුන් පස් දෙනෙක් පමණයි. ඒ ගැනත් ගැලරියේ ඉන්න ඉතාමත් සුළු පිරිස ගැනත් කල්පනා කළාම, මේ අයවැය ලේඛනය ගැන දක්වන සැල කිල්ලේ ප්‍රමාණය තේරුම් ගත හැකියි.

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීන් ගණනා වක්ම මේ අයවැය ලේඛනය ගැන කථා කළා. සමහර මන්ත්‍රීවරුන් කථා කෙළේ එතුමන්ලා මේ රටේ ජීවත්වන්නන් හැටි යට නොවෙයි. ඒ කථාවලට සවන් දෙන කෙනකුට නම් හිතෙන්නේ එතුමන්ලා මේ රටේ ජීවත්වන්නන් නොවිය හැකි බවයි. මට නම් එහෙම හිතුනා. මේ රටේ ජනතාව අද මොන තත්ත්වයක පසු වෙනවාදැයි ආණ්ඩු පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන්ට දැනුමක් තේරුමක් නැද්දෝයි සැකයක් මට පැහැදිලිවම ඇති වුණා. වගා ව්‍යාපාරය නිසා ගම්බද ජන තාවට කොයි තරම් සෙතක් ඇති වුණා දැයි පෙන්වන්නට උත්සාහ කළ එක් ගරු මන්ත්‍රීවරයෙක්, තමන් නියෝජනය කරන හඟුරන්කෙත කොට්ඨාශයේ ජන තාව ආර්ථික තත්ත්වයෙන් කොයි තරම් විශාල දියුණුවක් ලබා සිටිත්දැයි කියනොත්, ඒ කොට්ඨාශයේ ස්වර්ණා භරණ සාප්පුවල රත්රන් බඩු මොකක් වත් දැන් ඉතිරි වෙලා නැතැයි කිව්වා. ඒවා ඔක්කොම අරන්ලු. වගා ව්‍යාපාරය නිසා ගම්බද ජනතා වට සල්ලි වැඩි වෙලා රත්තරන් බඩු සාප්පුවල රත්තරන් බඩු අරගැනීම නිසා ඒ සාප්පු හිස් වෙලාලු. වාරියපොල මන්ත්‍රීතුමා (ඩී. එම්. ජී. බණ්ඩාර මයා.) කිව්වා, එතුමාගේ ඡන්දදායක කොට්ඨා ශයේ ගොවීන්ට සල්ලි වැඩි වෙලා මේ සැරේ අනුරාධපුර වන්දනාවෙත් ගියාය කියා. පසුගිය දවස්වල සිමෙන්ති හිඟයක් ඇති වුණේ, වහළ සෙවිලි කරන සීට්ස් හිඟයක් ඇති වුණේ, රට උළු හිඟයක් ඇති වුණේ ගම්බද ජනතාවට සල්ලි වැඩි වීම හේතුකොටගෙන ගෙවල් සෑදීම නිසාය කියා අගමැතිතුමා කියා තිබෙන බවක් මා ප්‍රවෘත්ති පත්‍රයක දැක්කා. එහෙත් අපේ ඡන්දදායක කොට්ඨාශවල නම් අළුතෙන් සාදන ගෙයක් පෙනෙන්නට නැහැ. මේ විධියට කියන අය අහසේ වැජඹෙන බවයි, අපට පෙනෙන්නේ. රටේ තත්ත්වය ගැන, මහජනයාගේ සැබෑ තත්ත්වය ගැන මේ රජයේ මැති ඇමති වරුන්ට නියම අවබෝධයක් නොතිබීම ගැන ඇත්ත වශයෙන්ම අප කණගාටු වෙනවා. ඒ අයගේ කථාවලට ඇහුම්කන් දෙන විට පෙනෙනවා, ඒ අය සම්පූර්ණ යෙන්ම වැරදි තැනක ජීවත් වන බව. මේ රජයේ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් නියම පිළිතුරු දීමට ජනතාව සූදානම් වී සිටින බවට කිසිම ප්‍රශ්නයක් නැති බව මා මේ අවස්ථාවේදී කියන්නට කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය ලේඛනය මේ ආණ්ඩුවේ 4 වැනි අය වැය ලේඛනයයි. මැතිවරණ කාලයේදී මේ ආණ්ඩුව කී දේ ගැන මා දැන් සඳහන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මන්ත්‍රීවරුන් රාශියක්ම ඒ ගැන සඳහන් කළා මැතිවරණයෙන් පසු ප්‍රථම අය වැය ලේඛනය ඉදිරිපත් කරන විට මේ ජනතාව බලාපොරොත්තු වුණා, ආණ්ඩුව වෙනස් වී අළුත් ආණ්ඩුවක් ඇති වී තිබෙනවා. දැන් අපට කිසි ප්‍රශ්නයක් නැහැ, දැන් රට කිරියෙන්, පැණියෙන් ඉතිරේය කියා. එහෙත් සිදු වුණේ කුමක්ද? පසුගිය ආණ්ඩුව මේ රට කාලා ගියාය, භාණ්ඩාගාරය හිස් කරලා ගියාය කියා ඒ වෙලාවෙදි බේරෙන්නට හැදුවා. පසුගිය ආණ්ඩුව දවස් 5 කට ජීවත් වන්නට හාල් ගන්නටවත් සල්ලි ඉතිරි කර ගියේ නැත කියා එක ඇමතිවරයෙක් කිව්වා. එසේ කියා ඒ අවස්ථාවේ අය වැය විවාදයෙන් බේරුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය අවුරුදු තුනහමාර ඇතුළත මේ ආණ්ඩුව විසින් විසඳා තිබෙන ප්‍රශ්නය කුමක්ද කියා මා ගරු මුදල් ඇමතිතුමාගෙන් අහන්නට කැමතියි. මේ වර ඉදිරිපත් කරන ලද අය වැය ලේඛනය ගැන නම් මේ රටේ ජනතාව කිසිම බලාපොරොත්තුවක් තබා තිබුණේ නැහැ. තමුන්නාන්සේලාගේ කෙරුම් ගැන—තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළ ගැන—අවුරුදු තුනහමාරක් තිස්සේ මේ රටේ ජනතාව දැනගෙන සිටි නිසා මේ අය වැය ලේඛනයෙන් තමන්ට සෙතක් සැලසේය කියා මේ රටේ ජනතාව තුළ බලාපොරොත්තුවක් තිබුණේ නැහැ. රටේ ජනතාව එය තුච්ඡුවකටවත් ගණන් ගත්තේ නැහැ. මේ ආණ්ඩුවේ කාලය අවසාන වී කොයි මොහොතේ අළුත් ආණ්ඩුවක් පිහිටුවා ගැනීමට තමන්ට අවස්ථාව සැලසේදෝ කියායි, මේ රටේ ජනතාව බලාගෙන සිටින්නේ.

දවස් 5කට කන්නටවත් සල්ලි නැත, රට බංකොලොත් කරලාය කියා එදා කී තමුන්නාන්සේලා මාස ගණනක් යන්නට කලින් තෙල් කොම්පැනිවලට කෝටි ගණනක් දුන්නා. නමුත් කීවේ ලුණු කැඳ බොන්නටවත් සල්ලි නැත කියායි. මා කලින් ඇසූ ප්‍රශ්නය නැවතත් ගරු මුදල් ඇමතිතුමාගෙන් අහනවා. මේ රටේ ප්‍රධාන වශයෙන් විසඳිය යුතු ප්‍රශ්න දෙකක් තියෙනවා. රැකීරක්ෂා ප්‍රශ්නය සහ ජීවන වියදම පිළිබඳ ප්‍රශ්නය ඒ දෙකයි. කොයි රටක වුණත් ප්‍රධාන වශයෙන් විසඳිය යුතු ප්‍රශ්න ඒවායි. රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීම සඳහා මේ ආණ්ඩුව මොන විධියට කටයුතු කර තිබෙනවාද කියා මා අහනවා. අපරාදෙ කියන්න බැහැ, මේ ආණ්ඩුව රැකී රක්ෂා ප්‍රශ්නය නම් විසඳුවා! එදාට වඩා ලක්ෂ ගණනක් අද රැකී රක්ෂා කාර්යාල වල ලියාපදිංචිව ඉන්නවා. සමහරුන් දැන් එපා වෙලා හය මාසයකට වරක් සීල් ගහගෙන කාඩ් එක අළුත් කර ගන්නවත් යන්නෙ නැහැ. සීල් වැදිල වැදිල දූන් ඒ අයට එපා වෙලා. අළුත් නොකිරීම නිසා දැන් සමහරුන්ගේ ලියාපදිංචියත් අවලංගු වෙලා. මේ රටේ විශ්ව විද්‍යාලවලින් පිටවන දහස් ගණනක් රැකී රක්ෂා නැතිව සිටින බව තමුන්නාන්සේ දන්නවා. රටට අවශ්‍ය දොස්තරවරුන් විශ්ව විද්‍යාලයෙන් පිටවෙනවා. අපේ රටේ ජනගහනය අනුව බලන විට තවත් දොස්තරවරුන් විශාල සංඛ්‍යාවක් අවශ්‍යයි. එහෙත් විශ්ව විද්‍යාලයෙන් පිටවන දොස්තරවරුන්ට රැකී රක්ෂා දෙන්න තමුන්නාන්සේලාට පුළුවන්කමක් නැහැ. රක්ෂා නැති දොස්තරවරුන් විශාල ගණනක් සිටිනවා.

අපි ආරම්භ කළ ජනසතු ව්‍යාපාර කාබාසිනියා කරන්ට නම් මේ රජය කටයුතු කරගෙන යනවා. අද ලංගමයට සිදු වී තිබෙන්නේ මොකක්දැයි මුදල් ඇමතිතුමාත් දන්නවා. ලංකා ගමනා ගමන මණ්ඩලය දැන් පණ අදිමිනුයි තිබෙන්නෙ. 1965 මැතිවරණයේදී තමුන්නාන්සේලා මහජනයාට දුන් පොරොන්දු ඉටු කරන්ට දැන් තමුන්නාන්සේලාගේ හෙංචයියලා දහස් ගණනින් කිසිම හේතුවක් නැතිව ලංකා ගමනා ගමන මණ්ඩලයට පත් කරගෙන යනවා. කිසිම හේතුවක් හෝ අවශ්‍යතාවක් නැතිව මගේ කොට්ඨාශයේ බදුලු ඩිපෝවටත් සේවකයන් පත් කර එවා තිබෙනවා. ඒ උදවියට දෙන්න රක්ෂා නැහැ. මෙයින් සමහර ඩ්‍රයිවර්ල දන්නෙ නැහැ, බස් රථ පදවන්න. මගේ කොට්ඨාශයෙන් එක උදාහරණයක් දෙන්නම්. මගේ ප්‍රදේශයේ හිටියා, හුණු කොටුවක් කරපු එක්තරා මුදලාලි කෙනෙක්. ඒ තැනැත්තා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කවදාවත් බස් එකක් තියා කාර්එකක්වත් එළවනවා මම දැකල නැහැ. එහෙත් මේ ආණ්ඩුව බලයට පත්වුණාට පසුව ඒ මිනිහත් ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස් ඩ්‍රයිවර් කෙනෙක්. ඔහු දැන් රිය අනතුරු තුන-හතරක් කරගෙන තිබෙනවා. මේ වගේ මිනිසුන්ටයි, පත්වීම් දෙන්නෙ. කොළඹ-බදුල්ල බස් රථයක් දෝවේදී පෙරළී 29 දෙනකු ජීවිතක්ෂයට පත්වූ බව තමුන්නාන්සේ දන්නවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
දෙන්නෙක් කොලොන්නාවෙ.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டா)*
(Mr. B. H. Bandara)

මේ රටේ ඉතිහාසයේ කවදාවත් සිදු නොවුණු අන්දමේ දේවල් සිදු වෙන්නෙ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව බලයට පත්වීමෙන් පසුව දේශපාලන බලපෑම් උඩ කිසිම දැනීමක් හෝ පුහුණුවක් නැති රියැදුරන් ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවයට පත් කර ගත් නිසයි. මේ ආණ්ඩුව බලයට පත් වුණායින් පසුව හැමදාම වගේ පත්‍රවල මේ විධියේ අනතුරු ගැන වාර්තා වෙනවා. අද ප්‍රවෘත්ති පත්‍රවලත් තිබෙනවා, මාවනැල්ලේ හිඟුල ප්‍රදේශයේදී බස් රථයක් පෙරළී විශාල පිරිසකට තුවාල සිදුවී තිබෙන බව. මේවාට හේතුව මන්ත්‍රීවරුන්ගේ හා ඇමතිවරුන්ගේ කියුම් කෙරුම් උඩ, කිසිම සුදුසුකමක් නැති අය ලංකා ගමනා ගමන මණ්ඩලයේ රියැදුරන් වශයෙන් පත් කරගෙන අහිංසක මහජනයාගේ ජීවිත සමග සෙල්ලම් කරන්නට යාමයි. මේක විශලා අපරාධයක්. එක් පුද්ගලයෙක් තමන්ගේ ඡන්ද කටයුතුවලට උදව් කළාය කියා ඒ පුද්ගලයා සන්තෝෂ කිරීමට විශාල පිරිසකගේ ජීවිත පිළිබඳ වගකීමක් ඇති මෙවැනි තනතුරක් දීම සාපයක්. එයින් ජීවිත රාශියක් නැතිවන්ට ඉඩ තිබෙනවා.

බස් රථවලට අවශ්‍ය උපකරණ වහාම සපයා නුදුන්නොත් ලංකා ගමනා ගමන මණ්ඩලයේ වැඩ කොයි මොහොතේ අඩපණ වී සම්පූර්ණයෙන් නවතීදැයි කියන්නට බැරි බව ලංගම නිලධාරීන් ජනසතු සේවා ඇමතිතුමාට කියා තිබෙන බව අද පත්‍රයෙන් මා දැක්කා. අළුත්වැඩියා කරන උපකරණ නොමැති නිසා අබලන් වූ බස් දහස් ගණනක් අද ගරාජ්වල තිබෙනවා. බස් මඟට යවන්න පිළිවෙලක් නැති නිසා මගීන්ගේ ගමනා ගමන පහසුකම් මොන තරම් දුරට අඩපණ වෙලා තිබෙනවාද? බොරැල්ලේ සිට වැල්ලවත්තට යන්නට තමාට ඊයේ පැය 1½ක් බස් නැවතුම්පොලේ සිටින්නට සිදු වුණු බව ඊයේ මා හමුවන්නට ආ කෙනකුගෙන් දැන ගන්ට ලැබුණා. බොරැල්ලේ සිට වැල්ලවත්තට යන්න පැය 1½ක් බස් එක එනතුරු බලා සිටින්න සිදු වුණාලු. ඒ කොළඹ තත්ත්වයයි. අපේ පළාත්වල සමහර පාරවල එක බස් රථයයි ධාවනය කරන්නෙ. හදිසියේ ඒ බස් රථය කැඩුණොත් කවදා හෝ යළිත් එය අලුත්වැඩියා කරන තුරු ඒ පාරේ බස් රථයක් දුවන්නේ නැහැ. මේ අන්දමට මගීන්ගේ ගමනා ගමන පහසුකම් සම්පූර්ණයෙන්ම ඇණහිට තිබෙනවා. විශාල ලාභ සහිතව අපේ ආණ්ඩුව විසින් පවත්වාගෙන ගිය ජනසතු ව්‍යාපාරවලට දේශපාලන බල පෑම් උඩ නුසුදුසු පුද්ගලයන් පත් කොට ඒවා අඩපණ කර තිබෙනවා. ප්‍රමාණයට වඩා සේවකයන් බඳවා ගැනීම නිසා ලංගමය සම්පූර්ණයෙන් ඇණහිටින තත්ත්වයකට අද පත්ව තිබෙන බව තමුන්නාන්සේ පවා දන්නවා. මේ රජය රැකීරක්ෂා ප්‍රශ්නය විසදා තිබෙන්නේ මේ විධියටයි. ලංකා ගමනා ගමන මණ්ඩලය වැනි ජාතික වස්තු ආරක්ෂා කර ගැනීම කවර රජයක වුවත් යුතුකමක්ව තිබියදී, මේ රජය එය විනාශ කර දමන්නට සූදානම් වෙනවා. එපමණක් නොවෙයි. අපගේ ආණ්ඩුව පැවැති කාලයේදී, කොලොන්නාවේ වර්තමාන ගරු මන්ත්‍රීතුමා (ටී. බී. ඉලංගරත්න මයා.) විසින් ඇති කරන ලද තෙල් සංස්ථාව, රක්ෂණ සංස්ථාව ආදී ව්‍යාපාරවලින් අද මේ රජය ප්‍රයෝජන ගන්නවා. රජයේ හෙන්චයියලා ඒවාට රිංගවමින් රැකීරක්ෂා ප්‍රශ්නය විසඳනවා. අප ඇති කළ ජනසතු ව්‍යාපාරවලට රජයේ හෙන්චයියලා ඇතුළු කරනවා මිස අලුතෙන් කිසිම ජනසතු සේවාවක් මේ රජය විසින් ඇති කර තිබෙනවදැයි මා අහනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

ඊළඟට, අද රටේ ඉතාම වැදගත්, ඉතාම බරපතල ප්‍රශ්නය වන ජීවන වියදම ගැන සලකා බලමු. ටික දවසකට කලින් 112ක්ව තිබුණු ජීවන වියදම් අංකය දැන් 121 හමාර දක්වා නැග තිබෙනවා. ජීවත් වන්නට පුළුවන් කමක් නැතිව මහ ජනතාව අද නොමැරී මැරී ජීවත් වෙනවා. ජනතාවගේ හාල් සේරු දෙකෙන් එකක් කපා දමූ රජය එක් සේරුවක් නිකම්දීම ගැන බොහෝම හයියෙන් කෑගහනවා. එහෙත් අනෙක් සේරුව ගන්න රු. 1.15, 1.20, 1.30, 1.40 ආදී වශයෙන් වැය කරන්නට ජනතාවට සිදු වී තිබීම ගැන කිසිවක් කියන්නෙ නැහැ. හාල් සේරුව කැපුවා පමණක් නොවෙයි. මිරිස්, ළූණු, පරිප්පු ආදී ද්‍රව්‍ය අද කෝ? කිසිම රටක ආහාර ද්‍රව්‍යවල මිළ අඩු කරන්නට පුළුවන් කමක් නැතැයි උඩුනුවර ගරු මන්ත්‍රීතුමා (ඩී. බී. විජේතුංග මයා) කිව්වා. එතුමා ජීවත් වන්නේ උඩුනුවරම පමණක් දැයි මා දන්නේ නැහැ. සමාජවාදී රටවල ජනතාවගේ ජීවන තත්ත්වය මොන අන්දමකට පවතිනවාදැයි එවැනි රටකට ගොස් බලන ලෙස මා ඒ ගරු මන්ත්‍රීතුමාට මතක් කරනවා. හාල් සේරුවක් කපා දමා ජනතාව බඩගින්නේ සිටින්නට සැලැස්සූ මේ රජය දැන් "හාල් ගෙන්වන ප්‍රමාණය අඩුයි, පැරකුම් යුගයක් උදා කරව්" කියමින් හැමදාම උදේට ගුවන් විදුලියෙන් කෑ ගහනවා. කන්දොස්කිරියාවේ ඉන්න හැටියක් නැති නිසා මා නම් මගේ ගෙදර රේඩියෝව ක්‍රියා කරවන්නෙත් නැහැ. අසුවල් කුඹුරෙන් අක්කරයකට බුසල් 280 ක් ලැබුණා. තවත් එකකින් බුසල් මෙපමණ ලැබුණා කියමින් ප්‍රචාරයක් ගෙන යනවා. කොහෙන් ලැබුණු ඒවාදැයි අප දන්නේ නැහැ. සම්පූර්ණ බොරුවක් මේ කරන්නේ. හාල් පිටරටින් ගෙන්වීම දැන් අඩුලු. ඒක කියන්න දෙයක්යැ! හාල් සේරු දෙකෙන් එකක් කැපුවහම, ගෙන්වන හාල් ප්‍රමාණයෙන් බාගයක් අඩු වෙනවා තමයි. රජය කියන තරමට මේ රටේ වී නිෂ්පාදනය හාල් නිෂ්පාදනය වැඩි වී තිබෙනවා නම්, කැපූ හාල් සේරුව ආපසු ජනතාවට නොදෙන්නේ ඇයි?

**එල්. සී. ද සිල්වා මයා.**
(திரு. எல். சி. டி சில்வா)
(Mr. L. C. de Silva)

මැතිවරණය ළං වන විට දෙයි.

**බී. එච්. බණ්ඩාර මයා.**
(திரு. பி. எச். பண்டாரா)
(Mr. B. H. Bandara)

ඔව්, එතකොට නම් දෙයි. මුදල් ඇමතිතුමාගේ අය වැය කථාවෙන් රෙදි මිළ බැස්සුවා. ඒත් පසුවදා රෙදි මිළ ඉස්සුණා. මුදල් ඇමතිතුමා එක පැත්තකින් බස්සන්න හදනකොට අනෙක් පැත්තෙන් ඉස්සෙනවා. කරන්න යන දේ නොවෙයි කෙරෙන්නේ. රෙදි පිළිබඳව පැහැදිලි විස්තරයක් අම්පාරේ ගරු මන්ත්‍රීතුමා විසින් කරන්නට යෙදුණු නිසාම ඒ ගැන කථා කරන්නට අදහස් කරන්නෙ නැහැ. අද රටේ ජනතාවට ජීවත් වන්නට සිද්ධ වී තිබෙන්නේ මෙවැනි තත්ත්වයක් යටතේයි. හැම දෙයක්ම වගා කරන ලෙස රජය ජනතාවට කියනවා. වගාවට අප කවදාවත් විරුද්ධ නැහැ. ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය ගැන විරුද්ධ පක්ෂයේ කිසිම මන්ත්‍රීවරයකු කවදාවත් විරුද්ධ වී නැහැ. ආහාර වගාවට සෑම ධෛර්යයක්ම විරුද්ධ පක්ෂයේ සෑම ගරු මන්ත්‍රීවරයෙකුම දෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිලධාරීන් ඉදිරිපත් කරන වැරදි සංඛ්‍යා ලේඛන නිසා අගමැතිතුමා පවා මුලාවට පත් වී සිටිනවා. තමන්ගේ තත්ත්වය උසස් කර ගැනීම සඳහා නිලධාරීන් වැරදි සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන බව අප දන්නවා. මගේ කොට්ඨාශයේ පසුගිය දා සිදු වූ සිද්ධියක් ගැන තමුන්නාන්සේට කියන්න කැමතියි. මගේ ප්‍රදේශයේ ගොවිරජා වශයෙන් තේරුණේ මුදලාලි කෙනෙක්. ඔහු කවදාවත් කුඹුරකට බහින කෙනෙක් නොවෙයි. ගොවි රජා තේරීමේ උත්සවයට මාත් සහභාගි වුණා. අක්කරයකට වී බුසල් 140 ක් ලබාගත්තාය කී අර මා කලින් සඳහන් කළ පුද්ගලයායි ගොවි රජා වශයෙන් තෝරා ගෙන තිබුණේ. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පුද්ගලයාට අයත් කුඹුරක් තිබෙනවා. එයින් වැඩි අස්වැන්නක් ලබාගත් පුද්ගලයා හැටියටයි ඔහු හඳුන්වා දී තිබෙන්නේ. සාමාන්‍යයෙන්, නිලධාරීන් අස්වැන්න ප්‍රමාණය ගණන් ගන්නේ මේ ආකාරයටයි. කුඹුරක හොඳින් වැඩී ගිය ලියැද්දක් තෝරා ගන්නවා. ඒ ලියැද්දේ හොඳින් වැඩී ගිය කොටසින් අස්වැන්න ලබාගෙන ඒ අනුව මෙපමණ බුසල් ප්‍රමාණයක් ලබා ගත්තායයි කියනවා. සමහර විට කලින් ලෑහැස්ති කර ගෙනයි එහෙම කරන්නේ. සම්පූර්ණ බොරුවක් මේ ගෙන යන්නේ. මා සොයා බැලුවා මේ කාරණය ගැන. මට දැනගන්න ලැබුණ හැටියට මුළු කුඹුරෙන්ම, අක්කරයකට වී බුසල් හතලිහකට වඩා ලැබී නැහැ. නමුත් නිලධාරීන් පෙන්වන්නේ අක්කරයකට බුසල් 140 ක් ලැබුණු හැටියටයි. නිලධාරීන් සමග මේවා ගැන කථා කලාම ඒ අය කියන්නේ, මේ අන්දමට කටයුතු නොකලොත් ඒ අයට ජීවත්වන්න බැරි බවයි. එසේ වුණත් මෙබඳු වාර්තා ඉදිරිපත් කිරීමෙන් ආණ්ඩුව මුලා වී තිබෙන බව පෙනී යනවා. ගොවිතැනෙහි දියුණුව කෙසේ වෙතත් මුළු රටම මුලා කිරීමටයි ආණ්ඩුව උත්සාහ දරන්නේ. ඇත්ත වශයෙන්ම වගාවෙහි දියුණුවක් ඇති වෙනවා නම් අපේ සම්පූර්ණ සහයෝගය ඊට දෙනවා. නමුත් එවැන්නක් සිදු වෙන්නේ නැහැ. ගොවි හමුදා වක්ය කියා එකක් පිහිටෙව්වා. නමුත් කෙරෙන වැඩක් නැහැ. ඇත්ත වශයෙන්ම යමක් සිද්ධ වෙනවා නම් විරුද්ධ පාර්ශ්වයේ සිටියත් අපි සහයෝගය දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ගොවිතැන දියුණු කරන්න ඕනෑය කියන අවංක හැඟීමක් මේ ආණ්ඩුවට තිබෙනවා නම්, උදේ සිට රෑ වෙනතුරු ගුවන් විදුලියෙන් කරන කන්දොස් කිරියාව නවත්වා දමා ප්‍රධාන වශයෙන් කළ යුතු කාරණා කීපයක් ගැන මේ අවස්ථාවේදී මතක් කර දෙන්න කැමතියි. ඒ කරුණු ටික කලොත් වගාවෙන් සෑහෙන දියුණුවක් ලබා ගන්න පුළුවන් වනවාට කිසිම අනුමානයක් නැති බව මා හිතනවා. ජනතාවට ඕනෑ කරන ඉඩම් ලබා දෙන්න, ඒවායේ වගා කිරීමට අවශ්‍ය ජලය ලබා දෙන්න, වුවමනා කරන ණය පහසුකම් දෙන්න, අවශ්‍ය පෝර, රසායනික බෙහෙත් ද්‍රව්‍ය සපයා දෙන්න, වෙනත් අවශ්‍ය පහසුකම් සලසා දෙන්න, එවිට තමුන්නාන්සේලා බලාපොරොත්තු වන අන්දමට වගාව දියුණු වෙනවා ඇති. එහෙම නැතුව ජීප් රථ ලබා දුන්නාට, වෙනත් දේවල් සපයා දුන්නාට වගාව දියුණු වන්නේ නැහැ. අප දන්නවා මේ ජීප් රථ පාවිච්චි කරන්නේ මොනවාටද කියා. තමුන්නාන්සේලා, ගොවියාට සහනයන් සලසා දෙනවාය කිවත්, අපේ කාලයේ අය කළ සියයට හයේ පොලිය දැන් සියයට දොළහ දක්වා වැඩි කර තිබෙනවා. එය නොගෙව්වොත් හාල් පොත් ටිකටත් තට්ටු වෙනවා. ගොවියාට සෑම උදව්වක්ම දෙනවාය කිවත් උදව් දී තිබෙන්නේ ඔය ආකාරයටයි. ආණ්ඩුව කියන අන්දමේ දියුණුවක් ඇති වී නැහැ. නිලධාරීන් තමන්ගේ තත්ත්වය උසස් කර ගන්න බොරු සංඛ්‍යා ලේඛන පෙන්වනවා. ඒවාට මුලා වී අස්වැන්න වැඩි වුණායයි කියනවා. හොඳයි, ඇත්ත වශයෙන්ම අස්වැන්න වැඩි වුණා නම් කැඳූ හාල් සේරුව නැවත දෙන්න බැරි මන්ද කියා ප්‍රශ්න කරන්න කැමතියි. ඇත්ත වශයෙන්ම මේ රටේ උපන් මිනිසුන් හැටියට මේ රට දියුණු වීම ගැන අප සන්තෝෂයි. නමුත් එවැන්නක් මේ ආණ්ඩුවෙන් සිදු වෙන්නේ නැහැ.

අධ්‍යාපන ප්‍රශ්නය, ආහාර ප්‍රශ්නය මෙන්ම වැදගත්. එහෙත් අද මේ රටේ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම අවුල් ජාලයක් බවට පත් වී තිබෙනවා. පසු ගිය මාසයේ 24 වනදා අපේ අධ්‍යාපන ඇමතිතුමා බණ්ඩාරවෙල නගරයට ගිය අවස්ථාවේ දී ගුරුවරුන් ඉදිරියේ ප්‍රසිද්ධියේ කරන ලද ප්‍රකාශය ගැන මා කණගාටුවට පත් වෙනවා. එතුමා එදා කියා තිබෙනවා, ගම්බද උදවියගේ කොල්ලන් විශ්ව විද්‍යාලයට ගියාට පස්සේ විශ්ව විද්‍යාලයේ තත්ත්වය සම්පූර්ණයෙන් පහත වැටී තිබෙනවාය කියා. විශ්ව විද්‍යාලය ගන්න දෙයක් නැතිලු; ගම්බද කොල්ලන් ඇවිත් විශ්ව විද්‍යාලය කා දමා තිබෙනවාලු; ගම්බද කොල්ලන් නිසා විශ්ව විද්‍යාලය කෙළෙසිලාලු. ඒ අන්දමටයි අධ්‍යාපන ඇමතිවරයා බණ්ඩාරවෙලට ගිය විට ගුරුවරුන් ඉදිරියේ කියා තිබෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නැවතත් කුරුඳුවත්තේ උදවියගේ දරුවන්ට පමණක් විශ්ව විද්‍යාලයේ ඉඩ කඩ සලසා දීමද මේ රජයේ ප්‍රතිපත්තිය කියා මා අහන්නට කැමතියි. අපි අවුරුදු නවයක් ආණ්ඩු කළා. ඊට කලින් මේ රට පැවති තත්ත්වයට නැවතත් පත් කරන්නටද කල්පනාව? ගරු අධ්‍යාපන ඇමතිතුමා ඉතාම නිහීන නින්දිත ප්‍රකාශයක් තමයි කර තිබෙන්නේ. අපේ කාලයේදී තමයි විශ්ව විද්‍යාලයට වැඩි ගණනක් ගම්බද දරුවන් ඇතුළත් වී තිබෙන්නේ. එම තත්ත්වය නුරුස්සන බව ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ කතාවෙන් පෙනී යනවා. මේ රටේ ජනතාවත් ඒ බව පිළිගෙන තිබෙනවා. එවැනි දෙයක් තමන්ගේ හිතේ තිබෙන එක වෙනම කාරණයක්. එහෙත් ප්‍රසිද්ධියේ එවැනි දෙයක් ප්‍රකාශ කරන්නට කොච්චර ලොකු විලිලැජ්ජා නැතිකමක් තිබෙන්නට ඕනෑද? එතුමා එවැනි ප්‍රකාශයක් කිරීම ගැන ඇත්ත වශයෙන්ම අප කණගාටුව ප්‍රකාශ කරනවා. ගුරු මහත්වරු ඇවිත් මේ ගැන කී වෙලාවේ මේ අන්දමේ මිනිස්සුද රට ආණ්ඩු කරන්නේ යැයි මට හිතුණා. ගම්බද අයගේ දරුවන් පැමිණීම නිසා විශ්ව විද්‍යාලයේ තත්ත්වය බැහැලා; කෙලෙසිලා. උන්නැහේගේ වැඩ පිළිවෙළට "හූ" කිව්වා. ගම්බද අය නොවෙයි ඒකට වැරදිකාරයෝ. ගම්බද ජීවිතය ගැන ඊරියගොල්ල උන්නැහේටත් අමතක වෙලා. එතුමා කුරුඳුවත්තට ආවායින් පස්සේ ඒ කියන්නේ කොළඹ ජීවිතයට බැස්සාට පස්සේ එතුමාට ගම්බද ජීවිතය අමතක වෙලා. මේ රටේ සංවර්ධනයට ඉවහල් විය හැකි අන්දමට මේ රටේ අධ්‍යාපන ක්‍රමය සකස් කරන්නට ඕනෑ. මේ රටේ සංවර්ධනයට වැඩක් විය හැකි අන්දමේ පුරවැසියන් බිහි කිරීම සඳහා අධ්‍යාපන ක්‍රමයක් සකස් විය යුතුයි. එස්. එස්. සී. සමත් වෙලා ලිපිකරුවකු නැත්නම් ගුරුවරයකු වීම ගැන පමණක් නොවෙයි කල්පනා කළ යුත්තේ. රටේ සංවර්ධනයට අවශ්‍ය වන අන්දමේ පුරවැසියන් බිහි කිරීමයි කළ යුතුව ඇත්තේ.

සමාජවාදී රටවල ක්‍රියා මාර්ග ගැන බලන විට ඉහතින් සඳහන් කළ කාරණය ඔප්පු වෙනවා. සමාජවාදී රටකට මා ලඟදීත් ගියා. අපට පේනවා, ඒ රටවල් තමන්ගේ වුවමනාවන් සපුරාලන්නට හැකි අන්දමේ පුරවැසියන් බිහි කිරීමේ පරමාර්ථයෙන් අධ්‍යාපන ක්‍රම සකස් කර තිබෙන බව. ඒ නිසා අපේ රටේත් දැන් පවතින ක්‍රමය වෙනස් කර දමා අපේ රටට පිරිමහින්නා වූ ආකාරයට, අපේ රටේ ආර්ථික තත්ත්වය නගාලීමට හැකි වන ආකාරයට හැඩගැසුණු මිනිසුන් හදන අධ්‍යාපන ක්‍රමයක් සකස් කළ යුතුයි. එසේ නොකර "ගමේ කොල්ලන් ඇවිත් ඉමික කාල දැම්මා" වැනි වැදගැම්මකට නැති කතා කිය කියා ඇවිද්දාට වැඩක් වන්නේ නැහැ.

ගිය වර ජ්‍යෙෂ්ඨ විභාගයේ ප්‍රතිඵල කවදාටත් වඩා පහත් තත්ත්වයකට වැටී තිබෙනවා. මේ රටේ අධ්‍යාපන තත්ත්වය සම්පූර්ණයෙන් කඩාකප්පල් වෙලා. අද පාසල් ළමුන්ට සිදු වී තිබෙන්නේ වැඩි කාලයක් වගා කරන්නයි. මේ පුංචි ළමයින්ට මොන කෙහෙල්මල් වගාවක්ද? දෙමව්පියන් අද තමන්ගේ දරුවන් පාසල් ගොස් ආපසු ගෙදර එන තුරු බලා සිටින්නේ ලොකු අමාරුවකිනුයි. උදැල්ලක් වැනි ආයුධයකින් කොතන කපා ගනීද කියා බයෙනුයි සිටින්නේ. ආරෝග්‍යශාලාවලට ළමයි ඇතුළත් කරන අන්දම දකින විට පේනවා පවතින තත්ත්වය. මේ ආකාරයට වගා කරන්නට ගිහිල්ලා අපේ දරුවන්ගේ කාලය නාස්ති කර දැමීම ගැනත් අපේ දරුවන්ගේ අධ්‍යාපනය කාබාසිනියා කර දැමීම ගැනත් මේ ආණ්ඩුවට සාප වෙනවාට කිසිම අඩමානයක් ඇත්තේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය තත්ත්වය ගැනත් වචනයක් දෙකක් කිවයුතුයි. දැන් ආරෝග්‍යශාලාවලට ඇතුළත් වන ලෙඩුන්ට බත් නම් කන්නට හම්බ වන්නේ නැහැ. බත් විතරක් නොවෙයි අද බෙහෙතුත් නැහැ. බදුල්ල ආරෝග්‍ය ශාලාවේ දොස්තර මහතුන් සමග කීප වතාවක්ම කතා කරද්දී මට දැනගන්නට ලැබුණා රෝගීන්ට වුවමනා කරන බෙහෙත් හේත් නොමැති බව. [[illegible] කිරීමක්] දොස්තරලත් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දොස්තර විභාගය සමත් කළ අය සිටිනවා. නමුත් ඒ අයට රක්ෂා නැහැ. පුද්ගලික ඩිස්පෙන්සරිවලින් බෙහෙත් ලබා ගත හැකි ධනපතියන් පමණක් බේරේවි. එසේ නැතිනම් වාසනාව තිබෙන්නට ඕනෑ, බේරෙන්නට. කන්න නැතුව ලෙඩ සනීප වෙන්නෙත් නැහැ. ලෙඩට වුවමනා කරන බෙහෙත් ද්‍රව්‍ය ඇත්තේත් නැහැ. අද අපේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වයෙහි පවත්නා දුර්වලතාවය නිසාත් ආහාර ගිහයේ බරපතලකම නිසාත් මැලේරියාව වැනි රෝගවලින් ලක්ෂ ගණන් පීඩා විඳින බව පේනවා. ශරීර සෞඛ්‍ය හීන වන විට ජනතාව එවැනි තත්ත්වයකට වැටෙනවා. කන්නත් නැහැ, බේතුත් නැහැ ; ලෙඩත් බෝ වෙනවා. මේක ප්‍රශ්න විසඳන්නට බොහොම ලෙහෙසි ක්‍රමයක් වන්නට ඇති. මා ඒ ගැන ඊට වැඩි යමක් කියන්නේ නැහැ.

අපේ උඩරට ප්‍රදේශයේ ජනතාවට විශේෂයෙන් බලපෑන ප්‍රශ්නයක් ගැන තවත් වචන කීපයක් කිව යුතුයි. උඩරට ප්‍රදේශයට වැදගත් වන ප්‍රශ්නයක් තමයි, මේ රටින් ඉන්දියානුන් පිට කිරීම. සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම අනුව මේ රටින් ඉන්දියානුවන් යැවීම පිළිබඳව මේ ආණ්ඩුව විසින් මෙතෙක් කල් කිසියම් පියවරක් ගෙන නැහැ. එකම ඉන්දියානුකාරයෙක් වත් තවම යවා ඇත්තේ නැහැ. අගමැතිතුමා මොනවා කිව්වත් මා දන්න හැටියට නම් බදුල්ලේ සිටි ඉන්දියානුකාරයින් ගෙන් එක් කෙනෙක්වත් අඩු වී නැහැ. ඇදිගම පැත්තේ සිටි අය නම් ගියාද කියා මම දන්නේ නැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)**

*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும், தகவல், ஒலிபரப்பு அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

ඇදිගම පැත්තේ නැහැ.

**බී. එච්. බණ්ඩාර මයා.**

*(திரு. பி. எச். பண்டார)*

(Mr. B. H. Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට දැනගන්න ලැබී තිබෙන හැටියට නම් ඉන්දියානු පුරවැසිකම් ලබා ගැනීම සඳහා යවන ලද ඉල්ලුම්පත්‍රත් ආපසු ලබාගෙන තිබෙනවා. එහෙමනම් කොහොමද අගමැතිතුමා කියන්නෙ ඉන්දියානුකාරයින් යවනවාය කියා? ඒ නිසා නමුන්නාන්සේලාගේ කාලය ඇතුළතදී—තොන්ඩමන්, වෙල්ලායගම් යන මන්ත්‍රීවරුන් සිටින තෙක්—එක් ඉන්දියානුකාරයෙක්වත් යැවීමට මේ ආණ්ඩුවට පුළුවන් වේවිය කියා මා සිතන්නේ නැහැ. නමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේ එකම ඉන්දියානුකාරයෙක්වත් ඉන්දියාවට යැවෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත රට ප්‍රදේශයට නම් මෙය එතරම් දැනෙන්නේ නැහැ. නමුත් උඩරට ප්‍රදේශයේ සිටින ජනතාවට—වතුවලින් වට වී තිබෙන ගම්වල ජීවත්වන ජනතාවට—අද රක්ෂාවල් නැහැ. අපේ ප්‍රදේශයේ ඌව පළාතේ එකම කර්මාන්ත ශාලාවක් නැහැ. රක්ෂාවක් කරන්න තිබෙන්නේ වතුවල පමණයි. තේ වතුවල රක්ෂාවක් ලබා ගත්තේ නැති නම් කරන්න වෙනත් රක්ෂාවක් ඇත්තේ නැහැ. ඒ වතුවලත් ඉන්දියානුකාරයින් ගොඩ ගැසී සිටින නිසා අපේ මිනිසුන්ට රක්ෂාවක් ලබා ගන්න ක්‍රමයක් නැහැ. මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසු වතුවල වැඩ කළ සිංහල කම්කරුවන් කිහිප දෙනාටත් අයින් වෙන්න සිදු වුණා. ඒ වෙනුවට දෙමළ උදවියම පත් කර ගෙන සිටිනවා. ඒ නිසා අපේ ජනතාව හැම විටම ප්‍රශ්න කරනවා, ඇයි මේ දෙමළ උදවිය යවන්නේ නැත්තෙ කියා. සමා කරන්න දෙමළ යන වචනය පාවිච්චි කිරීම ගැන. මා මේ කථා කරන්නේ ඉන්දියානුකාරයින් ගැනයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මේ සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම ඇති කළේ උඩරට ප්‍රදේශයේ ජනතාවගේ උද්ඝෝෂණය නිසයි. කෙසේ නමුත් අවංකව කියනවා නම් ඉන්දියානුකාරයින් සැහෙන සංඛ්‍යාවක්වත් ඉන්දියාවට යවන්නේ නැතිව උඩරට ප්‍රදේශයේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳන්න පුළුවන්කමක් නැහැ. මේ ගිවිසුම ඇති කළේ ඒ නිසාමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

නමුත් මෙතෙක් කල් එකම ඉන්දියානු කාරයෙක්වත් නොයැවීම ගැන අපේ බලවත් අප්‍රසාදය මේ ආණ්ඩුවට පළ කළ යුතුව තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය වැදගත් ජාතික ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය පිළිබඳව මේ ආණ්ඩුව උදාසීන භාවයෙන් කටයුතු කිරීම ගැන උඩරට ජනතාව වෙනුවෙන් මා තමුන්නාන්සේලාට දොස් කියනවා; මගේ කනගාටුව පළ කරනවා. අද උඩරට සිටින අපේ ජනතාවට රක්ෂාවක් ලබා ගන්න ක්‍රමයක් නැහැ. හාල් සලාකය කැපුවා. ලූනු, මිරිස්, පරිප්පු ආදිය කිසිවක් ලැබෙන්නෙ නැහැ. රෙදි මිල වැඩි කළා. රක්ෂාවක්වත් නැති මිනිසුන් කොහොමද ජීවත් වන්නෙ? ආණ්ඩුවේ සේවකයන් හැටියට අපේ මිනිසුන් පත් වී සිටින්නේ ග්‍රාමසේවකයන් වශයෙන් පමණයි. එස්. එස්. සී. විභාගය සමත් කර ගුරු පත්වීම් ලබා ගත් අය කිහිප දෙනෙකුත් ඉන්නවා. ඒ හැරෙන විට ආණ්ඩුවේ රැකියාවක් කරන මිනිහෙක් අපේ පළාත්වල නැහැ. රක්ෂාවක් නැත්නම්, හාල් සලාකය කපලා නම්, ලූනු, මිරිස්, පරිප්පු ටික ලැබෙන්නේ නැත්නම්, අපේ ජනතාව ජීවත් වන්නේ කොහොමද? මුදල් ඇමතිතුමා රෙදි මිල බස්වනවා. නමුත් ඇත්ත වශයෙන්ම එහි මිල ඉහළ යනවා. ඒ නිසා සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම අනුව ඉන්දියානුකාරයින් ඉන්දියාවට පිටත් කර යැවීමට මේ ආණ්ඩුව විසින් කටයුතු නොයෙදීම ගැන උඩරට ජනතාව මේ ආණ්ඩුව වෙත තමන්ගේ බලවත් අප්‍රසාදය පළ කරනවා. ඔවුන් මේ ආණ්ඩුවට සාප කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව තවත් කරුණු රාශියක්ම කියන්න තිබෙන නමුත් මට අයිති කාලය නිම වී යන බැවින් මා ඒ පිළිබඳව කරුණු දැක්වීම නතර කරනවා.

ඊළඟට මට තවත් කරුණු දෙකක් ඉදිරිපත් කිරීමට තිබෙනවා. කර්මාන්ත පිළිබඳවත් වචන දෙක තුනක් කිව යුතුව තිබෙනවා. කර්මාන්ත නම් රාශියක්ම මේ රටේ ඇති වී තිබෙනවා. කයිට්ස්හි මන්ත්‍රීතුමා (වී. නවරත්නම් මයා.) කියන්න යෙදුනා, එතුමාගේ පළාතට කර්මාන්ත ශාලාවක් දුන්නේ නැත කියා. ඒ පළාතේ නම් සිමෙන්ති කම්හලක් ශාලාව ආදිය පිහිටුවා තිබෙනවා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආසන 10 කින් යුත් ඌව පළාතට එකම කර්මාන්තශාලාවක්වත් නැහැ. මේ දක්වා තිබුණ එකම ආණ්ඩුවකින්වත් එය ඉටු කර දී නැහැ. කිසිම කර්මාන්තයක් අපේ ප්‍රදේශයේ පිහිටුවා නැහැ. ඒ අය මේ රටේ මිනිසුන් නොවෙයිද? මේ ආණ්ඩුවට අයත් මිනිසුන් නොවෙයිද? ආණ්ඩුවේ යුතුකමක් තිබෙනවා, තමුන්ට වුවමනා කරන ප්‍රදේශ පමණක් උසස් තත්ත්වයට ගෙන ඒමට කටයුතු නොකර, තමන්ට වුවමනා ප්‍රදේශවල පමණක් කර්මාන්තශාලා පිහිටුවන්නේ නැතිව, මුළු රටේම ජනතාවගේ රක්ෂා ප්‍රශ්නය විසඳෙන ආකාරයෙන් කටයුතු කිරීමට. එහෙම බවක් මට නම් පේන්නේ නැහැ. ඌව පළාතේ නම් මොන කර්මාන්තයක්වත් ඇති කර නැහැ. එහි අමු ද්‍රව්‍ය ඕනෑ තරම් තිබෙනවා. ඒ නිසා ඒ අමු ද්‍රව්‍යවලින් ප්‍රයෝජන ගන්නට පුළුවන් වන විධියට වැඩ පිළිවෙළක් සකස් නොකිරීම ගැන කනගාටුයි. දුප්පත් ජනතාවට භාග්‍යය ලබා දීමට මේ ආණ්ඩුව ක්‍රියා කරනවා නම්, එය කාගේත් ප්‍රශංසාවට ලක් විය යුතු බව මතක් කරන අතරම තවත් කාරණයක් මතක් කරන්නට කැමතියි.

අපේ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා අපේ ප්‍රදේශවලටත් පේෂ කර්ම මධ්‍යස්ථාන දුන්නා. ඒ ගැන එතුමාට ස්තුතිවන්ත වෙනවා. එහෙත් අපට දැන් ඒ මධ්‍යස්ථානවල වැඩ කරන අයගෙන් දැන ගන්නට ලැබී තිබෙන්නේ ඒවායේ නොයෙකුත් අඩුපාඩු තිබෙන බවයි. ඒවාට අවශ්‍ය නූල් නැති නිසා සමහර මධ්‍යස්ථාන වැසීගෙන යනවා. මේ තත්ත්වය නිසා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාට මා පිරිනැමූ ස්තුතිය ආපසු ගන්නටයි, සිදු වී තිබෙන්නේ. ඇත්තෙන්ම මේ විධියට ගියහොත් අපේ රට කොතැනින් නතර වේවිද?

තම කොට්ඨාශයේ ගොවීන්ට මුදල් වැඩි වී අනුරාධපුරයේ වන්දනාවේ ගිය බව වාරියපොල ගරු මන්ත්‍රීතුමා (සී. එම්. පී. බණ්ඩාර මයා.) කීවා. මේ අන්දමට කරුණු සිදු වුවහොත් නම් වන්දනාවේ නොව ඉක්මනින්ම පරලොව යන්නටයි, සිදු වන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දැන් පිරිවැටුම් බද්ද සියයට පහකින් වැඩි කර තිබෙනවා. කලින් සඳහන් කරන ලද දේ නිසා පමණක් නොව, පිරිවැටුම් බද්දත් මේ අන්දමට වැඩි කර තිබෙන නිසා, මිල පාලනයක් නොකළ හොත් දේශීය භාණ්ඩවල මිල වැඩි වෙනවා. මුදල් ඇමතිතුමාගේ කථාවෙන් එවැන්නක් කියැවුණේ නැහැ. පිරිවැටුම් බද්ද වැඩි කිරීම හේතුකොටගෙන දේශීය භාණ්ඩවල මිල සම්පූර්ණයෙන්ම ඉහළ යනවා. සපත්තු, සෙරෙප්පු, විස්කෝතු, ඉඳි කටු, සිසිල් බීම, ටෝච් බැටරි යන හැම දේකම මිල වැඩි වෙනවා. මිල වැඩි වීම නවත්වන්න නම් මිල පාලනයක් ඇති කරන්නට ඕනෑ. පාලන මිලක් ඇති නොකළොත් සිදු වන්නේ, කබලෙන් ළිපට වැටීමක්. රුපියලේ අගය අඩු කළා; හාල් කැපුවා; රෙදි මිල ඉස්සුවා. එවැනි තත්ත්වයක් තිබෙන අතරම මිල පාලනයක් ඇති නොකොට, පිරිවැටුම් බද්ද වැඩි කිරීම නිසා ජනතාවට ජීවත් වන්නට පවා බැරි තත්ත්වයක් ඇති වෙනවා.

1965 මැතිවරණයෙන් බලයට පත් වුණු මේ රජය පළමු වැනි අයවැය ලේඛනය ඉදිරිපත් කරමින් කියා සිටියේ, පසුගිය රජය රට බංකොළොත් කළා කියායි. එය ඇත්ත වෙන්න ඇතැයි හිතා, පළමු වරට මහජනතාව රජයට සමාව දුන්නා දෙවැනි තුන්වැනි අයවැය ලේඛනවලින් පසුවවත් ඇපල්, මුද්දරප්පලම් කන්නට පුළුවන් වේ යයි ඔවුන් අවංකවම කල්පනා කළා. එහෙත් මේ රජය බලයට පත් වී අවුරුදු 3 1/2 කට පසු, අද තිබෙන තත්ත්වය මොකක්ද? අද රැකීරක්ෂා ප්‍රශ්නය ඉතාමත් බරපතළයි. ජීවන වියදම අහස උසට නැග තිබෙනවා. 1965 මැතිවරණයේ දුන් පොරොන්දු කිසිවක් මේ දක්වා ඉෂ්ට නොකිරීම ගැන තවදුරටත් සමාව දෙන්නට මහජනතාව සූදානම් නැති බව ඉතාමත් හොඳින් පැහැදිලි වෙනවා, මේ රජය බලයට පත් වීමෙන් පසුව පැවැත්වුණු අතුරු මැතිවරණ දිහා බලන විට. එපමණක් නොවෙයි. පසුගිය දවස්වල පැවැති දෙහිවල-ගල්කිස්ස නගර සභා මැතිවරණ ප්‍රතිඵලවලිනුත් පැහැදිලිවම පෙනී යන්නේ, මේ ආණ්ඩුව වැරදි මඟක ගමන් කරන බවත්, ජනතාව ඒවා නුරුස්සන බවත් බැව් මා කියන්න කැමතියි.

එම නිසා දැන්වත් තමුන්නාන්සේලා හැදෙන්න බලන්න. මොන ආණ්ඩුවකින් හෝ වේවා අපට වුවමනා කරන්නේ, මේ රටේ ජනතා ප්‍රශ්න විසඳන්නටයි. හිතට එකඟව කථා කරන බව මතක් කරමින් අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන) කීවා, කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාට යැවූ ලිපියකට මේ දක්වා පිළිතුරක් ලැබුණේ නැති බව. එතුමා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකුට පවා ලැබෙන්නේ එවැනි සැලකිල්ලක් නම්, විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් ගැන කියනුම කවරේද? අපට ලබන වර බලය ලැබෙන්නේ නැහැ, ඒ නිසා ඔන්න ඔහේ ඉන්නවා යන උදාසීන හැඟීමකින් මේ රජය කටයුතු කරන බව පෙනෙනවා. උදාසීන නොවී, බලයේ ඉන්නා මේ කාලය තුළදීවත් වැඩක් කරන ලෙස මා රජයෙන් ඉල්ලා සිටිනවා. එහෙම උදාසීන නොවී වැඩ කෙරුවේ නැත්නම් ලබන වර බලයට පත් වන රජයටවත් වැඩක් කිරීම අමාරු වෙනවා. ජනතාව හාමතේ තබා මරන්නේ නැතිව, ඊළඟට බලයට පත් වන රජයකට වත් වැඩක් කිරීමට ඉඩක් තබා, මේ සුළු කාලය තුළදීවත් වැඩක් කිරීම තමුන්නාන්සේලාගේ යුතුකම බව මතක් කරන්න කැමතියි.

මේ අයවැය ලේඛනය දිහා බලන විට නම්, රැකීරක්ෂා ප්‍රශ්නයවත්, ජීවන වියදම් ප්‍රශ්නයවත්, ජනතාවගේ වෙනත් ප්‍රශ්නවත් විසඳීමට එයින් ආධාරයක් ලැබේ යයි පෙනෙන්නේ නැහැ. එම නිසා මේ අයවැය ලේඛනයට විරුද්ධව මගේ ඡන්දය පාවිච්චි කරන බව මතක් කරන අතරම, තමුන්නාන්සේලාගේ වැරදි ක්‍රියා මාර්ගය ගැන ජනතාව කෝප වී සිටින බව මැතිවරණ ප්‍රතිඵලවලින් පැහැදිලිවම දක්වා තිබෙන නිසා, දැනට දක්වෙන උදාසීන ගතිය නැති කරගෙන, පුරුෂ ධෛර්ය—පුරුෂ ධෛර්යයක් තමුන්නාන්සේලාට තිබෙනවාදැයි මා දන්නේ නැහැ—උපදවාගෙන, රටට වැඩක් වන විධියට කටයුතු කරන ලෙස රජයෙන් ඉල්ලමින්, මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 5.4

**ඒ. අමිර්තලිංගම් මයා. (වඩ්ඩුකොඩ්ඩෙයි)**

(திரு. அ. அமிர்தலிங்கம்—வட்டுக்கோட்டை)

**(Mr. A. Amirthalingam—Vaddukoddai)**

உபசபாநாயகர் அவர்களே, இந்தத் தேசிய அரசாங்கத்தின் நான்காவது வரவு செலவுத் திட்ட விவாதத்தில் கலந்துகொண்டு சில வார்த்தைகள் பேச வாய்ப்புக் கிடைத்ததையிட்டு மிகவும் மகிழ்ச்சி அடைகிறேன். எந்த அரசாங்கம் ஒரு வரவு செலவுத் திட்டத்தைக் கொண்டு வந்தாலும் அதை எதிர்க் கட்சியினர் வரவேற்பது கிடையாது. அரசாங்கம் எந்த நன்மையான காரியத்தைச் செய்தாலும் அதற்கு எதிர்க் கட்சியினர் பாராட்டுத் தெரிவிப்பதும் கிடையாது. அதே தோரணையில் தான் இந்த வரவு செலவுத் திட்ட விவாதத்தில் இதுவரை பேசிய அத்தனை எதிர்க் கட்சி அங்கத்தவர்களும் நடந்து கொண்டார்கள். அடுத்த பொதுத் தேர்தலுக்கு ஒத்திகையாக இந்தத் தேசிய அரசாங்கத்தைத் திட்டித் தீர்ப்பதையே நோக்கமாகக் கொண்டு எதிர்க் கட்சி அங்கத்தவர்கள் பேசியதைக் கவனிக்கக் கூடியதாக இருந்தது.

கௌரவ பதுளைத் தொகுதிப் பாராளுமன்ற அங்கதவர் (திரு. பி. எச். பண்டார) அரசாங்கம் பதவிக்கு வந்த பின்னர்தான் பாடசாலைகள் பாழடைந்து விட்டன, வைத்திய சாலைகள் பாழடைந்து விட்டன; மலை நாட்டுத் தோட்டங்களுக்குக்கூட இந்த அரசாங்கம்தான் தமிழர்களைக் கொண்டு வந்து புகுத்தி விட்டது என்ற தொனியில் பேசிய பேச்சைக் கேட்டபோது இப்படியும் பாராளுமன்றப் பிரதிநிதிகள் இருக்கிறார்களா என்று நாம் ஆச்சரியப்பட வேண்டியவர்களாக இருக்கிறோம். சாதாரண பாமர மக்களை ஏமாற்றுவதற்கு ஒரு அங்கத்தவர் இந்தச் சபையைப் பாவிக்க முற்படுவது கௌரவ சபாநாயகர் அவர்களையும் இச்சபையின் கௌரவ அங்கத்தவர்களையும் அவமதிப்பதாக இருக்கும்.

இந்த நாட்டின் பொருளாதார அமைப்பு எப்படி இருக்கின்றது, அதைச் சீர் செய்வதற்கு அரசாங்கம் எடுத்துள்ள நடவடிக்கைகள் சரியா, இந்த நடவடிக்கைகளினால் மக்கள் பிரச்சினைகள் தீர வழி பிறந்து இருக்கின்றதா என்பதை வரவு செலவுத் திட்ட விவாதத்தில் நாம் ஆராய வேண்டும். இந்த அரசாங்கம் அதிகாரத்திற்கு வந்த நேரத்தில் காலியாக இருந்த திறைசேரிதான் அதற்குக் கிடைத்தது. வெளிநாட்டுக் கடன்கள் நன்கொடைகளைக் கொண்டு உள்நாட்டு உற்பத்தியைப் பெருக்குவதன் மூலம் இந்த நாட்டுப் பொருளாதாரத்தை வளம்பெறச் செய்ய வேண்டிய பெரும் பொறுப்பு இந்த அரசாங்கத்தைச் சார்ந்திருந்தது. எந்தப் பொருளாதார அபிவிருத்திக்கும் அடிப்படையாக, மூலவேராக அமைய வேண்டியது உள்நாட்டிலுள்ள பல்வேறு மக்களுடைய ஒற்றுமையும் ஒத்துழைப்பும்தான். இந்த அரசாங்கம் பதவிக்கு வந்ததும் முதல் செய்த வேலை இந்த நாட்டில் வாழும் பல்வேறு இனங்களையும் ஒன்று படுத்தியதுதான். ஒரு தேசிய அரசாங்கம் என்ற அடிப்படையில் பொருளாதார அபிவிருத்திக்கு மூலாதாரமான ஒற்றுமையை ஏற்படுத்த அது முயற்சி செய்தது. சம தர்மத்தைப் பேசுகின்ற எதிர்க் கட்சியினர், சம தர்மத்தின் இன பேதம், சாதி பேதம், மொழி பேதத்திற்கு இடமில்லை என்பதை மறந்து அரசாங்கம் ஏற்படுத்த நினைத்த ஒற்றுமை அத்தனைக்கும் முட்டுக் கட்டையாக இருக்கின்றனர். அரசாங்கம் பல்வேறு இனங்களிடையேயும் ஏற்படுத்த நினைக்கும் ஒற்றுமையைச் சீர் குலைக்கும் நோக்கமாகக் கடந்த மூன்றரை ஆண்டுகளாக எதிர்க் கட்சியினர் பணி புரிந்து வந்திருக்கிறார்கள். கடந்த அரசாங்கத்தினால் இந்த நாட்டில் சிறுபான்மை இனத்தவர்களுக்கு இழைக்கப்பட்ட அநீதிகள் சிலவற்றை நீக்குவதற்கு இந்தத் தேசிய அரசாங்கம் முற்பட்ட நேரங்களில் எல்லாம் வகுப்புத் துவேஷப் பிரசாரத்தில் இறங்கி இந்த நாட்டில் 1956 ஆம் ஆண்டிலிருந்து 1965 ஆம் ஆண்டுவரை எந்த நிலைமை இருந்ததோ அதை மீண்டும் ஏற்படுத்த எதிர்க் கட்சியினர் முயற்சி செய்தார்கள். இன்றைக்கும் அதே முயற்சியை அவர்கள் செய்து கொண்டுதான் இருக்கிறார்கள். இந்த விதமான சூழ்நிலையில் சமீப காலங்களில் வகுப்பு ஒற்றுமையை, இன ஒற்றுமையைக் குலைப்பதற்கு இந்த நாட்டில் எடுக்கப்பட்ட சில முயற்சிகளைப் பற்றி நான் சிறிது கூற வேண்டியவனாக இருக்கிறேன்.

ஒரு நாட்டின் பொருளாதார அபிவிருத்திக்கு, நாட்டு மக்கள் எல்லோரும் அந்த அபிவிருத்தியில் ஈடுபடவேண்டியது அத்தியாவசியம். உதாரணமாக, பல ஐந்தாண்டுத் திட்டங்களை வகுத்து அந்த நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்ப முற்பட்ட இந்திய அரசாங்கம், அந்த நாட்டின் ஒவ்வொரு பகுதியி

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

லும் வாழும் மக்களை அந்த அபிவிருத்தியில் நேரடியாக ஈடுபடச் செய்ய விரும்பி, ஒவ்வொரு ஜில்லாக்களுக்கும் "ஜில்லாப் பரிஷத்" என்ற பெயரிலே மாவட்ட சுயாட்சி சபைகளை நிறுவியது. அவ்விதம் நிறுவி, அவற்றின் மூலம் மக்களை அபிவிருத்தித் திட்டங்களோடு நெருங்கிய தொடர்பு கொள்ளச் செய்து, அபிவிருத்தியை ஏற்படுத்த வழிதேடிக் கொண்டு வந்திருக்கிறது. அதே முறையிலே, இந்த நாட்டின் ஒவ்வொரு பகுதியிலும் உள்ள மக்களும் அந்தந்தப் பகுதி அபிவிருத்தியில் ஈடுபாடு கொள்ளக்கூடிய விதமாக, அவர்களுடைய குரல் கேட்கக் கூடிய விதமாக, மாவட்ட சபைகளை அமைப்பதன் மூலம் அதிகாரத்தைப் பரவலாக்கிப் பகிர்ந்தளிக்க இந்த அரசாங்கம் முயற்சி செய்தது. அதனை ஒரு காரணமாக வைத்துக்கொண்டு நாடெல்லாம் வகுப்பு வெறியைத் தூண்டிவிட பலர் முற்பட்டார்கள். கௌரவ எதிர்க்கட்சி அங்கத்தவர்களும் முன்னை நாம் பிரதம நிதியரசர் ஒருவரும் அவருடன் சேர்ந்து வணக்கத்துக்குரிய பௌத்த குருமார் சிலரும் இவ்விதம் வகுப்பு வெறிப் பிரசாரத்தில் இறங்கினார்கள். அதன் மூலம் நாட்டில் ஒரு கொந்தளிப்பான நிலையை ஏற்படுத்தினார்கள் என்பது எமக்கு நன்றாகத் தெரியும்.

எதிர்க்கட்சி அங்கத்தவர்கள் இந்தப் பிரசாரத்தில் இறங்கிய முக்கிய நோக்கம், அரசாங்கம் தமது மாவட்ட சபைத் திட்டத்தை நிறைவேற்றிவிட்டால் அதை வைத்து நாம் இந்த அரசாங்கத்தை விட்டு வெளியேறுவோம், அதைத் தொடர்ந்து அரசாங்கத்தை வீழ்த்திவிடலாம் என்று அவர்கள் கனவு கண்டார்கள். அரசாங்கம் அவ்விதம் எதிர்ப்பையும் பொருட்படுத்தாமல் அதனை நிறைவேற்ற முற்பட்டால் அரசாங்கக் கட்சியிலிருந்து சிலரைத் தமது பக்கத்துக்குச் சாரச் செய்து, அந்த வகையில் அரசாங்கத்தை வீழ்த்தலாம் என்று கனவு கண்டார்கள். எப்படியாவது அரசாங்கத்தை வீழ்த்தும் நோக்கத்தைக் கொண்டு அவர்கள் பணி புரிந்தார்களேயல்லாமல் நாட்டின் நலனில், கொள்கையில், இலட்சியத்தில் எந்தவிதமான பற்றும் அற்றவர்களாக நடந்துகொண்டார்கள். இவ்விதமான சூழ்நிலையில்தான், நாட்டில் ஏற்பட்ட வெறியாட்டத்தில் இந்த அரசாங்கத்தை எப்படியாவது வீழ்த்திவிட்டுத் தாம் அதிகாரத்துக்கு வரலாம் என்று அவர்கள் கண்டு கொண்டிருந்த பகற் கனவைப் படு குழியில் புதைப்பதற்காகத்தான்

மாவட்ட சபைகள் அமைக்கப்படா விட்டாலும் இந்த அரசாங்கத்துக்கு ஆதரவு கொடுக்க எமது கட்சி தீர்மானித்தது; ஆதரவும் கொடுத்து வருகிறது.

எமது இந்தத் தீர்மானம் இரண்டு முக்கியமான நோக்கங்களுக்காக எடுக்கப்பட்டது. முதலாவதாக, கௌரவ பிரதம அமைச்சர் அவர்களின் தலைமையில் இந்த நாட்டில் கட்டியெழுப்பப்பட்ட ஒற்றுமையை, வகுப்பு வெறியில் சிதைத்தொழிக்க முற்பட்ட எதிர்க்கட்சியினர் சதிக்கு இந்த நாட்டைப் பலியாக்கக் கூடாதென்பதே எமது முதல் நோக்கம். இரண்டாவதாக, தப்பித்தவறி இனவெறி பிடித்தவர்களை அதிகாரத்துக்கு வர விடுவோமானால் இன்று இருப்பதிலும் பார்க்க படுமோசமான நிலைமைக்கு இந்த நாட்டிலுள்ள சிறுபான்மை இனத்தவர்கள் உள்ளாக்கப்படுவார்கள் என்பது எமக்கு நன்றாகத் தெரியும். இவற்றை மனதில் வைத்துத்தான் நாம் தொடர்ந்தும் அரசாங்கத்துடன் இருக்கத் தீர்மானித்தோம்.

உப சபாநாயகரவர்களே, நாங்கள் நாட்டின் நன்மை, இனத்தின் நன்மை கருதி எடுத்த முடிவுக்கு சிலர் விசித்திரமான காரணங்களைக் கூற முற்பட்டிருக்கிறார்கள். சமீபத்தில் கிளிநொச்சியில் நடைபெற்ற, நீங்களும் சமுகமளித்திருந்த ஒரு கூட்டத்தில் இத்தகைய விசித்திரமான காரணங்களைச் சிலர் கூறியதாக அறிந்தேன். அந்தப் பொய்யான கூற்றுகளுக்கு இந்தச் சபையிலே திட்டவட்டமாக மறுப்புத் தெரிவிக்கக் கடமைப்பட்டவனாக இருக்கிறேன். எங்கள் கட்சியைச் சேர்ந்த பாராளுமன்ற அங்கத்தவர்கள் சிலர்மீது இலஞ்சக் குற்றச்சாட்டுக்கள் இருப்பதாகவும், நாங்கள் அரசாங்கத்தை விட்டு வெளியேறினால் அதனால் ஆபத்து என்று அரசாங்கத்தை விட்டு வெளியேறாமல் இருக்கிறோம் என்றும் சிலர் கூறியிருக்கிறார்கள். யார் மேல் இலஞ்சக் குற்றச்சாட்டு இருக்கிறது என்று பெயரைக் குறிப்பிட்டுச் சொன்னால் தங்களுக்கு ஆபத்து என்பதால் பொதுப்படையாக தமிழரசுக் கட்சி அங்கத்தினர்கள் மேல் இலஞ்சக் குற்றச்சாட்டு இருக்கிறது என்று கூறியிருக்கிறார்கள். கிளிநொச்சியில், நீங்களும் சமுகமளித்திருந்த அந்தக் கூட்டத்தில் அந்தக் கூற்றுக் கூறப்பட்டது என்று அறிந்தவுடன் நான் கௌரவ சபாநாயகரவர்களைச் சந்தித்து அதைப் பற்றிக் கேட்டேன். ஏனென்றால், உங்களுக்குத் தெரியும் கௌரவ உப சபாநாயகரவர்களே, யாராவது ஒரு பாராளுமன்ற உறுப்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශ්‍රී, අමිර්තලිංගම් මයා.]

பினர் மீது இலஞ்சக் குற்றச்சாட்டு இருப்ப தாக இருந்தால் அதைப் பற்றி விசாரிக்க கௌரவ சபாநாயகரவர்களுடைய அனு மதியை இலஞ்ச விசாரணை ஆணையாளர் பெற வேண்டும் என்பது. நான் கௌரவ சபாநாயக ரவர்களைச் சந்தித்து அப்படி எமது கட்சி அங்கத்தவர் எவர் மேலாவது இலஞ்சக் குற்றச்சாட்டு இருப்பதாகவோ அதைப் பற்றி விசாரிக்க அனுமதிவேண்டுமென்றோ இலஞ்ச விசாரணை ஆணையாளர் கேட்டு இருக்கிறாரா என்று நேரடியாகக் கேட்ட பொழுது அந்த விதமான கோரிக்கை எது வுமே கிடையாது என அவர் தெட்டத் தெளிவாகப் பதிலளித்தார். நீங்கள் சமூக மளித்திருந்த கூட்டத்தில் மாத்திரமல்ல, கௌரவ உப சபாநாயகரவர்களே, எதிர்க் கட்சி அங்கத்தினர்களுடைய சில கூட்டங் களிற்கூட, பெயரைச் சொல்லாமல் இத்தகைய பொய்க் குற்றச்சாட்டுக்களைச் சுமத்திக் கொண்டு வருகிறார்கள். அவ்விதம் கூறித்திரி பவர்களுக்கு அரசியலில் கண்ணியம் என்றால் என்னவென்பது, நாணயம் என்றால் என்ன வென்பது தெரியுமாயிருந்தால், அவர்களுக்கு மனிதத் தன்மை இருக்குமேயாகவிருந்தால் இனிமேலாவது இத்தகைய பொய்ப் பிரசாரங் களை நிறுத்தி விடுவார்கள் என்று எதிர்பார்க் கிறேன். அல்லது பகிரங்கமாகச் சொல்லட்டும் யார் மீது குற்றச்சாட்டு என்று. அல்லது நிரூ பிக்கட்டும். நாங்கள் எங்களது பாராளுமன்ற ஸ்தானங்களை விட்டுப் போவதற்கு ஆயத்த மாக இருக்கிறோம் என்பதை இந்தக் கௌரவ சபையிலே நின்று நாட்டு மக்கள் அனைவருக் கும் அறிவிக்க நான் கடமைப்பட்டிருக் கிறேன். கௌரவ உப சபாநாயகரவர்களே, நான் இதைக் குறிப்பிடும் பொழுது நீங்கள் தலைமை வகிப்பது சாலவும் சிறந்தது. பொருத் தமானது. மகிழ்ச்சிக்குரியது.

சில பத்திரிகைகள் கூட இத்தகைய பிர சாரத்தில் ஈடுபட்டதை நாம் அறிவோம். கௌரவ ஊர்காவற்றுறை பிரதிநிதி (திரு. வீ. நவரத்தினம்) வெளியிட்ட ஒரு அறிக்கையில் "எங்களுடைய வீடுகளில் சில எலும்புக் கூடு கள்" "skeleton in the cupboard" என்று ஏதோ ஒரு வசனம் சொன்னாராம். அதை வைத்துக் கொண்டு ஒரு பத்திரிகையின் அர சியல் நிருபர் கயிறு திரிக்கத் தொடங்கினார். கயிறு திரிக்கத் தொடங்கிய அவர் நேர்முக மாகச் சொல்லத் தைரியமின்றி கோழைத்தன மாக, மற்றவர்கள் அந்த விதத்திலே நினைக்க கூடியதாகவும், அந்த நேரத்தில் ஏதாவது நீதிமன்றத்தில் நிற்க வேண்டிய நிலைமை வந்தால் யார் மீதும் சொல்லவில்லையே என்று சொல்லக் கூடியவகையிலும் அந்த நிருபர் எழுதிக் கொண்டிருப்பது கேவலமானது. கோழைத்தனமானது.

1964 ஆம் ஆண்டு இந்த நாட்டிலே உண்மை யில் பத்திரிகைச் சுதந்திரத்தைப் பாதுகாப்ப தற்காக, முந்திய அரசாங்கம் எம்மை எவ்வள வோ வருத்தி அழைத்தும் கூட அதனைப் புறக் கணித்து ஜனநாயகம் இந்த நாட்டிலே பாது காக்கப்பட வேண்டும்; பத்திரிகைச் சுதந் திரம் பாதுகாக்கப்பட வேண்டும் என்று நாங் கள் நின்றோம். அந்த நேரத்தில் நாங்கள் இந் தப் பத்திரிகைகளுக்கு மாறாக முன்னைய அர சாங்கத்துடன் சார்ந்து இருந்திருப்போமே யானால் இப்படிப் பொய்யான செய்திகளை கோழைத்தனமாக எழுத இவர்களால் இன்று முடியாது. நாம் செய்தவற்றுக்கு இவர்களிட மிருந்து கிடைக்கும் நன்மை எங்களைப் பற்றி பொய்யும் புனைந்துரையுமாக எழுதிக் கொண் டிருப்பதுதான். ஆகவே, அவர்கள் கூறு வதைக் கண்டிக்கும் அதே நேரத்தில் எமது கொள்கையை, ஜனநாயகத்தின் பெயரால் பத் திரிகைச் சுதந்திரம் பாதுகாக்கப்படவேண் டும் என்ற கொள்கையை நாங்கள் கைவிட வில்லை என்றும் கூறவிரும்புகிறேன். பத்திரி கைச் சுதந்திரம் என்பதை ஆங்கிலத்தில் freedom of the wild ass—"காட்டுக் கழுதையின் சுதந்திரம்" என்று சொல்வார் கள். நினைத்ததை எல்லாம், கண்டகண்ட பொய்களையெல்லாம் கண்டகண்டபடி எழு தும் சுதந்திரத்தை எந்தப் பத்திரிகைக்கும் கொடுக்க முடியாது. சமீபத்திலே எங்கள் நாட்டிலே சில பத்திரிகைகள் இந்த விதத் தில் பிரசாரம் செய்துவருகின்றன. சிறப்பாக நான் ஒரு குறிப்பிட்ட கோஷ்டிப் பத்திரிகை களைப் பற்றிக் குறிப்பிட வேண்டியவனாகவிருக் கிறேன். "சன்" "தவச" 'தினபதி" குழு வைச் சேர்ந்த பத்திரிகைகள் எழுதுகின்ற விதம் இந்த நாட்டிலே மிகக் கேவலமான நிலையை உருவாக்குவதாக இருக்கின்றது. தமிழ் மக்களைக் காட்டிக் கொடுக்கிறது அர சாங்கம்; தமிழரசுக் கட்சி தமிழர்களைக் காட்டிக்கொடுத்துவிட்டது என்று தமிழ் மக் களைத் தூண்டிவிடக்கூடிய முறையிலே "தின பதி"ப் பத்திரிகையிலே எழுதுவார்கள். "தவஸ" ப் பத்திரிகையிலே எழுதுகின்ற [illegible]து, பிரதமர் அவர்கள் சிங்கள மக்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

களைக் காட்டிக் கொடுத்துவிட்டார்கள், சிங்கள மக்களைத் தமிழ் மக்களுக்கு விற்றுவிட்டார்கள் என்ற தோரணையில் எழுதுவார்கள்.

"சன்" பத்திரிகையிலே பார்க்கும் பொழுது ஒவ்வொருநாளும் முன்னாள் பிரதம நீதியரசரொருவரின் படம் போடப்பட்டிருக்கும். படம் எடுப்பவர்களையும் கூட்டிக்கொண்டு போய் அவர் ஒவ்வொரு நாளும் ஒவ்வொரு காணியிலே நிற்பார்—எந்தக் காணியிலோ வயலிலோ எங்களுக்குத் தெரியாது. அந்த வயலில் விளைந்த நெல்லைப்பற்றி, பயிரைப் பற்றி கையினால் காட்டி விளக்கிக் கொண்டிருப்பார். அந்தப் பயிரையோ நெல்லையோ விளைவிக்க எந்த விதமான சேவையும் செய்திருக்கமாட்டார் அவர். ஆனால் படம் பிடிக்க மாத்திரம் அங்கு செல்வார். இவ்விதமாக அவரையும், அவரது கருத்துக்களையும் பற்றி விளக்கி ஒரு செய்திவிருக்கும். சிங்களப் பத்திரிகைக்குச் சின்னமாகச் சிங்கத்தைப் பொறித்திருப்பார்கள். தமிழ்ப் பத்திரிகையான "தினபதி" க்குச் சின்னமான இடபத்தைப் பொறித்திருக்கிறார்கள். எல்லோருக்கும் எல்லாமாக நடந்து இந்த நாட்டிலுள்ள பல்வேறு இனங்களை அழித்து, ஒழிக்கப் பத்திரிகைச் சுதந்திரத்தைப் பயன்படுத்திக் கொண்டு வருகின்றன இப்பத்திரிகைகள்.

பத்திரிகைச் சுதந்திரமென்றால் இத்தகைய வற்றுக்கெல்லாம் இடம் கொடுக்க முடியாது. இந்தச் சந்தர்ப்பத்திலே நான் கௌரவ பிரதம அமைச்சரையும் இந்த அரசாங்கத்தையும் கேட்டுக்கொள்வதென்னவென்றால், இவ்விதமாகக் கட்டுப்பாடற்ற சுதந்திரமற்ற அளவுக்கு உண்மையான செய்திகளை மறைத்து செய்திகளை வெளியிடக்கூடிய நிலைமையை நிச்சயமாக அதி சீக்கிரத்தில் நீக்க வேண்டும் என்பதே. அல்லது தங்கள் பத்திரிகைகளை விற்பதற்கு ஒரு இரத்தக்களரியைக்கூட இந்த நாட்டிலே ஏற்படுத்த இவ்விதமான பத்திரிகைகள் ஆயத்தமாக இருக்கின்றன வென்பதைக் கூறி வைக்கவிரும்புகிறேன்.

உப சபாநாயகரவர்களே, இச்சந்தர்ப்பத்திலே கௌரவ ஊர்காவற்றுறை பிரதிநிதி கூறிய இரண்டொரு கூற்றுக்களுக்கும் நான் பதிலளிக்க வேண்டியவனாக இருக்கிறேன். முந்திய அரசாங்கம் வகுப்புவாத ரீதியிலே இயங்கியதும், அபிவிருத்தித் திட்டங்களை வகுப்புவாத ரீதியிலே நடாத்தியதும் நாம் எல்லோரும் அறிந்ததே. 1957 ஆம் ஆண்டு இதே சபையிலே நான் எதிர்க்கட்சி ஆசனத்திலிருந்து கொண்டு வரவுசெலவுத்திட்ட விவாதத்திலே பேசிய பொழுது, அப்பொழுது இருந்த கைத்தொழில் அமைச்சரவர்களுக்கு ஒரு வேண்டுகோள் விடுத்தது எனக்கு நல்ல ஞாபகமாக இருக்கிறது. காங்கேசன்துறைச் சீமெந்து தொழிற்சாலையின் இரண்டாவது, மூன்றாவது சூளைகளை உடனடியாக ஆரம்பியுங்கள் என்று நான் அவருக்கு வேண்டுகோள் விடுத்தேன். அப்பொழுது கௌரவ வில்லியம் டி சில்வா கைத்தொழில் அமைச்சராக இருந்தார். அவர், நாங்கள் அடுத்த தொழிற்சாலையை அம்பலாங்கொடையிலே ஆரம்பிப் போமே தவிர யாழ்ப்பாணத்திலேயுள்ள தொழிற்சாலையை அபிவிருத்தி செய்யமாட்டோமென்று எங்களுக்குக் கூறினார். ஆனால், இன்று இந்த அரசாங்கம், சிம்மாசனப் பிரசங்கத்திலும் வரவுசெலவுத் திட்டத்திலும் வெளியிட்டுள்ளபடி இரண்டாவது சூளையைப் பொருத்தியது மாத்திரமன்றி மூன்றாவது சூளையையும் ஆரம்பித்து காங்கேசன்துறையிலுள்ள சீமெந்துத் தொழிற் சாலையைப் பூரணத்துவமுடைய ஒரு தொழிற்சாலையாக—நாட்டின் தேவையைப் பூர்த்தி செய்யக்கூடிய ஒரு தொழிற்சாலையாக அமைக்க நடவடிக்கை எடுத்துவருகிறது என்பதை மிக மகிழ்ச்சியோடு கவனிக்கின்றோம்.

காங்கேசன்துறைத் துறைமுகத்தை அபிவிருத்தி செய்யவேண்டும்; அதையும் வர்த்தகத்துக்கான ஒரு துறைமுகமாக—பெரிய கப்பல்கள் வரக்கூடிய துறைமுகமாகத் திருத்தவேண்டுமென்று முந்திய அரசாங்கத்தை நாங்கள் பலமுறை பணிந்து பணிந்து கேட்டோம். 15, 20 ஆண்டுகளாக நாங்கள் வேண்டுகோள் விடுத்து வந்தோம். ஆனால் "செவிடனின் காதில் ஊதிய சங்கு" போல அது அவர்கள் காதில் ஏறவில்லை. இந்த அரசாங்கம் காங்கேசன்துறைத் துறைமுகத்தை அபிவிருத்தி செய்ய இந்த வரவுசெலவுத் திட்டத்திலே 40 இலட்சம் ரூபா ஒதுக்கியிருக்கிறது. கூடிய விரைவிலே அதை அபிவிருத்தி செய்வார்கள் என்றே நாங்கள் நம்புகிறோம். சில சந்தர்ப்பங்களிலே "தெய்வம் விடை கொடுத்தாலும் பூசாரி விடைகொடுக்கார்" என்ற மாதிரியாகச் சில காரியங்கள் நடந்துவிடுகின்றன. அரசாங்கம் அதைச் செய்ய விரும்பிச் செய்ய முற்பட்டாலும் தடைக்கல்லாக இருக்கின்றார்கள் முந்திய அரசாங்கத்திலே பழக்கப்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ஜீ. அம்பிட்டிலிங்கம் மயா.]
பட்ட உத்தியோகத்தர்கள் சிலர். அவ்வுத்தியோகத்தர்கள் அதனைத் தடுத்துக் கொண்டு வருவதாக நாம் அறிகின்றோம். ஒவ்வொரு இலாகாவிலும் இந்த விதமான தடைகள் இருக்கின்றன. அவற்றை நீக்குவதற்கு முந்திய அரசாங்கமாக இருந்தால் அத்தகைய உத்தியோகத்தர்களுடைய தன்மானத்திற்கோ அவர்களுடைய சேவைக்கோ மதிப்புக் கொடுக்காமல் அவர்களை உதைத்துத் தள்ளி இருக்கும். எங்கள் பிரதமர் அவர்கள் எல்லாவற்றையும் முறையாக, நீதியாகச் சரிவரச் செய்ய வேண்டுமென்று எண்ணி சில சந்தர்ப்பங்களில் முட்டுக்கட்டையாக இருப்பவர்களைக்கூடச் சேவையில் விட்டு வைத்துக் கொண்டு இருக்கிறார்கள். அதனால் சில அபிவிருத்தித் திட்டங்கள் தடைப்பட்டுக் கொண்டு இருக்கின்றன. ஆனால் அவை நிட்சயமாக நிறைவேற்றப்படுமென்றே நான் நம்புகிறேன்.

ஆனையிறவில் இன்னொரு பெரிய உப்புத் தொழிற்சாலைக்கு கௌரவ கைத்தொழில் அமைச்சர் ஒரு திட்டத்தைத் தயாரித்து இருக்கிறார். இந்த அரசாங்கம் அதற்குத் திட்டமிட்டிருக்கின்றது என்பதை எனது நண்பர் கௌரவ ஊர்காவற்றுறைப் பிரதிநிதி நன்கு அறிவார். இப்படியாக இன்னும் எத்தனையோ நாங்கள் செய்யவேண்டும். அப்படிச் செய்வதற்கு வழி தேட வேண்டும்.

கௌரவ உள்ளூராட்சி அமைச்சர் திரு. எம். திருச்செல்வம் இச்சபையில் இல்லாத காரணத்தினால் அவர்மீது கௌரவ ஊர்காவற்றுறைப் பிரதிநிதி விடுத்த தாக்குதல்களுக்கு நான் இங்கு பதில் அளிக்க வேண்டியவனாக இருக்கிறேன். கௌரவ ஊர்காவற்றுறைப் பிரதிநிதி தாம் கடந்த இருபது வருடமாகச் சொல்லி வந்த அத்தனையையும் ஒரே கவளமாக விழுங்கி விட்டு கௌரவ யாழ்ப்பாணத் தொகுதிப் பாராளுமன்ற அங்கத்தவர் (திரு. ஜீ. ஜீ. பொன்னம்பலம்) அவர்களுக்கு நட்சாட்சிப் பத்திரம் கொடுக்க வந்துள்ள முடிபு அவரது குட்டிக் கரணம் எவ்வளவு தூரம் போய் விட்டது. அவர் எவ்வளவு தூரம் குட்டிக் கரணவீரராக மாறிவிட்டார் என்பதை நாம் மிக வேதனையோடு கவனிக்க வேண்டிய நிலையை இன்று ஏற்படுத்தி இருக்கின்றது. காங்கேசன் துறைச் சீமெந்துத் தொழிற்சாலை 1947 ஆம் ஆண்டுக்கு முந்திய அரசாங்கத்தினால் உருவாக்கப்பட்டதே அல்லாமல் கௌரவ யாழ்ப்பாணத் தொகுதிப் பாராளுமன்ற அங்கத்தவரால் உருவாக்கப்பட்டதல்ல என்று கௌரவ ஊர்காவற்றுறைப் பிரதிநிதி பல மேடைகளில் சொன்னதை நான் அறிவேன். ஆனால், அப்படித் தாம் அன்று சொன்னதை இன்று விழுங்கி ஏப்பம் விட்டுவிட்டு அவர் பேசுகின்ற காட்சியைக் காணும்போது நான் அவரை எனது முன்னைநாள் சகபாடி என்று அழைப்பதற்கு வெட்கப்படுகிறேன். பேசும்பொழுது நேர்மையோடு முன்பு பேசியவைகளைச் சிந்தித்துப் பார்த்துப் பேச வேண்டுமென்று அவரை நான் கேட்டுக் கொள்ள விரும்புகிறேன்.

அவரது பக்கத்தில் இன்றிருக்கும் கௌரவ யட்டியாந்தோட்டைப் பிரதிநிதி (கலாநிதி என். எம். பெரேரா) சென்ற ஆண்டு வரவு செலவுத் திட்ட விவாதத்தில் பேசும்பொழுது கௌரவ உள்ளூராட்சி அமைச்சரைப் பற்றி என்ன சொன்னார்? அதை இன்று நீங்கள் மறந்திருக்க மாட்டீர்கள் கௌரவ உப சபாநாயகர் அவர்களே. டாக்டர் என். எம். பெரேரா தண்ணீர்த் திட்டங்கள் அத்தனையும் வடக்குக் கிழக்கு மாகாணங்களுக்குத்தான் செல்கின்றன என்று அன்று குற்றம் சாட்டினார். இதற்காக நம்பிக்கை இல்லாத் தீர்மானம் ஒன்றைக்கூடக் கொண்டு வந்தார்கள். விடமைப்புத் திட்டங்கள் வடமாகாணத்தில் அச்சுவேலியில் திறவப்பட இருக்கின்றனவே, ஏன் அப்படி என்று அவர் ஒரு கேள்வியைக் கிளப்பினார். இவையெல்லாவற்றையும் மறந்து உள்ளூராட்சி அமைச்சர் என்ன செய்தார் என்று கேட்கிறார் கௌரவ ஊர்காவற்றுறைப் பிரதிநிதி. அவருக்கு ஒருவேளை புங்குடுதீவில் ஒரு தண்ணீர்த் திட்டம் ஆரம்பிக்கப்படவில்லை என்ற மனஸ்தாபம் இருக்கலாம். உங்களுக்குத் தெரியும் உப சபாநாயகர் அவர்களே, உங்களுடைய தொகுதியில் கட்டைவேலி கிராம சபைப்பகுதியில் ஒரு தண்ணீர்த் திட்டம் ஆரம்பிக்கப்பட்டிருக்கின்றது. என்னுடைய தொகுதியில் வட்டுக்கோட்டை கிராம சபைப் பகுதியில் ஒரு தண்ணீர்த் திட்டம் திறக்கப்பட்டிருக்கின்றது. பட்டிருப்புத் தொகுதியில் துறைநீலாவணையில் ஒரு தண்ணீர்த் திட்டம் ஆரம்பிக்கப்பட்டிருக்கின்றது. கல்முனைத் தொகுதியில் நற்பட்டிமுனையில் ஒரு தண்ணீர்த் திட்டம் திறக்கப்பட்டிருக்கின்றது. இன்னும் எத்தனையோ திட்டங்களை ஆரம்பிக்க வேலைகள் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. வடக்கு, கிழக்கு மாகாணங்களி

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ளுள்ள மக்களது கஷ்டங்களை அறியாமல் உள்ளூராட்சி அமைச்சர் அவர்கள் இயங்குகின்றார்கள் என்று ஊர்காவற்றுறைப் பிரதிநிதி நினைத்தால் அவர் ஒருவேளை தன்னுடைய இடத்தில் அவரை வைத்துப் பேசுகின்றாரோ என்னவோ எனக்குத் தெரியாது.

உப சபாநாயகர் அவர்களே, புங்குடுதீவில், அனலைதீவில், காரைநகரில் தண்ணீர்த் திட்டங்களை ஆரம்பிப்பதற்காக எத்தனையோ நிபுணர்களை அனுப்பிப் பரிசீலனைகள் நடைபெறுகின்றன. தண்ணீர்த் திட்டங்களை ஆரம்பிக்க, அதாவது ஒரு இடத்திலிருந்து தண்ணீரை விநியோகிக்க முதலில் ஒரு இடத்தில் தண்ணீர் இருக்க வேண்டும். ஒரு கிணற்றைக் கொண்டு அந்த இடத்தில் போதிய அளவு தண்ணீர் இருக்கின்றதா என்று பரிசீலனை செய்து பார்த்துத்தான் தண்ணீர்த் திட்டங்களை ஆரம்பிக்க முடியும். அப்படியான பரிசீலனைகள் போதிய அளவு பலனைக் கொடுக்காமல் இருக்கலாம். கௌரவ உள்ளூர் ஆட்சி அமைச்சர் சில திட்டங்களைக் கொண்டு வருவதில் இப்படியான தடைகள் இருக்கின்றனவே அல்லாமல் வேறு ஒன்றும் அல்ல என்பதை கௌரவ ஊர்காவற்றுறை பிரதிநிதி நன்கு அறிந்திருந்தும், அதற்கு மாறாகப் பேசுவதுதான் சரியற்றதாகும். குற்றம் சாட்டினால் சாட்டலாம். நாம் ஒன்றும் செய்யவில்லையென்று சொல்லலாம். ஆனால், வேண்டுமென்றே உண்மையை மறைத்துக் குற்றச்சாட்டுக்களைக் கொண்டு வருவதை இனிமேலாவது தவிர்க்க வேண்டுமென்று நான் கௌரவ ஊர்காவற்றுறைப் பிரதிநிதி அவர்களைக் கேட்டுக் கொள்கிறேன்.

அவர் இன்னும் ஒரு விடயத்தைப் பற்றிக் குறிப்பிட்டார். அரசாங்கத்தின் திட்டங்கள் சரிவர நடைபெறுவதற்கு திருப்தியான அரசாங்க சேவை தேவை. அரசாங்க ஊழியரைப் பொறுத்தவரையில், அரசாங்க சேவையில் திருப்தியற்ற நிலையிலே பலர் இருந்துகொண்டிருக்கிறார்கள் என்பதை நாமறிவோம். முந்திய அரசாங்கம் பல ஆயிரக்கணக்கானோரை அதே நிலையில்தான் வைத்திருந்தது. சிங்களத்தில் தேர்ச்சி பெறவேண்டுமென்ற எந்தவிதமான நிபந்தனையுமின்றி சேவையில் சேர்ந்த பழைய ஊழியருக்கு கட்டாய வேலை நீக்க உத்தரவைப் பிறப்பித்தது முந்திய அரசாங்கம். ஆனால் 1965 ஆம் ஆண்டு இந்த அரசாங்கம் ஏற்பட்டதன் பின்னர், பழைய அரசாங்க ஊழியர் 55 வயதுவரை எதுவித கெடுபிடியுமின்றி பணி புரியக் கூடிய வாய்ப்பையும் பதவி உயர்வுகளையும் சம்பள உயர்வுகளையும் பெற்றுக் கொடுத்தது இந்த அரசாங்கம் என்பதை ஊர்காவற்றுறைப் பிரதிநிதி அவர்கள் மனச்சாட்சியோடு ஒப்புக்கொள்ள வேண்டும். அதற்கு மேலும், அதாவது 55 வயதுக்கு மேலும் அவர்கள் சேவையில் தொடர்ந்திருக்க வேண்டுமென்று நாம் விரும்பினோம். அது பற்றி அரசாங்கத்துடன் பேசினோம். ஆனால், பல்வேறு காரணங்களுக்காக அதனைச் செய்ய மறுத்தார்கள்.

அடுத்ததாக அவர் புதிய அரசாங்க ஊழியரைப் பற்றிக் குறிப்பிட்டார். எங்களுடைய நிலையை இந்தச் சந்தர்ப்பத்தில் நான் தெளிவாகக் குறிப்பிட விரும்புகிறேன். இப்பொழுது கூட எதிர்க்கட்சி அங்கத்தவர்கள் சிலர் கூறித் திரிகின்றார்கள், புதிய ஊழியர்கள் சிங்களம் படிப்பதை நாங்கள் எதிர்க்கிறோம் என்று. அது தவறு. அரசாங்கம், அரசாங்க ஊழியரைப்பற்றி எடுத்த 1965 ஆம் ஆண்டு தேசிய முடிக்குப் பின்னர் புதிய ஊழியர் சிங்களம் படிக்க வேண்டுமென்ற கொள்கையை நாம் ஏற்றுக் கொண்டோம். கனம் ஊர்காவற்றுறைப் பிரதிநிதி அவர்கள் கூட இந்தப் பக்கத்திலிருக்கும்போது அதனை ஏற்றுக்கொண்டார்.

**වි. නවරත්නම් මයා.**
(திரு. வி. நவரத்னம்)
**(Mr. V. Navaratnam)**

நான் ஒரு காலமும் ஏற்றுக்கொள்ளவில்லை.

**අමිර්තලිංගම් මයා.**
**(Mr. Amirthalingam)**
(திரு. அமிர்தலிங்கம்)

அப்படியானால் இந்த மூன்றரை வருடகாலமாக நீங்கள் ஏதோ கனவுலகில் சஞ்சரித்திருக்க வேண்டும். இந்த உலகத்தில் இருந்திருந்தால் நீங்கள் இதை நன்றாக அறிந்திருப்பீர்கள். 1967 ஆம் ஆண்டு அமைச்சரவை முடிவை நாம் ஏற்றுக்கொண்டோமா, இல்லையா? அப்படி ஏற்றுக்கொண்டால் கௌரவ ஊர்காவற்றுறைப் பிரதிநிதியும் சேர்ந்துதான் அதை ஏற்றுக்கொண்டார். அப்படி அமைச்சரவை முடிவை ஏற்றுக்கொண்டால், புதிய ஊழியர் சிங்களம் படிக்க வேண்டுமென்பதை அவரும் ஏற்றுக்கொண்டார். அதனை ஏற்றுக்கொள்ளாவிட்டால் அந்த நேரம் அவர் அந்தப் பக்கம் போயிருக்க

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමිර්තලිංගම් මයා.]

வேண்டும். அவருக்கு ஞானம் உதிக்க மூன்றரை வருடகாலம் சென்றதென்றால் அவரது மூளை அபாரமானதாகத்தான் இருக்க வேண்டும். அவரும் அப்போது அதை ஏற்றுக் கொண்டுவிட்டு இப்பொழுது மற்றப் பக்கத்திற்குப் போய்க் கல் எறிவது ஒரு கண்ணியமற்ற செயல் என்பதைத்தான் சுட்டிக் காட்ட விரும்புகிறேன். இப்பொழுது பேசுவது சுலபம். எதையும் பொறுப்பற்ற முறையில் சொல்லலாம். நாட்டைப் பிரிக்க வேண்டுமென்று சொல்லலாம். பிரிக்க வேண்டுமென்று சொல்லும் நேரத்தில் கூட, சட்டத்திலிருந்து தப்புவதற்கு மகாராணியைக் கொண்டு வந்து அவருக்குக் கீழேதான் பிரித்து இரண்டு "டொமினியன்" களை ஆக்க வேண்டுமென்று பேசிக் கொண்டிருப்பது கெட்டித்தனம் அல்ல. அது பழைய பாடம். முன்னாள் வவுனியா அங்கத்தவராக இருந்த திருவாளர் சுந்தரலிங்கம் அவர்கள் சொல்லிக் கொடுத்த பாடத்தை இன்றைக்கு கௌரவ ஊர்காவற்றுறை பிரதிநிதி ஒப்புவித்துக் கொண்டிருக்கிறார்.

நாங்கள், தமிழ்ப் பேசும் மக்கள், இந்த நாட்டிலே கண்ணியத்தோடும் மானத்தோடும் வாழவேண்டும். எந்த விதத்திலும் இரண்டாந்தரப் பிரஜைகளாக வாழ நாம் ஆயத்தமாக இல்லை. ஆனால், அதே நேரத்தில் நாம் இந்த நாட்டில் வதியும் மற்ற இனத்தவரோடு ஒத்து வாழ வேண்டும். அந்த அடிப்படையில்தான், கௌரவ ஊர்காவற்றுறைப் பிரதிநிதியும் சேர்ந்து எமது கட்சிக் கொள்கையை உருவாக்கும் நேரத்தில், ஒரு சமஷ்டி அமைப்பின் கீழ் நாம் வாழவேண்டுமென்று கூறினோம். இருபது வருடங்களாகத் திட்டவட்டமாக அதனை நாம் கூறி வந்துள்ளோம். அவர் இன்று அத்தனையும் மறந்து பேசுவது அர்த்தமற்றது.

புதிய அரசாங்க ஊழியர்கள் மூன்றாண்டு காலத்தில் சிங்களத்தில் சேர்ச்சி பெறவேண்டுமென்ற நிபந்தனையில் சேர்ந்தவர்கள். அவர்களைச் சிங்களம் படிக்க வேண்டாம் என்று நாம் சொன்னோம். நான் இதைப் பகிரங்கமாக ஒப்புக் கொள்கிறேன். தவறாக எதையாவது சொல்லியிருந்தால் அதை வைத்துக்கொண்டு-

**වී. නවරත්නම් මයා.**
**(Mr. V. Navaratnam)**
*(திரு. வீ. நவரத்னம்)*

அப்படியிருந்தால் நல்லூர்ப் பிரதிநிதி அவர்கள் இராஜனாமாச் செய்ய வேண்டும்.

**අමිර්තලිංගම් මයා.**
*(திரு. அமிர்தலிங்கம்)*
**(Mr. Amirthalingam)**

ஏன் அவர் இராஜினாமாச் செய்யவேண்டும்? நீங்கள் இராஜினாமாச் செய்யுங்கள் முதல். கொடுத்த வாக்குறுதியை மீறி அந்தப் பக்கத்தில் போயிருந்துகொண்டு கொக்கரிக்கின்ற நீங்கள் முதல் இராஜினாமாச் செய்துவிட்டு, ஊர்காவற்றுறையில் போய் நின்று தனித் தமிழ் நாட்டைப் பற்றிப் பேசிப் பாருங்கள். ஊர்காவற்றுறை மக்கள் உங்களுக்கு நல்ல பாடம் படிப்பிப்பார்கள். சமஷ்டிக் கொள்கையில் வந்து இந்தச் சபையில் இருந்துகொண்டு தனித் தமிழ் நாட்டைப் பற்றிப் பேசும் நீங்கள் இராஜினாமாச் செய்ய வேண்டுமா, அல்லது அதே கொள்கையில் நிற்கும் நாங்கள் இராஜினாமாச் செய்ய வேண்டுமா?

சிங்களம் படிக்க வேண்டாம் என்று புதிய ஊழியர்களைச் சொன்னோம். அவர்கள் படியாமல் விட்டார்கள். அதனால் சம்பள உயர்வு, பதவி உயர்வு கிடைக்காமல் கஷ்டப்பட்டார்கள். 1965 ஆம் ஆண்டுக்குப் பின் அவர்களுக்கு மீண்டும் மூன்று வருடங்கள் கொடுக்கக் கூடியதாக 701 ஆம் இலக்க திறைசேரி சுற்றறிக்கை ஆக்கப்பட்டது. இவற்றைப் பற்றியெல்லாம் இப்பொழுது விரிவாகப் பேசிக் கொண்டிருக்க வேண்டிய தேவை இல்லை. பழைய அரசாங்கம் ஏற்படுத்திய பல கெடுபிடிகள் அவர்களுக்கு இல்லாமல் பதவி உயர்வுப் பரீட்சையை அவர்கள் தமது சொந்த மொழியிலேயே எழுதக் கூடியதாகவும், அவர்களில் சிலருக்கு குறைந்த தரத்தில் சிங்களப் பரீட்சை எடுக்கக் கூடியதாகவும் திறைசேரிச் சுற்றறிக்கைகளை அரசாங்கம் ஆக்கியது. ஆனால், நான் முன்னர் கூறியது போல "தெய்வம் விடை கொடுத்தும் பூசாரி விடை கொடுக்க வில்லை" என்ற மாதிரி, முந்திய அரசாங்கம் எஸ். எஸ். சி. தரத்தில் சித்தியடைய வேண்டும் என்று விதித்திருந்ததை இந்த அரசாங்கம் எட்டாம் தரத்தில் சித்தியடைந்தால் போதும் என்று மாற்றிய பின்னரும், பரீட்சை வைக்கும் உத்தியோகத்தர்கள் சிலர் சேர்ந்து எஸ். எஸ். சி. தரத்திலும் பார்க்க எட்டாவது தரத்தினுடைய தரத்தை உயர்த்தி அதனால் இந்த அரசாங்கம் கொடுத்ததைக் கூடக் கெடுத்து விட்டார்கள் என்று கூற வேண்டியவனாக இருக்கிறேன்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*1962 ஆம் ஆண்டின் எஸ். எஸ். சி. பரீட்சையின் தரத்தையும் இப்பொழுது எட்டாவது தரத்தினுடைய* — Grade III — *தரத்தையும் நான் கௌரவ நிதி அமைச்சர் அவர்களுடைய கவனத்துக்குக் கொண்டுவந்திருக்கிறேன். இது உத்தியோகத்தர்கள் சிலர் செய்யும் சதி. இந்த அரசாங்கத்தையும் எம்மையும் பிரிக்கச் சூழ்ச்சி செய்யும் சதிகாரக் கும்பல்கள் இத்தகைய உத்தியோகத்தில்தான் இருக்கிறார்கள் என்பதை நாம் அறிவோம். முன்னைய அரசாங்கத்தால் பொறுப்பு வாய்ந்த பதவிகளில் அமர்த்தப்பட்டவர்கள் இன்றும் இருந்துகொண்டு இன்னல்களை ஏற்படுத்திக் கொண்டிருக்கிறார்கள். இந்த நாட்டிலே நாம் இரண்டாம் தரப் பிரஜைகளாக எந்த நாளும் வாழச் சம்மதிக்க மாட்டோம். நாம் கண்ணியத்தோடு, கௌரவத்தோடு எமது இனத்தை வாழ வைப்போம் என்ற நம்பிக்கையில் தான் நாங்கள் இன்றும் இந்த அரசாங்கத்தில் இருக்கிறோம் என்பதை கௌரவ ஊர்காவற்றுறை பிரதிநிதி அறிந்துகொள்ள வேண்டும்.*

*உப சபாநாயகரவர்களே, இப்பொழுது எங்களுக்கு உபதேசம் செய்ய பலர் முன்வந்திருக்கிறார்கள். நாம் இன்ன கொள்கையை வைத்துக்கொள்ள வேண்டும், இன்ன கொள்கையை விட்டுவிட வேண்டும் என்று இந்தச் சபையிலே பல்வேறு கட்சியைச் சேர்ந்த பல்வேறு அங்கத்தவர்கள் கூறுகிறார்கள். அவர்கள் எவரும் எங்களுக்கு எசமானர்கள் அல்ல. அவர்கள் அரசாங்கக் கட்சியைச் சேர்ந்தவர்களாக இருந்தாலென்ன, எதிர்க் கட்சியில் உள்ளவர்களாக இருந்தாலென்ன அல்லது இந்தச் சபைக்கு வெளியே இருப்பவர்களாக இருந்தாலென்ன, அவர்கள் எமக்கு எசமானர்கள் அல்லர். "நாம் யார்க்கும் குடியல்லோம்." நாம் எவர்க்கும் அடிமைகள் அல்ல. இந்த நாட்டில் எமக்கும் ஒரு கொள்கை உண்டு. அந்தக் கொள்கையை ஏற்க எமது மக்கள் இருக்கிறார்கள். அவர்களுக்குப் பதில் சொல்ல நாங்கள் கடமைப்பட்டவர்களே தவிர வேறு யாருக்கும் பதில் சொல்ல மாட்டோம். அந்தத் துறையில் நின்றுகொண்டு, இந்த நாட்டின் நலனுக்காக, எங்கள் பிரதமர் அவர்களும் இந்த அரசாங்கமும் எடுக்கும் முயற்சிகளுக்கு உதவியாக நின்று எமது இனத்தினுடைய உரிமையையும் பேணி, நாட்டின் நலனையும் காத்து நடப்பதுதான் எமது குறிக்கோள் என்று கூறி, இத்தனையையும் கூறுவதற்கு எனக்கு வாய்ப்பு அளித்தமைக்காக நன்றி தெரிவித்து என்னுடைய பேச்சை முடித்துக் கொள்கிறேன்.*

අ. භා. 5.37

**ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ අවාසනාවකට වගේ දෙවතාවක්ම මට කථා කරන්නට ලැබුණේ වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමාගේ (ඒ අමිර්තලිංගම් මයා.) කථාවෙන් පසුවයි. එමෙන්ම වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමාට දෙවතාවක්ම කථා කරනන්ට ලැබුණේ කයිට්ස්හි ගරු මන්ත්‍රීතුමාගේ (වී. නවරත්නම් මයා.) කථාවෙන් පසුවයි. මෙය මොන විධියේ කරුමයක් පලදීමක්ද කියා මට නම් හිතන්නට බැහැ. එහෙත් එය අප විසින් ඉදිරිපත් කළ නාමලේඛනය අනුව සිදු වීමක් නිසා කර්මඵලයක් නිසා සිදු වන්නක් යයි සිතන්නට පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමාට විශාල මෙහෙයක් ඉටු කරන්නට සිදුවී තිබෙනවා. එක මෙහෙයක් නම් තමන්ගේ ආණ්ඩුව ආරක්ෂා කරගැනීමයි. තවත් මෙහෙයක් නම් තමන්ගේ හිටපු මිත්‍රයෙක් කයිට්ස්හි ගරු මන්ත්‍රීතුමාට පහරට පහර ගැසීමයි තවත් මෙහෙයක් නම් තම ඡන්ද කොට්ඨාශයේ ජනතාවට—ද්‍රවිඩ ජනතාවට—තමන් තව දුරටත් මේ ආණ්ඩුව හා අත්වැල් බැඳගෙන ඉන්නේ ඇයි කියන එක පහදා දීමයි. ඔය මෙහෙයන් නැත්නම් කරුණු තුනටම වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් වී සිටිනවා. තවත් කරුණක් තිබෙනවා. ඒ කරුණ නම් විරුද්ධ පාර්ශ්වයට පහර ගැසීමයි. මෙන්න මේ විධියේ ඉතා අමාරු වූ කම්බියේ ගමනකට පා තබන්නට වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමාට කීප අවස්ථාවකදීම සිදු වුණා. එතුමාත් කයිට්ස්හි ගරු මන්ත්‍රීතුමාත් අතර තිබෙනවාද භේදවලට සහභාගී වන්නට අපට බැහැ. ඒ දෙගොල්ලම අන්ත ජාතිවාදී කොටස් වශයෙන් මේ ගරු සභාව තුළදීත් රට තුළදීත් හැසිරෙන නිසා ප්‍රතිපත්ති වශයෙන් අපි ඒ දෙගොල්ලම එක වගේ හෙළා දකිනවා. වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමා සභා



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංරත්න මයා.]

වෙන් පිටව යැම ගැන කණගාටුයි. තව ටිකක් ඉන්නවා නම් හොඳයි. කථාවක් කළාඩින් පසු සභාවෙන් පිට වී යැම සම හර මන්ත්‍රීවරුන් සිරිතක් වශයෙන් කර නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික සමගිය ඇති වුණේ 1965ට පසු වයි, ඊට කලින් තිබුණු ආණ්ඩුව ජාතික අසමගිය ඇති කිරීමට නොයෙකුත් දේ කළාය කියා වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමා කිව්වා. එහෙත් වර්තමාන ගරු කර්මාන්ත ඇමතිතුමා විවාදයට සහ භාගි වෙමින් වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමා ගැන කරන්නට යෙදුණු විවේචනයක් එතුමාට මතක නැතත් මට මත කයි. වර්තමාන ගරු කර්මාන්ත ඇමතිතුමා එදා කීවේ කුමක්ද? වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමාගේ ෆෙඩරල් වාදය, ෆෙඩරල් පක්ෂයේ නායකයාගේ ෆෙඩරල් වාදයට වඩා වෙනස්ය, වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් නිතරම මතක් වන්නේ අමෙරිකා හඬයි, ගාන්ධිවාදියකු වශයෙන් ෆෙඩරල් පක්ෂයේ නායකයා කථා කරන නමුත් දරුණු රණකාමියකු වශයෙන් වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමා කථා කරන වාය කියන එකයි එතුමා ඒ කාලයේ කිව්වේ. මා හිතන අන්දමට ගරු කර්මාන්ත ඇමතිතුමා තවමත් ඒ අදහස් වෙනස් කරගෙන නැහැ. එහෙත් එක පක්ෂයේ සිටින නිසා කියන්නට විධියක් නැහැ. එහෙත් 1965ට කලින් තිබුණු ආණ්ඩුව—විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව—ජාතිභේද වාදය අවිස්සුවාය කියා නිරතම අපටයි චෝදනා කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අර රහස් ගිවිසුමකට තවත් කොන්දේසියක් තිබුණාය කියා කයිට්ස්හි ගරු මන්ත්‍රීතුමා විසින් කියන්නට යෙදුණා. අද එයත් එළි වුණා. කලින් අප දැනගෙන සිටියේ කොන්දේසි 4යි කියලයි. ගරු අගමැතිතුමා අවසර දෙනවා නම් 5 වැනි කොන්දේසියත් සභාවට කියන්නට කැමති බව කයිට්ස්හි ගරු මන්ත්‍රීතුමා කිව්වා. කලින් දැනගෙන හිටියේ කොන්දේසි 4 යි. දැන් බලන විට කොන්දේසි 5 ක් තිබෙනවා. 5 වැනි කොන්දේසිය නම්, ද්‍රවිඩ රජයේ සේවකයන් සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබා ගැනීමට වුවමනාවක් නැත කියන එකයි. මේ රහස් ගිවිසුමේ කොන්දේසි 4 ක්ම දැන් ක්‍රියාත්මක වී තිබෙනවා. කයිට්ස් ගරු මන්ත්‍රීතුමා තව කීයක් ලියාගෙන තව කීයක් ඉදිරිපත් කරන්න හිතාගෙන ඉන්නවාද දන්නෙ නැහැ. දැනට කොන්දේසි 5යි. පළමුවෙනි කොන්දේසිය : සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කරනවා වාගේම දෙමළ භාෂාවටත් උතුරු සහ නැගෙනහිර පළාත්වල පරිපාලන තත්ත්වය දීමයි. දෙවැන්න : එහි උසාවි භාෂාව දෙමළ භාෂාව කිරීමයි. තුන්වැන්න : රට සභා පිහිටුවීමයි. සිව්වැන්න : උතුරු හා නැගෙනහිර පළාත්වල ඉඩම් ප්‍රශ්නයයි. පස්වැන්න : ද්‍රවිඩ රජයේ සේවකයන්ට සිංහල ප්‍රවීණතාව ලබා ගැනීමට බල නොකිරීමය. ඔය විධියට ඒ රහස් ගිවිසුමේ කොන්දේසි 5ක් තිබෙනවාලු. මෙහෙමත් කළාට පසුව වඩ්ඩුකොඩ්ඩෙයි ගරු මන්ත්‍රීතුමා (ඒ. අමිර්තලිංගම් මයා.) කියනවා, කලින් තිබුණ ආණ්ඩුව නොහොත්—ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තමයි ජාතිභේදවාදය ඇවිස්සුවේ කියා.

මා කනගාටු වෙනවා, නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අගමැතිතුමා මෙහි නොසිටීම ගැන. පසු ගිය දා රාජාසන කථා විවාදයේදී මා සඳහන් කළා ගරු ආහාර ඇමතිතුමා විසින් කලින් කරන ලද ප්‍රකාශයක් ගැන. මොකක්ද එතුමා කළ ප්‍රකාශය? බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම ගැන කථා කරමින් එවකට මතුරට ගරු මන්ත්‍රීතුමා වශයෙන් විරුද්ධ පක්ෂයේ සිටි වර්තමාන ආහාර ඇමතිතුමා කියා තිබෙනවා, ඒ ප්‍රශ්නය එතැනින්ම හමාර වෙනවා නම් අපි බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුමට විරුද්ධ වන්නේ නැත, නමුත් සිද්ධ වන්නේ අද ටිකක් ඉල්ලාගෙන ඊට පසු තවත් නොයෙක් නොයෙක් දේ නැවතත් ඔවුන් ඉල්ලන්න පටන් ගැනීමය කියා.

එදා ආහාර ඇමතිතුමා කළ ප්‍රකාශය මම හැන්සාඩ් වාර්තාවෙන්ම කියවන්නම්. ඒ මක්නිසාද? මා එදා ඒ කාරණය සඳහන් කළ වෙලාවේ ගරු අගමැතිතුමා අභියෝග කළා එවැනි ප්‍රකාශයක් කවදාවත් කෙළේ නැත. එසේ කර තිබෙනවා නම් කරුණාකර පෙන්වන්නය කියා. 1958 ජූනි මාසෙ 5 වෙනිදා හැන්සාඩ්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාර්තාවේ 191 වෙනි තීරයේ මෙසේ සඳහන් වෙනවා. මෙය හදිසි නීතිය පිළිබඳව විවාද කරන අවස්ථාවයි :

"Mr. Banda : If he reveals the truth probably the Hon. Prime Minister will not be so misled as he is now. I thought his position would be that in the Cabinet he would give some able guidance to the Hon. Prime Minister."—

I am sorry the Federal Party member is going out. I wish he would wait and listen. This is very interesting.

**ගරු මන්ත්‍රිවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

They are going for tea.

**සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.** (අත්තනගල්ල)
*(திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டாரநாயக்க—அத்தனகல்ல)*
(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)

They are not going for tea, they have had coffee.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

—"I say that the seeds of destruction of the Bandaranaike-Chelvanayakam Pact were within itself. Why ? I gave so many reasons. I will give you the final and conclusive reason. The members of the Federal Party did not give up their four demands although they accepted a temporary agreement. It was only a temporary adjustment. Even if the Hon. Prime Minister was able to implement the first step of that agreement the Federal Party members were not giving up their fight for the other steps.

What is the position ? To come to an agreement in a situation like this the Federal Party must accept the condition that that agreement is a final basis. Suppose the Government implemented that. Then again another crisis would have occurred when the Federal Party wanted to implement the rest of their proposals. You cannot avoid it. With the best will in the world the Hon. Prime Minister or the Federal Party could not avoid a situation where there would be a head-on collision again. You could not have avoided that. Owing to all that you will find that the present situation has arisen.

I will not continue my speech further but would refer to certain news paragraphs to show the attitude of the Government Members themselves towards the Bandaranaike-Chelvanayakam Pact." [OFFICIAL REPORT, 5th June 1958 ; Vol. 31, cc. 191-2.]

ඒ අවස්ථාවේදී ෆෙඩරල් ක්‍රමය ගැනත්, රට සභා ගැනත්, බණ්ඩාරනායක—චෙල්වනායගම් ගිවිසුම ගැනත් එක්සත් ජාතික පක්‍ෂය දැක්වූ අදහස් එහෙමයි. මා කියන්නට යෙදුණේ අන්න ඒකයි. "අප මේකට විරුද්ධයි, රට සභා ක්‍රමයට විරුද්ධයි, ඒ වාගේම අනික් කොන්දේසිවලටත් විරුද්ධයි, හැබැයි, යම් විධියකින් මෙයින් ඒ අයගේ ෆෙඩරල් වාදී අදහස්, භාෂාවට සම තැන ඉල්ලීමාදී අදහස් අමතක වෙනවා නම් අප සතුටුයි" යන අදහස් තමයි එදා එක්සත් ජාතික පක්‍ෂය දැරුවේ. එක්සත් ජාතික පක්‍ෂය එදා මෙවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කළ බව වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමාට මා මතක් කර දෙන්නට සතුටුයි. මෙවැනි අදහස් දරමින් එක්සත් ජාතික පක්‍ෂය තමයි ඒ කාලයේදී නොයෙකුත් විධියේ ජාතිභේදවාදී ඝට්ටන ඇති කළේ. පදවියේ, ත්‍රිකුණාමලේ ඝට්ටන ඇති කළා. මහනුවර රට පයින් ගමන් කරමින් ඝට්ටන ඇති කළා. එවකට සිටි ගරු අගමැතිතුමාට රහස් ගිවිසුමක් ඇති කරගෙන ආණ්ඩුව පවත්වාගෙන යන්නට වුවමනාවක් තිබුණේ නැහැ. එතුමාට ඕනෑ තරම් බලය තිබුණා. ඕනෑ තරම් ඡන්ද තිබුණා. නමුත් පළල් දේශපාලනඥයකු වශයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂයේ නැත්නම් මහජන එක්සත් පෙරමුණේ ඡන්ද ප්‍රකාශනය අනුව සිංහල භාෂාවට රාජ්‍ය භාෂාව හැටියට තැනදී දෙමළ භාෂාවට සාධාරණ තැනක් දීම එතුමා ප්‍රතිපත්තියක් හැටියට සැලකුවා. ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී තමයි දෙමළ අයට දෙනවා වැඩිය, සිංහල අයට මදිය කියා එක්සත් ජාතික පක්‍ෂය කියන්නට යෙදුණේ. එසේ කියමින් එක්සත් ජාතික පක්ෂය තමයි එදා පදවියේ ඝට්ටන ඇති කළේ ; මහනුවරට පයින් ගියේ. 1958 දී එක්සත් ජාතික පක්‍ෂයේ උදවිය තමයි ඒ ආකාරයට ජාතිභේදවාදී ඝට්ටන ඇති කළේ. ඒකට ෆෙඩරල් පක්‍ෂයත් හවුල්කරුවන් වෙනවා, ජාතිභේදවාදය උඩ පක්‍ෂයක් පිහිටුවා ගත් නිසා. ඒක අමතක කරන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

නට බැහැ. ඒ අය පමණක් නොවෙයි, තමුන්නාන්සේලා සමග ආණ්ඩුවක් පිහිටුවන්නට අත්වැල් බැඳගත් රාජරත්න යුවළත් ඒකට හවුල්කරුවන් වෙනවා. එවැනි තත්ත්වයක් තිබියදී තමයි වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමා විලි ලජ්ජා නැතිව අපට ඇඟිල්ල දික් කර ජාතිභේද වාදීන් සමග අපේ කිසිම සම්බන්ධකමක් නැත කියා කියන්නෙ. මේක මහ පුදුම තත්ත්වයක්ය කියා කෙනෙකු කල්පනා කරන්නට පුළුවනි. මගේ දේශපාලන දර්ශනයේ හැටියට නම් එහි පුදුම වෙන්නට කාරණයක් නැහැ. දේශපාලන වශයෙන් එකිනෙකා අතර මොන තරම් පරතරයක් තිබුණත් මේ අයට වුවමනා කරන්නේ ධනපති ක්‍රමයත් අධිරාජ්‍යවාදී ක්‍රමයත් ආරක්ෂා කර ගැනීමයි ; ගසා කෑමේ අයිතිවාසිකම ආරක්ෂා කර ගැනීමයි. වයස වැඩි වුණාම ඇමති කෙනෙකු වී මැරෙන්නට ඕනෑය කියා කල්පනා කරන උදවියත් මේවාට සම්බන්ධ වෙනවා. එනැතින් නොනැවතී ඒකට දේශපාලන දර්ශන පවා ඉදිරිපත් කරනවා. ධනවාදයත් සමාජවාදයත් අත්වැල් බැඳගෙන ගෙන යන්නට ඕනෑලු. ඒකලු අළුත් ප්‍රතිපත්තිය. ඇමරිකාවත් රුසියාවත් දෙකම ඇදාගෙන යන්නටය කියා කවුදෝ ඔබ්සර්වර් පත්‍රයේ ලියා තිබුණාලු. ඒකලු කර්මාන්ත ඇමතිතුමාත් කරන්නෙ. අපටත් ඒක කරන්නටයි එතුමා දැන් අවවාද දෙනවා. ධනපති ක්‍රමයත් සමාජවාදී ක්‍රමයත් කසාද බන්බන්දවා ගෙන යන්නලු. ඔවැනි වැදි බණ මතක් වන්නේ, අර මුල්කිරිගල ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන්, තමන්ගේ හෙලුව වසා ගන්නටයි. වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමාත් අද කථා කරන්නේ ඒ විධියටයි. එතුමා කථා කළේ කයිට්ස්හි ගරු මන්ත්‍රීතුමාට (නවරත්නම් මයා.) නොවෙයි. එතුමා කථා කළේ ඡන්දදායකයන්ටයි ; රටටයි. අප කථා කරන්නේ එහෙමයි. රහස් ගිවිසුම කඩාකප්පල් වෙද්දීත් එක්සත් ජාතික පක්ෂය සමග අත්වැල් බැඳගෙන සිටින්නේ මක්නිසාද කියන එක රටට තෝරා දීමටයි එතුමා කථා කළේ. නමුත් මේ රටේ සාමාන්‍ය ද්‍රවිඩ සහෝදරයින් ඔය වචන පිළිගනීවිය කියා මා සිතන්නේ නැහැ. සාමාන්‍ය ද්‍රවිඩ සහෝදරවරුන්ට වුවමනා

සිංහලය දෙමළය කියා භේදයක් නැතිව, ජාතිභේදයෙන් තොරව, මේ රටේ වැසියන් වශයෙන්, සමානාත්මතාවයකින් යුත් ජීවිතයක් ගත කිරීමටයි. අද මේ ගරු සභාවේ සිටින ෆෙඩරල් පක්ෂයේ නායකයින් තමන්ට තිබෙන වාසි බලාගෙන, පදවි සහ ධන ලෝභයෙන්, මේ එක්සත් ජාතික පක්ෂයත් සමග නැත්නම් හත් හවුලත් සමග අත්වැල් බැඳගෙන ධනපති ක්‍රමයත් අධිරාජ්‍යවාදයත් තහවුරු කරමින් සිටින බව ඒ අය අවබෝධ කර ගෙන අවසානයි. ඒකෙ තියෙන ආදීනව, ඒකෙ තියෙන විපාක අනික් මහා මැතිවරණයේදී උතුරෙන්, නැගෙනහිරෙන්ම ඒ අයට ඔප්පු වෙනවාට කිසි අනුමානයක් නැහැ. වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමා (අමිර්තලිංගම් මයා.) අපට ඇඟිල්ල දික් කර අප ජාති භේද වාදය අවුස්සනවාය කිව්වා. එතුමන්ලාගේ ගෙදරම තිබෙන අවුල් තවම එතුමන්ලාට අහෝසි කර ගන්නට බැරි වී තිබෙනවා. කුල හීනය කියන අයට තවමත් ඒ පළාතේ කෝවිලකට කිට්ටු වන්නට බැහැ. කුල හීනය කියන ඒ අය දෙමළ භාෂාව කථා කරන්නෙ නැද්ද? ගොවිතැන් කරන්නේ නැද්ද? වැඩ කරන්නෙ නැද්ද? වාතය ආශ්‍රහණය කරන්නෙ නැද්ද? ඒ අයගේ දුක ගැන බලන්නෙ නැතිව, තමන්ගේ ගෙදර දොරේ සාමය ඇති කර ගන්නෙ නැතිව, අනුන්ට දොස් කියන්නෙ ඇයි?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා ඉතාමත්ම පැහැදිළියි, ෆෙඩරල් පක්ෂයට වුවමනා කරන්නේ තමන්ගේ භාෂාව ආරක්ෂා කර ගන්නටවත්, තමන්ගේ ජාතියට රැකවරණ ලබා ගැනීමටවත් නොව එක්සත් ජාතික පක්ෂයේ ඥතීන් සමග අධිරාජ්‍යවාදීන්ගේ අතකොළු වී ගසාකෑමේ පියවර ඉදිරියටත් ගෙන යාම පමණක් බව.

ලඟදී ජාති භේද වාදය අවුස්සා රටසභා පනතට විරුද්ධව විශාල ඝෝෂාවක් ඇති කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, වාමාංශික පක්ෂ දෙකත්ය කියා වඩ්ඩුකොඩෙයිහි ගරු මන්ත්‍රීතුමා විසින් කියන් [illegible]ණා. බස්නායක උන්නැහෙත්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මඩිහේ පඤ්ඤාසීහ නායක හාමුදුරුවොත් මල්වත්තේ මහානායක හාමුදුරුවොත් රටසභා පනතට විරුද්ධව ඇති කල උද්ඝෝෂණය ගැන ඒ මන්ත්‍රීතුමාට මතක නැද්ද? ඒ උදවිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයද? සමසමාජ පක්ෂයේ අයද? කොමියුනිස්ට් පක්ෂයේ අයද? එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් ගොඩනැංවීමට සියයට සියයක් මහන්සි වී වැඩ කළ ඒ උදවියත් රටසභා පනතට විරුද්ධව අප සමග අත්වැල් බැඳගෙන නැගී සිටියා. එසේ නැගී සිටින්නට ඒ අයව පුරුදු කළේ එක්සත් ජාතික පක්ෂයේ උදවියයි. 1958දී ගරු රාජ්‍ය ඇමතිතුමාගේ අනුගාමිකයන් කොටසක් 'අප සිංහල' කියා කණ්ඩායමක් ඇති කරගෙන ද්‍රවිඩ කෝලාහල ඇති කළ හැටි වඩ්ඩුකොඩෙයිහි මන්ත්‍රීතුමාට මතක් කරන්නට කැමතියි. කයිට්ස්හි මන්ත්‍රීතුමාට (වී. නවරත්නම් මයා.) හෝ අපට හෝ පහර දෙන ලීලාවෙන් කථා කළාට තමන්ගේ ජනතාව රවටන්නට බැරි බව මා ඒ මන්ත්‍රීතුමාට මතක් කරන්නට කැමතියි. වඩ්ඩුකොඩෙයිහි මන්ත්‍රීතුමා ගැන මා කියන්නේ එපමණයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප කාලයක් තිස්සේ අය වැය විවාදවලට සහභාගි වී තිබෙනවා. ඇතැම් විට මේ සභාවට පත් වී එන්නට පෙර මහජන ගැලරියේ සිට අය වැය විවාද අසා තිබෙනවා. 1947 සිට වරින් වර විරුද්ධ පාර්ශ්වයේත්, ආණ්ඩු පාර්ශ්වයේත් ඉඳගෙන අය වැය විවාදවලට සහභාගි වී තිබෙනවා. එහෙත් කිසිම දවසක මේ වගේ උද්යෝගයක් නැති අය-වැය විවාදයක් අපට කවදාවත් දකින්නට ලැබුණේ නැහැ. අය වැය යෝජනා ඉදිරිපත් කරන දවස ගැන මුළු රටම ඉතා ඕනෑකමින් බලාපොරොත්තුව සිටිනවා. මේ අය වැය ලෙඛනයෙන් අපට ඇති වන සහන මොනවාද, අපට ඇති වන අසහන මොනවාද කියා ජනතාව බලාගෙන ඉන්නවා. ඒ ගැන රටේ තොටේ පත්‍රවලත් නොයෙක් විධියේ අදහස් පළ කරනවා. අය වැය විවාදය බලන්නට ගැලරියට එන්නට අවසර පත්‍ර ඉල්ලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් කරදර කරනවා. එහෙත් මෑතක සිට එහෙම එකක් නැහැ. මොකක්ද ඒකට හේතුව? මේ ආණ්ඩුව කෙරෙහි මහජනතාවගේ විශ්වාසයක් නැහැ. ආණ්ඩු බලයේ රැඳී සිටින්නට මේ ආණ්ඩුවට කිසිම බලයක් නැහැ; අයිතිවාසිකමක් නැහැ. මේක ප්‍රජාතන්ත්‍රවාදීව ගොඩනගා ගත් ආණ්ඩුවක් නොවෙයි. ප්‍රතිපත්තියක් ඉදිරිපත් කර මෙය ක්‍රියාත්මක කරන්නට ඉදිරිපත් වෙනවාය කියා හදා ගත් ආණ්ඩුවක් නොවෙයි, මේක. මේක කුමන්ත්‍රණ බලයෙන් හදා ගත් ආණ්ඩුවක්. එම නිසා මේ ආණ්ඩුව කෙරෙහි මහජනතාව තුළ විශ්වාසයක් නැහැ. හැබැයි, එක විශ්වාසයක් නම් තිබෙනවා. ඒ විශ්වාසය මොකක්ද? ආණ්ඩුව කරන හැම දෙයක්ම දුප්පතුන්ට විරුද්ධ දේවල් නිසා, ජාතිවිරෝධී දේවල් නිසා, එයින් ප්‍රයෝජන ලබන උදවිය හොඳහැටි දන්නවා, ආණ්ඩුව මොනවද කරන්ට යන්නෙ කියා. සිදු වෙන්ට යන්නෙ මොකක්ද කියා ප්‍රයෝජන ලබන උදවිය දන්න නිසා ඒ උදවිය ඉවසිල්ලෙන් සිටිනවා. අනිකුත් සාමාන්‍ය ජනතාව ඒ ගැන කිසි සැළකිල්ලක් දක්වන්නෙ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ආණ්ඩු කරන කාලයේ පත්‍ර අපෙන් හුඟක් ඈත්වෙලයි හිටියෙ. හැබැයි, රහස් ලබා ගන්න විතරක් බොහොම කිට්ටු වෙනවා. සමහරවිට අර කුමන්ත්‍රණකරුවන් ඒ කාලයේ සිටි නිසා කැබිනෙට්ටුවෙන් රහස් ලබා ගන්න ඇති. එහෙත් පත්‍රකාරයින් මේ ආණ්ඩුවත් සමඟ ඉතා කිට්ටු සම්බන්ධතාවක් ඇතිකර ගෙනයි ඉන්නෙ. අද විරුද්ධ පාර්ශ්වයේ අපේ ආණ්ඩුවක් තිබුණා නම් මේ පත්‍රකාරයන් විශාල චෝදනාවක් ගෙනෙනවා ඇති, අය වැය ලේඛනය ඉදිරිපත් වන්නටත් කලින් එහි ඇතුළත් යෝජනා රටේ ප්‍රචාරය වී ඉවරයි කියා. මේ පත්‍ර මේ ආණ්ඩුව සමඟ කොතරම් කිට්ටු සම්බන්ධතාවකින් සිටිනවාද යන්න තමුන්නාන්සේට මේ පත්‍රයෙන් වැටහෙනවා ඇති. අගෝස්තු 1 වැනිදා "ටයිම්ස් වීක් එන්ඩ්" පත්‍රයේ—අයවැය කථාව ඉදිරිපත් කළේ අගෝස්තු 2 වැනිදායි—මුදල් ඇමතිතුමාගේ අභිලාෂයන් හා පරමාර්ථ කොයිතරම් හොඳින් පැහැදිලි කර තිබෙනවාදයි බලන්න:

"A Sunshine Budget Tomorrow?

Tax and living cost relief predicted.

The National Government's fourth Budget (to be presented tomorrow) is expected to be "a Sunshine Budget",

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංරත්න මයා.]
providing all-round tax relief and a series of measures to bring down the cost of living of the average man, according to the general anticipations in financial circles in Colombo.

There are hopes that the maximum tax slab of 80 per cent. will be scaled down to 60 per cent..."

මේ කාරණා මේගොල්ලො දන්නෙ කොහොමද ?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

It is not scaled down to 60 per cent?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

But they are so near the mark.

ඒක තමයි උපක්‍රමය. ඒ ගොල්ලො හරි ඇත්ත කියන්නෙ නැහැ. සමාන ඇත්තක් කිව්වාම ඒගොල්ලන්ට බේරෙන්න පුළුවන්, අපි නියම ඇත්ත කිව්වෙ නැහැ කියා. මේක අපි නිකම් වනල වෙඩි තිබ්බෙ කියා කියන්න පුළුවන්. දැන් මුදල් ඇමතිතුමාත්, තැපැල් ඇමතිතුමාත් නිදහසට කාරණයක් වශයෙන් කියන්නෙත් ඒගොල්ලො හරියට කිව්වෙ නැහැ කියායි. 85 යි ; 65 යි කිව්ව නම් හරි. කොයි තරම් දුරට කැබිනට් රහස් තබාගෙන සිටිනවාද යන්න මෙයින් පෙනෙනවා.

"..with corresponding reductions for those in the middle-income bracket. It has been suggested that the loss in revenue by these concessions be offset by the withdrawal of the relief now offered for approved savings and approved investments.

In an effort to bring down the cost of living a higher foreign exchange allocation for subsidiary foodstuffs is likely.

It is felt that the Government will announce a scheme of relief for the unemployed which will be tied up to development programmes."

මේක තමයි, ප්‍රචාරය සඳහා යෙදුව කැල්ල. අනික් කෑල්ල තමයි, ඇත්ත. සමහර විට අරක්කු බෝතලයේ මිළ රු. 2 කින් වැඩි වෙනවාය කියන කාරණයත් මේ අයට දැනගන්න පුළුවන් වූ බව්ට ඇත. මානයක් නැහැ. අය බදු යෝජනා ගැන මේ තරම් කිට්ටු දැනීමක් මේ පත්‍රකාරයින් තුළ තිබුණා නම් අරක්කුවලත්, සිගරට්වලත් මිළ මේ අන්දමට වැඩි වෙනවා යයි දැනගන්න ඒ උදවියට හොඳටම ඉඩ තිබෙන්න ඇති. ඒ වගේම, "ඩේලි නිවුස්" පත්‍රයත් බොහොම කිට්ටුවෙන් කියා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අපට රහස කුත් එළි කර තිබෙනවා, අපි කවුරුත් දන්න. මෙන්න ඒ වාර්තාව :

"The Government has to maintain a reasonable deficit in its annual budget owing to the fact that the I.M.F. aid which has so generously made available resources to Ceylon, insists on certain safeguards in this respect."

මේ අන්දමට මුදල් ඇමතිවරයා අයවැය කථාව පවත්වන්නත් කලින් එතුමාගේ අයවැය යෝජනා හුඟක් දුරට ඒ උදවිය ලබාගෙන ප්‍රචාර විධියටත්, ඇත්ත විධියටත් පත්‍රවලින් ඉදිරිපත් කර අවසානයි. සාමාන්‍ය ජනතාව මේ විධියට මෙම ආණ්ඩුව කෙරෙහි විශ්වාසයක් නැතිව සිටින්නේ බලය ලබා ගැනීම සඳහා මුල සිටම නොයෙක් විධියේ කුමන්ත්‍රණ කළ නිසා බව මා කලින් පැහැදිලි කළා. 1956 දී නියම ජනතා යුගයක් පහළ වුණු බව අප කවුරුනුත් දන්නවා. එහෙත්, 1958 දී කිසියම් පිරිසක් විසින් කරන ලද කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් වශයෙන් අපේ ඒ නායකයා 1959 දී අකාල මරණයකට පත් වුණා. ඒ අකාල මරණයේ පසුබිම තවමත් හරියාකාර එළි වී නැහැ. කවදා හෝ එය එළි වේවායි අප ප්‍රාර්ථනා කරනවා. ඊළඟට 1962 දී තවත් කුමන්ත්‍රණයක් ඇති වුණා. නම ප්‍රතිපත්ති ජනතාවට ඉදිරිපත් කොට ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා මහ ජන ඡන්ද බලයෙන් ගොඩනගන ලද ආණ්ඩුවක් පෙරලීමටයි ඒ කුමන්ත්‍රණය ඇති වුණේ. ඒ කුමන්ත්‍රණකාරයන් අද කොහේද ? එක්කෙනකු මේ ආණ්ඩුව යටතේ, ගරු අගමැතිතුමාගේත් ආශිර්වාදය ඇතිව, මසකට රුපියල් 4,000ක් පඩි ලබන රැකියාවක යෙදී සිටිනවා. තවත් තැනැත්තකු ඒ වාගේම අගමැතිතුමාගේ ආශිර්වාදය ඇතිව මසකට රුපියල් 2,500ක වේතනයක් ලබමින් මේ ආණ්ඩුව යටතේ සේවය කරනවා. එහෙම නම්, 1962 ඇති වුණු ඒ කුමන්ත්‍රණයත් අගමැතිතුමාත් අතර ඇති සම්බන්ධය කුමක්ද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිරිමාවෝ බණ්ඩාරනායක මිය.
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Bandaranaike)
ඒක පැහැදිලියි.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
මෙවා ගැන අද රටේ මිනිසුන් කථා කරනවා. ඒ කුමන්ත්‍රණයට අසුවුණු සියලු දෙනාම වාගේ අද මේ රජය යටතේ එක්කෝ ලොකු සංස්ථාවල අධ්‍යක්ෂ ධුර දරනවා. එසේ නැත්නම්, ආරක්ෂක නිලධාරීන් වශයෙන් කටයුතු කරනවා. විශාල පඩි ලබනවා. මේ නිසා, අද ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහිත් මහජන ඡන්ද බලය කෙරෙහිත් එක්තරා විධියක සැක සහිත කලකිරීමක් ජනතාව තුළ ඇති වී තිබීම යුක්තිසහගතයි. මහජනතාව එකතු වී ආණ්ඩු හදනවා. තවත් පිරිසක් ඊට විරුද්ධව කුමන්ත්‍රණ කරනවා. කුමන්ත්‍රණයට අසු වූවත් මේ රටේ අධිකරණය මගින් වැරදිකරුවන් කෙරෙනවා. ඊට විරුද්ධව අභියාචනා කිරීමට රජයෙන් ඉඩක් ලැබෙන්නේ නැහැ. ඊට පසුව සිදුවන්නේ කුමක්ද? ඊළඟට එන ආණ්ඩුව යටතේ එම කුමන්ත්‍රණකරුවන්ට ලොකු වේතන සහිත උසස් රැකියා ලැබෙනවා. මෙය ප්‍රජාතන්ත්‍රවාදයටත් මහජන ඡන්ද බලයටත් කරනු ලබන විශාල නින්දාවක්, මහ හිරිහැරයක්.

මෙයින් පසු 1964 දී කුමන්ත්‍රණයක් ආවා. දැන් ඒ පිළිබඳ සියලුම කරුණු හෙළි වී තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂකයා වශයෙන් රත්‍රන් පැනක් තෑගි ලැබූ පුද්ගලයා 1964 කුමන්ත්‍රණය සාර්ථක කරන්නට මොන විධියේ ව්‍යාපාරයක් ගෙන ගියාද යන වග ඔහුම දැන් හැම තැනම කියා පානවා. ඔහු නායකයන් වෙනස් කළා. එහෙත් ඔහු ගොඩනැගූ නායකයන් දැන් ඔහුටම මදි වී තිබෙනවා. 1964 කුමන්ත්‍රණය සාර්ථක කෙළේ තමා බවත් එහි එකම කෙරුම්කාරයා තමා බවත් ඔහු දැන් සැමතැනකම ප්‍රචාරය කර හරිනවා. තවත් කෙනකු අපේ කටේ බලයෙන් ලංගමයෙන් යන්නම් පිට කර යැව්වා. ඔහු දැන් මොන විධියේ කුමන්ත්‍රණ ව්‍යාපාර යොදා තිබෙනවාදැයි අප දන්නේ නැහැ. අද මේ එක්සත්

ජාතික පක්ෂය ඇතුළු හත් හවුල විසින් ගෙන යනු ලබන්නේ මේ විධියේ ඉතාමත් භයානක තත්ත්වයකට තුඩු දෙන ක්‍රියා කලාපයක්. මහජනතාව ඔවුන්ට විඳින්නට සිදු වී තිබෙන මේ දුක ඉවසා සිටින්නේ මේ ආණ්ඩුව තවමත් හදිසි නීතිය යටතේ රට පාලනය කරන බව දන්නා නිසායි. අද වෘත්තිය සමිතිවලට කිසිම සහනයක් නැහැ. වෘත්තිය සමිති තම සාධාරණ ඉල්ලීම් ඉදිරිපත් කොට කිසියම් උද්ඝෝෂණයක් කළහොත් ඒවාට මේ රජය පහර ගහනවා.

මේ රටේ මීට පෙර කවදාවත් කම්කරු දෙපාර්තමේන්තුවෙහි වැඩ වර්ජන ඇති වුණේ නැහැ. මේ ආණ්ඩුව යටතේ එයත් ඇති වුණා පමණක් නොව මාස දෙකක්ම ගත වනතුරු ඒ වැඩ වර්ජනය නතර කරන්නටත් බැරි වුණා. මා අදත් දුටුවා වැඩ වර්ජනයෙහි යෙදී සිටින විශාල පිරිසක් පෙළපාලියේ යනවා. ඒ අය මොනවාද කියන්නේ? කම්කරු ඇමතිතුමාගේ දරදඬු රපෝර්තු ක්‍රියාත්මක කරනවාට විරුද්ධයි, දරදඬු ක්‍රියා මාර්ගයට විරුද්ධයි ඔය ආදී දේවල් කියමිනුයි පෙළපාලියේ යන්නේ. මේ ආණ්ඩුවේ දරදඬු පාලන ක්‍රමය නිසා ඒ අයට විඳින්න වී ඇති අප්‍රමාණ ගැහැට අද කරබාගෙන විඳ දරාගෙන සිටියත් එහි සීමාව ඉක්ම ගිය විට ඒ උදවිය තුළ අද දක්නට තිබෙන ඉවසිල්ලත් නැතිව යන්න පුළුවනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙයට පෙර කථා කළ වඩ්ඩුක්කොඩෙහි ගරු මන්ත්‍රීතුමා කීවේ මොනවාද? 1965 දී මේ ආණ්ඩුව බලයට පැමිණෙන විට සහල් ලබා ගන්නාවත් මුදල් තිබුණේ නැතිලු. මේ කථාව තමයි ආණ්ඩුව තවමත් කර ගෙන යන්නේ. ඒ කෙසේ වුණත් එදා තත්ත්වයත් අද තත්ත්වයත් අතර ඇති වෙනස අප පෙන්වා දුන්නා; ගණන් හිලව්වලින් එය පැහැදිලි කර දුන්නා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවක තත්ත්වය මනින්නේ ඒ ආණ්ඩුව දුන් පොරොන්දුවලින් කොපමණ ප්‍රමාණයක් ඉටු කර තිබෙනවාද කියන මිම්මෙන්. මේ ආණ්ඩුව බලයට පත් වුණේ අප කළ දේවල් පිළිබඳ කියන්නට නොවෙයි. මේ ආණ්ඩුව පොරොන්දු විසි එකක් අඩංගු ප්‍රකාශනයක්, ලිතක් වශයෙන් මහජනතා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංරත්න මයා.]

වට ඉදිරිපත් කර, අපේ ආණ්ඩුවට වඩා හොඳින් ඒ සියල්ලක්ම ඉටු කරනවාය කියමින් මහජනතාවගෙන් බලය ලබා ගත්තා. එහෙත් බලයට පත් වුණාට පස්සේ අපත් එහෙම කළායයි කීමෙන් රටට කිසිම සෙතක් සිදු වන්නේ නැති බව මතක් කර දෙන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප පෙන්නා දුන්නා, මේ ආණ්ඩුව පෙඩරල් පක්ෂයත් සමග ඇති කර ගෙන තිබෙන රහස් ගිවිසුමේ අඩංගු කොන්දේසි මොන වාද කියා. දැන් තවත් කොන්දේසි කීප යක් ඊට එකතු වී තිබෙනවා. එයින් පළමු වැන්න, සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම අඩ පණ කිරීම. 1964 අවුරුද්දේදී අපේ ආණ්ඩුව ඉදිරිපත් කළ රාජාසන කථාවෙහි මුල් තැනක් ගත්තේ සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම ක්‍රියාත්මක කිරීම ගැනයි. එහෙත් අද සිදු වී තිබෙන්නේ මොකක්ද? සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම සම්පූර්ණයෙන් අඩපණ කර දමා තිබෙනවා පමණක් නොවෙයි, එය මරා දමා ඇති බවයි කියන්න තිබෙන්නේ. එය ක්‍රියාත්මක කරන්නටයයි නීති පනවා ගත්තත් ඒවා ගිවිසුමේ පරමාර්ථවලට සම්පූර්ණයෙන් පටහැනි බව කියන්න කැමතියි. එය ක්‍රියාත්මක කරන්න අදහස් කරන්නේත් පරමාර්ථවලට සම්පූර්ණයෙන්ම විරුද්ධව පමණක් නොවෙයි, ගිවිසුමේ කොන්දේසිවලටත් විරුද්ධවයි; අදාල නොවන පිළිවෙළටයි. දැන් අවුරුදු තුන හමාරක කාලයක් තිස්සේ ආණ්ඩුව ගෙන ගියත් කී දෙනෙකු මේ රටින් පිටමං කර තිබෙනවාද, කී දෙනකුට ඒ රටේ පුරවැසි භාවය ලබා දී තිබෙනවාද, කී දෙනෙකු ඒ රටේ පුරවැසි භාවය භාර ගෙන තිබෙන වාද කියා දැනගන්න කැමතියි.

රහස් ගිවිසුමේ තවත් කොන්දේසියක් නම්, අප කවුරුත් දන්නා පරිදි, සිංහල භාෂාවට ඇති රාජ්‍ය භාෂා තත්ත්වය පහත හෙළීමේ යටිකූට්ටු වැඩපිළිවෙළයි. අද උතුරු නැගෙනහිර පළාත්වල රාජ්‍ය භාෂාව සිංහල නොවෙයි. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව පිහිටුවීමට නොයෙක් අයුරින් වැඩ කළ ස්වාමීන්වහන්සේලාද කියන්නේ, සිංහල භාෂාව ඒ පළාතෙන් දැන් තුරන් වී ඇති බවයි.

කළ කයිට්ස්හි ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් වැටහී ගියා හතරවන කොන්දේසිය ක්‍රියාත්මක කරන ආකාරය ගැන. උතුරු, නැගෙනහිර පළාත්වල ඉඩම් බෙදා දීමේදී ඒ ප්‍රදේශවල පදිංචි දෙමළ භාෂාව කථා කරන ද්‍රවිඩ ජනතාවට පළමුවත්, ඊළඟට, ලංකාවේ කොතැනක වුණත් පදිංචිව සිටින ද්‍රවිඩ ජනතාවටත් පමණක් එම ප්‍රදේශවල ඉඩම් දිය යුතු බව කියනවා. එයයි දැනට ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළ. ඉන් පිටස්තරව එකම බිම් අඟලක්වත් මේ ආණ්ඩුව යටතේ මෙතෙක් බෙදා දී නැහැ. රහස් ගිවිසුමේ ඉහතකී කොන්දේසිය නීත්‍යානුකූල වශයෙන් එළිපිට ක්‍රියාවේ යොදවන්නේ නැතත් පරිපාලන යන්ත්‍රානුසාරයෙන් දැනට ක්‍රියාත්මක වන්නේ එය බව නම් අපට පැහැදිලිව පෙනී යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ධනපති ක්‍රමය ආරක්ෂා කිරීමට මේ ආණ්ඩුව බැඳී සිටින නිසා ඒ අයට දුන් නොයෙකුත් පොරොන්දු ඉෂ්ට කර ගෙන යන බව පෙනී යනවා. රුපියල් ලක්ෂ 550ක් තෙල් වන්දි වශයෙන් විදේශීය කොම්පැනිවලට ගෙවා තිබෙනවා. බූදල් බද්ද අඩු කළා. වීසා බද්ද අඩු කළා. රුපියල් ලක්ෂ 511ක පමණ අයබදු සහනයක් ධනපතීන්ට දුන්නා. බලු බද්ද නැති කළා. මේවා කිරීමෙන් පමණක් නැවතුනේ නැහැ. ගිය සුමානේ ආඥා පනතක් ගරු සභාවට ඉදිරිපත් කර සම්මත කර ගත්තා. විදේශීය බැංකුවල නැවත වරක් පරණ ගිණුම් පවත්වා ගෙන යාමට අවසර දීමට. ඒ වාගේම දේශීය කොමිස් ගන්නා උදවියට නොයෙක් විධියේ ජාවාරම් කර ගෙන යාම පිණිස, භාණ්ඩාගාර ක්‍රමය යටතේ නොයෙකුත් බඩු තොග ගණන් පිටරටින් ගෙන්වීමට ඉඩ දී තිබෙනවා. 1966 අයවැයෙන් ලොකු අයට දුන් සහන මොනවාදැයි කියන්නට මා කැමතියි. තෙල් වන්දි ලක්ෂ 550ක් දී තිබෙනවා. අවුරුද්දකට රුපියල් ලක්ෂ 511කුත් 40,000ක අයබදු සහන දුන්නා. බූදල් බදු අවුරුද්දකට ලක්ෂ 1½යි. ඒ වාගේම වීසා බද්ද, බලු බද්ද, ආදි වශයෙන් අවුරුද්දකට ලක්ෂ 2,000ක් පමණ ධනපති සාක්කුවලට ඇම්මා. එසේ ඇමීම නිසා සිදු වුණේ කුමක්ද? 1965-66 අවුරුද්දේ ලක්ෂ 66ක වැඩි බරක් ජනතාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිට පැටෙව්වා. සහල් කැපීමෙනුත් රේගු බදු වැඩි කිරීමෙනුත් 1966-67 දී ලක්ෂ 2400ක වැඩි බරක් ජනතාව පිට පැටෙව්වා. හාල් සලාකය කපල රේගු බදු වැඩි කරල. 1967-68 දී ලක්ෂ 350ක බරක් පැටවූ අතර 1967 අවසාන වන විට රුපියල් ලක්ෂ 2,816ක ශුද්ධ බරක් ජනතාව පිට පැටෙව්වා. එහෙත් 1968-69 දී එක්තරා සහනයක් සැලසෙවියැයි අප කල්පනා කළා. කුමක්ද සිදු වුණේ? ලක්ෂ 200ක අරක්කු හා දුම්කොළ බද්දක් නැවත වරක් මහජනතාව පිට පැටෙව්වා. ඉතිරි ලක්ෂ 8,500 ණයට ගන්නයි යන්නේ. විදේශ ණය වශයෙන් කොටසකුත් ප්‍රාදේශීය ණය වශයෙන් කොටසකුත් ගන්නවා. ඒ ආකාරයටයි අයවැය පියවන්නේ.

1964 අප බලයේ සිටි කාලයේදී තිබුණු විදේශ ණය රුපියල් ලක්ෂ 4121යි. දේශීය ණය රුපියල් ලක්ෂ 33,753යි. ඒ දෙකේ එකතුව රුපියල් ලක්ෂ 37,874යි. දැන් තත්ත්වය කෙසේද? විදේශ ණය රුපියල් ලක්ෂ 12,153යි. දේශීය ණය රුපියල් ලක්ෂ 49,572යි. ඒ දෙකේ එකතුව රුපියල් ලක්ෂ 61,725යි. 1964 දී විදේශීය හා දේශීය ණයවල සම්පූර්ණ එකතුව රුපියල් ලක්ෂ 37,874යි. අද එය රුපියල් ලක්ෂ 61,725යි. එතකොට ලක්ෂ 34,000ක් වැඩියි.

කෙසේද මේක වැඩි වුණේ? කරපු කර්මාන්ත මොනවාද? ගරු මුදල් ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා කිව්වා, කර්මාන්ත 111ක් ඇති කළ බව. ඒ කර්මාන්ත මොනවාදැයි මා අහනවා. කරපු කර්මාන්තයක් අපට නම් පේන්න නැහැ. මේ ආණ්ඩුව ලොකු වාර්තාවක් පිහිටුවාගෙන යන බව කියනවා, සහල් නිෂ්පාදනය පිළිබඳව. බජට් එකෙනුත් ඒ වාගේම ලොකු වාතීවක් පිහිටුවා තිබෙනවා. 1968-69 අයවැය හිඟය ලක්ෂ 10,000යි. කිසි කලෙක ලංකාවේ මේ විධියේ අයවැය හිඟයක් ඇති වී නැහැ. එම අයවැය හිඟය පියවන්නේ කෙසේද? අයබදු වැඩි කිරීමෙන් අරවායින් මේවායින් ලක්ෂ 15ක් පමණ සොයාගෙන ලක්ෂ 8,500 ක් ණයට ගනන්වා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
බදු බර නොදා.

**ස්ටැන්ලි තිලකරත්න මයා. (කෝට්ටේ)**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன—கோட்டே)*
(Mr. Stanley Tillekeratne—Kotte)
විජ්ජාවක්.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
කාටද බදු බර? ලොකු උදවියට බදු බර පටවන්නේ නැතුව අවුරුදු 25 කට ජාතිය ණය කරනවා. ඒකයි වේදනාව. තමුන්නාන්සේලා ආධාරකාර ජාවාරම්කාර යන්ගෙන් එම ණය අරගෙන හත් මුතු පරම්පරාවක් ජාතිය ඔවුන්ට ණය කර වීමෙනුයි මෙම අයවැය හිඟය පියවන්නේ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
ණය ගන්නෙ කොහෙන්ද බලන්න.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
කොහෙන් ගත්තත් ණයනෙ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
කර්මාන්ත 420 ක් ඇති කිරීමෙන් සහ නොයෙකුත් සංවර්ධන කටයුතු කිරීමෙන් පසුත් 1963-64 අයවැය හිඟය කීයද? ලක්ෂ, 5,150 යි. 1965-66 දී තමුන්නාන්සේලා ආවාට පස්සෙ කීයද? ලක්ෂ 5,700 යි. 1966-67 ලක්ෂ 6,250 යි. 1967-68 ලක්ෂ 8,290 යි. අද ලක්ෂ 10,000 යි. මේ සල්ලි ගිහින් තියෙන්නේ කොහාටද?

අප කවුරුත් දන්නවා දළ වශයෙන් භාණ්ඩාගාරයට ආදායම් ලැබෙන ක්‍රම 4ක් තිබෙන බව. එක් ක්‍රමයක් තමයි අයබදු. අනික් ක්‍රමය රජයේ දෙපාර්තමේන්තු හා සංස්ථා මගින් ලැබෙන ආදායම. අනික් ක්‍රමය විදේශ ආධාර. හතරවැනි ක්‍රමය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා]
තමයි ණය මුදල් ගැනීම. ඔන්න ඔය මාර්ග වලින් තමයි භාණ්ඩාගාරයට මුදල් ලැබෙන්නෙ. මේ ආණ්ඩුව දැන් කොහොමද වැඩ කර ගෙන යන්නෙ. පසුගිය කාලයේදී අපේ ආණ්ඩුව විසින් භාණ්ඩාගාරය හිස් කළාය කියා තමුන්නාන්සේලා අපට චෝදනා කරනවා. තමුන්නාන්සේලා තෙල් වන්දි වශයෙන් රුපියල් ලක්ෂ 550 ක් දුන්නා. අයබදු වශයෙන් ලැබෙන්න තිබුණ මුදල් කොයි තරම් අඩු වුණාද කියා මා තමුන්නාන්සේට පෙන්වා දුන්නා. අයබදු මගින් භාණ්ඩාගාරයට ලැබෙන්න තිබුන මුදල් ආපසු හැරෙව්වා; උඩුගං බලා හැරෙව්වා. ඉතින් කොහොමද භාණ්ඩාගරයේ මුදල් තිබෙන්නෙ. භාණ්ඩාගාරයේ මුදල් නැති වන විට මහජනතාව සූරා කනවා.

එපමණක් නොවෙයි, තමුන්නාන්සේලා සංස්ථාවලට මොකද කළේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංස්ථා වල තත්ත්වය ඉතාමත් ඛේදජනකයි. තමුන්නාන්සේ දන්නවා සතොස ආයතනය ගැන. සම්පූර්ණයෙන්ම රෙදි ආනයනය කිරීම සතොස ආයතනයට භාර දීලයි තිබුණේ. එයින් ලැබුණ ලාභය මහජනතාවටත් භාණ්ඩාගාරයටත් බෙදී ගියා. සුළු ගණනක් තබා ගෙන මහජනතාවට රෙදි වික්කා. නමුත් අද සිදු වී තිබෙන්නෙ කුමක්ද? අද සළුසල කියා සංස්ථාවක් ආරම්භ කර තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ ආධාරකරුවන්ට එහි කොටස් වලින් සියයට 49 ක් වික්කා. කුමන්ත්‍රණ නඩුවට අසු වුණ කෙනෙක් මැනේජර් වශයෙන් පත් කර ඔහුට මාසයකට රුපියල් 2,500 ගණනේ වැටුපක් ගෙවනවා.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
නඩුවෙන් නිදහස් වුණා.

ඉලංගරත්න මයා.
(திரு. இலங்காரத்ன)
(Mr. Ilangaratne)
නීති ප්‍රශ්න උඩ නඩුවෙන් නිදහස් වුණා.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
නඩුවෙන් වැරදිකරුවෙක් වුණේ නැහැ. නිදහස් වුණා.

ඉලංගරත්න මයා.
(திரு. இலங்காரத்ன)
(Mr. Ilangaratne)
නඩුවෙන් නිදහස් වුණත්, කුමන්ත්‍රණයකට අසු වුණ පුද්ගලයෙක් පත් කළේ මොකටද? ආණ්ඩුවටත් අගමැතිතුමාටත් තිබෙන කැක්කුම මොකක්ද? ඔහු නැතුවාට නව මිනිසුන් දහස් ගණනක් ඉන්නෙ රක්ෂාවල් නැති අය. සුදුසු අය තවත් ඉන්නෙ. කුමන්ත්‍රණයකට අසු වුණ පුද්ගලයෙක් පත් කළේ ඇයි? තමුන්නාන්සේලා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නේ ඔහොමද? ප්‍රජාතන්ත්‍රවාදී රජයක් පෙරලීමට කුමන්ත්‍රණ කළ කෙනෙක්ම ඇයි පත් කළේ? අපේ ආණ්ඩුව පෙරළන්නට නොයෙක් විධියෙන් ආධාර කළ උදවියට රක්ෂා ලබා දී තිබෙනවා. එක් කෙනෙකුට රුපියල් 4,000 බැගින් මාසයකට පඩි දෙනවා. අනික් එක් කෙනාට රුපියල් 2,500 බැගින් මාසයකට පඩි දෙනවා. ඒ වගේම තවත් ගුණතිලක කියා පුද්ගලයෙක් ඉන්නවා. ඔහු අයථා වැඩ කරනවාය කියා වෘත්තීය සමිති මගින් කොයි තරම් පැමිණිලි කර තිබෙනවාද? අධ්‍යක්ෂවරයෙක් වශයෙන් කටයුතු කරන ඔහු කොන්ත්‍රාත් වැඩත් කරනවා. වරාය සංස්ථාවේත් තත්ත්වය ඔය විධියයි. මෙන්න මේ විධියටයි තමුන්නාන්සේලා වැඩ කරන්නෙ.

ඊළඟට පැට්‍රල් සංස්ථාව ගැන බලමු. පැට්‍රල් වෙළඳාම ජනසතු කිරීමේ ප්‍රධාන අරමුණ අපේ තේ විකිණීමට ක්‍රමයක් සලස්වා ගැනීමයි. තෙල් පිරිසිදු කිරීමේ යන්ත්‍රයකුත් අපි සකස් කළා. අපි කර්මාන්ත ශාලාවක් ඇති කළා. අපි එසේ කළේ ඉරාකයෙන් අමු තෙල් ගෙන්වා ගැනීම සඳහායි. මොකක්ද හේතුව? අපේ තේ තොග ගණන් ඉරාකයට යවනවා. නමුත් අපට ඒ අයගෙන් ගත හැකිව තිබුණේ ඉඳි පමණයි. අන්න ඒ නිසයි ඉරාකයෙන් අමු තෙල් ලබා ගැනීමට මාර්ගයක් සකස් කළේ. අමුතෙල් ඉරාකයෙන් ගෙන්වා අපට අවශ්‍ය ප්‍රමාණය හැරෙන විට අතිරික්ත කොටස අපනයන කරන්න අපට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පුළුවනි. අන්න ඒ සඳහායි අපි කර්මාන්ත ශාලාව ඇති කළේ. දැන් ඒ සංස්ථාවට මොකක්ද සිදු වී තිබෙන්නේ ? මේ ආණ්ඩුව "එසෝ" කොම්පැණියත් සමග ලක්ෂ 5,000 ක කොන්ත්‍රාත් එකක් ඇති කර ගෙන තිබෙනවා. එම කොම්පැණියෙන් තෙල් ගෙන්වීම සඳහා කොන්ත්‍රාත් එකක් ඇති කර ගෙන තිබෙනවා. තමුන්නාන්සේලාටත් අපටත් මෙයින් පාඩුවක් වන්නේ නැහැ. නමුත් මේ රටේ ඉදිරියට එන හත්මුතු පරම්පරාවට නේද මේ ණය ගෙවන්න සිදු වන්නෙ. අපි තමුන්නාන්සේලා අද හෙට මැරී යනවා. නමුත් ඉදිරියට එන පරම්පරාව. ඇයි නුවරඑළියේ මන්ත්‍රීතුමාගේ තේ ඉරාකයට යවා අමු තෙල් ලබා ගන්න බැරිද ? ඇයි මේ "එසෝ" කොම්පැනියත් සමග තමුන්නාන්සේලා කොන්ත්‍රාත් එකක් ඇති කරගත්තෙ ? මැතිවරණ කාලයේදී ලක්ෂ ගණනින් වියදම් කරමින් ඒ අය තමුන්නාන්සේලාට වැඩ කරනවා නේ. සී. අයි. ඒ. එකත් සමග හවුල් වී හොඳට වැඩ කරයි. තමුන්නාන්සේලා සංස්ථාවලට වැඩ කරන්නේ ඔන්න ඔය විධියටයි.

ඊළඟට විරාය නැව්බඩු සංයුක්ත මණ්ඩලය ගැන කල්පනා කර බලමු. එහි 1965 සහ 1966 යන අවුරුදුවල වාර්තා අපට ලැබී තිබෙනවා. ඒ වාර්තාවලින් පෙනෙන්නේ එයින් ලක්ෂ දෙකක් පාඩු වී තිබෙන බවයි. සමහර විට දැන් ඊටත් වඩා පල්ලම් බැස ඇති. මේ සංයුක්ත මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් පාලනය කරන්නට දැන් ගරු ඇමතිතුමාටත් බැරි වී තිබෙනවාලු. ඉතින් මේ විධියට පාඩු සිදු වීමෙන් භාණ්ඩාගාරය හිස් වන කොට විදේශවලින් ණය ගන්නට සිදු වෙනවා. 1965 වනතුරු අප කිසි කලෙක භාණ්ඩවලින් විදේශාධාර ලබා ගත්තේ නැහැ. නොයෙක් විධියේ ව්‍යාපාරවලට, කර්මාන්තවලට අවශ්‍ය භාණ්ඩ මිස අනෙක් කටයුතු සඳහා කිසි විටෙක භාණ්ඩාධාර ගත්තේ නැහැ. එහෙත් මේ ආණ්ඩුව භාණ්ඩාධාර විශාල ප්‍රමාණයක් ලබා ගෙන තිබෙනවා. මේ ආධාරවලින් මොනවාද ගෙන්වන්නේ ? ටයර් ගෙන්වනවා. එසේ ටයර් ගෙන්වීම නිසා ෆෘඩන්බර්ක් කොම්පැනියට කොමිස් ලැබෙනවා. භාණ්ඩාධාර වශයෙන් බටහිර ජර්මනියෙන් ටයර් ගෙන්වනවා. හැතැප්ම පහළොස් දාහක් විතර දිව්වාම ඒ ටයර් ගෙවී යනවා. එහෙත් අප හත්මුතු පරම්පරාවක් පොලියත් සමග ණය ගෙවිය යුතුයි. ඊළඟට භාණ්ඩාධාර වශයෙන් වියලි මිරිස් ගෙන්වනවා. එන්. එම්. අප්පුහාමිට වෙළඳාම් කිරීම සඳහා ට්‍රැක්ටර් ගෙන්වනවා. මේවාද වැඩ ?

ධනපති ක්‍රමය හා සමාජවාදී ක්‍රමය එකට ගමන් කරවීම කර්මාන්ත ඇමතිතුමාගේ ප්‍රතිපත්තියයි. ඒ ප්‍රතිපත්තිය අනුව ට්‍රැක්ටර් ගෙන්වා ඒවායේ වෙළෙඳාම එන්. එම්. අප්පුහාමිට භාර දෙනවා. ජාතිය අවුරුදු විසිපහක් තිස්සේ පොලියත් සමග ණය ගෙවන්නට ඕනෑ. ෆෘඩර්න්ඩර්ග් කොම්පැනියට වෙළෙඳාම් කිරීම සඳහා ටයර් ගෙන්වා දෙනවා. ජාතිය ඒ සඳහා අවුරුදු විසිපහක් තිස්සේ පොලියත් සමග ණය ගෙවන්නට ඕනෑ. මේ විධියට කටයුතු කරන ගමන් අපට බණ කියනවා. ඉස්සර නිලපට දර්ශනවාදයක් තිබුණාලු. වැඩිය සිල් රකින්නේ නැති හාමුදුරු කෙනකු කොහේදෝ ගොස් සිවුර වෙනුවට නිල් රෙද්දක් පොරවාගෙන ආවාලු. ඒක මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිල නොවෙයි. සමහර විට කොළපාට වන්නටත් ඇති. එසේ නිල් රෙද්දක් පොරවාගෙන ආවායින් පසු "මේක තමයි හරි" කියමින් දර්ශන වාදයක් ඇති කරන්නට හැදුවාලු. මහසෙන් රජතුමාගේ කාලයේදීදෝ මේ වගේ දෙයක් ඇති වුණත් එය විනාශ කරන්නට සිද්ධ වුණා. බල ලෝභිකමට ඇමතිකමක් ලබාගෙන තමන්ගේ ලජ්ජාව වසා ගන්නට අපට ධර්ම දේශනා කරන්නට සමහරුන් එනවා. අවුරුදු විසිපහක් තිහක් තිස්සේ සමාජවාදය මේක යයි කියමින් කාරණා ඉදිරිපත් කළ අය දැන් කියන්නේ ධනවාදය හා සමාජවාදය අත්වැල් බැඳගෙන යන බවයි. එක නරියකුගේ වලිගය කැපුණාම ඌ අනෙක් නරින්ටත් තිබේ වලිගා කපා ගන්නා ලෙසටයි.

වගා ව්‍යාපාරය ගැනත් වචනයක් දෙකක් කියන්නට ඕනෑ. මේ ගැන හුඟක් කථා කරන්නට යෙදුණා. එහෙත් මාත් වචනයක් දෙකක් නොකියා බැ. මේ ආණ්ඩුව මේ ව්‍යාපාරය ගෙන යන්නේ ප්‍රෝඩා වෙනුයි. මා ප්‍රවෘත්ති ඇමති නම් වහාම ගුවන් විදුලිය භාරව කටයුතු කරන නිලධාරියා සේවයෙන් පහ කරනවා. එසේ නැත් නම් ඇමතිවරයා හැටියට මා ඔය විධියේ වැරදි නියෝගයක් දුන්නා නම් මා ඇමති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා]
ක්‍රමෙන් ඉල්ලා අස්වෙනවා. ගුවන් විදුලිය මේ බොරු කියන්නේ ඇයි ? ගුවන් විදුලිය ගණන් හිලව් පෙන්වන්නේ 1965 සිටයි. 1964 ගණන් හිලව් පෙන්වන්නේ නැහැ. ඊට කලින් කවදාවත් නොතිබුණු වාර්තා වක් 1964 දී පිහිටුවා තිබෙනවා. 1965 සිට 1967 දක්වා වී නිෂ්පාදනය වැඩි වූ ආකා රය පෙන්වනවා මිස ඊට පෙර තත්ත්වය පෙන්වන්නේ නැහැ. 1967 දී වී බුසල් ලක්ෂ 551 ක් නිෂ්පාදනය කර තිබෙනවා. 1965 දී නිෂ්පාදනය කෙළේ ලක්ෂ 362 යි. 1965 ත් පෙර තත්ත්වයත් මම පෙන්වා දෙන්නම්. 1960 දී බුසල් ලක්ෂ 410 යි. 1961 දී බුසල් ලක්ෂ 431 යි. 1962 දී බුසල් ලක්ෂ 480 යි. 1963 දී බුසල් ලක්ෂ 491 යි. 1964 දී බුසල් ලක්ෂ 505 යි. ඒ අනුව ඊට පෙර කවදාවත් නොපිහිටුවන ලද වාර්තා වක් 1964 දී පිහිටුවා තිබෙනවා. 1965 දී ඇති වුණු තත්ත්වය මොකක්ද? ඒ අවු ඇති වුණු තත්ත්වය මොකක්ද? 362 යි. ඉඩෝරය, ගංවතුර ආදිය නිසා වී නිෂ්පාදනය ඒ අවුරුද්දේදී බැස්සාවු. 1966 වර්ෂයේදී වී නිෂ්පාදනය බුසල් ලක්ෂ 458 යි. එතකොට ඒ අවුරුදු දෙකේදීම 1964 ලැබූ තරම් වී ප්‍රමාණයක් ලබා ගන්නට බැරි වුණා. 1967 දී වී නිෂ් පාදනය බුසල් ලක්ෂ 551 යි.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

එතකොට ඉහළට නැඟල තියෙනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඔව්, ඉහළටම නැංගා. පන්සිය පණස් එක, පන්සිය පහට වඩා ලොකු ගණනක් නොවෙයිද ? ඒ ගැන තර්කයක් නැහැ නේද ? එහෙම නම් ඇයි, 1964 අවුරුද්දේ ඉලක්කම් නොකියන් නේ ? ලෝක වාර්තාවක් පිහිටුවා තිබෙන වාය කියනවා. මීට පෙර කවදාවත් ඒ තරම් විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කර නැතැයි කියනවා. ඒ විධියට කියන අය, 1964 ඉලක්කම් අමතක කර දමනවා. ඒවා කියවන්නේ නැහැ. ඒ අවුරුද්දේ ගණන ලක්ෂ 365 යි. 1965 දී ලක්ෂ 363 යි. ඒ වුණාට 363 තමයි ගණන් ගන්නේ. ඒ විධියට ගණන් ඉදිරිපත් කරමින් ලොකු වට කියනවා, එන්. එම්. අප්පුහාමි මහත් මයාගේ ට්‍රැක්ටර්වලටත්, පෝරවලටත් පින් සිදු වන්නට නිෂ්පාදන වැඩි කර තිබෙනවාය යනාදි වශයෙන්. ඔය විධියට බොරු කියන්නට හොඳ නැහැ. එය වැඩි යෙන්ම නරක අන්දමට බලපාන්නේ ළමයින් කෙරෙහි බව කියන්නට ඕනෑ. මේවා ළමයින්ට ඇහෙනවා. එතකොට ඒ අයත් බොරු කියන්නට පුරුදු වෙනවා. මගේ ළමයාත් මේවා ගැන මගෙන් අහනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

ඉස්සර පණහට තිබිලා දැන් පණස් පහක් වුණාම ඒක ලොකු දෙයක් ඉතා වෙයිද ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

පණහට වඩා පණස් පහ ලොකු බව මා පිළිගන්නවා. ඒ ගැන කිසිම තර්කයක් නැහැ. එහෙත් ඒක නොවෙයි මා කියන් නේ. 505 නොපෙන්වා 363 පෙන්වන්නේ ඇයි ? ඒකයි මා අහන්නේ. ඉස්සරවෙලාම 1965 ගණන් කියවනවා. ඒ පදනම මත ප්‍රතිඵල හොඳ වෙලා තියෙනවාය කියාත් ප්‍රකාශ කරනවා. මේවා සිංහලෙනුයි කිය වන්නේ. ඉංගිරිසියෙනුත් මේවා කියවනවා දැයි මා දන්නේ නැහැ. ඉංගිරිසි අය බත් කන්නේ නැහැ නොවැ. සිංහලෙන් නම් මේවා බොහොම ආටෝප කර කියවනවා.

එදා මා මෙවැනි තර්ක ඉදිරිපත් කර සංඛ්‍යාලේඛන මගින් ඒවා සනාථ කළා. ගරු අගමැතිතුමා ඒ ගැන සඳහන් කර මින්, මට මේවා එවලා තියෙන්නේ රත්න දේශප්‍රිය මහත්මයාදැයි ඇහුවා. හාල් බුසලක නියම වටිනාකම කොතෙක්දැයි පෙන්වීමටයි එදා මා සංඛ්‍යාලේඛන විග්‍රහ කර පෙන්නුවේ.

ශ්‍රී ලංකා මහ බැංකුවෙන් 1967 වර්ෂය වෙනුවෙන් මුදල් ඇමති වෙත ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තාවේ 175 වැනි පිටුවේ සහල් ටොන් එකක වටිනාකම රුපියල් 640.80 කැයි දක්වා තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මගේ කථාවේදී මා පෙන්නුවේ මෙයයි. හාල් සේරුවක මිල ශත 56 ක් බවත්, හාල් රාත්තලක මිල ශත 28 ක් බවත් මා එදා කිව්වා. ඒ සමගම, අපේ ආණ්ඩුව එහෙම තිබුණා නම් හාල් සේරු දෙකක් රුපියලකුත් ශත දොළහකට අරගෙන ශත පණහකට දෙනවාය කිව්වා. එතකොට ආණ්ඩුවට ශත හැට දෙකක් පාඩු විඳින්නට සිදු වන බවත් ඒ සමගම කිව්වා. මහජන මුදලින් ඔය පාඩුව පිරිමසා ගන්නට ශත 62 ක් දෙන්නට ඒ අනුව සිදු වෙනවාය කිව්වා. එකයි දොළහට දෙකක් අරන්, දෙකම ශත පණහකට දුන්නාම ඒකයි සිදු වන්නේ. මේ ආණ්ඩුව කරන්නේ මොකක්ද? එකයි දොළහකට දෙකක් අරන් එකක් නිකම් දෙනවා. එකක් නිකම් දෙන අතර අනෙක රුපියලකුත් ශත විස්සකට දෙනවා. එතකොට හාල් සේරු දෙකටම රුපියලකුත් ශත විස්සක් ආණ්ඩුවට ලැබෙනවා. මේ ආණ්ඩුව හාල් සේරු දෙක, එකයි දොළහකට අරන් එකයි විස්සකට විකිණීමෙන් ශත අටක ලාභයක් ලබනවා. අපේ ආණ්ඩුව හාල් සේරු දෙක, එකයි දොළහකට අරන් දෙකම ශත පණහකට විකිණීමෙන් ශත හැට දෙකක පාඩුවක් වින්දා. මේ ආණ්ඩුව නොමිලයේ හාල් සේරුවක් දීමේ වෙස්සන්තර ක්‍රමය නිසා ඇත්ත වශයෙන්ම මේ ආණ්ඩුවට ලාබයි. අත්පොළසන් ගහන්නට උදවිය ඉන්න නිසා ගරු අග්‍රාමාත්‍යතුමා හුඟක් දේවල් කියනවා. එයින් බොහෝ විට ප්‍රශ්නය වැහෙනවා. අපේ ආණ්ඩුවක් තිබුණා නම් ශත හැට දෙකක් පාඩු විඳගෙන අප කරන විධියයි මා කියා සිටියේ. මේ ආණ්ඩුව 1.12 ට අරන් 1.20 ට විකිණීමෙන් ශත අටක ලාභයක් ගන්නවා. එතකොට ඔය ක්‍රම දෙක අතර තිබෙන වෙනස කියද? වෙනස ශත හැත්තෑවයි. වෙස්සන්තර ක්‍රමය නිසා මේ ආණ්ඩුවට ශත හැත්තෑවක් හිමි වෙනවා මා පෙන්වන්නට අදහස් කෙළේ ඒකයි.

වී බුසලකට රුපියල් 14 ක් ගෙවන බවට පුරසාරම් දොඩනවා. ඒ ගැන මුල්කිරිගල ගරු මන්ත්‍රීතුමා (ජෝර්ජ් රාජපක්ෂ මයා.) කිව්වා. හාල් විකුණන මිල කියද? වී බුසලක් ගන්න මිල කියද? හාල් කොටන වාට සේරුවකට ශත හතර බැගින් ගෙවනවා. එතකොට හාල් සේරුවකට රුපියල් 1.20 ක් වැටෙනවා. අපේ ආණ්ඩුවක් තිබුණා නම් හාල් සේරු දෙකක් රුපියල් 2.40 කට අරන් ශත 50 කට දෙනවා. එතකොට රුපියල් 1.90 ක් අපට පාඩුයි. මේ ආණ්ඩුව කරන්නේ කුමක්ද? රුපියල් 2.40 කට හාල් සේරු දෙක අරන් එකක් නිකම් දෙනවා. රුපියලකුත් ශත හතළිහකට විතර අනෙක දෙනවා. එතකොට අපේ ආණ්ඩුවට වඩා ශත අනූවක් මේ ආණ්ඩුවට හිමි වෙනවා. ඒකයි, වෙස්සන්තර ක්‍රමයේත්, බණ්ඩාරනායක ක්‍රමයෙත් තිබෙන වෙනස. ගරු අගමැතිතුමාට පෙන්වා දෙන්නට මා උත්සාහ කෙළේ අන්න ඒකයි.

වගා ව්‍යාපාරය ගැන කියන විට භයානක ප්‍රවෘත්තියක් එළි කරන්නට අපට සිදු වෙනවා. වී වගාව අප කාටත් අවශ්‍යයි. තමුන්නාන්සේලා කොයි විධියට කිවත් අපේ මුළු ධෛර්‍යයම යොදා ගොවිතැනට අපේ ආධාරය දෙන බව කවුරුත් පිළිගන්නවා. හැබැයි, බොරු ප්‍රචාරවලට නම් අප විරුද්ධයි. අප කාගේත් යුතුකම, ඇත්ත කීමයි. වගාව ගැන කථා කරන මේ අවස්ථාවේදී, මට ලැබී තිබෙන ආරංචියක් ගැනත් සඳහන් කරන්නට සිදු වී තිබෙනවා. මා හිතන අන්දමට රජයටත් ඒ ආරංචිය ලැබී ඇති. D. R. Weerasinghe, Secretary, All-Ceylon United Agricultural Front. ඒ වීරසිංහ මහත්මයා අගමැතිතුමාට ලිපියක් එවා තිබෙනවා. ඔහු කියන්නේ, එක්තරා වී වර්ගයක ඇති භයානක කමයි. ඔහුගේ අදහස, තර්කානුකූලව ඔප්පු කරමින් කරුණු පෙන්නා දී තිබෙනවා. ඒ වී වර්ගය හේතුකොට ගෙන ලංකාවේ වී වගාව වඳ වන්නට පුළුවන් බව වැඩිදුරටත් පෙන්නා දී තිබෙනවා. ඔහුගේ අදහස් එක්තරා අන්දමකට පිළිගැනීමක් විධියට පෙනෙනවා, ඒ වී සම්බන්ධයෙන් විභාග කර රපෝර්තුවක් ඉදිරිපත් කරන ලෙස "ප්ලාන්ට් පැතොලොජිස්ට්"ට නියම කිරීම. ඒ ගැන මා සන්තෝෂ වෙනවා. මා කියන්නේ නැහැ, මෙය සම්පූර්ණයෙන්ම පිළිගන්න කියා. ඒ පිළිබඳව සොයා බලා,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

විභාග කර, විවාද කර අවශ්‍ය කටයුතු කරන ලෙසයි, මා ඉල්ලා සිටින්නේ. මෙන්න, අර මහත්මයාගේ අදහස් :

"NECESSITY TO AVERT A NATIONAL TRAGEDY AND SAVE THE PRESENT AND FUTURE GENERATIONS FROM ITS DANGERS

Dear Sir,

In order to avert a National Tragedy and save the present and future generations from its dangers, I have written to Hon. Mr. Dudley Senanayake, Premier, in his capacity as the Chairman of the National Food Production Advisory Council, to agree to a public debate as it is a matter of public importance."

ඉදිරිපත් කර තිබෙන මේ කරුණු සියල්ලම එකහෙළා පිළිගන්නැයි මා කියන්නේ නැහැ. එහෙත් ඉදිරිපත් කර ඇති මේ අදහස් ගැන සලකා බැලිය යුතුව තිබෙනවා. මේ ලිපියේ තිබෙන සේරම කියවන්නට මා අදහස් කරන්නේ නැහැ. අත්‍යවශ්‍ය කොටස් කීපයක් පමණක් අතනින් මෙතනින් කියවන්නම් :

"The total foreign exchange required for the importing of fertilizers, weedicides, insecticides, fungicides, machinery, fuel, etc., would be greater than the amount required for importing of rice. To solve one problem, several other problems are being created on the advice of foreign capitalist manufacturing firms and their local sympathizers. At least 400 million rupees would be required per year."

මේකයි, වැදගත් එක.

"It has been reported at a meeting of the Matara District Agricultural Committee that the miracle rice IR8 introduced from the International Rice Research Institute at Manila, has brought in serious diseases. With the introduction of 1R8, serious virus and bacterial diseases are being introduced. The local sympathizers of foreign capitalists have made arrangements to import 10,000 bushels of 1R8 and thereby spread these diseases into the country. This will be grown in several districts.

"The orange growing industry in the Bibile and Vavuniya areas was ruined by the introduction of such diseases on the recommendations made by similar cympathizers of vested interests who desired no competitor to their export of oranges etc. The grafted and heavy-bearing foreign varieties of oranges were so good at the commencement that if any one warned them of the danger, they have been laughed at.

"The local red rice of the Indica group has vitamins, proteins, amino-acids and fats. The white rice (Itihal) such as P. T. B.—16, IR8, is of the Japonica and Javanica groups of rice, and H7, H8, etc., are also white.

"The foreign capitalists through their local propaganda agents desire us to first get used to eating itihal or white rice, then to wheat flour products (string hoppers, hoppers, pittu, bread from flour) and then to America's newly produced artificial rice when our paddy is fully diseased and it is not economical to control the pests and diseases. This is a carefully drawn-out plan."

මේ විධියට විශාල විස්තරයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම අර සතා—ගොයම් පූරුක් පණුවා—ගැනත් පරීක්ෂණ පවත්වා, එක්තරා අන්දමක නිගමනයකට බැස තිබෙනවා. එයින් අදහස් කරන්නේ මේ විධියට මේ වී වගා කරන්නට ඉඩ දුන්නොත් ලංකාවේ වී වගාව සම්පූර්ණයෙන්ම වඳ වන බවයි. එසේ වුණොත් පිටරටින් හාල් ගෙන්වන්නට සිදු වෙනවා. එහෙම නැත්නම් අමෙරිකාවෙන් කෘත්‍රිම හාල් ගෙන්වාගෙන අපේ බඩගින්න නිවා ගැනීමට සිදු වෙනවා. මෙහි සත්‍යතාවය හෝ අසත්‍යතාවය අපට කියන්නට බැහැ. එහෙත් ආණ්ඩුවේ නිලධාරියෙක්—පැතොලොජිස්ට් කෙනෙක්—මෙය විභාගයක් කිරීමට තරම් බැරෑරුම් ප්‍රශ්නයක් හැටියට පිළිගැනීම ගැන අපි සන්තෝෂ වෙනවා. "රොක්ෆෙලර්" ආයතනයෙනුත් මේ රටට විශේෂ පොහොර ගෙන්වීමට සිදු වී තිබෙනවා. ඒ අයට වුවමනා කරන්නේ පෝර අපනයනය කර ඒ අයගේ ආදායම වැඩිකර ගැනීමයි. ඒ නිසා මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ක්‍රියා කරන ලෙස මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. මා හිතන විධියට බස්නායක මහත්මයාත් මේ සම්බන්ධයෙන් මීට කලින් ප්‍රචාරයක් ගෙන ගියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ සමගම මේ වගාව ගැන මේ තරම් ප්‍රචාරයක් ගෙනයෑම හොඳ නැති බවත් කියන්නට ඕනෑ. සියලු දෙනාම දන් ඒවා විහිළුවට ගන්නවා. මේ ප්‍රචාරය විහිළුවක් වී තිබෙන නිසා මධ්‍යස්ථ අයවත් දන් ඒවා ගණනකට ගන්නේ නැහැ. ඇහුම්කන් දෙන්නේවත් නැහැ. බත කියන්න ගියත් වගාව; නාට්‍යයක් කරන්න ගියත් වගාව; සින්දුවක් කියන්න ගියත් වගාව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
ඒක හොඳයිනේ ?

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
කෝක වුණත් වැඩි එක හොඳ නැහැ. එක සිද්ධියක් ගැන කියන්න කැමතියි. ගුවන් විදුලි ආයතනයට නිතර නිතර ගොස් ගුවන් විදුලියෙන් ගී කියන මොරිස් දහනායක කියා මහත්මයෙක් සිටින බව තමුන්නාන්සේත් දන්නවා ඇති. ඔහු කවුරුත් කැමති ප්‍රසිඬ ගුවන් විදුලි ගී ගායකයෙක්. ඒ මහත්මයාත් 1968 ජූනි 14 වැනි දා නෙවිල් ජයවීර මහත්මයාට ලිපියක් යවා තිබෙනවා. ඒ මහත්මයා මෙන්න මෙහෙම කියනවා :

Sir,

I am an auditioned Light Songs artiste of both the National and Commercial services of the Ceylon Broadcasting Corporation broadcasting regularly since 1952. I have also recorded songs for 'H. M. V.' and 'Philips' discs, sung for several Sinhala films and recorded songs for Radio Manila for programmes conducted by Rev. Don Rubesh.

**During the past two and a half years we have been compelled by the C.B.C. authorities to record 'Govi Gees' and 'National songs' for every programme allotted to us very much against the wishes of so many Radio Artistes. We auditioned artistes of the C. B. C. comply with these rules as we have no choice. On the contrary artistes who sing over the Western Programmes of the Commercial and National services are allowed to sing songs set to any lyric. These rules do not apply to them ?"—**

ඉංග්‍රීසි උගත් අය මෝඩ කරන්න බැරිය කියලයි ඒ අයගේ කල්පනාව. ඒ නිසා ඒ අයට වැදි බන කියන්න ගියොත් ඒවාට ඔවුන් ඇහුම්කන් දෙන්නේ නැත කියා සිංහල අයට පමණයි ඒ කොන්දේසිය දමා තිබෙන්නේ. හැම වැඩ සටහනකටම අඩු වශයෙන් ගොවි ගී දෙකක්වත් කියන්නට ඕනෑ. එහෙම නැත්නම් එය බාර ගන්නේ නැහැ.

—"I received an invitation dated 11.7.68 from the C. B. C. for a Light Song Programme, now they want me to sing two 'National songs'. This is very unfair as we are allotted 15 minutes once in 6 months for a song recital and allowed to sing only 3 songs.

Meanwhile I have received hundreds of requests from our Radio Listeners to sing love songs and songs on other topics. Some of these listeners have told me that they are sick of listening to the Programmes broadcast over the Sinhalese Service.

I hope Sir, that you will give this matter your kind consideration and remedy this situation in fairness to our listeners and Radio Licence holders of Sri Lanka. I have attached my script herewith for the kind approval of the C. B. C."

මෙයට නෙවිල් ජයවීර මහත්මයා යවා තිබෙන පිළිතුර මොකක්ද ? මම කියවන්නම් :

"Dear Sir,

**Reference to your letter dated 4th July 1968 I regret to inform you that there can be no revision of our policy in regard to Govi Gees and National songs. Over the past many years artistes have been singing any number of love songs. We require different types of songs now to generate the enthusiasm of our people for the development of their country. I see no reason why we should deviate from this policy. In any case out of the 3 songs allocated to you only 2 songs have to observe this requirement."—**

සින්දු තුනක් කියන විට ඉන් දෙකක් ගොවි ගී වෙන්න ඕනෑලු.

—"**The third song can be one of your selection.**

**In any case we are not compelling any person to accept our programmes. Those who do not wish to conform to our requirements are entirely free to refrain from singing on the C. B. C.**

**Relevant documents are returned herewith.**

Yours faithfully,
**Neville Jayaweera**
Director-General".

මා මෙය කියවන්න යෙදුණේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වදෙන් පොරෙන් මේවා ප්‍රචාරය කරවන ආකාරය පැහැදිලි කිරීමටයි. ගරු අග්‍රාමාත්‍යතුමාගේ ස්ථිර ලේකම්තුමා සෑම සංස්ථාවකටම චක්‍රලේඛයක් යවා තිබෙනවාලු ප්‍රචාරය සඳහා ධනපති පත්‍රවල පිටු අඩු ගණනේ 25 ක් වත් පාවිච්චි කරන්නය කියා. ඒ බව මැද වච්චියේ ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංරත්න මයා.]
මින් පෙන්වා දුන්නා ඒ සඳහා ලක්ෂ ගණනක මුදලක් ධනපති පත්‍රවලට යන බව. ඔය විධියේ බලකිරීම්වලින් නොයෙක් ප්‍රචාර කරනවා.

"සිළුමිණ" කතුවැකියකත් මේ ප්‍රචාරය ගැන පළ කර ඇති අදහස් වගයක් කිය වන්න ලැබුණා. තමුන්නාන්සේලා කවුරුත් පාහේ දන්නවා "සිළුමිණ" පත්‍රය ආණ්ඩුවට හුඟාක් ආධාර කරන පත්‍රයක් බව. අපේ ආණ්ඩුව කඩා බිඳ හෙළීමට ප්‍රමුඛස්ථානයක් ගත් පත්‍රයක් "සිළුමිණ" පත්‍රය. එහෙත් ඒ පත්‍රයෙනුත් කියන්න යෙදුණේ, "ඔය ගැන ඔය හැටි කියන්න ඕනෑද, ඔය කන්කෙඳිරිය නවත්තපල්ලා" කියායි. ඒ තරම් පිරිහිලයි දැන් තිබෙන්නෙ. අපි කැමතියි තමුන්නාන්සේල පිරිහෙනවාට; හැබැයි පෞද්ගලික වශයෙන් නොවෙයි දේශපාලන වශයෙන් පිරිහී ඔතැනින් ඉවත් වී යනවට. ඒ මොකද? ජනතාව බේරාගන්න පුළුවන් වන නිසායි. ජාතිය මෙවැනි නින්දාවට භාජනය කරනවාට අපි කැමති නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

If the hon. Member is coming to a new point, I shall call upon the Hon. Deputy Chairman of Committees to take the Chair.

අ. භා. 6.45

**අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයේ, කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා [ජී. ජේ. පාරිස් පෙරේරා මයා.] මූලාසනාරූඪ විය.**

*அதன் பிறகு, உப சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் [திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா] தலைமை தாங்கினார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. G. J. PARIS PERERA] *took the Chair.*

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි අපේ ආර්ථික ප්‍රශ්න විසඳන්න කටයුතු කරන අවස්ථාවලදී අපේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව විපරම් කර බැලීමත් අපේ යුතුකමක්. අපට හැඟෙන හැටියට, විදේශ ආධාර ලබාගැනීමේදීත් වෙළහෙළඳාම් කට යුතු කරගෙන යෑමේදීත් අප ඉතාමත් ප්‍රවේසමෙන් කටයුතු කළ යුතුව තිබෙනවා. එම නිසා "හාපර්ස්" නැමති සඟරාවෙ පළ වී තිබෙන එක ලිපියක කොටසක් කෙරෙහි මේ ආණ්ඩුවෙ අවධානය යොමු කිරීමට මා අදහස් කරනවා. එය මෙසේයි:

"Harper's magazine
Larry L. King on

Rockefeller
Stravinsky on

Stravinsky
Jules Feiffer on
L B J

Caricatured
and reviews by
William Styron and
John W. Aldridge

Nearly all of the important nations of Southeast Asia and the Pacific are supporting our effort in Vietnam, either actively or tacitly—a fact that critics of the Administration usually ignore. Some, such as Australia, Korea, the Philippines, and Thailand, are contributing men and money. Others, such as Japan and Malaysia, are giving diplomatic support; while India, Ceylon and Indonesia have whispered secret encouragement."

අපට පෙන්වනවා, අපි විරුද්ධය යුද්දෙට කියා, නමුත් රහසින් කියනවා කර ගෙන පලයල්ලා කියා. මේක ඉතා වැදගත් කාරණයක්. ඒ මොකද? මේ විධියේ ප්‍රකාශ අපේ වෙළහෙළදාමට පමණක් නොව, අපේ ආර්ථික ප්‍රශ්නවලටත් බොහෝම තදින් බල පානවා.

මුදල් ඇමතිතුමාගේ විදේශ මුදල් ප්‍රතිපත්තිය ගැන මා තුළ සැකයක් තිබෙන්නේ මේ නිසයි. මෙහෙම කර ලද, මේ විධියේ ප්‍රතිඥා දීලද මේ තරම් විශාල ආධාර මුදල් හා ණය මුදල් ගන්නේ? "Harper's Magazine." ලෝක ප්‍රසිද්ධ සඟරාවක්. 14 වන පිටුවෙන් මා කියෙව්වෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

මං සිතුවේ තමුන්නාන්සේලා ඇමරිකන් සඟරාවල තිබෙන දේවල් විශ්වාස නො කරනවාය කියායි.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ඉරාකය පිළිබඳව ඇතිවූ සිද්ධියක් මට මතකයි. ලංකාවේ පත්‍රයක පළවූ ප්‍රවෘත්තියක් ගැන එක්තරා නිලධාරියකු ඉරාකයේ ප්‍රධානියාට දන්වා යැව්වා. ඉස්රායෙල්-අරාබි යුද්ධය සම්බන්ධයෙන් ලංකාව කෙලින්ම ඉස්රායෙල් පැත්ත ගන්නවාය කියායි ඔහු ඉරාකයේ ප්‍රධානියාට වාර්තා කළේ. ඒ අවස්ථාවේදී කථාවක් කරන අතර තුර මා ඒ කාරණය ගරු අගමැතිතුමාට පෙන්වා දුන්නා. ඒ අවස්ථාවේදී එහෙම එකක් නැත කියා තත්ත්වය පැහැදිලි කරන ලෙස ඉරාකයේ තානාපතිතුමාට තමා නියෝගයක් යැව්වාය කියා ගරු අගමැතිතුමා කිව්වා. පසුව එහෙම කළත් අර ප්‍රවෘත්තිය නිසා සිදුවුණේ අපේ තේ වෙළඳ පොළ ඇහිරී යාමයි. ඒවාගේ තමුන්නාන්සේලා මේ දුප්පත් අපත් ඇදා ගෙන ලංකාව තොල් මතුරමින් ඒ අයට ආධාර දෙනවාය කියා ප්‍රචාරය වුණාම තමුන්නන්සේලාට පමණක් නොවෙයි අපටත් ඒක සහගහනව. අනාගත පරම්පරාවටත් ඒක සහගහන්නට ඉඩ තිබෙනවා.

"They are not behaving like this out of devotion to the United States, or to the independence of South Vietnam. They are supporting us now because they expect our help if they get into trouble."

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

If we get into trouble.

සිරිමාවෝ බණ්ඩාරනායක මිය.
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Bandaranaike)

You are in trouble; economically you are in trouble.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

මුදල් ඇමතිතුමාගෙන් මා අසන ප්‍රශ්නය මේකයි. මා දන්නා හැටිය 1969 දී විදේශාධාර වශයෙන් ලක්ෂ තුන් දහසක් ගත්තත් ඒක මදි ගෙවන්නට තිබෙන ගෙවීම්වලට. එහෙම නම් මේ තරම් විශාල වශයෙන් තමුන්නාන්සේලාට විදේශාධාර දෙන්නේ මොන රක්ෂණයක් උඩද? මේ තරම් විශාල වශයෙන් භාණ්ඩාධාර, විදේශාධාර දෙන්නේ මොන රක්ෂණයක් උඩද? ඒකයි මා අසන ප්‍රශ්නය. ඇත්ත වශයෙන්ම මේක භයානක තත්ත්වයක්. මේක සිනහවෙන් අමතක කළ හැකි ප්‍රශ්නයක් නොවෙයි. මෙවැනි වැදගත් ඇමරිකන් සඟරාවක මේ ආකාරයට අප ගැන සඳහන් වෙනවා නම් නියම තත්ත්වය පැහැදිලි කර දීම අගමැතිතුමාගේ යුතුකමක්. අපේ මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තිය මේකය, අප එක් පැත්තකට බරවී වැඩ කරන්නේ නැත කියා කරුණු පැහැදිලි කිරීම අගමැතිතුමාගේ යුතුකමයි. එමනිසා රටේ තත්ත්වය ආරක්ෂා කර ගැනීම පිණිස මා ඉතා ඕනෑකමින් ඉල්ලීමක් කරනවා. මෙවැනි අවස්ථාවලදී අපේ ප්‍රතිපත්තිය පිළිබඳව ප්‍රසිද්ධ ප්‍රකාශන නිකුත් කරන්න. අප්‍රසිද්ධියේවත්, රහසින්වත් එවැනි ධෛර්යයක් අප නොදෙනවාය කියා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්න.

ග්‍රාමීය ණය ගැනත් වචනයක් දෙකක් කිවයුතුව තිබෙනවා. ග්‍රාමීය ණය පිළිබඳව පවතින තත්ත්වය ගැන ගරු ඇමතිමාවත් හරියට දන්නේ නැහැ. ඇමතිවරයකු වශයෙන් සිටින විට සෑම කාරණයක් පිළිබඳවම සම්පූර්ණ විස්තර ඇනගතන්ට අවස්ථාවක් ලැබෙනවාය කියා මා කියන්නේ නැහැ. සමහර විට විරුද්ධ පක්ෂයේ අපට ඇමතිවරයකුට වඩා අවස්ථා ලැබෙනවා. ග්‍රාමීය ණය පිළිබඳව පවතින තත්ත්වය ඉතාම භයානකයි; ඉතාම අසතුටුදායකයි. ග්‍රාමීය ණය ගැන විස්තරයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාවේ 105 වන පිටුවේ පළ වෙනවා. මේකේ තිබෙන හැටියට නම් ගම්බද ජනතාවට සෑම පහසුකමක්ම සලස්වා දී තිබෙනවා. ඒ වාගේම ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය කථාවේ සඳහන් කර තිබෙන විධියටත් ගම්බද


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
ජනතාවට කිසිම අඩුපාඩුවක් නැතිව සියලු ම පහසුකම් සලස්වා දී තිබෙනවා. නමුත් ඇත්ත වශයෙන්ම සිද්ධ වී තිබෙන්නේ කුමක්ද? මේ ණය හරියාකාරව ලැබෙන්නේ නැහැ. ඒ වාගේම දී තිබෙන ණය ආපසු අයකර ගැනීමට ප්‍රයත්නයක් දරන්නෙත් නැහැ. එමනිසා සිද්ධ වී තිබෙන්නේ කුමක්ද? මහජන බැංකුවටත් විශාල පාඩුවකට මුහුණපාන්නට සිද්ධ වී තිබෙනවා. මහජන බැංකුව දැන් හුඟක් දුරට අඩ පණවෙලයි තිබෙන්නෙ. ළඟදී ඒ සම්බන්ධයෙන් පියවර දෙක තුනක් ගත්තා. මහජන බැංකුවට තිබුණු ගිණුම් අනික් බැංකුවලටත් දී තිබෙනවා. එයින් එක්තරා විධියක අමාරුවකට මහජන බැංකුවට මුහුණ පාන්නට සිදු වුණා. ඒ අතරතුර ඉඩම් බේරීමේ දෙපාර්තමේන්තුව රජයේ උගස් බැංකුවට දුන්නා. එතකොට පාඩු දෙකයි. ඒ අතර තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවෙන්දෝ චක්‍ර ලේඛයක් යවා තිබෙනවා, සංස්ථාවල ගිණුම් සියල්ලක්ම ලංකා බැංකුව දෙන්න ඕනෑය කියා. ගරු මුදල් ඇමතිතුමා ඔළුව වැනුවාට ඇති වැඩක් නැහැ. සිදු වන්නේ කුමක්ද කියා එතුමා දන්නෙ නැහැ. සංස්ථාවල සියලුම ගිණුම් ලංකා බැංකුවට දෙන්නය කියා චක්‍ර ලේඛයක් යවා තිබෙනවා. මේ අනුව මහජන බැංකුවට තුන් පැත්තකින් පහර වැදී තිබෙනවා. ඒ අතර තමුන්නාන්සේ නියෝග කර තිබෙනවා, සමූපකාර සමිතිවලට ණය දීම ආදිය හැම බැංකුවකින්ම කළ හැකිය කියා. එහෙත් අද වන තෙක් මහජන බැංකුවෙන් හැරෙන්න වෙන කිසිම බැංකුවකින් සමූපකාර සමිතිවලට ශතයකවත් ණයක් දීලා නැහැ. ඒ ඇයි? ලොකු ව්‍යාපාරිකයන්ට තමයි, ලොකු ව්‍යාපාරිකයන් ආධාර කරන්නේ. මහජන බැංකුව ඇති කළේ පෙඩි ව්‍යාපාරිකයන්ට හරියාකාර ගනුදෙනු කිරීමට අවස්ථාවක් නැති නිසයි. ගරු අධ්‍යාපන ඇමතිතුමා කොයි තරම් හොඳ අධ්‍යාපනයක් දුන්නත් මහජන **බැංකුවටත්** තට්ටු වී තිබෙන බව එතුමාට මතක් කරන්නට කැමතියි.

මහජන බැංකුවට තීප අතකින් පහර වදිනවා. මහජන බැංකුව විසින් දී තිබෙන ණයවලින් ආපසු ලැබෙන්නේ බොහොම ටිකයි. මහජන බැංකුව ණය දෙන්නේ මොන කොන්දේසි උඩද යන්න මුල්කිරිගල ගරු මන්ත්‍රීතුමා (ජෝර්ජ් රාජපක්ෂ මයා.) විසින් පැහැදිලි කරන්නට යෙදුණා. ඒක භයානක එකක්. යම්කිසි අමාරුවක් ඇති වුණොත් අප සියයට හැත්තෑපහකට ඇප වෙනවා කියා ආණ්ඩුව කියනවා එහෙම කිව්වට, අනික් බැංකුකාරයන් ගරු මුදල් ඇමතිතුමාට කීකරු වන්නේ නැහැ. බැංකු කියන විධියටයි, මේ ආණ්ඩුව නටන්නෙ. බැංකු නටන්නෙ නැහැ, තමුන්නාන්සේලා කියන විධියට. විදේශ බැංකු, ලංකා බැංකුව, මුදල් ඇමතිතුමා කියන දේ අහන්නෙ නැහැ. එතුමා යටතේ සිටින මහජන බැංකුවේ නිලධාරීන් පමණයි, එතුමා කියන දේ අහන්නේ. වගා ව්‍යාපාරය සඳහා ණය දෙන්නට ඒ අයට බලකිරීමක් තියෙනවා. එහෙත් ඒ ණය ආපසු ලැබෙන්නෙ නැහැ. මිනිසුන්ට නිකම් මුදල් ලැබෙනවා නම් අපේ අකමැත්තක් නැහැ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
**(The Hon. Wanninayake)**
ණය ආපසු ලැබෙන්නෙ නැතැයි කීම වැරදියි.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
**(Mr. Ilangaratne)**
ආපසු ලැබෙන්නෙ බොහොම ටිකයි.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
**(The Hon. Wanninayake)**
කව්ද එහෙම කියන්නෙ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
**(Mr. Ilangaratne)**
තමුන්නාන්සේලාගේ ගණන් හිලව් වලින්ම මම ඒක පෙන්වන්නම්. මේ පිළිවෙළටයි ගණන් පෙන්වා තිබෙන්නේ: 1967-68 මහ කන්නයට ණය දීම සඳහා අනුමත කළ මුදල රුපියල් 8,40,35,841.69 යි. වෙන් කර තිබෙන මුදල රුපියල් 7,68,18,281.38 යි. තමුන්නාන්සේලා ගණන් පෙන්වන විට පෙන්වන්නෙ මේ ඉතුරුව තිබෙන දෙකෝටි අට ලක්ෂයක පමණ මුදලත් ආපසු ලැබුණු ණය හැටියටයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
**(The Hon. Wanninayake)**

නැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
**(Mr. Ilangaratne)**

නැහැ කියන්න එපා ගිහින් සොයා බලන්න. වරදක් පෙන්වා දුන්නාම ගරු කම්කරු ඇමතිතුමාත් ඔහොම කරනවා. මෙතැනදී නැහැ කියා පසුව වෙනස් කරන වා. සම් භාණ්ඩ සංස්ථාව අප විවේචනය කළ අවස්ථාවකදී කිව්ව, සම්පූර්ණයෙන්ම සංස්ථාව නිපදවන සපත්තු තොගය කලම්බු ඒජන්සි නමැති ආයතනයට දෙන වා කියා. කර්මාන්ත ඇමතිතුමා ඒ අවස්ථාවෙ නැඟිටල කිව්ව, නැහැ, එහෙම එකක් නැහැ කියා.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
**(Mrs. Sirimavo Bandaranaike)**

බෙරිහන් දුන්න.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
**(Mr. Ilangaratne)**

ඒ විතරක් නොවෙයි, යටියන්තොට ගරු මන්ත්‍රීතුමාව (ආචාර්ය එන්. එම්. පෙරේරා) නොයෙක් විවේචනවලටත් ලක් කළා. ඒ මැයි මාසයේදීයි. ජූනි මාසයේ ගිහින් නිලධාරීන් කැඳවා බැලුවාම කාරණය ඇත්ත බව පෙනී ගියා. කලම්බු ඒජන්සිය ට සපත්තු ඒකාධිකාරිය දී තිබෙන බව පෙනී ගියා. ආණ්ඩුවේ සංස්ථාවක් නිෂ්පා දනය කරන මේ සපත්තු ලබා ගන්න කෙලවරක් නැතිව වෙළඳුන් බලා ඉන්න වා. මෙතැනදී නැහැයි කියල ගෙදර ගිහින් හරිගැස්සුවා. ඒ නිසා නිකම්ම නැහැ නො කියා කරුණාකර මේ ගැන විභාග කර බලා සදොස් තැන් තිබෙනවා නම් නිදොස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

මා කලින් කියෙව්වෙ මහ කන්නයේ දුන් ණය ගැනයි. යල කන්නය සඳහා ණය දෙන්න අනුමත කර තිබෙනවා, රුපි යල් 1,40,94,689.39ක්.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
**(The Hon. Wanninayake)**

කවුද ඕක ලියල දුන්නෙ? එක්කො මහ ජන බැංකුවෙ වාර්තාවකින් කියවන්න ඕනැ; එහම නැත්නම් අයවැය ලේඛන කථාවෙන් කියවන්න ඕනැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
**(Mr. Ilangaratne)**

මේක බැංකුවේ වාර්තාවක් නොවෙයි. ගරු සභාපතිතුමනි, අපට ඉතා විශ්වාස මාර්ගවලින් ලැබෙන පැහැදිලි වශයෙන් අපට විශ්වාස කරන්ට පුළුවන් ආරංචි ඉදිරිපත් කිරීම අපේ යුතු කමක්. ඒ ගැන විභාග කර ඒක එහෙම නොවෙයි කියන එක තමුන්නාන් සේලාගේ යුතුකම. එහෙම නැතිව මේවා ඔප්පු කරන්න අපට සාක්ෂිකරුවන් අර ගෙන එන්න පුළුවන් කමක් නැහැ. අද නම් වාසනාවකට වගේ මේ ස්ථානයේ ඇමතිවරුන් දෙදෙනෙක් ඉන්නව.

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)**
*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார அலுவல்கள் அமைச்சர்)*
**(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)**

මම මේ හදිසියේ ආවෙ ඔය කථාව අහන්නමයි.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
**(Mr. Ilangaratne)**

බොහොම ස්තුතියි. වෙන දවස්වල කවු රුවත් නැහැ. ගරු නියෝජ්‍ය සභාපති තුමනි, දැන් මේ අයවැය විවාදය සිදුවන පිළිවෙලට මට හිතෙනවා, "මොනවටද මෙච්චර ආසන. තමුන්නාන්සේග් ආසන යයි; කථා කරන නැනැත්තාට ආසනය තුයි තිබුණොත් ඇති" කියා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
**(The Hon. Iriyagolle)**

සියක් නම් හොඳටම ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
සියක් ඕනෑ නැහැ; දෙකක් තිබුණත් ඇති.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
ඒකට අපි ඉස්සරවෙලා ඡන්දය අර ගෙන පස්සෙ කථා කරමු.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
එහෙම තමයි තමුන්නාන්සේලාගේ පක්ෂය ක්‍රියා කරන්නෙ.

සිරිමාවෝ බණ්ඩාරනායක මිය.
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Bandaranaike)
ඒකද ප්‍රජාතන්ත්‍රවාදය?

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
ඉස්සරවෙලා රහස් ගිවිසුම් ගහල පසුව ඒක එළි කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ණය දීම සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී මා දීර්ඝ විස්තරයක් කරන්ට යන්නෙ නැහැ. මා අදහස් කරනවා, කාරක සභා අවස්ථා වේදී ඒ ගැන වැඩිදුර සඳහන් කරන්න.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
තමුන්නාන්සෙ කියන්නෙ මොකක්ද?

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
වෙන් කර තිබෙන මුදල දීල නැහැ. ආපසු ලැබුණ මුදල්ය කියන්නෙ නොදී තිබෙන මුදල්.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
කොහොමද නොලැබුණ ඒව ලැබුණ කියන්නෙ?

ගරු රියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
ඒ මිනිසුන්ගෙන් ඇහුවාම කියනවා, ලැබෙනවා කියා.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
දීල තිබෙන මුදල් හරිහැටි ලැබෙන්නෙ නැහැ. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා සාමාන්‍යයෙන් හයයි. නිලධාරීන් සාමාන්‍ය යෙන් හය නැහැ. තමුන්නාසේලා කිකරු කමට එහෙම කරනවා මිස ගණන් සොයා බැලුවොත් එහෙම නොවන බව පෙනෙයි.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
තමුන්නාන්සේ කියන්නෙ මුදල් ලැබුණා කියා බැංකුව බොරු කියනවා කිය ලද?

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
එක අතකින් එහෙම වෙනව නම් මම සන්තෝෂයි.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
මුදල් ආපසු ලැබෙනව නම් සන්තෝෂයි නේද?

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
ආපසු ලැබෙනවාට සන්තෝෂයි. එහෙත් තමුන්නාන්සේලා ඒ ගැන ඇස් කන් පියාගෙන සිටිනවා නම් ඒත් සන්තෝෂයි. දුප්පත් මිනිසුන්ගෙ හාල් පොත් බේරෙන නිසා.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
එහෙම වෙන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

මොකද නැත්තෙ? අම්බලන්තොට හෝ හම්බන්තොට මිනිහෙක් කියා තිබෙනවා, අනේ හාමුදුරුවනේ මගේ ළමයාට කිරි ගන්න වුවමනා නිසා ඒ ළමයාගේ පොත විතරක් ගන්න එපා කියා.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

කුඹුරු පාළු වුණු අයගේ හාල් පොත් ගන්නෙ නැහැ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ණය ආපසු ලබා ගන්නෙ නැහැ කියා එක පැත්තකින් දොස් කියනවා; ණය මුදල් දෙන්නෙ නැහැ කියා තවත් පැත්තකින් දොස් කියනව.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

අසත්‍ය ප්‍රකාශ නොකළ යුතු බවයි මා කියන්නේ. මා කියන දේ මුදල් ඇමතිතුමාට හරි හැටි වැටහුණත් ප්‍රචාරය සඳහා ඔය විධියට කථා කරනවා. කරුණාකර ඇත්ත කියන්න. ගන්නවාද නැද්ද? ගන්නේ නැත්නම් නැ කියන්න. ගන්නවා නම් ඒ බව කියන්න.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

කුඹුරු පාළු වුණු අයගෙන් ගන්නේ නැහැ.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

කිරි පිටි ආදිය ගන්නට තිබෙන නිසා මගේ පුතාගේ පොත පමණක් ඉතිරි කොට අනෙක්වා ගන්නයයි එක්තරා ගැමියකු ඉල්ලා තිබෙනවා. සමහරවිට එවැනි කෙනකුගේ පොත් නොගෙන තිබුණත්, තමුන්නාන්සේලාට පක්ෂපාත, බලතල ඇති උදවිය ඒවා පෙන්නුම් කරනවා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Irivagolle)

අප එවැනි දේවලට ඉඩ දෙන්නේ නැහැ.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

අධ්‍යාපන ඇමතිතුමා පමණ එවැනි දේට ඉඩ දෙන ඇමති කෙනකු තවත් ඇත්තේ නැහැ. කාට හෝ යමක් කර දෙන්නේ ඔහුගේ පාටිය මොකක්ද කියා අහලයි. ඒ ප්‍රතිපත්තිය එතුමා කොයිතරම් දුරට ගෙනයනවාද කියතොත්, ගම්බද ළමයින්ට තැනක් නැති වන විධියටයි ප්‍රතිපත්ති සකස් කරන්නේ. ඉංග්‍රීසි පැලැන්තියට හැම දේම හැඩ ගස්සන්නයි එතුමා සූදානම් වන්නේ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ගම්බද ළමයින්ටත් ඉංග්‍රීසි උගන්වන්නයි මා ලැස්ති වන්නේ.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

බදුල්ලේ මන්ත්‍රීතුමා (බී. එච්. බන්ඩාර මයා.) කිව්වේ මොකක්ද?

ගරු රියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

පට්ට පල් බොරුවක්. මම ඒකට උත්තර දෙන්නම්.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

තමුන්නාන්සේ මෙතැන ඉන්නේ නැහැනේ. කොහොමද උත්තර දෙන්නේ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

කතා සේරම මා කියවනවා. පළාතක වත් නොසිටි මිනිහෙක් බොරුවක් කෙළලා තියෙනවා. ඡන්ද බලාපොරොත්තු වන කෙනකු පිටිසර පළාතකට ගිහින් ඔය විධියට කථා කරයිද? කෙනකු එහෙම කථා කරනවා නම් ඒ මිනිහා මහ මෝඩයෙක්.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කර්මාන්ත ඇමතිතුමා විසින් කර තිබෙන විවේචනයක් ගැන ඊළඟට මා වචනයක් කියන්නට ඕනෑ. එතුමාගේ කථාවේ සෑම කොටසක් ගැනම මා කථා කරන්නට අදහස් කරන්නේ නැහැ. කවුරුන් විසින් කවුරුන් පාවා දුන්නාද යන්න ගැනවත්, එතුමා සඳහන් කළ නොයෙක් වාද ගැන වත් මා කරුණු කියන්නේ නැ. ඒවා ගැන දන්න උදවිය ඒවාට පිළිතුරු දෙනවා ඇති.

මා යමක් කියන්නට අදහස් කරන්නේ කර්මාන්ත ඇමතිතුමා යටතේ තිබෙන සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ වැඩ පිළිවෙළ ගැනයි. ඇමතිතුමාගේ අසමර්ථකමේ බර කම්කරුවන් හා සේවකයන් පිට දැමීමේ ප්‍රකාශයක් ඇමතිතුමා විසින් කර තිබෙනවා. 1968 අගෝස්තු මස 10 වැනිදා හැන්සාඩ් වාර්තාවේ 208 වැනි තීරුවෙහි එම ප්‍රකාශය මෙසේ සඳහන් වෙනවා.

"But I must say this, Sir: the quality of the material turned out has deteriorated because of the incentive bonus that we are giving to the workers."—

පරස්පර විරෝධි කථාවක්.

—"That is, people are only interested in producing quantity. If they produce quantity they get a higher bonus. As a result, quality has come down. I have examined this question very carefully and we propose to go into this again and see that quality also is improved."—(OFFICIAL REPORT, 10th August 1968; Vol. 80, c 208.)

මට ලැබී තිබෙන ආරංචියේ හැටියට නම් මෙය, තම අසමර්ථකම සංස්ථාවේ සේවකයන් පිටින් යන්නට ඇමතිතුමා කළ ප්‍රකාශයක්. අපට දැන ගන්නට තිබෙන හැටියට සංස්ථාවේ කටයුතු ඉතාමත් අසතුටුදායකයි. "ඒ" ග්‍රේඩ් හා "බී" ග්‍රේඩ් යනුවෙන් හම්වල කොටස් දෙකක් ඉස්සර තිබුණා. "ඒ" ග්‍රේඩ් හම් දාහකුත් "බී" ග්‍රේඩ් හම් පන්දාහකුත් සංස්ථාව ගත්තවා. මේ ආණ්ඩුව ආවාට පසු මොකද වුණේ? කර්මාන්ත ඇමතිතුමාගේ දේශපාලන මිත්‍රයකු මෙම සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කරනවා. නමුත් නාන්සේලා සංස්ථාවලට දේශපාලන හිතවතුන් නොදැමුවත් මෙම සංස්ථාවට, බැරිවීමකින් කෙනකු වැටී තිබෙනවා. ඔහුට ඕනෑකම තිබෙනවා, සංස්ථාවේ වැඩ හුඟක් දියුණු බව ඇමතිතුමාට පෙන්වන්නට. "ඒ" ග්‍රේඩ් එකට ගෙවන්නේ ශත 60 යි. "බී" වර්ගයේ හම් හාර දහසක් "ඒ" වර්ගයට ඇතුළත් කර ශත 60 ගණනේ ගෙවා ගන්නවා. මේ නිසා "බී" වර්ගය ඉතුරු වෙනවා. "ඒ" වර්ගයෙන් හදන සපත්තු නමයි විකුණන්නේ. සපත්තුවල තත්ත්වය පහත බැස තිබෙන්නේත් මේ කාරණය නිසයි. එහි සේවක පිරිස් පැමිණ මේ කාරණා අපට කියනවා. එහෙත් එම සේවක පිරිසට ඉස්සර මෙන් ඇමතිතුමා ළඟට දැන් යන්න පුළුවන්කමක් නැහැ. සංස්ථාවේ අධ්‍යක්ෂතුමා ළඟට නම් ඒ තරම්වත් ළං වන්න බැහැ. "බී" වර්ගයේ හම්වලින් සපත්තු සාදන නිසා තත්ත්වය තවත් පහළ යනවා. අපට ලැබී ඇති ආරංචිවල හැටියට ඉස්සර පිටරටින් ගෙන්වූයේ ඉතාම හොඳ හම් වර්ගයක්. මට නම් හම් ගැන එතරම් දැනුමක් නැහැ. කොහොම වුණත් දැන් පිටරටින් ගෙන්වන හම් "බී" වර්ගයේ හම් වාගෙයි. මෙයින් සිදු වී තිබෙන්නේ මොකක්ද? සපත්තු ප්‍රමාණයෙන් වැඩි වුණත් තත්ත්වයෙන් පහත වැටී තිබෙනවා. අධ්‍යක්ෂ මණ්ඩලයට ඒවායේ තත්ත්වය ආරක්ෂා කර ගැනීමට වුවමනාවක් නැහැ. එපමණක් නොවෙයි, සපත්තු මිලත් වැඩි වී තිබෙනවා.

කලම්බෝ ඒජන්සිස් සමාගමට නිෂ්පාදනය කරන සපත්තු තොගය දීම වැරදි වැඩක් බව පෙන්වා දුන් විට ඇමතිතුමා එය නැතැයි කලින් කීවා. නමුත් එය කළ බවට සාධක තිබෙනවා. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) එදා පෙන්නා දුන්නා සංස්ථාවට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අයත් වැන් රථයක් එම සමාගමේ වෙළඳ කටයුතු සඳහා ප්‍රයෝජනයට ගන්න බව. වැන් රථයේ අංකය 33 ශ්‍රී 6075 යි. එහි වැඩ කරන්නේ සංස්ථාව යටතේ සේවය කරන ඕෆ්පන් කියන මහත්මයෙක්. ඔහුට එම ඒජන්සිය යටතේ වැඩ කරන්න ඉඩ දී තිබෙනවා. මෙම වැන් රථය ජූනි මාස යේ 18 වනදා සිට ජූලි මාසයේ 18 වනදා දක්වා කාලය තුළ දී සැතපුම් 1,817 ක් ධාවනය කර තිබෙනවා.

එක් අතකින් සපත්තුවල තත්ත්වය පහත වැටී ඇති අතර අනික් අතින් මිලද වැඩි කර තිබෙනවා. එසේ කළේ රුපියලේ අගය සියයට විස්සකින් පහත දැම්ම නිසා ද නැති නම් විදේශ විනිමය සියයට 45 කින් වැඩි වුණු නිසාද කියන්න අප දන් නේ නැහැ. එස්. 1 කියන සපත්තු වර්ගය, මෙම ආණ්ඩුව බලයට පත් වෙන්න පෙර රු. 32.75 යි. මේ ආණ්ඩුව ආවාට පස්සේ එය රු. 33.80 කළා. 1967 නොවැම්බර් මාසයේ 15 වනදා සිට නැවත වරක් රු. 34.75 දක්වා වැඩි කළා. ඒ වාගේම 64 සී කියන සපත්තු වර්ගය තමයි වැඩියෙන් අලෙවි වන්නේ. සමහර විට වැඩියෙන් අලෙවි වන නිසාද දන්නේ නැහැ, දැන් එම වර්ගය වැඩියෙන් සාදන්නේ නැත් තේ. හේතුව මට තර්කානුකූලව මොකක් දැයි කියන්න බැහැ. ඉස්සර සපත්තුවල මිල නියම කරන්නේ අනික් සපත්තු හා සංසන්දනය කර බලා ඒ අනුවයි. එහෙම නොවෙයි දැන් කරන්නේ, නිලධාරීන් තමන්ට කැමැති කැමති අන්දමට මිල ගණන් නියම කරනවා. මෙබඳු භයානක අයහපත් තත්ත්වයකට සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය පරිවර්තනය වී ඇති බවයි එහි සේවකයන් අප හමු වීමට ඇවිත් කියන්නේ.

එපමණක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතා භයානක තත්ත්ව යක් වෘත්තීය සංගම් තුළ ඇති වේගෙන යන බව පෙනී යනවා. මේ ආණ්ඩුව, නො යෙකුත් අන්දමේ බලතල පාවිච්චි කරමින්, හදිසි නීතිය වැනි දරදඬු නීතිවල අනුස සින්, නොයෙකුත් විධියේ පලි ගැනීම් වලින් වෘත්තීය අයිතිවාසිකම් යටපත් කරගෙන පාලනය ගෙන යන බව පෙනෙ නවා. මහජනතාව ඒ නිසයි මළක් තිශ් ශබ්දව සිටින්නේ. එහෙම කරමින් තමයි ශක්තිමත් ආණ්ඩුවක්ය කියන්නේ. ඔය ශක්තිය තිබෙන්නේ බොත්තම් තිබෙන තුරු පමණක් බව මතක් කර දෙන්න කැමතියි. බොත්තම් ගැළ වුණු දාට ඔය ශක්තිය නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
**(The Hon. Iriyagolle)**
කාගෙත් එහෙමයි.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
**(Mr. Ilangaratne)**
එම නිසා බොත්තම් පරිස්සම් කර ගන් නයි ඒ අයට අද සිදු වී තිබෙන්නේ. සමහර විට ඔය බොත්තම් ගලවා බලයෙන් පහ කරන්නත් බැරි නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
**(The Hon. Iriyagolle)**
ඇයි තමුන්නාන්සේලාට බොත්තම් නැද්ද ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
**(Mr. Ilangaratne)**
තමුන්නාන්සේට නම් තිබෙන්නේ සිප්පි බොත්තම්.

අද වෘත්තිය සමිතිවලින්, තමන්ගේ අයිතිවාසිකම් ඉල්ලමින් නොයෙකුත් අන්දමේ උද්ඝෝෂණය පවත්වනවා. තමුන්නාන්සේට මතක ඇති 1965 සිට මේ වන තෙක්ම කම්කරු ඇමතිතුමා විසින් කියන්න යෙදුනා, සංස්ථාවලින් එහෙම නැත්නම් පුද්ගලික ආයතනවලින් ලැබෙන ලාභය ඒ ඒ ආයතනවල වැඩ කරන සේවකයින් අතර බෙදා දෙනවාය කියා. නමුත් මේ අයවැය ලේඛනයේ නම් එය සඳහන් වන්නේ නැහැ. මා හිතන හැටි යට මුදල් ඇමතිතුමාත් රාජ්‍ය ආමතිතුමාත් දන්නවා ඇති ඒ මොන හේතුවක් නිසාද කියා. ලෝක බැංකුව විසින් කියන්න ඇති "මොහමඩ් මහතා කරන්න යන්නෙ ඔය මොන තරම් මෝඩ වැඩක්ද? ඕවා කරන්න ඉඩ දෙන්න එපා " කියා. තමුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

නාන්සේලා මහ ලොකුවට කටට ආ පළියට කිව්වත් දැන් තත්ත්වය එහෙමයි. තමුන්නාන්සේලා 1966 දී අයවැය ලේඛනයෙන් කිව්වා, හැම ගෙදරටම ටෙලිවිෂන් ලබා දෙනවාය කියා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
**(The Hon. Wanninayake)**

ඒකත් හරියටම මඟුල් පෝරු දෙනවාය කිව්වා වාගේ තමයි.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
**(Mr. Ilangaratne)**

මඟුල් පෝරු දුන්නත් "ටෙලිවිෂන්" නැතිව බලන්න බැහැ නේ. ඒ වගේ දැන් කම්කරු ඇමතිතුමාට කලින් කිව්ව දේ අමතක වෙලා වගෙයි. එහෙම අමතක වුණ දේවල් අපි මතක් කර දෙන විට තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ? ඊටත් වඩා තද නීති රීති දමා ගෙන යනවා. මේ වර රාජාසන කථාවෙන් කියා තිබෙන්නෙ මොකක්ද? වෘත්තීය සමිති පිළිබඳ එක්තරා කොමිටියක් පත් කළාලු. ඒ කොමිටියේ වාර්තාවෙන් පෙන්නුම් කරන කරුණු ක්‍රියාත්මක කරන්න යනවාලු. මා කියන්න කැමතියි, මේ සම්බන්ධයෙන් දැනටමත් වෘත්තීය සමිතිවල විරෝධය පළ කර තිබෙන බව. 1956 ට කලින් තිබුණ තත්ත්වයටත් වඩා දරදඬු තත්ත්වයක් ඇති කිරීමටයි දැන් තමුන්නාන්සේලා සූදානම් වන්නෙ. ගරු රාජ්‍ය ඇමතිතුමාටත් මතක ඇති වෘත්තීය සමිති අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා 1947 පමණ කාලයේදී කොයි තරම් සටන් කළාද කියා. ඊට පසු 1956 දී එක්තරා අන්දමක විප්ලව රාශියක් ඇති කර වෘත්තීය සමිති අයිතිවාසිකම් ලබාගත්තා. නමුත් දැන් තමුන්නාන්සේලා මොකක්ද කරන්න යන්නෙ? තමුන්නාන්සේලා පසුගිය මැතිවරණ කාලයේදී කිව්වා, රජයේ සේවකයන්ටත් දේශපාලන අයිතිවාසිකම් ලබා දෙනවාය කියා. දැන් ඒවා තමුන්නාන්සේලාට මතක නැහැ. වෘත්තීය සමිති අයිතිවාසිකම් ලබා දෙනවාය කිව්වා. ඒ විධියට කිව්ව තමුන්නාන්සේලා දැන් කරන්නේ තිබුණ අයිතිවාසිකම් පවා අඩපන කර දැම්මයි. රාජ්‍ය ඇමතිතුමා විසින් දැන් හුඟක් දුරට එය ක්‍රියාත්මක කර අවසානයි. සතොස ආයතනයේ සිටි අයට වෘත්තීය සමිති අයිතිවාසිකම් තිබුණා, දේශපාලන අයිතිවාසිකම් තිබුණා. ඊටත් වඩා අයිතිවාසිකම් ලබා දෙනවාය කිව් අය දැන් කරන්නේ තිබුණ අයිතිවාසිකම් පවා නැති කර දැම්මයි. දැන් තමුන්නාන්සේලා කියනවා සතොස ආයතනයේ සේවකයන් පවා රජයේ සේවකයන් වශයෙන් සලකනවාය කියා.

කම්කරු ඇමතිතුමා විසින් කොමිටියක් පත් කළා. ඒ මගින් නිර්දේශයක් නිකුත් කර තිබෙනවා. මේ පත් කිරීම් කළේ කවුරුන් විසින්ද කියා මා දන්නේ නැහැ. සමහර විට කම්කරු ඇමතිතුමාගේ පුද්ගලික ලේකම්තුමා වෙන්න ඇති. රැකීරක්ෂා කාර්යාලය භාරව සිටින්නෙත් එතුමායි. ඒ නිසා එතුමාට කියාම මෙයත් කරවන්න ඇති. කෙසේ වුණත් මේ නිර්දේශයන් ගැන රාජ්‍ය ඇමතිතුමා හොඳට කල්පනා කර බලන්න. වෘත්තීය සමිතිවල තිබෙන සාමය ආරක්ෂා කර ගන්න නම් මේ වගේ දරදඬු නීති රීති ඇති කරන්න එපා කියා මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

තමුන්නාන්සේලා රුපියලේ අගය අඩු කිරීමෙන් ජීවන වියදම වැඩි කළා. ඊළඟට විදේශ විනිමය සහතික පත්‍ර වෙන්දේසියේ විකිණීමට සැලැස්වීමෙන් සියයට 45 කින් ජීවන වියදම වැඩි කළා. ඒ ක්‍රමය නිසා, සාධාරණ මිලකට බඩු ගෙන්වුවත් රුපියල් 100 භාණ්ඩය රුපියල් 180 තෙක් ඉහළ යනවා. රුපියල් 100 භාණ්ඩයට රුපියල් 180 ක් පමණ ගෙවන්න සිදු වෙනවා. ජීවන වියදම ඔය විධියට ඉහළ යනවා. ඊළඟට භාෂා අයිතිවාසිකම් ලැබිය යුතු අයට ලැබෙන්නෙ නැහැ. හදිසි නීතිය නිසා, මිනිස් අයිතිවාසිකම් ලැබෙන්නේ නැහැ. එහෙමත් කළ තමුන්නාන්සේලා දැන් ජනතාවගේ බඩටත් අනින්නයි සූදානම් වන්නෙ. ඒ අයගේ අත කටත් වහන්නයි සූදානම් වන්නෙ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා අද දැක්කා විශාල පෙළපාලියක්. කම්කරු ඇමතිතුමාගේ නිර්දේශවලට විරුද්ධවයි ඒ අය පෙළපාලි යන්නෙ. ඒ අයට වෙන කරන්න පුළුවන් දෙයක් නැහැ. මේ වගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දරදඬු නීති ඇති කරන්න එපාය කියා ඒ අය පෙළපාලි යනවා. රාජ්‍ය ඇමතිතුමා කියා තිබෙනවා 1956 දී තිබුණ එක්සත් ජාතික පක්ෂය නොවෙයි දැන් තිබෙන්නෙ කියා. දැන් තිබෙන්නේ සමාජවාදී එක්සත් ජාතික පක්ෂයක් ලු. එදා කිව්වේ එහෙමයි. කම්කරු ඇමතිතුමා නම් කියන්නේ "අපි සමාජවාදී ධනවාදී පක්ෂයක්" කියායි. එහෙත් එදා රාජ්‍ය ඇමතිතුමා ඊටත් වඩා ඉස්සරහට ගියා. "දැන් තිබෙන්නේ ප්‍රගතිශීලී එක්සත් ජාතික පක්ෂයක්. දැන් තිබෙන්නේ ඉස්සර තිබුණු එක්සත් ජාතික පක්ෂය නොවෙයි." යනාදී වශයෙනුයි, එතුමා එදා කීවේ. ඒ විධියට කියා බලය ලබාගෙන මේ විධියට හැම පොරොන්දුවක්ම කඩා එයින් නොනැවතී එදා මහජනයාට තිබුණු අයිතිවාසිකම් පවා පැහැර ගන්නවා නම් එය කාටවත් ඉවසන්නට පුළුවන් දෙයක් නොවෙයි. ඒ නිසා ආර්ථික අතින් ගහන ආකාරයටම මිනිස් අයිතිවාසිකම්වලටත් නොගහන ලෙසට මා ඉල්ලා සිටිනවා.

මීට ඉස්සර නම් අයවැය ලේඛන ඉදිරිපත් කරන අවස්ථාවලදී ගරු මුදල් ඇමතිතුමා මීට වඩා අවංක වුණා. "අයවැය පියවන්නේ මේ විධියට මේ ආයතනවලින් ණය අරගෙනයි" යනුවෙන් එදා නම් එතුමා කීවා. එහෙත් මේ වර එවැන්නක් කියා නැහැ. රක්ෂණ සංස්ථාවෙන්, තෙල් සංස්ථාවෙන්, සේවක අර්ථසාධක අරමුදලෙන්, අප පිහිටුවන ලද කර්මාන්ත 430 න් කොච්චර මුදල් ගෙන මේ අයවැය පියවන්නවාදැයි මේ වර කියා නැහැ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
**(The Hon. Wanninayake)**
ණය ගන්න බව කියා තිබෙනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
**(Mr. Ilangaratne)**
ඒ වුණාට අසුවල් අසුවල් ආයතනවලින් ණය ගන්නවා යයි කියා නැහැ. මීට පෙර නම් අසුවල් අසුවල් සංස්ථාවෙන් මේ මේ තරම් ගන්නවා යයි කීවා. අයවැය කථාව පටන් ගැනීමේදී මෙතෙක් ගත් ඒවා ගැන කියනවා මිස ගන්නට බලාපොරොත්තු වන ඒවා ගැන කියන්නේ නැහැ. එක අතකින් බලනවිට දැන් සංස්ථා නැහ.

දැන් සළුසලට සිදු වී තිබෙන්නේ මොකක් ද? රෙදිවල රේගු ගාස්තු අඩු කරන බව කීවා. යාරයකට ශත 25 ක් අඩු කරන බව කීවා. එහෙත් දැන් සිදු වී තිබෙන්නේ මොකක් ද? රෙදි මිළ අඩු කරන බව කියමින් ඇත්තෙන්ම රෙදි මිළ වැඩි කර තිබෙනවා. සළුසලට මේ මොනවා වෙලා ද? ක්‍රමයක් වශයෙන් නම් අප මොනම ක්‍රමයකටවත් විරුද්ධ නැහැ. කර්මාන්ත ඇමතිතුමාගේ ධනපති සමාජවාදයට හෝ ප්‍රගතිශීලී සමාජවාදයට හෝ වෙන මොන වාදයකට හෝ ක්‍රමයක් වශයෙන් නම් අප විරුද්ධ වන්නේ නැහැ. අපට වුවමනා කරන්නේ ප්‍රතිඵලයි. සළුසල කාට දුන්නත් අපට කමක් නැහැ. අපට වුවමනා කරන්නේ ඇඳුම්. දැන් ඇඳුමක් ගන්නට කීයක් ඕනෑ ද?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
**(The Hon. Iriyagolle)**
කීයට ගත්තා වුණත් අද විතර හොඳට එදා ඇන්දේ නැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
**(Mr. Ilangaratne)**
ගරු අධ්‍යාපන ඇමතිතුමා ඔය කථාව ඊට පෙරත් කියා තිබුණා. අද විතර හොඳට එදා කෑවේ නැති බවත් කියා තිබුණා. "මේ ස්කෝලෙ විතර ලස්සන ගැහැණු ළමයින් වෙන කොහේදිවත් දැකලා නැහැ" කියාත් එතුමා සඳහන් කර තිබුණා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
**(The Hon. Iriyagolle)**
ලස්සනට ඇඳලා ඉන්නවා දැක්කා. හැම තැනම එක වාගේ ලස්සනට ඇඳලා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
**(Mr. Ilangaratne)**
ගරු ඇමතිතුමා යන දවසට ඒ ඒ ස්ථාන ලස්සන කර තබා ගන්නට ගුරුවරුන්ට නියෝග ලැබෙනවා. මල් පොකුරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

ගේන්නට, පිච්චමල් ගේන්නට, ළමයින් යුනිෆෝම් ඇඳගෙන එන ලෙසට වග බලා ගන්නට, හොඳට පිරිසිදුවට ඇඳගෙන එන ලෙසට වග බලා ගන්නට නියෝග ලැබෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

කලින් දැනුම් දීමක් නැතිව ගිහි හැටියේ ගියත් ඒ තත්ත්වමයි. ඕනෑ නම් අත්තනගල්ලට ගොස් බලන්න.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

උම්මග්ග ජාතකයේ එන මහෞෂධ පණ්ඩිතයන්ගේ කථාවේ එක් කොටසක් සඳහන් වන්නාක් මෙන් හැම නැනම සශ්‍රීක යයි හිතනවා. [බාධා කිරීමක්]

මා මීට වඩා කථා කරන්නේ නැහැ. කිසි කලක නැති විධියට ලක්ෂ 10,000 ක අයවැය හිඟයක් ඇති කර තිබීම ගැන අප ඉතාමත් කනගාටු වෙනවා. ඒ හිඟය පිය වන්නට ලක්ෂ 8,500 ක ජාතික ණය ගන්නා බව සඳහන් කර තිබෙනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

නෑ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

කෝටි 85 ක් ගන්නේ ණයට නොවෙයි ද? තමුන්නාන්සේ කී දේ තමුන්නාන්සේම දන්නේ නෑ. වුවමනා නම් මම ඒ කොටස කියවා දෙන්නම්. මේක කවදාවත් නොසිදුවුණු දෙයක්. ධනපතියන්ට පුළුවන් තරම් දුරට සහන දී තිබෙනවා. මේ පරම්පරාව පමණක් නොවෙයි, හත්මුතු පරම්පරාවම අවුරුදු 25කට ණය කරලයි තමුන්නාන්සේලාගේ ආණ්ඩුව එන්. එම්. අප්පුහාමි උන්නැහේට වැක්වරුත්, ෆ්‍රෑඩන් බර්ග් සමාගමට ටයරත් අරන් දෙන්නේ. ඇයි මේවා කරන්නේ? තමුන්නාන්සේලාට හෘදය සාක්ෂියක් එහෙම තියෙනවා ද? තමුන්නාන්සේලා මේ පරම්පරාව පමණක් ණයට බඳවනවා නම් කොහොමවත් අපට ඒක ඉවසන්නට පුළුවනි. ණය වෙලා කියලත් මොනවාද තමුන්නාන්සේලා කරන්නේ? තමුන්නාන්සේලා ඇති කළ කර්මාන්ත මොනවාද? තමුන්නාන්සේලා මොනවාද නිෂ්පාදනය කරන්නේ? ඒ නිසා, කරුණාකර, පුළුවන් තරම් ඉක්මනින් මැතිවරණයක් පවත්වා සුදුසු රජයක් තෝරා ගැනීමට ජනතාවට ඉඩ ලැබෙන පරිදි පාර්ලිමේන්තුව විසුරුවා හරින ලෙස මා ඉල්ලනවා.

**සී. රාජදුරෙයි මයා.** (මඩකලපුව පළමු වන මන්ත්‍රී)
*(திரு. சி. இராஜதுரை—மட்டக்களப்பு முதலாம் அங்கத்தவர்)*
(Mr. C. Rajadurai—First Batticaloa)

*அக்கிராசனரவர்களே, தேசிய அரசாங்கத்தின் நாலாவது வரவுசெலவுத்திட்ட விவாதத்திலே பங்குபற்றி வரவுசெலவுத் திட்டத்தைப் பற்றியும் எனது பகுதியினைப்பற்றியும் சில வார்த்தைகள் பேசக் கிடைத்தமைக்கு நான் எனது நன்றியைத் தெரிவித்துக்கொள்ள வேண்டியவனாகவிருக்கிறேன். சம்பிரதாயமாக எதிர்க்கட்சியினர், ஆளும் கட்சியினரின் வரவு செலவுத்திட்டத்தைப்பற்றிக் குறை கூறுவது ஜனநாயக நாட்டின் வழக்கமான முறையாகி விட்டது. இந்த ஆண்டு வரவு செலவுத்திட்ட விவாதத்திலே எதிர்க்கட்சியினர் பெரும் அக்கறை காட்டாமல் இருப்பதைப் பார்க்கின்ற பொழுது, அவர்கள் இவ்வரவுசெலவுத்திட்டத்தின் பெரும்பகுதியினை ஏற்றுக்கொண்டுள்ளார்களோ என்ற ஒரு அச்சம் பலருக்கு ஏற்படவே செய்கிறது. கடந்த சில தினங்களாக தேசிய அரசாங்கத்தின் இந்த நாலாவது வரவுசெலவுத் திட்டம்பற்றி உரையாற்றிய எதிர்க்கட்சி அங்கத்தினர்கள் ஆணித்தரமாக, அல்லது நடுநிலைமை நோக்குடையோர் ஏற்றுக் கொள்ளக்கூடிய வண்ணம், இந்த வரவு செலவுத் திட்டத்தைப் பற்றி விமர்சிக்கவில்லையென்பதை நான் வெளிப்படையாகக் கூறவிரும்புகிறேன். இந்த வரவு செலவுத்திட்டத்திலே அதி முக்கியமாக, தேசத்தின் விவசாயத்துறைக்கு ஊக்கமளிக்கின்ற பகுதிகளை நிதி அமைச்சர் சேர்த்திருக்கின்றார். விவசாயப் பகுதியான ஒரு மாகாணத்திலிருந்து வந்தவன் என்ற வகையிலே இவ்வரவுசெலவுத்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

திட்டத்தைச் சமர்ப்பித்த நிதி அமைச்சரவர்களை நான் பாராட்டக் கடமைப்பட்டிருக்கிறேன்.

இலங்கையைப் பொறுத்த அளவில், இலங்கை முற்றிலும் ஒரு விவசாய நாடு என்பதை நாம் நினைவுபடுத்திக்கொள்ள வேண்டும். இயற்கை அன்னை நமக்குக் கொடுத்த வளமான நிலங்களையும் வற்றாத ஜீவ நதிகளையும் கடந்த பல ஆண்டு காலமாக மாறி மாறி வந்த அரசாங்கங்களினால் சரிவரப் பயன்படுத்த முடியாமலிருந்தது ஒரு துர்ப்பாக்கியமான நிலைமையாகும். குறிப்பிட்ட ஒரு சில காலங்களிலே இலங்கையிலே உள்ள ஜீவ நதிகள் பொங்கிப் பெருக்கெடுத்து வெள்ளக்காடாகக் கடலைச் சென்றடைவதையும், சில காலங்களிலே அந்த ஜீவ நதிகள் வரண்டு மணல் மேடுகளாகக் காட்சி அளிப்பதையும் நாம் பார்த்திருக்கிறோம். உரிய நேரத்திலே நீர்ப்பாசனத் திட்டங்கள் பலவற்றை கடந்த கால அரசாங்கங்கள் செய்திருந்த போதிலும் பல நீர்ப்பாசனத் திட்டங்கள் கவனக்குறைவால் கைவிடப்பட்டிருக்கின்றன என்பதை நான் இங்கே சொல்லிவைக்க விரும்புகிறேன்.

இந்த வரவுசெலவுத்திட்டத்திலே புதிய முயற்சிகள் காரணமாக வரியுயர்வு என்ற பகுதியிலே நிதியமைச்சரவர்கள் உருப்படியான சில நல்ல ஆலோசனைகள் சிலவற்றைக் கொடுத்திருக்கிறார்கள் :

" வரிவிதிப்பு விசாரணைக் குழுவின் குறிப்புரைகளைக் கருத்தில் கொண்டு நான் உத்தேசித்துள்ள பிறிதொரு மாற்றம் யாதெனில், 25 பேருக்கு மேற்பட்டோரை வேலையிலமர்த்திப் பண்டங்களையும் பொருட்களையும் உற்பத்தி செய்வதில் ஈடுபட்டுள்ள எல்லாப் புதிய முயற்சிகளுக்கும் இப்பொழுது பெறத்தக்கதாகவுள்ள ஐந்தாண்டு வரி ஒய்வை விலக்குதலாகும். இந்த வரி ஒய்வு விலக்கம் ஆழ் கடலில் மீன் பிடிக்கும் முயற்சிகளுக்கும், அரசாங்கம் மூலதனம் உதவும் கம்பனிகளுக்கும், விசேட குத்தகைத் திட்டத்தின் கீழமைந்த வேளாண்மை முயற்சிகளுக்கும் பொருத்தமுடையதாகும். "

வேளாண்மை முயற்சிகள், தேசிய அரசாங்கம் சாதித்த நல்ல காரியங்களில் ஒன்றாக இருக்கிறது. சில தினங்களுக்கு முன்னர் எதிர்க்கட்சியினர் சார்பில் இச்சபையிலே பேசிய கௌரவ அங்கத்தவர் ஒருவர் வெறும் கடதாசிப் புள்ளிவிபரங்களே கொடுக்கப்பட்டிருக்கின்றனவென்று இப்புள்ளிவிவரங்களைக் கொடுத்த அதிகாரிகளுக்கு முன்னெச்சரிக்கை விடுத்ததை நான் அறிவேன். கிழக்கு மாகாணத்தைப் பொறுத்த அளவிலே கடந்த சில தினங்களுக்கு முன் தென்மாகாணப் பகுதியில் நான் பிரயாணம் செய்த பொழுதுகூட விவசாயத்துறையிலே இலங்கை மக்கள் இப்பொழுது பெரும் நாட்டமும் அதிக ஊக்கமும் காட்டுவதை நான் கண்ணாரக் கண்டிருக்கிறேன். திருத்தப்படாமலிருந்த ஆயிரக்கணக்கான ஏக்கர் பிரதேசங்களை இப்பொழுது மக்கள் திருத்திக் கமத்தொழிலில் அதிக ஊக்கம் காட்டுவதை நான் பார்த்திருக்கின்றேன். விவசாயத்துறையில் ஏற்பட்டிருக்கின்ற இந்த மாற்றத்துக்கு அரசாங்கத்தினுடைய பேராதரவு இன்னும் போதாதென்பதே என்னுடைய அபிப்பிராயமாகும். உரிய காலத்தில் விவசாயிகள் கடன் பெறக்கூடிய வசதிகள் செய்யப்பட வேண்டும். உரிய காலத்தில் வேளாண்மை செய்யப்படவில்லையென்றால், அக்கால வேளாண்மையில் விவசாயிகள் தோல்வி அடைந்துவிடுவார்கள். இதில் அரசாங்க இலாகாக்களிலுள்ள கால தாமதம், அசமந்தப் போக்கு முதலியவற்றைத் தீர்த்துவைப்பதில் அந்தந்த அமைச்சர்கள் மிகத் துரிதமாக நடவடிக்கை மேற்கொள்ள வேண்டும். உதாரணமாக குறிப்பிட்ட காலத்தில் விதை நெல், குறிப்பிட்ட காலத்தில் கமச் செய்கைக்கான கடன் முதலியவற்றைப் பெற முடியாவிட்டால் விவசாயத்தில் படுதோல்வியே காண வேண்டும். வெளி நாடுகளில்—எங்களுக்கு அரிசி தரும் நாடுகளில்—கால நிலை பொய்த்தால், அல்லது காலக் கோளாறு காரணமாக யுத்த நிலை ஏற்பட்டால் நமது நாடு பட்டினி கிடக்கவேண்டிய பரிதாப நிலை ஏற்படும். இந்த நிலை நமக்கு ஒரு காலமும் ஏற்படாமல் இருப்பதற்கு நமது மக்கள் விவசாயத்துறையில் அதிகமாக ஈடுபட்டுப் பாடுபட வேண்டும்.

ஒரு நாட்டின் வாலிப சக்தி அல்லது இளைஞர் சக்தி துஷ்ப்பிரயோகமாகக் கூடாது. இலங்கையைப் பொறுத்த அளவில் ஏராளமான இளைஞர்கள் இன்று தொழில் இலாகாக்களைச் சுற்றிக்கொண்டு, தொழிற் கந்தோர்களை நாடிக் கொண்டு, பாராளுமன்றப் பிரதிநிதிகளைச் சுற்றிக் கொண்டு உத்தியோகம் பெற முயற்சித்துக் கொண்டிருக்கும் ஒரு பரிதாப நிலையை நாம் கண்டு கொண்டிருக்கிறோம். இந்த ஆண்டு மாணவ ஆசிரிய பரீட்சைக்கு ஒரு இலட்சத்து முப்பதினாயிரம் பேர் மனுச் செய்திருப்பதாக அறியக் கூடியதாக இருக்கிறது. மேலை நாடுகளை எடுத்துக்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජ්‍යදොරෙයි මයා.]

கொண்டால், அவை ஜனநாயக நாடுகளாக இருந்தாலும் சரி சோஷலிச நாடுகளாக இருந்தாலும் சரி அந்த நாடுகளில் இளைஞர்களுடைய சக்தி தேசத்தினுடைய முன்னேற்றத்திற்கு, தேசத்தினுடைய வளத்திற்கு, தேசத்தினுடைய உயர்ச்சிக்குப் பாதுகாக்கப்பட்டு பயன்படுத்தப்படுகிறது. நம் நாட்டைப் பொறுத்த வரையில் நமது இளைஞர்களுடைய சக்தி விரையம் செய்யப்படுகிறது. அவர்களுடைய சக்தி நமது நாட்டுக்குச் சரிவரப் பயன்படுத்தவில்லை என்பதை நான் இங்கே சுட்டிக்காட்ட விரும்புகிறேன். இருப்பினும் இந்த அரசாங்கம் சமீபத்தில் உருவாக்கிய விவசாயப்படைத் திட்டம் இன்னும் பூரணமான பலன்களைப் பெற்றுக் கொடுக்கவில்லை என்றாலும் அது இந்த நாட்டிற்கு உண்மையான பலன்களைக் கொடுக்கக்கூடிய ஒரு திட்டமாகும்.

"கமத்தொழில் படைகள் செய்துள்ள வேலைகள், பலவேறு பிரதான திட்டங்களின் கீழ் நீர்ப்பாசன வசதிகள் அளிக்கும் ஏற்பாடுகளைத் துரிதப்படுத்த உதவியது. இதுவரை 5,000 இளைஞருடன் இருபத்தைந்து பாசறைகள் நிறுவப்பட்டுள்ளது. மேலும் பன்னிரண்டு நீர்ப்பாசனத் திட்டங்களைப் புதுப்பிக்கும் வேலைகளையும் நீர்ப்பாசனப் படைகள் மேற்கொண்டுள்ளன."

இவ்வாறு நிதி அமைச்சர் தமது வரவு செலவுத் திட்டத்தில் கூறி இருக்கிறார். இந்த விவசாயப்படைகளுக்குப் போதிய அளவு வசதிகள் செய்து கொடுக்கப்படவில்லை என்பதை இங்குநான் குறிப்பிட விரும்புகிறேன். இப்பொழுது திரட்டப்பட்ட விவசாயப்படைகள் போதாது என்பதும் எனது அபிப்பிராயம். இன்னும் ஆயிரக்கணக்கான இளைஞர்களை இந்தத் துறையில் ஈடுபடுத்தி அரசாங்கம் திட்டமிட்டு அதற்கான முயற்சிகளை மேற்கொள்ள வேண்டும். நமது நாடு விவசாய நாடு. நமது முன்னோர்கள் அத்தனைபேரும் விவசாயிகள். உண்மையில் நாம் அனைவரும் அந்நிய ஏகாதிபத்திய கல்விக் கொள்கை காரணமாக அலுவலக உத்தியோகங்களில் நாட்டம் கொண்ட காரணத்தினால் இன்று பின் தங்கி விட்டோம். அரிசி, மிளகாய், பருப்பு போன்ற உணவுப் பொருட்களுக்கெல்லாம் வெளிநாடுகளிடம் கையேந்தி நிற்க வேண்டிய நிலை இன்று எமது நாட்டிற்கு ஏற்பட்டிருக்கின்றது. கோடிக்கணக்கான ரூபா நமது தேசத்திலிருந்து ஆண்டுதோறும் இதன் பொருட்டு வெளிநாடுகளுக்குப் போய்க் கொண்டிருக்கிறது. ஆகவே விவசாயப்படைகளை விரிவுபடுத்தி அவற்றில் அதிகமான இளைஞர்களைச் சேர்க்க அரசாங்கம் முன்வர வேண்டுமென்று நான் கேட்டுக் கொள்ளுகிறேன்.

நான் வெளி நாடுகளில் பிரயாணம் செய்த போது அந்த நாடுகளில் எல்லாம் விவசாயப் படைகளுக்குச் சகல வசதிகளும் செய்து கொடுக்கப்பட்டிருப்பதை அவதானித்தேன். விவசாயத்தில் ஈடுபட்டிருக்கும் இளைஞர்களுக்குப் படிக்க வாசிகசாலைகள், விளையாட விளையாட்டு மைதானங்கள், செய்திகளைக் கேட்கவும் பொழுது போக்கவும் ரேடியோக்கள் எல்லாம் அங்கு கொடுக்கப்பட்டிருக்கின்றன. ஆனால், இந்த வசதிகள் எங்கள் நாட்டில் விவசாயப் படைகளுக்குச் செய்து கொடுக்கப்படவில்லை என்பதை இங்கு சுட்டிக்காட்டவேண்டியது எனது கடமையாகின்றது.

கடந்த சில வருடங்களுக்கு முன் தொகுதி வாரியாக பண்ணைகள் ஆரம்பிக்கப்பட்டன. அதாவது இளைஞர் பண்ணைகள் ஆரம்பிக்கப்பட்டன. ஆனால், இந்தப் பண்ணைகள் எதுவும் சரிவர இயங்கவில்லை. இதன் காரணம் என்ன? இந்தப் பண்ணைகள் 3 ஆரம்பிக்கப்பட்ட போது அவற்றில் படித்த வாலிபர்கள் மிகவும் உச்சாகத்தோடு சேர்ந்தகர்கள். ஆனால், அப்படிச் சேர்ந்தவர்களுக்குப் போதிய வசதிகள் செய்து கொடுக்கப்படவில்லை. இதே மாதிரிப் பண்ணை ஒன்று என்னுடைய தொகுதியில் ஆரம்பிக்கப்பட்டது. அந்தப் பண்ணையில் தண்ணீர் பாய்ச்ச ஒரு நீர்க் குழாய்ப் பொறி கொடுக்கப்படவில்லை. 750 ரூபா செலவில் இத்தகைய ஒரு பொறி கொடுக்க அரசாங்கத்தினால் முடியவில்லை. இதன் காரணமாக அந்தப் பண்ணை மூடப்பட்டு விட்டது. இவ்வித திட்டங்களைச் செயற்படுத்த முனையும்பொழுது அத்திட்டங்களில் உள்ளவர்களுக்குப் போதிய வசதிகளை அரசாங்கம் செய்து கொடுக்க வேண்டும்.

நான் உல்லாச வசதிகளைப்பற்றி இங்கு குறிப்பிடவில்லை. காட்டுப் பிரதேசங்களில் நீர்ப்பாசன வசதிகளைச் செய்ய இருப்பவர்களுக்குப் படிக்கப் பத்திரிகை வேண்டும். தினசரி அவர்கள் உலக உள்நாட்டு அன்றாடச் செய்திகளை அறிய வேண்டும். அதற்காக அவர்களுக்கு ஒரு ரேடியோ இருக்க வேண்டும். அவர்கள் பொழுதுபோக்காக விளையாடுவதற்கு விளையாட்டு மைதானம் இருக்க வேண்டும். ஆகவே, விவசாயப்படைகளை இன்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

னும் விரிவுபடுத்தி இன்னும் ஆயிரக்கணக்கானவர்களை அவற்றில் சேர்த்து அவர்களுக்கு வேண்டிய வசதிகளையும் செய்து கொடுத்தால் நாடு முன்னேற்றமடையும். பண்டைய மன்னர்களால் கட்டுவிக்கப்பட்ட எமது பண்டைய குளங்கள் எல்லாம் இன்று தூர்ந்துபோய் இருக்கின்றன. அவற்றைச் சீர் செய்து நாட்டின் விவசாயத்தைப் பெருக்கவேண்டியது எமது கடமையாகும். இலங்கை தனது சரித்திரத்தில் வெளிநாடுகளுக்கு அரிசியை ஏற்றுமதி செய்திருக்கின்றது. இதற்கான சான்றுகள் தமிழ் இலக்கியங்களில் காணப்படுகின்றன. ஆனால், எமது நாடு கடந்த ஐம்பது ஆண்டுகளுக்குள்ளாகத்தான் இலங்கை அரிசிக்காக வெளிநாடுகளை எதிர்பார்த்துக் கொண்டிருக்கும் நிலை மேலோங்கியது. ஆகவே நமது மன்னர்களால் ஆக்கப்பட்ட குளங்கள் எல்லாவற்றையும் நாம் சீர் திருத்த வேண்டும். அவற்றை மிகத் துரிதமாகச் செயற்படுத்த வேண்டும். அவற்றை மிகத் துரிதமாகக் கட்டுவதற்கு இந்நாட்டின் இளைஞர் சக்தியைச் சரிவரப் பயன்படுத்த வேண்டும். எனினும், விவசாயத்தை ஊக்குவிப்பதற்கும் விவசாயப் படையினரைச் சேர்ப்பதற்கும் இந்த அரசாங்கம் அமைக்கும் திட்டங்கள் மிகச் சிறப்புடைய திட்டங்கள் என்று சொல்ல விரும்புகிறேன்.

அடுத்து, விவசாயத்திட்டங்களைப் பொறுத்த அளவில் இந்த நாட்டின் அரிசித் தேவையில் பெரும் பகுதியை இந்த நாட்டுக்குக் கொடுக்கின்ற கிழக்கு மாகாணம் கடந்த பல ஆண்டு காலமாக எல்லா அரசாங்கங்களாலும் புறக்கணிக்கப்பட்டு வந்திருக்கின்றதென்பதை நான் இங்கு பகிரங்கமாகச் சுட்டிக்காட்ட விரும்புகிறேன். ஏன் இந்த நிலை என்பதை அரசாங்கங்கள், அமைச்சர்கள் நினைவு கூர வேண்டும். கல்லோயாப் பள்ளத்தாக்கின் இடது புற வாய்க்கால் கடந்த ஐந்து, ஆறு ஆண்டுகளாகச் செயற்பட முடியாமல் நிறுத்தப்பட்டிருக்கின்றது. அந்த வாய்க்கால் திட்டமிடப்பட்டபடி உன்னிச்சைக் குளத்தோடு இணைக்கப்பட வேண்டும். அப்படி இணைப்பதன் மூலம் 50 ஆயிரம் ஏக்கர் நிலம் நீர்வளம் நிறைந்ததாக மாறுவதோடு இலட்சக்கணக்கான புசல் நெல்லை, இந்த நாட்டு மக்களின் பிரதான உணவான நெல்லை உற்பத்தி செய்யக் கூடியதாகவும் இருக்கும். இந்தத் திட்டம் ஏன் கைவிடப்பட்டதென்பது எனக்கு விளங்கவில்லை. பல சந்தர்ப்பங்களில் இந்தக் கௌரவ சபையிலே நான் இதனையிட்டுக் குறிப்பிட்டிருக்கிறேன். அரசாங்கத்தால் திட்டமிடப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்ட, ஒப்புக் கொள்ளப்பட்ட திட்டம் ஏன் கைவிடப்பட்டது? அந்தத் திட்டம் செயற்படுத்தப்படுமானால் 50 ஆயிரம் ஏக்கர் பிரதேசங்கள் நீர் வளம் நிறைந்த பிரதேசங்களாக மாற்றப்பட்டு இலட்சக்கணக்கான புசல் நெல்லை நாட்டு மக்களுக்கு கிழக்கு மாகாணம் கையளிக்கக் கூடியதாக இருக்கும்.

மேலும். விவசாயிகளின் இன்னுமொரு பிரச்சினையைப் பற்றிக் குறிப்பிட விரும்புகிறேன். விவசாயத்தைப் பெருக்க வேண்டுமென்று அரசாங்கம் பிரசாரம் செய்யும் பொழுது, விவசாயிகளின் அதி முக்கியமான தேவைகளை நன்கு கவனத்துக்கு எடுத்துக் கொள்ள வேண்டும். 1952 ஆம் ஆண்டுக்குப் பின்னர் அரசாங்கம் பொதுமக்களுக்கு காடு வெட்டுவதற்கு சகாயப்பணம் கொடுப்பதில்லை. பொதுமக்கள் அரசாங்க பூமிகளைக் கண்டு பிடித்து, தங்கள் சொந்த முயற்சியில் அங்கு சென்று. காடுகளை வயலாக்கி வேளாண்மை செய்கிறார்கள். அப்படிக் காடுகளை வயலாக்கி வேளாண்மை செய்யும் விவசாயிகள் தங்கள் வயற்புறங்களுக்குச் செல்வதற்குப் போக்குவரத்து வசதிகள் கிடைக்கவேண்டும். குறைந்த பட்சம் "கிரவல் ரோட்" டுக்களையாவது அமைத்துக் கொடுக்க அரசாங்கம் முன்வரவேண்டும். அங்குள்ள விவசாயிகளுக்குத் தெருக்கள் இல்லை. விதை நெல்லைக் கொண்டுபோவதற்கு, முட்கம்பிகளைக் கொண்டு போவதற்கு, பசளையைக் கொண்டுபோவதற்கு, தங்கள் விளைச்சலைப் பலநோக்குக் கூட்டுறவுச் சங்கங்களுக்குக் கையளிக்க வருவதற்கு போக்குவரத்துக்காகப் பாதைகள் இல்லாமல் இருந்துகொண்டிருக்கின்றன. இது தீர்க்கப்பட வேண்டும்.

மேலும், குளங்களைத் திருத்தி அமைப்பதில் அரசாங்கம் தீவிர கவனம் செலுத்தவேண்டுமென்று முன்னர் குறிப்பிட்டேன். பல குளங்கள் இன்று கவனிப்பாரற்று கிடக்கின்றன. மட்டக்களப்பைப் பொறுத்த அளவில், 25 மைல் நீளத்துக்குத் தொடர்பான ஒரு வாய்க்காலால் அந்த மாவட்டம் பிரிக்கப்பட்டிருக்கிறது. அவை கிழக்குப் பகுதி, மேற்குப் பகுதி என அழைக்கப்படுகின்றன. இவற்றை இணைப்பதன் மூலம் விவசாயத்துறையில் முன்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සී. රාජදුරෙයි මයා.]

னேற்றம்காண முடியும். வலேயிறவு, வவுன தீவு ஆகிய இவ்விரண்டையும் இணைக்க ஒரு தாம்போதி அமைப்பது மிகவும் அத்தியாவசியம் என்பதைப் பல தடவைகளில் இந்தச் சபையில் வற்புறுத்தி வந்திருக்கிறேன். ஆனால், மிக வருத்தத்துடன் கூறுகிறேன்; கடந்த சில மாதங்களுக்கு முன்னர் மராமத்துப் பகுதி உயர்தர அதிகாரி ஒருவரிடமிருந்து ஒரு கடிதம் கிடைத்தது. அந்தத் தாம்போதி முக்கியமானதல்ல என்றும், அதனால் போதிய வருமானம் கிடைக்காதென்றும், முன்னர் போக்குவரத்து அமைச்சராக இருந்த திருவாளர் கனுகல்லேயின் காலத்தில், அமெரிக்காவிலிருந்து விஜயம் செய்து இலங்கைத் தெருக்களைப் பார்வையிட்டு எந்தெந்தத் தெருக்கள் அவசியம் என்று சிபாரிசு செய்த கமிஷனர்கள் இந்தத் தாம்போதியைச் சிபாரிசு செய்யவில்லை என்றும் அந்தக் கடிதத்தில் குறிப்பிடப்பட்டிருந்தது. கொழும்பில் இரண்டு, மூன்று மாடிக் கட்டடங்களில் குளிர்சாதன அறைகளிலிருந்து கொண்டு இந்த நாட்டு மக்களின் அத்தியாவசியப் பிரச்சினைகளைத் தீர்க்கமுடியாது, உண்மை நிலையை உணரவும் முடியாதென்பதை அந்த அதிகாரிகளுக்குச் சொல்லிவைக்க விரும்புகிறேன். அவர்கள் குறிக்கப்பட்ட அந்தப் பிரதேசங்களுக்குப் போய் பார்த்தால்தான் உண்மை நிலையைக் காண முடியும். உன்னிச்சை, மகிழவட்டுவான், கித்துள்வேவ போன்ற குளங்களை அண்மி ஆயிரக்கணக்கான ஏக்கர் பிரதேசங்களில் வேளாண்மை செய்யப்படுகிறது. இவற்றை இணைப்பதற்கு தாம்போதிகள் அவசியமில்லை என்று அதிகாரிகள் சொல்லக் கூடுமானால் அவர்களுக்கு உண்மையில் இலங்கையின் பூகோள அமைப்புத் தெரியவில்லை அல்லது அந்தப் பிரதேசத்தை அவர்கள் பார்க்கவில்லை என்பதுதான் என்னுடைய கருத்தாகும். சில வாரங்களுக்கு முன் கௌரவ போக்குவரத்து அமைச்சர் அவர்களை நாங்கள் சந்தித்து இவ் விஷயத்தை அவரது கவனத்துக் கொண்டு வந்ததன் மூலம் அவர் இந்தப் பிரச்சினைக்கு முதலிடம் கொடுத்து இதைச் செய்து தருவதாகக் கொடுத்த வாக்குறுதிக்கு நான் அவருக்கு நன்றி தெரிவித்துக் கொள்வதுடன் இவ்விஷயத்தை விரைவில் தொடங்குவதன் மூலம் அவர் மட்டக்களப்பு விவசாயிகளுக்கு பெரும் நன்மை செய்தவர் ஆவார் என்பதையும் சொல்ல விரும்புகிறேன்.

அடுத்து, உப உணவுப் பொருட்களாகிய மிளகாய், வெண்காயம், பம்பாய் வெண்காயம், உருளைக்கிழங்கு, அன்னுசி, காய்கறி போன்ற துணை உணவுப் பொருட்களைப் பயிரிடுவதற்கு கடன்கள் அளிக்கப்பட்டன என்று கௌரவ நிதி அமைச்சர் தமது வரவு செலவுத் திட்டத்தில் குறிப்பிட்டிருக்கிறுர். அரசாங்கம் இத்தகைய சிறந்த திட்டத்தை உருவாக்கினுற்கூட அவற்றுல் பயன் பெற முடியாமல் இருக்கும் விவசாயிகளுக்குக் கூடிய விரைவில் மிகத் துரிதமாக கடன் பெறக் கூடிய வழிவகைகளை அரசாங்கம் செய்ய வேண்டும். என்னுடைய தொகுதியிலே ஒருவர், மிளகாய், வெண்காயம், கிழங்கு போன்றவற்றைப் பயிரிடுவதற்கு விவசாய இலாகாவை அண்மி அதனிடமிருந்து கடன் பெற்று இவற்றைச் செய்வதற்கு முயற்சித்துக் கை சோர்ந்து, மெய் சோர்ந்து கடைசியில் அந்த எண்ணத்தையே விட்டுவிட்டார் என்பது எனக்குத் தெரியும். ஆகவே, மிளகாய், வெண்காயம், உருளைக்கிழங்கு, அன்னுசி காய்கறி போன்றவற்றை உற்பத்தி செய்வதற்கு அரசாங்கம் கொடுக்கும் உதவிப் பணத்தைப் பெறுவதிலுள்ள தாமதங்கள் மிகத் துரிதமாகத் தீர்க்கப்பட வேண்டும் என்று குறிப்பிட விரும்புகிறேன்.

அடுத்ததாக, தெங்குச் செய்கை பற்றி சில கருத்துக்களைச் சொல்ல விரும்புகிறேன்.

> "தெங்குச் சபை, சுகாதார நியமனங்களுக்கேற்ற முறையில் உலர் தேங்காயை உற்பத்தி செய்வதற்காகத் தற்கால உபகரணங்களை ஆலைகளில் இணைக்கும் திட்டமொன்றைத் தொடங்கியுள்ளது. இதுவரை ஏழு ஆலைகளில் இவ்வித உபகரணங்கள் இணைக்கப்பட்டுள்ளன. தென்னந்தும்புச் சபையொன்று நிறுவப்பட்டுள்ளது. அது இக் கைத்தொழிலைத் தற்கால முறைப்படி அமைக்கும் பிரச்சினைக்கும், தர நியமங்களைப் புகுத்துவதற்கும், மேலும் கயிற்றுத் தும்பைப் பயன்படுத்தல் பற்றிய ஆராய்ச்சிக்கும் முதன்மையளிக்கின்றது. இச்சபை, கயிற்றுத் தும்புக் கைத்தொழிலில் 1 கோடியே 80 இலட்சம் ரூபா முதலீடு செய்யும் ஒரு தற்காலிக அபிவிருத்தித் திட்டத்தைத் தயாரித்துள்ளது."

என கௌரவ நிதி அமைச்சர் வரவுசெலவுத் திட்டப் பிரசங்கத்திலே குறிப்பிட்டுள்ளார். தெங்குச் செய்கை, குறிப்பாக கிழக்கு மாகாணத்தைப் பொறுத்த அளவில் ஒரு தோல்வித் திட்டமாக இருப்பதை நான் காண்கிறேன். ஆயிரக் கணக்கான ஏக்கர் விஸ்தீரணமுள்ள தென்னந்தோட்டங்கள் இன்று அழிந்து, கவனிப்பாரற்று பயனற்றுப் போய் விட்டன. இவற்றுக்கு அரசாங்கம் சிறந்த

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

உதவியளிக்க முன்வர வேண்டும். அதன் மூலம் எங்களுடைய நாட்டுக்கு வெளிநாட்டு மூலதனம் கிடைக்க வசதி கிடைக்கும்.

அடுத்து, எனது தொகுதியில் முந்திரிகைச் செய்கை மிகவும் முக்கியமான ஒன்றாக இருக்கிறது. முந்திரிகைச் செய்கையின் மூலம் இந்த நாட்டுக்கு கோடிக்கணக்கான ரூபா வெளிநாட்டு மூலதனத்தைச் சம்பாதிக்கக் கூடியதாக இருக்கும். ஆனால், நடந்தது என்ன? முந்திரிகைச் செய்கைக்கு நிலம் அளிக்கப்பட்டது. நிலம் பெற்றவர்கள் முந்திரிகையை நாட்டி அதன் மூலம் ஊதியத்தைப் பெற முடியாத அளவுக்கு வறுமையால் தாக்கப்பட்டுக் கொண்டிருக்கிறார்கள். ஆகவே, முந்திரிகைச் செய்கைக்கு அரசாங்க உதவிகள் அளிக்கப்பட வேண்டும். முந்திரிகை செய்வதற்கு அரசாங்கம் சகாயப்பணம் கொடுக்க முன்வர வேண்டும் என்று கேட்டுக் கொள்கிறேன்.

இந்த நாட்டின் மின்சாரம் இன்னமும் சரிவரப் பயன்படுத்தப்படவில்லை.

"கிராமங்களுக்கு மின்சாரம் வழங்குதல் சம்பந்தமாக, 500 க்கு மேற்பட்ட கிராமங்களுக்கு மின்சாரம் வழங்குவதற்குரிய நான்கு ஆண்டுத் திட்டம் விரைவில் தொடங்கும். இத் திட்ட வேலைகட்கு 2 கோடியே 50 இலட்சம் ரூபா செலவாகுமென எதிர்பார்க்கப்படுகிறது."

என்றும் கௌரவ நிதி அமைச்சர் குறிப்பிட்டுள்ளார். இன்று கல்லோயாப் பள்ளத்தாக்கிலிருந்து பொலன்னறுவ வரையில் மின்சாரக் கம்பிகள் இணைக்கப்பட்டுவிட்டன. நூற்றுக் கணக்கான கிராமங்களை ஊடறுத்து இந்த மின்சாரக் கம்பிகள் வருகின்றன. ஆனால், அந்தக் கிராமங்களிலே மின்சாரம் இல்லை. விஞ்ஞான யுகத்திலே, மின்சாரமென்பது வீடுகளுக்கு வெளிச்சம் கொடுப்பதற்கு மட்டுமல்ல, விவசாயிகளுக்கும் கைத்தொழில் துறையிலும் மிக இன்றியமையாத வொன்றாக இருக்கிறது. ஆனால், இன்று மின்சாரக் கம்பிகளை கிராமங்களை ஊடறுத்துச் செல்கின்றனவேயொழிய, அந்த மின்சாரக் கம்பிகளைப் பயன்படுத்தக் கூடிய முறையில் கிராம மக்கள் இல்லாமலிருக்கின்றார்கள். கிராமப் புறங்களுக்கு மின்சாரம் அளிக்கும் திட்டம் கடந்த பல ஆண்டுகாலமாக பல அரசாங்கங்களினால் செய்யப்பட்டு வந்திருக்கின்றன. இருப்பினும் இன்னும் அதனைச் செயற்படுத்த முடியாமலிருப்பது மிகவும் துர்ப்பாக்கியமான நிலையாகும்.

ஆகவே, கிராமப் புறங்களுக்கு மின்சாரம் அளிக்கும் திட்டத்தைக் கூடிய விரைவில் செயல்படுத்தவேண்டுமென்று இங்கே கூற விரும்புகிறேன்.

அடுத்து, ஒரு வரவுசெலவுத் திட்டத்திலே குறிப்பிடப்படுகின்ற கருமங்கள் அந்த ஆண்டுக்காலத்திலே நடைபெறமுடியாமல், ஒதுக்கப்படுகின்ற பணங்கள் உரிய உரிய வேலைகளுக்குச் செலவிடப்படாமல் இருப்பது வருந்தக்கூடிய ஒரு விடயமாகும். பல ஆண்டுகாலமாகப் பல திட்டங்களுக்கென ஒதுக்கப்படுகின்ற பணங்கள் செலவழிக்கப்படாமல் அப்படியேயிருந்துவருகிறதை நான் பல முறை சுட்டிக்காட்டியிருக்கின்றேன். மட்டக்களப்பிலே ஒரு தாதிமார் பயிற்சிக் கல்லூரியை ஆரம்பிக்கக் கடந்த ஐந்து, ஆறு ஆண்டுகளாக மதிப்பீட்டிலே பணம் ஒதுக்கப்பட்டு வந்திருக்கிறது. ஆனால், அந்தப் பணம் செலவு செய்யப்படவில்லை. அந்தத் திட்டம் ஆரம்பிக்கப்படவில்லை. மட்டக்களப்புக்கு ஒரு தபால் நிலையம் அவசியம். ஒரு சிறிய கட்டடத்திலே மட்டக்களப்புத் தபால் நிலையம் இயங்கிக் கொண்டுவருகிறது. அங்கு ஒரு தபால் நிலையம் கட்டுவதற்கு மூன்று இலட்சத்து, நாற்பதினாயிரம் ரூபா கடந்த மூன்று நான்கு வருடங்களாக வரவுசெலவு மதிப்பீட்டிலே இடம் பெற்று வருகிறது. ஆனால், அந்த வேலை ஆரம்பிக்கப்பட்டதாக இல்லை. அதிகாரிகளோடு தொடர்பு கொண்டால் படம் கிடைக்கவில்லை; இன்னும் அதற்குரிய மற்ற வேலைகளிலே தாமதம் இருக்கிறது என்று சொல்லுகிறார்கள். ஆனால் நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருக்கிறது. குறிக்கப்பட்ட அந்த ஆண்டிலேயே வேலையைத் தொடங்கினால் பரவாயில்லை. தொடங்கப்படாமலிருப்பது பெரும் துர்ப்பாக்கிய நிலையாகும். இதே போலப் பல வேலைகளுக்கு பணம் ஒதுக்கீடு செய்யப்பட்டும் அந்தப் பணம் செலவுசெய்யப்படாமலிருப்பது மிகவும் வருத்தத்திற்குரிய ஒரு காரியமாகும்.

அடுத்து, இந்த நாட்டிலே சமூக, சமுதாய ஒற்றுமை மிக அவசியமான ஒன்றாகும். கடந்த சில தினங்களுக்கு முன்பு கௌரவ கைத்தொழில், கடற்றொழில் அமைச்சர் இச் சபையிலே பேசிய பேச்சைக் கேட்டு இந் நாட்டு மக்கள் பெரிதும் மகிழ்ச்சியும் நம்பிக்கையும் அடைந்தார்கள். இந்நாட்டுச் சிறுபான்மை மக்களுடைய தொண்டைக்குள்ளே

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජදොරෛයි මයා.]

பெரும்பான்மையின மக்களுடைய மொழியை வலிந்து திணிக்க முடியாதென்று எங்கள் கைத்தொழில் அமைச்சரவர்கள் தங்களுடைய கருத்தை எடுத்துக்கூறியிருக்கின்றார்கள். நீண்ட காலமாக அரசியல் வாழ்விலே ஈடுபட்டிருந்த ஒருவர் அவர். வெளிநாடுகள் பலவற்றுக்குச் சென்று முதிர்ந்த அனுபவம் பெற்ற அரசியல் வாதியான அவர் தமது கருத்தினை மிக ஆணித்தரமாக இச்சபையிலே எடுத்துக்கூறியிருக்கின்றார்கள். இது இந்நாட்டுப் பெரும்பான்மை மக்கள் மத்தியிலேயிருக்கின்ற தீவிர வாதிகள், தங்கள் கவனத்துக்கெடுத்துக்கொள்ளக்கூடிய ஒரு கருத்தாகும். 1956 ஆம் ஆண்டுக்குப் பின் இந்நாட்டில் தேசிய அரசாங்கம் ஏற்படும் வரை இந்நாட்டின் பொருளாதார நிலைமை சீர்குலைந்திருந்தது. இந்நாட்டின் தேசிய வளம் குறைந்தது. இந்நாட்டில் சமூக ஒற்றுமை இல்லாமல் போய்விட்டது. இந்நாட்டிலே சகோதரத்துவ நிலை அற்றுப்போய்விட்டது. வெளிநாடுகளிலே நம் தாய் நாட்டின் மதிப்புக் குறைந்துவிட்டது. அன்று ஆட்சியிலிருந்து அகற்றப்பட்டுப்போன கூட்டு ஆட்சி வாதிகள் மீண்டும் அரசியல் பொறுப்பை ஏற்றுக்கொள்வதற்காக மறுபடியும் இந்நாட்டிலே வகுப்பு வாதத்தை, மொழி வெறியை ஏற்படுத்த முனைகின்றார்கள். அதை எண்ணியே கௌரவ கைத்தொழில் அமைச்சரவர்கள் அப்படி ஒரு எச்சரிக்கையை விடுத்துள்ளார். இந்நாட்டின் சிறுபான்மையினராகிய நாம் சரித்திர காலந்தொடக்கம் இந்நாட்டிலே வாழ்ந்து வருகிறோம் என்பதை எவரும் மறுக்க முடியாது. இந்நாட்டின் வரலாற்றுக் காலத்திலிருந்தே இந்நாட்டின் ஒரு பகுதியைத் தமிழ் மக்களும் மறுபகுதியை இந்நாட்டுச் சிங்களம் பேசும் பெருமக்களும் ஆண்டுவந்திருக்கிறார்கள் அவர்கள் நட்புறவோடு வாழ்ந்திருக்கின்றார்கள் அரசியல் காரணங்களுக்காக, குறுகிய சுலோகங்களை வைத்து இந்த நாட்டு மக்களின் வாக்குகளைப் பெற்று ஆட்சியைக் கைப்பற்ற வேண்டுமென்று நினைக்கின்ற அரசியல் வாதிகளினால்தான் இந்த நாட்டின் ஒற்றுமை குலைந்து இந்த நாட்டின் பொருளாதாரம் க்ஷீணித்து இந்த நாட்டின் தேசிய வளம் சிதைந்து போனதென்பதை நாம் இந்தச் சபையில் நினைவுபடுத்திக் கொள்ள வேண்டும். ஆகவே இந்த நாட்டின் பழம்பெரும் அரசியல் வாதிகளில் ஒருவரான கைத்தொழில், கடற்றொழில் அமைச்சர் கௌரவ பிலிப் குணவர்த்தன இச்சபையிலே கூறிய கூற்று அவருடைய வயது முதிர்ச்சி காரணமாகவும் அவருடைய அரசியல் ஞானத்தின் காரணமாகவும் கூறப்பட்ட ஒரு கூற்றென்பதை நாம் நினைவுபடுத்திக்கொள்ள வேண்டும்.

எந்த ஒரு கால கட்டத்திலும் நாம் இந்த நாட்டின் முன்னேற்றத்திற்கும் ஒற்றுமைக்கும் உழைத்து வந்திருக்கிறோம் என்பதை நமது கட்சியின் கடந்தகால அரசியல் வரலாறு எடுத்துக் காட்டி இருக்கிறது. இந்த நாட்டின் பெரும்பான்மை மக்களோடு இணைந்து சகோதரர்கள் போல ஒன்றாக வாழ்வதற்கு எத்தனையோ சந்தர்ப்பங்களை நாம் ஒவ்வொரு அரசாங்கத்துக்கும் அளித்து வந்திருக்கிறோம். 1956 ஆம் ஆண்டு முதல் 1960 ஆம் ஆண்டு வரை ஒவ்வொரு கால கட்டத்திலும் நாம் இந்த நாட்டில் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சிக்கும், கூட்டாட்சிவாதிகளுக்கும் நமது கொள்கைகளில் இருந்து இறங்கி ஓரளவு அவர்களோடு இணைந்து வாழ்வதற்கான சந்தர்ப்பங்களை அளித்திருக்கிறோம். அந்தச் சந்தர்ப்பங்களை எல்லாம் கெடுத்துக் குட்டிச் சுவராக்கி எங்களுக்கு நம்பிக்கைத் துரோகம் செய்தவர்கள் மீண்டும் இந்த நாட்டில் சமூகக் கிளர்ச்சிகளை உண்டாக்கி அடுத்த தேர்தலில் வெற்றி பெறுவதற்கான முயற்சிகளை இன்று செய்து கொண்டிருக்கிறார்கள். இந்த நாட்டின் தேசிய வளம் பெருகி சமூக ஒற்றுமை மலர சிறுபான்மை மக்களுடைய உரிமைகளைக் கொடுப்பதில் ஒருவருமே பின்நிற்கக்கூடாது. சிறுபான்மை மக்களுடைய உரிமைகளைப் பறித்த எந்த நாடும் உலக சரித்திரத்தில் முன்னேறியது கிடையாது. மனித வர்க்கத்திற்குக் கொடுக்கப்பட்டுள்ள ஒரு வரப்பிரசாதம்தான் வரலாறாகும். ஜேர்மனிய தேசம் சிறுபான்மை மக்களை அடக்க முற்பட்டதன் காரணமாகப் பிளவு பட்டுப் போனதைக் காண்கிறோம். உலகில் அறிவுக் களஞ்சியமான பல மேதைகளை உற்பத்தி செய்த ஜேர்மன் நாடு இன்று துண்டாடப்பட்டிருக்கின்ற பரிதாப நிலையைக் காண்கிறோம். ஸ்பானிய தேசமும் தனது நாட்டின் சிறுபான்மை மக்களாகிய இஸ்லாமிய மக்களின் உரிமைகளைப் பறிக்க முனைந்த காரணத்தினால் அது ஐரோப்பிய சரித்திரத்தில் ஒரு நோஞ்சல் நாடாக, மற்றவர்களால் மதிக்கப்பட முடியாத ஒரு தேசமாக விளங்குவதையும் இன்று நாம் காண்கிறோம். ஐரோப்பிய நாடுகளின் சரித்திரத்திலும் சரி ஆசிய நாடுகளின் சரித்திரத்திலும்சரி சிறுபான்மை மக்களின்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

உரிமைகளைப் பறிக்க முனைந்த எந்தத் தேசமும் நிம்மதியாக இருந்தது இல்லை. அத்தகைய நாடுகள் எல்லாம் உலகில் மடிந்து பிழந்துபோனதை வரலாற்றில் நாம் காணக் கூடியதாக இருக்கின்றது. அப்படி ஒரு நிலை அழகும் இயற்கை வளமும் மிக்க இந்த மரகதமணித் தீவுக்கு வரக்கூடாதென்பதுதான் இந்த நாட்டில் வாழக்கூடிய சிறுபான்மை மக்களின் எண்ணம் என்பதை இங்கு ஆணித்தரமாகக் கூறிவைக்க விரும்புகிறேன். ஆகவே, இன்று மலர்ந்திருக்கும் சகோதரத்துவ சமுதாய ஒற்றுமையை நாம் எல்லோரும் கட்டிக் காக்க வேண்டும். இதன் மூலம் இந்த நாட்டின் பொருளாதாரம் உயர்ந்து இந்த நாடு முன்னேற்றமடைவதற்கு இந்த வரவு செலவுத் திட்டம் மிகப் பொருத்தமுடையதொன்று என்று கூறி எனது பேச்சை முடித்துக் கொள்கிறேன்.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
**(Mr. Deputy Chairman of Committees)**

In the absence of any of the Opposition speakers whose names have been sent up, I call upon the hon. Member for Nikaweratiya.

අ. භා. 7.54

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)
*(திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய)*
**(Mr. M. Tennakoon—Nikaweratiya)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි අද සාකච්ඡා කරන්නේ අපේ රටේ වැසියාගේ යහපතට යයි කියා සකස් වූ 22 වැනි අය වැය වාර්තාවයි. මේ පාර්ලිමේන්තුවට අය වැය වාර්තා ඉදිරිපත් කිරීමේ පීතෘවරයා ඉදිරියේදී අද අපි මේ සාකච්ඡා කරන්නේ 22 වැනි වරටයි. ගරු රාජ්‍ය ඇමතිතුමා ලංකා පාර්ලිමේන්තුවේ අයවැය වාර්තා ඉදිරිපත් කිරීමේ තාත්තා හැටියට සලකන්නට පුළුවනි. ඒ "තාත්තා" අයවැය වාර්තා 22 න් 13 කම වගකිවයුත්තාත් වී සිටිනවා. අයවැය වාර්තා 22 කින් 13 කම වගකීම බාරගන්නා රාජ්‍ය ඇමතිතුමාගේ ඒ අය වැය ලේඛනවලින් 1947 සිට 1968 අගෝස්තු 12 වැනි දා වන විට ජනතාව බලාපොරොත්තු වූ සහනයන් හා දියුණුව කොතරම්දුරට සාර්ථක කර දෙන්නට පුළුවන් වී තිබෙනවාද කියා තමන්ගේ හිතට එකඟව, හිතේ සැනසීම සඳහා, දේශපාලනයෙන් පිටස්තරව, බෞද්ධයෙක් වශයෙන් කල්පනා කර බලා පිළිතුරක් දෙන්නය කියා ඉල්ලා සිටින්නට කැමතියි. අයවැය වාර්තා 22 න් 13 කම වගකිවයුත්තා හැටියට හිතට එකඟව, බෞද්ධයෙක් හැටියට, අවංකව එතුමා කල්පනා කර බැලුවොත් අද ජනතාව දුක් කරදර පීඩනවලට ලක් වී සිටින බව එතුමාට පිළිගන්නට සිදු වෙනවා.

නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රාජ්‍ය ඇමතිතුමා හැම විටම බොහොම රසවත් කතා කියන කෙනෙක්. එතුමාගේ පළමු වැනි කථාවේ ඇති රසවත් දේ කුමක්ද කියා මා සොයා බැලුවා. 1947 දෙසැම්බර් මාසයේ 1 වැනි සඳුදා—මා දන්නේ නැහැ සඳුදා පටන්ගත් නිසාද කියා—ඉදිරිපත් කළ අයවැය යෝජනාවලින් බලාපොරොත්තු වූ ඵලය අපේ රටවැසියාට නම් ලැබී නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමා 1947 දෙසැම්බර් මාසයේ 1 වැනිදා බොහොම ලක්ෂණට කථාව ආරම්භ කළා. මා දැන් කියවන්නට යන්නේ පාර්ලිමේන්තු **හැන්සාඩ්** වාර්තා පොතේ පළමු වැනි **කාණ්ඩයේ** 397 වැනි තීරයෙනුයි. එතුමාගේ කථාව තිබෙන්නේ ඉංග්‍රීසියෙන්. ඒ නිසා මා ඒ විධියටම කියවීමට බලාපොරොත්තු වෙනවා. එතුමා කථාව පටන්ගෙන වාක්‍යයක් දෙකක් කීවාට පසුව මෙන්න මෙහෙම කියා තිබෙනවා :

**"They represent the framework or the skeleton of the work to be done. It will be my task—**

අදත් එතුමාගේ වගකීම ඒකයි.

**—as well as the task of other spokesmen on behalf of the Government to give this framework flesh and spirit and life, so that you may measure in terms—**

1947 දී අයවැය ලේඛනය ඉදිරිපත් කරමින් එතුමා කළ කථාවේ පළමුවැනි ඡේදයේම එය සඳහන් වෙනවා. එතුමාගේ කථාවෙන් පසු කථා කරන අය ඉදිරිපත් කරන අදහස්වලින් එතුමාගේ අයවැය යෝජනාවලට තවත් ශක්තිය ලැබෙනු ඇතැයි එතුමා එදා කිව්වා. මොකටද ? මහජනතාවගේ සැනසුමට සැප පහසුවට මහජනයා සන්තෝෂ කිරීමටත්, මහජනයාගේ සැනසුමටත් ඒ අදහස්වලට ජීවයක් තමයි එතුමාගෙන් පසුව කථා කරන්නට සිටි



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

අයගෙන් එතුමා බලාපොරොත්තු වන බව එතුමා 1947 දී කිව්ව අපට දැන් සිද්ධ වෙලා තියෙන්නෙ මොකක්ද? 1947 සිට අයවැය ලේඛන 13 කට වගකිවයුත්තකු වශයෙන් එතුමාගේ පක්ෂයේ මූලිකත්ව යෙන් තිබුණු ආණ්ඩුවලින් සහ එතුමා ගෙන් කොතෙක් දුරට ඒ කාලය තුළ මුල් අයවැය ලේඛනයේ අදහස් ක්‍රියාත්මක වී ඇද්දැයි සොයා බලන්නටයි අපට තිබෙන්නේ. එතුමාගෙන් පසුව ආ අය ඒ පරමාර්ථය කොතෙක් දුරට ඉටු කර තිබෙනවා දැයි බැලිමත් අශ්‍යයි.

*එකල් හි වේලාව අ. භා. 8 වූයෙන්, මන්ත්‍රී මණ්ඩලයේ අදහස් විමසන ලදුව, නියෝජ්‍ය සභාපතිතුමා විසින් මෙම විවාදය තව දුරටත් පවත්වාගෙන යාමට අවසර දෙන ලදි.*

*அப்பொழுது நேரம் பி. ப. 8 மணி ஆகிவிட்டவே குழு உப அக்கிராசனர் அவர்கள் சபையினது கருத்தை உறுதிப்படுத்திக் கொண்டு விவாதத்தைத் தொடர அனுமதித்தார்கள்.*

*It being* 8 P.M. MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *having ascertained the views of the House, permitted the Debate to be continued.*

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

එතුමාගෙන් පසුව දැන් මුදල් ඇමති ධුරය දරන්නේ යාපනුවේ ගරු මන්ත්‍රීතුමායි. එතුමා ගැන විශේෂයෙන්ම මම ආඩම්බර වෙනවා. ඒ කොයි හැටි වෙතත් අපට දැන් වුවමනා කරන්නේ අර මුලින් සඳහන් කළ අදහස මේ යෝජනාවලින් කොයි තරම් දුරට සාර්ථක වෙලා තිබෙනවාද යන්නයි. බලාපොරොත්තු වෙනවාය කී මහජන සන්තෝෂය, මහජන සැනසුම, මහජන සතිපය, මහජන ජීවය, ලබා දීමට කොතෙක් දේ කර තිබෙනවාද යන්න අහන්නට සිදු වී තිබෙනවා. බෞද්ධයකු වශයෙන් පිළිතුරු දෙතොත්, හිතට එක ගව නොවෙයි ඒ අදහස සාර්ථක වී ඇතැයි කියන්නට සිදු වන්නේ. ඒ නිසා ඒ ප්‍රශ්නය මම එතුමාගෙන් අහන්නේ නැහැ. හිතට එකගව ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙතොත්, 1947 සිට අද වන තුරු ඒ බලාපොරොත්තුව ඉටු වී නැතැයි කියන්නට සිදු වනු ඇති. අයවැය ලේඛනයේ වැඩ කටයුතු පිළිබඳ වගකීම භාර ගන්න කෙනකු හැටියට එතුමාටවත් එතුමාගේ ආණ්ඩුවටවත් පුළුවන්කමක් නැහැ, මෙතෙක් කල් මහජනයාගේ යහපතට අදාළ වන පරිදි, සන්තෝෂය ඇති වන පරිදි සැනසුම ලැබෙන පරිදි, වැඩ කර තිබෙනවායයි කියන්නට.

—in terms of human comfort and happiness the financial proposals I place before you."

අයවැය ලේඛනයක් ඉදිරිපත් කරන්නේ, ආදායම වියදම සකස් කරන්නේ, ආදායම ලබා ගන්නේ, කොහොමද? එය වියදම් කරන්නේ කොහොමද? පරමාර්ථය නම් ජනතාව සැනසීම යයි එතුමා තම මුල් අයවැය කථාවේම කියා තිබෙනවා. අවුරුදු 21 ක් ගත වී ඇතත්, තවමත් ඒ සැනසීම ජනතාවට ලබා දෙන්නට බැරි වී තිබෙනවා නම්, මෙවැනි අයවැය කථා ඉදිරියටත් පැවැත්වීමෙන් ඵලක් තිබෙනවාදැයි රාජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි. අවුරුදුපතා ඉදිරිපත් කරන මෙවැනි අයවැය යෝජනා වලින් ක්‍රම ක්‍රමයෙන්වත් ජනතාවට සහනයක් ලැබෙන්නේ නැත්නම්, මෙවැනි අයවැය කථා පැවැත්වීමේ තේරුම මොකක්ද? 1947 දෙසැම්බර 1 වැනි දා අර විධියේ කථාවක් කළ කෙනෙක්, 1968 අගෝස්තු 12 වැනි දා—අද—කියනවා නම් "මේ රටේ ජීවත් වීම අමාරුයි, අසීරුයි, කිසිම සහනයක් නැහැ, මොකක්ද මේ කර දරය" කියා, එවැනි අයගේ පාලනයක් යටතේ ජනතාවට ලැබෙන සහනය මොක්ද?

එම නිසා මේ රෝගයට බෙහෙතක් හොයන්න ඕනෑ අවස්ථාවකයි අද අප ඉන්නේ. එතුමා තම කථාව විකක්දුර් පවත්වාගෙන ගිහින්, එදා මේ විධියටත් කියා තිබෙනවා: එදා හැන්සාඩ් වාර්තාවේ 400 වැනි තීරුවේ මෙසේ සඳහන් වෙනවා:

"එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය
ද්වීහි කම්මං පයොජයෙ
චතුත්ථඤ්ච නිධාපෙය්‍ය
ආපදාසු භවිස් සති."

1947 දී එතුමා පාවිච්චි කළ වචනයි, ඒ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

මගේ වචන නොවෙයි; ඔය බුදු හාමුදුරුවන්ගේ වචන.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

අපේ අයවැය ලේඛන පිතෘවරයා එදා තමාගේ අයවැය ලේඛනය ඉදිරිපත් කර මින්, සම්මා සම්බුදු රජාණන් වහන්සේ ගේ වචන උපුටා දක්වමින් කථා කළේ ඇයි? එතුමාගේ බලාපොරොත්තුව, එතුමාගේ වචනවලින්ම මේ විධියට විග්‍රහ කර තිබෙනවා:

"Divide the wealth you earn into four parts. Of that wealth one quarter should be spent on maintaining yourself and your family; two quarters should be spent on future investments to your business in order to develop it; the fourth quarter you should save for a time of depression."—[OFFICIAL REPORT, 1st December 1947; Vol. 1, c. 400.]

අයවැය ලේඛන පිතෘවරයා ඒ බුද්ධ වචන කොයිතරම් දුරට හිතට එකඟව පිළි පැද තිබෙනවාදැයි, ක්‍රියාත්මක කර තිබෙන වාදැයි ප්‍රශ්න කරන්න කැමැතියි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

බැරි වුණා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

බැරි වුණා! එහෙම බැරිවුණා නම්, එය හරියට කරන්න කළ යුත්තේ මොකක් දැයි නැවතත් එතුමාගෙන් ප්‍රශ්න කරන් නට ඕනෑ.

අපේ අයවැය ලේඛන පිතෘවරයා එදා තමාගේ අයවැය කථාව බොහොම ලස් සණට ඉදිරිපත් කළා. දැන් කෙරෙන්නා වාගේ එදා දිග හැල්ලක් කියෙව්වේ නැහැ. දැන් නම්, අයවැය කථාව නමින් පොතක් කියවනවා. අද කියවන අයවැය කථාවල ඇතුළත් වචන සාමාන්‍ය මිනිහකුට ලෙහෙ සියෙන් තේරුම් ගන්න බැහැ. ඒ කථාව සිංහලට පරිවර්තනය කරන්නේ කවුදැයි මා දන්නේ නැහැ. අපේ මුදල් ඇමතිතුමා සාමාන්‍ය ජනතාවගේ නියෝජිතයෙක්; සාමාන්‍ය ජනතාවගේ හැඟීම් දන්නා කෙනෙක්. සාමාන්‍යයෙන් ප්‍රතිපත්ති ගරුක පුද්ගලයකු වන මුදල් ඇමතිතුමා, මේ සිංහල පරිවර්තන ගැන සැලකිල්ලක් නොදක්වීම පුදුමයට කාරණයක්.

ඒ කොහොම වුණත්, එදා අපේ අයවැය ලේඛන පිතෘවරයා බොහොම ලස්සණට කෙටි අයවැය කථාවක් කළ දාම, තවත් වැදගත් සිද්ධියක් වුණා. එතුමාගේ කථා වෙන් පසුව එදා මොකක්ද වුණේ? එතුමාට මතකද කියා මා දන්නෙ නැහැ. එතුමාගේ කථාවෙන් පසුව 3.05 තවත් වැදගත් සිද්ධියක් වුණා. එනම් එවකට අගමැති වූ ගරු ඩී. එස්. සේනානායක අග මැතිතුමා විසින් නිදහස් පනත ඉදිරිපත් කිරීමයි. එම නිදහස් පනත ඉදිරිපත් කිරී මට මොහොතකට පෙර රාජ්‍ය ඇමතිතුමා එවකට මුදල් ඇමති හැටියට කළ කථාව අවසන් කරමින් එදා කී කියමනක් මේ අවස්ථාවේදී නොකියාම බැහැ. 1947 දෙසැම්බර් මාසෙ 1 වෙනිදා හැන්සාඩ් වාර් තාවේ 437 වෙනි පිටුවේ මෙන්න මෙහෙම සඳහන් වී තිබෙනවා:

"While holding to these principles we shall further attempt to close from both ends the gap which separates the standard of living of the great mass of our fellow citizens from that of a small priviledged minority."—[OFFICIAL REPORT, 1st December 1947; Vol. 1, c. 437.]

එදා එතුමා ඔය විධියට කියා—

**කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Are we debating the throne speech of 1947?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

හරි, හරි, මම කියන්නම් ඇයි මේ කාර ණය මා ඉදිරිපත් කරන්නේ කියා. මේ වරත් වර්තමාන මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අයවැය වලිනුත් බලා පොරොත්තු වන්නේ සාමාන්‍ය මහජනතා වට සහනයක් ලබා දෙන්නයි. එතකොට දැනට අවුරුදු 21 කට කලිනුත් අයවැය වලින් බලාපොරොත්තු වුණේ සාමාන්‍ය මහජනතාවට සහනයක් ලබා දෙන්නයි. මා පැහැදිලි කරන්න යන්නේ මෙන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

මේ කාරණයයි. 1947 ඉදිරිපත් කළ අයවැය වලිනුත්, එතුමන්ලා බලාපොරොත්තු වුණේ මේ රටේ මහජනතාවගේ අඩුපාඩු කම් සම්පූර්ණ කර ජනතාවට සැනසිමක් ලබා දෙන්නයි. නමුත්, බැරි වුණා. එදත් අයවැය පරතරය පියවීම පිණිස එතුමන්ලා කරන්නට බලාපොරොත්තු වූ වැඩ කොට සක් තිබුණා. නමුත් ඒක හරි ගියේ නැහැ. එම නිසා එවැනි වැඩ පිළිවෙළවල් අද වන තුරුම සාර්ථක වී නැත්නම් මොකක්ද මේකට කළ යුතු ප්‍රතිකාරය කියා අපි බලන්න ඕනෑ. යෝජනා ටිකක් මාරු කර කර එහාට මෙහාට දැම්මට ප්‍රශ්නය විස දෙන්නෙ නැහැ. මෙහි යම් කිසි රෝගයක් තිබෙනවා. ඒ රෝගයට කළ යුතු ප්‍රතිකර්මය මොකක්ද කියායි සෙවිය යුත්තේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1947 දෙසැම්බර් මාසෙ පළමුවෙනිදා සිදු වූ අනික් වැදගත් සිද්ධිය නිදහස් පනත ඉදිරිපත් කිරීමය කියා මා දැන් මොහොතකට කලින් කිව්වා. ඒ නිදහස කියන්නේ මොකක්ද කියා එදා යම් යම් මත ඇති වුණා. එක කොටසක් කිව්වා නිදහස කියන්නේ අසු වල් අසුවල් දෙයටය කියා. තවත් කොට සක් ඊට වෙනස් අදහස් පළ කළා. අපට දේශපාලන නිදහස වාගේම ආර්ථික නිද හස තියෙන්න ඕනෑය කියා කොටසක් කිව්වා. නිදහසය කියන්නේ ඇඳීමේ නිද හසය, පැළඳීමේ නිදහසය, නිවාස ලැබීමේ නිදහසය, සෞඛ්‍ය සේවා ලැබීමේ නිද හසය, අධ්‍යාපනය ලැබීමේ නිදහසය ආදී වශයෙන් නිදහස ගැන නොයෙක් විධියේ තර්ක විතර්ක කළා. එහෙත් අවුරුදු 21 කට පසුවත් අපට ඒ සැම දේකින්ම ලැබෙන නිදහස භුක්ති විඳින්නට සිදු වී තිබෙන් නේ මේ අයවැය ලේඛනවලින් ඇති වන ප්‍රතිඵල අනුවයි. තත්ත්වය එසේ නම් එයට යම්කිසි ප්‍රතිකර්මයක් කළ යුතුව තිබෙනවාද නැද්ද කියන ප්‍රශ්නය කෙරෙහි අපේ සැලකිල්ල යොමු කරන්න ඕනෑ.

නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මේ ආණ්ඩු ක්‍රමය යටතේ අවුරුදු 21 කට පසු වත් අවුරුද්දක් අවුරුද්දක් පාසා ඉදිරි පත් කරනු ලබන අයවැය වලින් බලා පොරොත්තු වන සහනය අපේ සාමාන්‍ය ජනතාවට ලැබී නැත්නම් මගේ විශ්වාස යේ හැටියට මේ ආණ්ඩු ක්‍රමය පිළිබඳ වහාම සංශෝධනයක් ඇති කළ යුතුව තිබෙනවා. එයින් අප බලාපොරොත්තු වන සහනයන් අයවැය ලේඛනයකින් ජනතාවට ලබා දෙන්නට පුළුවන් වෙයිද, බැරි වෙයිද යන ප්‍රශ්නයයි මා රජයට ඉදිරි පත් කරන්නෙ. අයවැය ලේඛනයකින් එම සහනයන් දෙන්නට පුළුවන් වේයයි ගරු මුදල් ඇමතිතුමා කල්පනා කරනවාද කියා මා දන්නේ නැහැ. අයවැය ලේඛන යකින් ජනතාව බලාපොරොත්තු වන එම සහනයන් දෙන්නට පුළුවන් නම්, දැනට පවතින පාලන ක්‍රමයෙන් ඒකට නිදහසක් තිබෙනවා නම්, ඇයි එම සහනයන් ජනතා වට දීමට රජය කල්පනා නොකරන්නෙ? එදා අයවැය ලේඛන ඉදිරිපත් කළ අවස්ථා වලදීත් අපට සාකච්ඡා කරන්නට සිදු වුණේ ජනතාවගේ අපහසුකම් ගැනයි; අඩුපාඩුකම් ගැනයි; බඩගින්න, ඇඳීමට නැතිකම, නිවාස හිඟය, භාණ්ඩ හිඟය යනාදී කරුණු ගැනයි අප අදත් ඒ කරුණු ගැනමයි සාකච්ඡා කරන්නෙ. එදා තිබුණු තත්ත්වයට වඩා අද තත්ත්වය අබ මල් රේණුවකින් තරම්වත් හොඳ වී නැහැ. එදාට වඩා දහස් ගුණයකින් අද තත්ත්වය උග්‍ර වී තිබෙනවා.

අප අද හොඳින් ජීවත් වෙනවාය කියා සමාජයේ කුමන අංශයක කෙනෙකුවත් කියනවාද? සමාජයේ සැම මට්ටමකම ජීවත්වන සැම දෙනාටම අද සිද්ධ වී තිබෙන්නේ විශාල ආර්ථික පීඩනයකින් යුක්තව ජීවත් වීමටයි. එසේ නම් ඇයි මේකට ප්‍රතිකර්ම සොයන්නෙ නැත්තෙ? මේකට ප්‍රතිකර්මයක් සොයන්නට අප මහන්සි ගතයුතු නේද? එදා කියූ වැද ගත් කියමනක් මෙහි සඳහන් වෙනවා. අද ටත් ප්‍රතිකර්මය ඒකද? සමහර විට ඒක ප්‍රතිකර්මයක් හැටියට රජය සලකනවාද කියා මා දන්නේ නැහැ. එදා අයවැය ලේඛන විවාදයේදී රසවත් ප්‍රකාශයක් කර තිබෙනවා. ඔබතුමා පරණ දේවලට වැඩිය කැමති නිසා මා ඒ කොටස පමණයි කියවන්නෙ. අද මේ තිබෙන තත්ත්වයට අනික් ප්‍රතිකර්මය ඒකද? එකක් පාලන ක්‍රමය නැත්නම් ආණ්ඩු ක්‍රමය පිළිබඳව සංශෝධනයක් කර අයවැය ලේඛනය කින් ජනතාව බලාපොරොත්තු වන්නාවූ යහපත සලසා දීමයි. එසේ නොකරනවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නම් අනික් ප්‍රතිකර්මය කුමක් ද? එදා වැද ගත් අදහසක් පහළ වී තිබෙනවා. එවකට සෞඛ්‍ය හා පළාත් පාලන ඇමතිව සිටි එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහත්මයා කළ කථාවෙන් කොටසක් මා දැන් කියවන්නෙ :

"He made a—"

මෙතැන "He" කියන්නෙ යාපනේ ගරු මන්ත්‍රීතුමාටයි; පොන්නම්බලම් මන්ත්‍රීතුමාටයි. පොන්නම්බලම් මන්ත්‍රීතුමාගේ අදහසක් ගැන සඳහන් කරමින් බණ්ඩාරනායක මැතිතුමා කියන්නේ මෙහෙමයි :

"He made the brilliant suggestion that we should have rubber goods and soap—if I understood him right. In this juxtaposition, Mr. Speaker, rubber goods and soap are to solve the economic ills of Ceylon!"—(OFFICIAL REPORT, 11th December 1947; Vol. 1, c. 1328.)

අපේ ආර්ථික ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට නම් ඒ කියන විධියට රබර් භාණ්ඩ සහ සබන් පාවිච්චි කළ යුතුද? විද්‍යාත්මක යුගයක් හැටියට සලකන මේ යුගයේ ඒවා වෙනුවට දැන් වෙනත් දේ වල්, පෙති එහෙම නිෂ්පාදනය කර තිබෙනවා. එයින් ප්‍රශ්නය නිරාකරණය කරන්න යනවාද කියා මා දන්නේ නැහැ. හැබැයි, මේ රජයේ පසුගිය සෞඛ්‍ය ඇමතිතුමා ආර්ථික ප්‍රශ්නවලින් ගැල වෙන්නට අන්න ඒ ක්‍රමය යොදා ගැනීම ගැන කල්පනා කළා. එතුමා ඒ ඇමති පදවිය අත්හැර විද්‍යාත්මක හා පර්යේෂණ අමාත්‍යාංශයක් භාර ගත්තේ තවත් දේවල් නිපදවීම ගැන සොයන්නද කියා මා දන්නේ නැහැ. අද එතුමා ඉන්දියාවේලු.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කියන්නට වුවමනා කරන්නේ මේකයි. මේ ප්‍රශ්නය තවමත් අපට හරියාකාරව නිරාකරණය කර ගන්නට පුළුවන් වී නැහැ. අද තිබෙන මේ ආර්ථික ප්‍රශ්න මතුවීමට හේතු කීපයක් තිබෙනවා. සමාජයේ සමානාත්මතාවයක් නැත්නම්, මේ රටේ ජාතික සමගියක් නැත්නම්, කවදාවත් අපට මේ ආර්ථික ප්‍රශ්න නිරාකරණය කර ගන්නට බැහැ. වැඩි කොටසක් තියෙන පිරිස දෙනාත්, සුළු කොටසක් තියෙන වැඩි දෙනාත් අතර ඇත්තාවූ පරතරය නැති කළොත් පමණය, අපේ සමාජයේ සමානාත්මතාවය ඇති කරන්නට පුළුවන් වන්නේ, ඒ මගින් පමණය අපේ ආර්ථික ප්‍රශ්නය නිරාකරණය කර ගන්නට පුළුවන් වන්නේ කියා එදා ගරු රාජ්‍ය ඇමතිතුමා විසින් කියන්නට යෙදුණා. එසේ නම් ජාතික සමගියත්, සමානාත්මතාවයත් ඇති කිරීම සඳහා ජාතික රජය පසුගිය අවුරුදු 4 ඇතුළත කොයි තරම් දුරට කටයුතු කර තිබෙනවාද කියායි, අපට දැන් අහන්නට තිබෙන්නේ. ජාතික සමගිය ඇති කිරීම පැත්තකින් තබා ජාතික සමගිය සම්පූර්ණයෙන්ම නැති කිරීමේ කටයුතුවලට මේ රජය අත දෙන බවයි, අපට කියන්නට තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රටසභා පනතක් ගැන පසුගිය දවස්වල විවාද කරන්නට යෙදුණා. ඒ පනත සම්මත කර ගන්නට යන්නේ ජාතික සමගිය ඇති කිරීම සඳහාය කියා පෙන්වන්නට අග මැතිතුමා උත්සාහ කළා. ඉදිරිපත් වුණු විරෝධය පිළිගෙන ඒ අදහස අත්හැරීම ගැන අප ගරු අගමැතිතුමාට ස්තුති වන්ත වෙනවා. එහෙත් මේ රජය එදා තැත් කළේ ජාතික සමගිය ඇති කිරීමට නොවෙයි; ජාතික සමගිය කඩාකප්පල් කර, ජාතිය භේද භින්න කර වැඩි කොටසක් තිබෙන පිරිස දෙනාත්, සුළු කොටසක් තිබෙන වැඩි දෙනාත් අතර තිබෙන පරතරය වැඩි කිරීමටයි. ඒ චෝදනාවයි, අපට එල්ල කරන්නට තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජාතික සමගියක් ඇති කිරීමේ ඉලක්කය කරා යනා ගමන සාර්ථක කර ගැනීමේ මාර්ගය සමානාත්මතාවය ඇති කිරීම නම් මේ රජය ඔය දෙකම ඇති කිරීමට කටයුතු කර නැති බවයි, අපට කියන්නට තිබෙන්නේ. ජාතික සමගියක් මේ රටේ ඇති කිරීම සඳහා අවශ්‍ය ඉතාමත් වැද ගත් බැම්ම තද කරන්නය කියා අප එදා කියා සිටියා. මොකක්ද ඒ බැම්ම? එකම රාජ්‍ය භාෂාවකින් රටේ පාලන කටයුතු කිරීමයි. ඒක කිරීමට මේ රජය ලෑස්ති නැහැ.

මොහොතකට පෙර කයිට්ස්හි ගරු මන්ත්‍රීතුමා (වී. නවරත්නම් මයා.) කථා කරන විට සඳහන් කළා, 1966 දී මුදල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

ඇමතිතුමා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයක් ගැන. එනෙක්—1966 දක්වා—රජයේ සේවයේ නියුක්ත වූ අය ගෙන් බලාපොරොත්තු වූ රාජ්‍ය භාෂාවෙන් කටයුතු කිරීමේ තත්ත්වය ඉවත් කර නැවත වරක් ඒ ඒ අයට කැමති විධියට, හිතුවක්කාරකමට කටයුතු කිරීමේ නිදහස දී තිබෙනවා. ජාතික සමගිය ඇති කිරීමට තිබෙන ඒ බැම්ම—එකම එක භාෂාවකින් කටයුතු කිරීමේ බැම්ම—තද නොකරන්නේ ඇයි කියන ප්‍රශ්න යයි, අපට ගරු මුදල් ඇමතිතුමාගෙන් අහන්නට තිබෙන්නේ. රාජකාරිවලදී හෝ වේවා, ගෙදරදොරේදී හෝ වේවා ජාතීන් දෙකේ අයට වෙන් වෙන්ව හිතන්නට, ජාතීන් දෙක අතර භේදය තහවුරු වන විධියට කටයුතු කරන්නට, එතුමන්ලා ඉඩ දෙනවා නම් එතුමන්ලා බලාපොරොත්තු වන සමානාත්මතාවය ඇති කරන්නේ කොහොමද කියායි, අප අහන්නේ. ජාතික සමගිය ඇති කිරීම මේ ආර්ථික ප්‍රශ්න විසඳීමේ වැදගත් පිය වරක් වෙනවා.

එමනිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා මුලින් සඳහන් කළා වගේ අපේ ආණ්ඩු ක්‍රම සංශෝධනයක් අවශ්‍යයි. ජාතික සමගිය ඇති කිරීම පිණිස එක භාෂාවකින් කටයුතු කිරීම අවශ්‍යයි. එසින් ඒ ජාතියේ හෝ වේවා භාෂාවේ හෝ වේවා සම්පූර්ණ අයිතිය හා ආරක්ෂාව ලැබෙන අතර පරිපාලන කටයුතු වලදී සමානාත්මතාව ඇති වන විධියටත් ජාතික සමගිය තහවුරු වන විධියටත් භාෂා ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදිය යුතුයි. අපගේ ආර්ථික ප්‍රශ්න නිරාකරණය කර ගැනීමේදීත් එය විශාල උපකාරයක් වන්නේ නැද්දැයි මා රජයෙන් අහනවා. සමානාත්මතාව ඇති කිරීම පිණිස මේ රජය කොයිතරම් දුරට කටයුතු කර තිබෙනවාද? වැඩියෙන් තිබෙන සුළු පිරිසත් අඩුවෙන් තිබෙන විශාල පිරිසත් අතර තිබෙන පරතරය නැති කළ යුතු බව වර්තමාන රාජ්‍ය ඇමතිතුමා මීට අවුරුදු 21 කට පෙර ඉදිරිපත් කරන ලද එතුමාගේ අය වැය ලේඛනයකින් කියා තිබෙනවා. එහෙත්, ඒ කියමන ක්‍රියාත්මක කිරීමට එතුමා කොයිතරම් දුරට කටයුතු කර තිබෙන්වාද? අද අප ආර්ථික නිදහස ගැන කථා කරනවා. එහෙත්, ගම්බද ජනතාවගේ ආර්ථික නිදහස තහවුරු වීම සඳහා අත්‍යවශ්‍ය දෙයක් වන ගම්බද ඉඩම් ප්‍රශ්නය නිරාකරණය වී තිබෙනවාද? ගම්බද ජනතාවගේ කුඹුරු ප්‍රශ්නය හා ජල ප්‍රශ්නය නිරාකරණය වී තිබෙනවාද? ගම්බද ජනතාවගේ ණය බර වැඩි වුණා මිස සුළු වශයෙන්වත් අඩුවක් වී තිබෙනවාද? මුදල් ඇමතිතුමාගේ අයවැය කථාවෙහි සඳහන් වී තිබෙන මේ ප්‍රකාශය ගැන අප පුදුම වෙනවා :

> "එක් අතකින්, ආණ්ඩුව විසින් ගන්නා ලද මේ උත්සාහයන් මගින් ග්‍රාමීය අංශයෙහි මුදල් ආදායමේ වැඩිවීමකට ඉඩ සැලසුණා."

මේ කියන්නේ ගම්බද මිනිසුන්ට වැඩියෙන් මුදල් ලැබුණු බවයි. මුදල් ඇමතිතුමා මෙවැනි ප්‍රකාශයක් කිරීම ඇත්තෙන්ම පුදුමයි. එතුමා මේ ප්‍රකාශය කරන්නේ ගම්බද තත්ත්වය නොදැන වන්නට පුළුවනි. ගමේ කෙනකු වශයෙන් එතුමා මේ ප්‍රකාශය කරන්නේ හිතට එකඟවද? තමන් සතුව තිබෙන ඉඩකඩම් ටිකත් උකසට තබා ගොවි ණය ගෙවන්නට අද ගම්බද ගොවීන්ට සිදු වී තිබෙනවා. තත්ත්වය එය නම්, ගම්බද ජනතාව අතට වැඩිපුර මුදල් ආවායයි හිතට එකඟව කියන්නට මුදල් ඇමතිතුමාට පුළුවන්ද? ගොවි ප්‍රශ්නය නිරාකරණය වී නැහැ; ගම්බද ජනතාවගේ ඉඩම් ප්‍රශ්න නිරාකරණය වී නැහැ. ඔවුන්ගේ ආර්ථික තත්ත්වය දවසින් දවසම පිරිහෙනවා. කොළඹ සිටින ඉඩම් හිමියන්ගේ ඉඩම් ප්‍රශ්න නම් බොහෝම හොඳට විසඳී තිබෙනවා. නැති වැඩි පිරිසත්, ඇති සුළු පිරිසත් අතර තිබෙන පරතරය නැති කරන්නට ඕනෑයයි රාජ්‍ය ඇමතිතුමා එදා කිව්වා. එහෙත් සිදු වී තිබෙන්නේ කුමක්ද? ගැමි ජනතාවට ඉඩම් ටිකක් තිබුණේ වයඹ පළාතේ පමණයි. ඒකත් ගම්බද ජනතාවගේ බලවත් විරෝධය මැද්දේ අරගෙන කොම්පැනිකාරයන්ට දුන්නා. මේ නිසා ගැමියාගේ ඉඩම් ප්‍රශ්නය එන්න එන්නම උග්‍ර වන වාට කිසිම සැකයක් නැහැ. දැනටමත් එසේ වී තිබෙනවා. ගම්බද වාරිමාර්ග ප්‍රශ්න නිරාකරණය වෙලාත් නැහැ. තමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගේම ඡන්දදායක කොට්ඨාශයේ වාරි මාර්ග හා ඉඩම් ප්‍රශ්නය සාර්ථක ලෙස විසඳී තිබෙනවා යයි හිතට එකඟව කියන්නට ගරු මුදල් ඇමතිතුමාටවත් පුළුවන්ද? බැහැ. ඒ එක ප්‍රශ්නයක්වත් විසඳී නැහැ. මෙම ප්‍රශ්න විසඳීම සඳහා ගත යුතු පියවරවල් මොනවාදැයි සොයා බලා ඒ පියවරවල් ගන්නට රජය ක්‍රියා නොකරන්නේ ඇයි? එසේ ක්‍රියා නොකර, තත්ත්වය එසේ තිබියදී, මෙම පොතෙහි සඳහන් වී තිබෙන කරුණු සත්‍යයයි සාර්ථක ලෙස ඔප්පු කරන්නට මුදල් ඇමතිතුමාට පුළුවන්ද? ගම්බද ජනතාව අතේ අද වැඩිපුර මුදල් පරිහරණය වෙනවාය, ඒ නිසා ඔවුන්ට මුදල් හදල් අතින් සැනසීමට පත් වන්නට පුළුවන් වී තිබෙනවා යයි කියන්නට මුදල් ඇමතිතුමාට පුළුවන් වන්නේ කොහොමද? මා අහන ප්‍රශ්නය ඒකයි.

**එකල්හි වේලාව අ. භා. 8.30 වූයෙන් කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.**

**එතැන් සිට විවාදය 1968 අගෝස්තු 13 වන අඟහරුවාදා පවත්වනු ලැබේ.**

*அப்போது பி. ப. 8.30 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பெற்றது.*

1968 *ஓகஸ்ட்* 13, *செவ்வாய்க்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.*

*It being 8.30* P.M., *Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Tuesday, 13th August 1968.*

## කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

එකල්හි වේලාව අ. භා. 8.30 පසුකර තුබුයෙන් කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රි මණ්ඩලය කල්තබන ලදී.

**මන්ත්‍රි මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.21 ට 1968 අගෝස්තු 2 වන දින සභාසම්මතිය අනුව, 1968 අගෝස්තු 13 වන අඟහරුවාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේය.**

*அப்பொழுது நேரம் பி. ப. 8.30 க்குப் பிந்திவிட்டமையால் குழு உப அக்கிராசனர் அவர்கள் வினாவின்றிச் சபையை ஒத்திவைத்தார்கள்.*

*இதன்படி பி. ப.* 8.30 *க்குச் சபை அதனது* 1968 *ஆகஸ்ட்* 2 *ஆந் தேதிய தீர்மானத்திற் கிணங்க,* 1968 *ஓகஸ்ட்* 13, *செவ்வாய்க்கிழமை மு. ப.* 10 *மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 8.30* P.M., MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned the House without Question put.*

*Adjourned accordingly at 8.30* P.M. *until 10* A.M. *on Tuesday, 13th August 1968, pursuant to the Resolution of the House of 2nd August 1968.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

House of Representatives

1968 අගෝස්තු 13 වන අඟහරුවාදා

சனிக்கிழமை, 13 ஆகஸ்ட் 1968

Saturday, 13th August 1968

පූ. භා. 10 මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.

சபை, மு. ப. 10 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேலி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at* 10 A.M., MR. SPEAKER (THE HON. S. C. SHIRLEY COREA) *in the Chair.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

PAPERS PRESENTED

A set of By-laws made under Sections 22 and 24 of the Anuradhapura Preservation Board Act, No. 32 of 1961.—[*The Hon. Wanninayake on behalf of the Minister of Scientific Research and Housing.*]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

1967-68 අංක 20 දරණ පරිපූරක ඇස්තමේන්තුව—[ගරු දහනායක.]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

The Audited Accounts of the Ceylon Coconut Board for the year ended 31st December 1966.—[*The Hon. Hugh Fernando.*]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

Supplementary Estimate No. 19 of 1967-68.—[*The Hon. Dr. Dahanayake on behalf of the Minister of Agriculture and Food.*]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

A set of By-laws made under Sections 153 and 157 of the Urban Councils Ordinance (Cap. 255).—[*The Hon. Dr. Dahanayake on behalf of the Parliamentary Secretary to the Minister of Local Government, and to the Minister of Information and Broadcasting.*]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

வினாக்களுக்கு வாய்மூல விடைகள்

ORAL ANSWERS TO QUESTIONS

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Question No. 3.

**ඩී. පී. අතපත්තු මයා. (රාජ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டீ. பி. அத்தபத்து—இராஜாங்க அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. D. P. Atapattu—Parliamentary Secretary to the Minister of State)

On behalf of the Minister of Education and Cultural Affairs, I ask for one week's time.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Question No. 4.

**අතපත්තු මයා.**

*(திரு. அத்தபத்து)*

(Mr. Atapattu)

On behalf of the Minister of Public Works, Posts and Telecommunications, I ask for two weeks' time.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

### උඩුවක ආදී උප තැපැල් කාර්යාල උසස් කිරීම

*உடுவக முதலான உப தபால் நிலையங்கள் : தாமுயர்த்தல்*

### UDUWAKA AND OTHER SUB-POST OFFICES : UPGRADING

**5. පී. බී. විජයසුන්දර මයා. (කිරිඇල්ල)**
*(திரு. பீ. பி. விஜயசுந்தர—கிரியல்ல)*
**(Mr. P. B. Wijesundara—Kiriella)**

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කිරිඇල්ල ඡන්දදායක කොට්ඨාශයේ (i) උඩුවක, (ii) පොහොර බාව, (iii) හිඳුරන්ගල, (iv) මාවු වාගල යන ගම්වල උප තැපැල් කාර්යාල උසස් කිරීමට කිරිඇල්ලේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා තැපැල්පතිවරයාට දන්වා තිබෙන බව එතුමා දන්නවාද? (ආ) එකී තැපැල් කාර්යාලවල ගණුදෙනු නියමිත "යුනිට්" තත්ත්වයට පැමිණ නැති බැවින්, ඒවා උසස් කිරීමට නොහැකි බැව් තැපැල් පතිවරයා දන්වා එවා තිබෙන බැව් එතුමා දන්නවාද? (ඉ) "යුනිට්" ප්‍රමාණය නියම තත්ත්වයට නොපැමිණ ඇති නමුත්, සේවා අවශ්‍යතාම් උඩ සමහර තැපැල් කාර්යාලවල තත්ත්වය උසස් කර ඇති බව එතුමා දන්නවාද? (ඊ) එබැවින් සේවා අවශ්‍යතා වයන් උඩ එකී තැපැල් කාර්යාලවල තත්ත්වය උසස් කිරීමට එතුමා ක්‍රියා කරනවාද?

*அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) கிரியெல்லத் தேர்தல் தொகுதியைச் சேர்ந்த (i) உடுவக (ii) பொஹொரபாவ (iii) ஹிந்துராங்கல (iv) மாடு வாகல ஆகிய ஊர்களிலுள்ள உப தபால் நிலையங்களைத் தரம் உயர்த்துமாறு கிரியெல்லப் பாராளுமன்ற அங்கத்தவர் தபால் அதிபர் அவர்களைக் கேட்டிருந்ததை அவர் அறிவாரா? (ஆ) மேற்கூறிய தபால் நிலையங்களின் கொடுக்கல் வாங்கல் குறிக்கப்பட்ட அளவுக்கு வாராதிருதல் அவற்றைத் தரம் உயர்த்த முடியாதெனத் தபால் அதிபர் தெரியப்படுத்தியிருக்கிறார் என்பதையும் அவர் அறிவாரா? (இ) கொடுக்கல் வாங்கல் குறிப்பிட்ட அளவுக்கு வாராத போதிலும் சேவையின் தேவை அடிப்படையிற் சில தபால் நிலையங்கள் தரம் உயர்த்தப்பட்டிருப்பதை அவர் அறிவாரா? (ஈ) எனவே, சேவையின் தேவை அடிப்படையில் மேற்கூறிய தாபல் நிலையங்களைத் தரம் உயர்த்த அவர் நடவடிக்கை எடுப்பாரா?*

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) Is he aware that the Member of Parliament for Kiriella, has submitted a proposal to the Postmaster-General to the effect that the Sub-post Offices in the (i) Uduwaka, (ii) Pohorabawa, (iii) Hindurangala and (iv) Matuwagala villages should be upgraded? (*b*) Is he aware that the Postmaster-General has informed the Member of Parliament concerned that these Sub-post Offices cannot be upgraded as the volume of business transacted by them has not reached the required number of units? (c) Is he aware that in certain instances post offices have been upgraded notwithstanding the number of units, in view of the need to provide such postal services? (*d*) Will he therefore take action to upgrade the above-mentioned Sub-post Offices in view of the need to provide such postal services?

**අතපත්තු මයා. (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති වෙනුවට)**
*(திரு. அத்தபத்து—அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர்—சார்பாக)*
(Mr. Atapattu—on behalf of the Minister of Public Works, Posts and Telecommuncations)

(*a*) Yes. (*b*) Yes. (*c*) No. 'B' Grade sub-post office which has not obtained the required number of units was upgraded to 'A' Grade status. (*d*) No. Does not arise in view of (*c*) above.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## බිංගන්තලාව ජනපදයේ එම්. ජී. ටිකිරි බණ්ඩාට හා කේ. බී. බුලුමුල්ලට විරුද්ධව රාගල පොලීසියට කරන ලද පැමිණිල්ල

ருகலே பொலிஸ் : பிங்கன்தலாவ குடியேற்றத்தைச் சேர்ந்த எம். ஜீ. ரிக்கிரி பண்டா, கே. பீ. புலுமுல்ல ஆகியோருக்கெதிரான முறைப்பாடு

## RAGALA POLICE : COMPLAINT AGAINST M. G. TIKIRI BANDA AND K. B. BULUMULLA, BINTHALAWA COLONY

**බී. වයි. තුඩාවේ මයා. (මාතර) ටී. බී. එම්. හේරත් මයා.** (වලපනේ) වෙනුවට

*(திரு. பி. வை. துடாவ—மாத்தறை—திரு. ரி. பி. எம். ஹேரத்—வளப்பனே—சார்பாக)*

(Mr. B. Y. Tudawe—Matara—on behalf of—Mr. T. B. M. Herath—Walapane)

අග්‍රාමාත්‍ය, රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) වලපනේ රාගල පොලිස් වැසික්කියට අයත් බිංගන් තලාව (සාගල පුර) ජනපද වැසියන් කීපදෙනෙකු විසින් අර්තාපල් වංචාවක් පිළිබඳව එම ජනපදයේ එම්. ජී. ටිකිරි බන්ඩා, කේ. බී. බුලුමුල්ල යන දෙදෙනාට විරුද්ධව 1966 සැප්තැම්බර් මාසයේදී පැමිණිල්ලක් කරන ලද්දේ ද? (ආ) එම පැමිණිල්ල ගැන මෙතෙක් කුමක් කර තිබේද? (ඉ) මේ පිළිබඳව 1967.10.31 දින වලපනේ මන්ත්‍රිවරයා නුවරඑළියේ පොලිස් අධිකාරීවරයාට ලියාපදිංචි තැපැලෙන් යැවූ ලිපියට පිළිතුරු නුදු නැත්තේ මන්ද? (ඊ) දැන්වත් එම පැමිණිල්ල ගැන පොලීසිය ක්‍රියා කරන්නේද? නො එසේ නම්, ඒ මන්ද?

*பிரதம அமைச்சரையும், பாதுகாப்பு, வெளி விவகார அமைச்சரையும், திட்ட அமைப்பு பொருளாதார விவகார அமைச்சரையும், தகவல், ஒலிபரப்பு அமைச்சரையும் கேட்ட வினா (அ) வலப்பனே, ருகலே போலிஸ் வட்டாரத்திலுள்ள பிங்கன்தலாவ (சாகல்புர) குடியேற்றத்திட்டதில் வசிப்பவர்கள் பலர், உருளைக் கிழங்கு மோசடி ஒன்று சம்பந்தமாக அக்குடியேற்றத்திலுள்ள எம். ஜீ. ரிக்கிரிபண்டா, கே. பீ. புலுமுல்ல ஆகிய இருவருக்கும் எதிராக, 1966 ஆம் ஆண்டு செப்ரெம்பர் மாதத்தில் முறைப்பாடு செய்துள்ளனரா? (ஆ) அம் முறைப்பாடு சம்பந்தமாக இற்றைவரை என்ன செய்யப்பட்டுள்ளன? (இ) இவ்விடயம் சம்பந்தமாக 31.10.1967 அன்று வலப்பனைப் பாராளுமன்ற அங்கத்தவர் நுவரேலியாப் பொலிஸ் அதிகாரிக்குப் பதிவுத் தபால் மூலமாக அனுப்பிய கடிதத்துக்கு என் பதில் தானும் அனுப்பப்படவில்லை? (ஈ) இப்பொழுதாவது, அம்முறைப்பாடு சம்பந்தமாகப் போலிஸ் நடவடிக்கை எடுக்குமா? அன்றேல், என்?*

asked the Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting : (*a*) In September 1966 was a complaint made by several colonists of the Binthalawa (Sagalapura Colony in the Ragala police division in Walapane against two other colonists of the same colony, namely M. G. Tikiri Banda and K. B. Bulumulla, regarding a fraud involving potatoes? (*b*) What action has been taken so far, in connection with this complaint? (*c*) Why is it that the letter sent under registered cover to the Superintendent of Police, Nuwara Eliya by the Member of Parliament for Walapane, on 31.10.67, in connection with this matter has not even been replied to? (*d*) At least now, will the police take action in this matter and if not, why?

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති, සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)**

*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும், தகவல், ஒலிபரப்பு அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

(*a*) Yes. But the complaint had been made in October and not in September 1966. (*b*) The investigations have been completed and case No. 36478 has been filed in M. C. Nuwara Eliya against the two accused M. G. Tikiri Banda and K. B. Bulumulla for fraud. (*c*) Although a letter sent by the M.P. for Walapane had been received by the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Superintendent of Police, Nuwara Eliya on 21.11.67, it had not been acknowledged due to a lapse. Disciplinary action is being taken against the officer who is responsible for this lapse. (*d*) Does not arise.

### දඹගොල්ල විද්‍යාලය

*தம்பகொல்ல வித்தியாலயம்*

**DAMBAGOLLA VIDYALAYA**

2. තුඩාවේ මයා. (ටී. බී. එම්. හේරත් මයා—වෙනුවට)

*(திரு. துடாவ—திரு. ரி. பி. எம். ஹேரத்—சார்பாக)*

(Mr. Tudawe—on behalf of—Mr. T. B. M. Herath)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) නු/දඹගොල්ල විද්‍යාලය 1968.1.1 ට පෙර 10 වැනි ශ්‍රේණිය දක්වා පන්ති තිබූ විද්‍යාලයක් බව එතුමා දන්නවාද? (ආ) මෙම විද්‍යාලය පළාතේ මන්ත්‍රීවරයාගේ ඉල්ලීමද නොතකා 1968.1.1 සිට කණිෂ්ඨ (7 වැනි පන්තිය දක්වා) විද්‍යාලයක් බවට පහත හෙලනලද බව එතුමා දන්නවාද? (ඉ) 1968 ජනවාරි මාසයේ 7 වැනි පන්තිය සමත් සිසුන් 26 දෙනෙකු නිල්දණ්ඩාහින්න විද්‍යාලයට යවන ලද බව එතුමා දන්නවාද? (ඊ) ඉන් කී දෙනෙකු දැනට ඉගෙනීම අතහැර දමා තිබේද? (උ) ආර්ථික දුර්වලකම් වලින් පෙළෙන දුප්පත් දෙමාපියන්ට තමන්ගේ ළමයින් දුර බැහැර යැවීම උග හට බව එතුමා දනන්වාද? (ඌ) මෙම විද්‍යාලයේ නැවතත් 10 වැනි ශ්‍රේණිය දක්වා පන්ති පැවැත්වීමට එතුමා ක්‍රියා කරනවාද නො එසේ නම්, ඒ මන්ද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) நு/தம்பகொல்ல வித்தியாலயத்தில் 1.1.1968 க்கு முன் 10 ஆவது வகுப்புவரை வகுப்புகள் இருந்தன என்பதை அவர் அறிவாரா? (ஆ) அவ்வித்தியாலயம், அப்பகுதிப் பாராளுமன்ற அங்கத்தினரின் வேண்டுகோளையும் மதியாது 1.1.1968 இலிருந்து கனிஷ்ட (7 வது வகுப்பு வரை) வித்தியாலயமாகத் தரம் குறைக்கப்பட்டதையும் அவர் அறிவாரா? (இ) 1968 ஆம் ஆண்டு ஜனவரி மாதத்தில் 7 ஆவது வகுப்பு சித்தியெய்திய 26 மாணவர்கள் நில்தண்டாஹின்ன வித்தியாலயத்திற்கு அனுப்பப்பட்டதை அவர் அறிவாரா? (ஈ) அவர்களில் எத்தனை பேர் இப்பொழுது கல்வி கற்பதைக் கைவிட்டுள்ளனர்? (உ) பொருளாதார நெருக்கடியுள்ள வறிய பெற்றோர்கள் தமது பிள்ளைகளைத் தூரப் பகுதிகளுக்கு அனுப்புவது கஷ்டமான செயல் என்பதை அவர் அறிவாரா? (ஊ) இவ்வித்தியாலயத்தில் மீண்டும் 10 ஆவது வகுப்பு வரை வகுப்புகள் நடாத்த அவர் நடவடிக்கை எடுப்பாரா? அன்றேல், ஏன்?*

asked the Minister of Education and Cultural Affairs : (*a*) Is he aware that නු/Dambagolla Vidyalaya is a school where classes were held up to grade 10, prior to 1.1.68? (*b*) Is he aware that with effect from 1.1.68 this school has been converted to a Junior School (up to Std. 7) and thus lowered in status, notwithstanding the request of the Member of Parliament for the area? (*c*) Is he aware that in January, 1968, 26 students who had passed the 7th standard were sent to Nildandahinna Vidyalaya? (*d*) How many of these students have since given up their studies? (*e*) Is he aware that poor parents find it different to send their children to schools in far off places? (*f*) Will he take action to conduct classes once again up to grade 10 in the school referred to above, and if not, why?

**ගාමිණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமனி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

(*a*) Yes. (*b*) There has been no reduction in the status of this school due to reorganization. (*c*) The number of children who had passed the 7th standard is 27 and not 26. These children were at liberty to attend either N/Rupaha Maha Vidyalaya or N/Nildandahinna Maha Vidyalaya. So far only 19 children have sought admission to Nildandahinna Maha Vidyalaya, and of these, one has been withdrawn from school

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගාමිණී ජයසූරිය මයා.]

as the parents have left the area. (d) Not known. (e) N/Nildandahinna Maha Vidyalaya and Rupaha Maha Vidyalaya are situated at a distance of 2½ miles from Dambagolla Vidyalaya. The distance from the closest boundary of the village to these two schools is 1½ miles. This being the situation, no inconvenience has been caused to the students of Dambagolla Vidyalaya. (f) No. The matter has been clarified at (e).

කථානායක තුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Question No. 6.

ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)
(கௌரவ எம். டி. பண்டா—விவசாய, உணவு அமைச்சர்)
(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

The details asked for in this Question are so elaborate and so many departments are involved that at least two months will be required to sort out the information.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

### උඩහේවාහැට මුන්වත්තේ බී. ඩබ්ලිව්. කේ. බණ්ඩා මහතාගේ වැන්දඹුවට විශ්‍රාම වැටුප්

திரு. பீ. டபிள்யு. கே. பண்டா, முன்வத்த, உடஹேவாஹெற்ற

### MR. B. W. K. BANDA, MUNWATTE, UDA HEWAHETA : PENSION TO WIDOW

7. තුඩාවේ මයා. (ටී. බී. එම්. හේරත් මයා. වෙනුවට)
(திரு. துடாவ—திரு. ரி. பி. எம். ஹேரத்—சார்பாக)
(Mr. Tudawe—on behalf of Mr. T. B. M. Herath)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) විශ්‍රාම වැටුප් අංක 82/49683 දරණ බී. ඩබ්ලිව්. කේ. බණ්ඩා මහතා (නුවරඑළිය දිස්ත්‍රික්කය උඩ හේවාහැට-මුන්වත්ත) 1968.4.9 දින මිය ගිය බව එතුමා දන්නවාද? (ආ) ඔහුට හිමි හිඟ විශ්‍රාම වැටුප් ඔහුගේ භාර්යාව වන බී. ඩබ්. කුමාරිහාමි මහත්මියට නොපමාව ගෙවීමට එතුමා ක්‍රියා කරනවාද? නොඑසේ නම් ඒ මන්ද (ඉ) ඇයට වැන්දඹු ආධාර මුදල් දීමනා වහාම ලබාදීමට එතුමා ක්‍රියා කරනවද? නොඑසේ නම් ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) உபகாரச் சம்பள இல. 82/49683 ஐ, உடைய திரு. பி. டபிள்யு. கே. பண்டா (நுவரேலியா மாவட்ட உடஹேவாஹெற்ற முன்வத்த) 1968.4.9 ம் திகதி இறந்து போனதை அவர் அறிவாரா? (ஆ) அவருக்குரிய பாக்கி உபகாரச் சம்பளத்தை அவரின் மனைவியாகிய திருமதி பி. டபிள்யு. குமாரிஹாமிக்கு தாமதமின்றி வழங்க அவர் நடவடிக்கை எடுப்பாரா? அன்றேல் ஏன்? (இ) அன்னாருக்கு விதவை அநாதை இளைப்பாற்றுச் சம்பள நிதி உதவியை உடனே பெற்றுக்கொடுக்க அவர் நடவடிக்கை எடுப்பாரா? அன்றேல் ஏன்?

asked the Minister of Finance: (a) Is he aware that Mr. B. W. K. Banda (Munwatte, Uda Hewaheta, Nuwara Eliya District), whose pension number was 82/49683 died on 9.4.68? (b) Will he take action to pay arrears of pension due to the deceased person to his widow Mrs. B. W. Kumarihamy, without delay? If not why? (c) Will he take action to make all payments due to his widow immediately, and if not, why?

ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)
(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

(අ) ඔව්. (ආ) නැසීගිය බණ්ඩා මහතා වෙනුවෙන් 1968 අප්‍රේල් මසය සඳහා විශ්‍රාම වැටුප් වශයෙන් රු. 96.53 ක් ගෙවීමට ඇත. එම මුදල් ලබා ගැනීම සඳහා නුවරඑළිය දිසාපති කාර්යාලයට පැමිණෙන ලෙස නැසීගිය අයගේ නීත්‍යානුකූල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උරුමක්කාරයින්ට දන්වා යවා ඇත. (ඉ) වෙන්දමු විශ්‍රාම වැටුපක් හිමි නැති බැවින් ප්‍රදානය කළ හැකි නොවේ.

## අක්ෂිදන

கண் தானம்

EYE DONATIONS

8. ප්‍රින්ස් ගුණසේකර මයා. (හබරාදූව)
(திரு. பிறின்ஸ் குணசேக்கா—ஹபரதுவ)
(Mr. Prins Gunasekera—Habaraduwa)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අක්ෂිදන ක්‍රමය යටතේ 1968 ජනවාරි 1 වෙනිදා වනවිට ලැබුණු මුළු ඇස් ගණන කීයද ? (ආ) ඒ කාලය තුළ මාසයකට ලත් සාමාන්‍ය ඇස් ගණන කොපමණද ? (ඉ) 1968 අප්‍රේල් මාසයේ ඇස් බැංකුවට ලැබුණු ඇස් ගණන කොපමණද ?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) கண்தான திட்டத்தின்கீழ் 1969 ஜனவரி 1 ஆம் தேதி வரை கிடைத்த மொத்தக் கண்கள் எத்தனை? (ஆ) அக்கால கட்டத்தில் மாதத்தில் கிடைத்த கண்களின் சராசரி என்ன? (இ) 1968 ஏப்றில் மாதத்தில் கண் வங்கிக்கு கிடைத்த கண்கள் எத்தனை?*

asked the Minister of Health: (*a*) What is the total number of eyes received under the Eye Donation Scheme as at 1.1.1968 ? (*b*) What is the average number of eyes received per month during this period? (*c*) What is the number of eyes received by the Eye Bank in April 1968 ?

**ගරු ඊ. එල්. සේනානායක (සෞඛ්‍ය ඇමති)**
*(கௌரவ ஈ. எல். சேனநாயக்க—சுகாதார அமைச்சர்)*
(The Hon. E. L. Senanayake—Minister of Health)

(අ) 1062 (ආ) 20 (ඉ) 6.

## 1967 අ. පො. ස. (සාමාන්‍ය) විභාගය : සිංහල ලඝු ලේඛනය ප්‍රශ්න පත්‍රය

பொ. த. ப. (சா. த.) பரீட்சை, 1967: சுருக்கெழுத்து (சிங்களம்) பரீட்சை

G. C. E. (O/L) EXAMINATION, 1967 : SHORTHAND (SINHALA) PAPER

9. ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கா)
(Mr. Prins Gunasekera)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: 1967 දෙසැම්බර් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ (සිංහල මාධ්‍ය) ලඝු ලේඛනය/යතුරු ලියනය යන විෂයේ ලඝු ලේඛනය ප්‍රශ්න පත්‍රයට—(i) පාඨශාලා අයදුම්කරුවන් කී දෙනෙක් පෙනී සිටියෝද ? (ii) බාහිර අයදුම්කරුවන් කී දෙනෙක් පෙනී සිටියෝද (iii) ඔවුනතුරෙන් කී දෙනෙක් මේ ප්‍රශ්න පත්‍රයට උත්තර සපයා සාමාර්ථය ලබා සිටිත්ද ?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: 1967 பொ. த. ப. சாதாரண பரீட்சை சுருக்கெழுத்துப் பாடத்தில் சிங்கள சுருக்கெழுத்து/தட்டெழுத்து கேள்விப்பத்திரம் சம்பந்தமாகக் கீழ்க்கண்ட விவரங்களை அவர் சமர்ப்பிப்பாரா: (i) இப்பாடத்தேர்ச்சிக்குத் தோன்றிய பாடசாலை மாணவரின் எண்ணிக்கை; (ii) இப்பாடத்தேர்ச்சிக்குத் தோன்றிய வெளி மாணவரின் எண்ணிக்கை; (iii) இப்பாடத்தின் தேர்ச்சிபெற்ற மாணவரின் எண்ணிக்கை.*

asked the Minister of Education and Cultural Affairs: Will he state the following particulars in regard to the shorthand question paper set for shorthand/typewriting (Sinhala) in the 1967 G.C.E. (Ordinary Level) Examination: (i) the number of school candidates who appeared for this paper; (ii) the number of private candidates who appeared for this paper; (iii) the number of candidates who obtained passes in this paper ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

(i) පාඨශාලා අයදුම්කරුවන් 4165, (ii) බාහිර අයදුම්කරුවන් 4878, (iii) ඔවුනතුරෙන් සාමාර්ථය ලබා ඇති (අ) පාඨශාලා අයදුම්කරුවන් 931, (ආ) බාහිර අයදුම්කරුවන් 1081.

විජයසුන්දර මයා.
(திரு. விஜயசுந்தர)
(Mr. Wijesundara)

මේ විභාගයේ සිංහල ලසු ලේඛනය විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන්ට කියවා තිබෙන්නේ ඉංග්‍රීසි පොතකින් උපුටා පරිවර්තනය කරන ලද අමාරු සිංහල ඡේදයක් බවත්, ඉංග්‍රීසි ලසු ලේඛනය විෂයයක් වශයෙන් ගත් උදවිය සඳහා කියවා තිබෙන්නේ සාමාන්‍ය ලිපියක් බවත් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා දන්නවාද ?

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

මම දන්නෙ නැහැ. ඒ ගැන සොයා බලන්නම්.

### දුම්රිය දෙපාර්තමේන්තුවේ ආදේශක පෝටර්වරු

இ.பு.தி. : பதில் சுமையாளர்

C. G. R. : SUBSTITUTE PORTERS

10. ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ප්‍රවාහණ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ආදේශක පෝටර්වරු කොපමණ සිටිත්ද ? (ii) මින් ස්ථිර රැකියාව දීම සඳහා ලියාපදිංචි වී ඇති අවුරුදු හයකට වැඩි අය කොපමණ සිටිත්ද ? (iii) අවුරුදු හයකට වැඩි සේවයක් කර ඇති ආදේශකයින් ස්ථිර කරනවාද ? (ආ) 1951-393 වැනි චක්‍ර ලේඛනයේ කොන්දේසි අනුව අවුරුදු ගණනාවක් සේවය කළ ආදේශකයින්ට වයස් සීමාවක් නොමැති බව එතුමා දන්නවාද ? (ඉ) දැනට ස්ථිර රැකියාව සඳහා ලියාපදිංචි වී සිටින ආදේශකයින් ස්ථිර කරන තුරු බාහිර අය ගැනීම අසාධාරණ බැව් එතුමා දන්නවාද ? එය සම්පූර්ණයෙන් නතර කිරීමට කටයුතු සලස්වනවාද ?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) இலங்கை புகையிரதத் திணைக்களத்திலுள்ள பதில் சுமையாளர் எத்தனை பேர் ? (ii) இவ்வெண்ணிக்கையில் ஆறு வருட சேவையின் பின் நிரந்தர வேலைக்காகப் பதியப்பட்டோர் தொகை என்ன ? (iii) திணைக்களத்தில் ஆறு வருட சேவையுள்ள பதிவாளருக்கு நிரந்தர நியமனங் கொடுப்பாரா ? (ஆ) 1951 ஆம் ஆண்டின் 393 ஆம் இலக்கச் சுற்றறிக்கையில் காணப்படும் விதிகளின்படி பல வருடங்களாகச் சேவையாற்றிய பதிலாளர்கட்கு உச்ச வயதெல்லை கூறப்படவில்லையென்பதை அவர் அறிவாரா ? (இ) நிரந்தர வேலைக்காகப் பதியப்பட்டுள்ளோர்களுக்கு அவ்வித நியமனங் கொடுக்கும் வரை புதிதாகப் பதிலாளர்களைச் சேர்ப்பது நியாயமானதல்ல என்பதை அவர் அறிவாரா ? அவ்விதம் ஆட் சேர்ப்பதை முற்றாக நிறுத்தும்படி கட்டளை பணிப்பாரா ?

asked the Minister of Communications: (*a*) (i) How many substitute porters are there in the Ceylon Government Railway; (ii) of this number how many who have over six years' service have been registered for permanent appointments; (iii) will he give permanent appointments to those substitutes who have served over six years in the department? (*b*) Is he aware that in terms of the condition specified in Circular No. 393 of 1951, there is no maximum age limit for substitutes who have been in service for several years? (c) Is he aware that it would be unfair to recruit new substitutes until those who have been registered for permanent appointments are given such appointments? Will he order that such recruitment be completely stopped?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහණ ඇමති)

(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்குவரத்து அமைச்சர்)

(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

(*a*) (i) Four hundred and Thirty-eight. (ii) One hundred and six. (iii) No. They cannot be considered for permanent appointments on this qualification alone. (*b*) I am not aware of any such circular. According to the scheme of recruitment of porters, the age limit for substitutes is 30 years. (*c*) There is no provision for this in terms of Treasury Circular No. 674.

## කෙහෙල් ඇල්ල ගම්සභාවට ඉහළ මඩම් පැල්ලෙන් බිම් තීරුවක්

கஹெலெல்ல கி.ச. : மடம்பெற்றவில் காணித்துண்டுக் கான வேண்டுகோள்

## KEHELELLA V.C. : REQUEST FOT STRIP OF LAND AT IHALA MADAMPELLA

11. තුඩාවේ මයා. (ලක්ෂ්මන් ජයකොඩි මයා.—දිවුලපිටිය—වෙනුවට)

(திரு. துடாவ—திரு. லக்ஷ்மன் ஜயக்கொடி திவுலுபிட்டிய—சார்பாக)

(Mr. Tudawe—on behalf of Mr. Lakshman Jayakody—Divulapitiya)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කොළඹ දිසාපතිගේ ඇල්බී 8210 හා සර්වේ ජනරාල් තුමාගේ සීආර්/ඒ හා පිඹුරු අංකය පීපීඒ 1710 දරණ ඉහල මඩම්පැල්ලේ රජයට අයත් අඩි 60ක් පමණ බිම් තීරුව කෙහෙල්ඇල්ල ගම් සභාවට පවරා දෙනමෙන් කරන ලද ඉල්ලීම ඉටු නොවූයේ මන්දැයි එතුමා දන්නවාද? (ආ) එය ඉටු කිරීමට එතුමා වහාම කටයුතු කරනවාද? (ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) கொழும்பு அரசாங்க அதிபரின் இல. LD. 8210 ஐக் கொண்டதும் நில அளவையாளர் அதிபதியின் இல. CR/A ஐக் கொண்டதும் PPA 1710 இலக்க வரைப்படத்திலுள்ளதும் இகல மடம்பெற்றவிலுள்ளதுமான முடிக்குரிய 60 அடி காணித்துண்டை கஹெலெள்ள கிராம சங்கத்திற்கு ஒப்படைக்கும்படி செய்த வேண்டுகோளை நிறைவேற்றுததேன் என்று கூறுவாரா? (ஆ) இவ்வேண்டுகோளை நிறைவேற்ற உடன் நடவடிக்கை எடுப்பாரா? (இ) இன்றேல், ஏன்?

asked the Minister of Land, Irrigation and Power: (*a*) Will he state why the request that a 60-foot strip of land at Ihala Madampella belonging to the Crown and bearing Colombo Government Agent's No. LB. 8210, Surveyor-General's No. CR/A and Plan No. PPA. 1710 be handed over to the Kehelella Village Council, was not complied with? (*b*) Will he take immediate action to grant this request? (*c*) If not, why?

ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)

(கௌரவ சி. பி. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

(*a*) I have already approved the vesting of this land to the V.C. Kehelella. Action is being taken to have the land surveyed with a view to issuing the vesting order. (*b*) and (*c*) See above.

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

Question No. 12.

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சி. பி. டி சில்வா)

(The Hon. C. P. de Silva)

We have not been able to get all the information required. I want two weeks' time to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු

சபை அலுவல்

## BUSINESS OF THE HOUSE

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சி. பி. டி சில்வா)

(The Hon. C. P. de Silva)

I move,

"That for purposes of the proceedings on the Second Reading of the Appropriation Bill, 1968-69, Standing Order No. 74 (4) shall operate with the substitution of 'eight' and 'eighth' for 'seven' and 'seventh' respectively."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சி. பி. டி சில்வா)

(The Hon. C. P. de Silva)

I move,

"That Saturday, 17th August; Sunday, 18th August; Monday, 19th August and Tuesday, 20th August, 1968 be Allotted Days for the consideration of the Appropriation Bill, 1968-69."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්

சபை அமர்வு

## SITTINGS OF THE HOUSE

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சி. பி. டி சில்வா)

(The Hon. C. P. de Silva)

I move,

"That this House at its rising this day do adjourn until 10 A.M. on Friday, 16th August, 1968, and that the hours of Sitting that day shall be as though it were a Fifth day from the Poya Day."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## විසර්ජන පනත් කෙටුම්පත, 1968-69

ஒதுக்கீட்டு மசோதா, 1968-69

## APPROPRIATION BILL, 1968-69

කල් තබන ලද විවාදය තව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [අගෝස්තු 2.]

"කෙටුම්පත් පනත දැන් දෙවන වර කියවිය යුතුය"—[ගරු වන්නිනායක]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

ஓகஸ்ட் 2 ஆம் தேதிய வினா ஒத்திவைக்கப்பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

"மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிப்பிக்கப்படுமாக" [கௌரவ வன்னிநாயக்க]

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Order read for resuming Adjourned Debate on Question—[2nd August.]*

"That the Bill be now read a Second time".[*The Hon. Wanninayake.*]

*Question again proposed.*

අ. භා. 10.10

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)

(திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய)

(Mr. M. Tennakoon—Nikaweratiya)

ගරු කථානායකතුමනි, අපි ඊයේ විසිර යන අවස්ථාවේදී උත්සාහ කළේ අයවැය යෝජනාවලින් මේ රටේ පොදු මහජනතාව බලාපොරොත්තු වූ සහනයක් ලැබී නැති බව රජයට පෙන්වා දීමටයි. ගරු මුදල් ඇමතිතුමාගෙනුත් රජයෙනුත් අපි අහන්ට බලාපොරොත්තු වෙන්නෙ, මුදල් ඇමතිතුමාගේ අයවැය කථාවේ සඳහන් වන අන්දමට "ග්‍රාමීය අංශයෙහි මුදල් ආදාය මේ වැඩිවීමකට ඉඩ සැලසුණා" කියන කාරණය තමුන්නාන්සේලාට හිතට එකඟව ඔප්පු කරන්න පුළුවන්ද කියායි. ගරු කථානායකතුමනි, ග්‍රාමීය අංශයේ මුදල් වැඩිවීමක් වෙනුවට අද සිදු වී තිබෙන්නෙ ගම්බද මහජනයාගේ ආර්ථික තත්ත්වය කවදාවත් නොවූ විරූ අන්දමින් පහත වැටී මයි. ගොවි ණය ගෙවීම පිණිස තමන් සතු ඉඩකඩම් උකස් කිරීමට අද ගොවි ජනතාවට සිදු වී තිබෙන බව අප ඊයේ රාත්‍රියේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පෙන්වා දුන්නා. මෙයින් සිදු වී තිබෙන්නෙ, එදාට වඩා අද ගම්බද මහජනයා විශාල ආර්ථික පිරිහීමකට, තදබදයකට, හිරවීමකට පාත්‍ර වීමයි. එම නිසා මේ ආර්ථික සැලැස්මේ රජය අනුගමනය කරන වැඩ පිළිවෙලේ, සාර්ථක තත්ත්වයක් තිබෙනවායයි හිතට එකඟව රජය කල්පනා කරනවා යයි මා හිතන්නෙ නැහැ. මෙය පැහැදිලිව අපට ඔප්පු වෙනවා. එක් අතකින් පාරිභෝගික ආහාර ද්‍රව්‍ය ගෙන්වීම සඳහා වැය වන විදේශ විනිමය නැවැත්වීමට මේ රජය තරයේ කටයුතු කර ගෙන යනවා. පාරිභෝගික ආහාර ද්‍රව්‍ය සහ වෙනත් අත්‍යවශ්‍ය බොහෝ දේවල් ගෙන්වීම වැළැක්වීමෙන් මේ රජය විදේශ විනිමය ආරක්ෂා කර ගන්නා එ මගින් රටේ ආර්ථික තත්ත්වය රැක ගන්න උත්සාහයක් දරනවා යයි කීවත් ඇත්ත වශයෙන්ම අපේ විදේශ විනිමය රැක ගැනීම පිණිස මේ රජය උත්සාහයක් දරනවා ද? නැහැ. අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හා පාරිභෝගික ආහාර ද්‍රව්‍ය ගෙන් වීම බොහෝ දුරට නවත්වා දමා අනවශ්‍ය යන්ත්‍රෝපකරණ ගෙන්වීමට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැය කර තිබෙනවා, එය තමුන්නාන්සේ පිළිගන්නවා ද ?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

තමුන්නාන්සේ කියන ඔක්කොම පිළිගන්න බැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

අපේ විදේශ විනිමය ආරක්ෂා කර ගන්න උත්සාහ දරා නැහැ. විදේශ විනිමය ආරක්ෂා කර ගැනීමේ මුවාවෙන් පොදු මහජනතාවට බලපාන ප්‍රශ්නවලට අවහිරකම් ඇති කර තිබෙනවා. අපේ විදේශ විනිමය ආරක්ෂා කර ගනිමින්, අපේ ආර්ථික තත්ත්වය හොඳ අතට නැංවීමට කටයුතු යොදනවාය කීවත් දවසින් දවස අපේ ගෙවීම් ශේෂය වැඩි වෙමින් පවතිනවා. මේ නිසා පොදු මහජනතාවට ආර්ථික සහනයක් නොලැබෙන බව පැහැදිලිව පෙනී යනවා.

ගරු කථානායකතුමනි, 1965 න් පසුව බලයට පැමිණි මේ රජය අද වනතුරු අනුගමනය කර ගෙන ආ විදේශ විනිමය ප්‍රතිපත්ති නිසා දවසින් දවසම අපේ ආර්ථික තත්ත්වයට හානි පැමිණ නැද්ද කියා ප්‍රශ්න කරනවා. එයට හොඳට නිදසුනක් තමයි මෑතකදී ඇති කළ විදේශ විනිමය සහතික පත් ක්‍රමය. පසුගිය රජය අපේ ගෙවීම් ශේෂය වැඩි වීම වැළැක්වීම පිණිස යම් යම් පියවර ගත්තා නම් ඒ පියවර සියල්ලම අද ක්‍රම ක්‍රමයෙන් ලිහිල් කර ගෙන නැවතත් මේ රටේ ධනය විදේශ රටවලට ඇදී යාමේ මාර්ග විවෘත කර තිබෙන බව පෙනී යනවා. එක් පැත්තකින් විදේශ විනිමය සහතික පත් ක්‍රමය ක්‍රියාවේ යොදවන අතර අනික් පැත්තෙන් කෘෂිකාර්මික නිෂ්පාදන ද්‍රව්‍ය වැඩි කර ගැනීම පිණිස යයි යන්ත්‍රෝපකරණ ගෙන්වීම, ගමනා ගමන පහසුකම් ඇති කිරීම සඳහා යයි කියමින් ධනපති කොටස්වලට වාහන ආදිය ගෙන්වන්න ඉඩ දීම යනාදිය සඳහා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැය කරනවා. මෙයින් පෙනී යන්නේ එක් පැත්තකින් මේ රටේ පොදු මහජනතාවගේ පහසුකම් අඩු කරමින්, අනික් පැත්තෙන් ධනය ඇති සුළු කොටසකට පහසුකම් සැලසීම සඳහා, අහංකාරකමින්, උද්ධච්චකමින්, ආඩම්බරයෙන් ජීවත්වන සුළු කොටසකගේ තත්ත්වය රැක දීම සඳහා, ඔවුන්ගේ ධනය වැඩි කර දිම සඳහා මේ රජය ක්‍රියා කර තිබෙන බවයි. එබඳු තත්ත්වයක් පවතින තාක් කල් මේ රටේ පොදු ජනතාවට දුෂ්කරතාවනට මුහුණ දෙන්න වෙනවා.

ගරු මුදල් ඇමතිතුමා විසින් මෙවර ඉදිරිපත් කළ අයවැය වාර්තාවේ මෙන්න මේ අන්දමට කියා තිබෙනවා :

"දැනට පවතින ජාත්‍යන්තර මිළ නැඹුරු වීම් අනුව, ලංකාව, වඩ වඩාත් ධෛර්‍යවීමත්ව කෘෂිකාර්මික ස්වයංපෝෂිතතාව කරා ප්‍රබල ලෙස ඉදිරියට යා යුතුයි. නො එසේ නම්, නොකඩවා ඇති විය හැකි ආහාර හා සෙසු භාණ්ඩවල දුර්ලභත්වයකට මුහුණ පෑ යුතුයි."

මේ රජයේ වගකිව යුතු ඇමතිවරයකු වන ගරු මුදල් ඇමතිතුමා පිළිගන්නවා, ආහාර හා සෙසු භාණ්ඩවල දුර්ලභත්වයකට මුහුණ පාන්න වෙනවාය කියා. හොඳයි, අපේ විදේශ විනිමය ආරක්ෂා කර



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

ගැනීමට අපේ ධනය වැඩි පුර පිට රට වලට ගලා යාම නතර කළ යුතුය කියන ප්‍රතිපත්තිය පිළිගන්නවා නම්, දැනට යන්ත්‍රෝපකරණ ආදිය ගෙන්වීම සඳහා වැය කරන විශාල ධනය නතර කර ගැනීමට පියවර නොගෙන අපේ ආර්ථික තත්ත්වය රැක ගන්නේ කොහොමද කියා ප්‍රශ්න කරන්න කැමතියි. වැඩියෙන් ගෙවනවා, අඩුවෙන් ණය වෙනවා. වැඩියෙන් වැය කිරීම අඩු කර නැහැ. වැඩියෙන් වැය වීම අඩු කිරීම සඳහා පාරිභෝගිකයාට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගෙන්වීම අඩු කරනවා. හොඳයි. අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ගෙන්වීම කපා හැරියා නම් මහජනතාවට ඒ වෙනුවට සැලැස්විය යුතු පහසුකම් සැලැස්සුවා ද? නැහැ. මේ රටේ සිටින ධනේශ්වර කොටසට පහසුකම් සැලැස්වීම පමණයි කර තිබෙන්නෙ.

ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය කථාවෙන් එතුමා මේ විධියට කියනවා: "ආහාර හා සෙසු භාණ්ඩවල දුර්ලභත්වයට මුහුණ පයු යුතුයි." ලබන අවුරුද්දේ දී මුදල් ඇමතිතුමා කියාවි, "මම ගිය අවුරුද්දේ ඔය කතාව කිව්ව නේ. අද ඒ කතාව ඉටු වී තිබෙනවා. එයට වැරදිකාරයා ආණ්ඩුව නොවෙයි. රටේ සිටින පොදු මහජනතාවයි" ලබන අවුරුද්දේ අයවැය ලේඛනය ඉදිරිපත් කරන විට මුදල් ඇමතිතුමා විසින් ඔය විධියේ තර්කයක් ඉදිරිපත් කරන්නට ඉඩ දී තිබෙනවා. ඒ නිසා අපි කියන්නේ, මේ රටේ පොදු මහජනතාව අයවැය ලේඛනයෙන් බලාපොරොත්තු වන සහනය ලබා දීමට නම්, වැය ශීර්ෂය අඩු කළ යුතුය කියායි. වැය ශීර්ෂය අඩු නොකර, රටේ මුදල් තත්ත්වය ආරක්ෂා නොකර, ඔවුන්ට සහනයක් ලබා දිය නොහැකියි. නොයෙකුත් විධියේ මාර්ගවලින් මුදල් සොයා ගෙන වෙනත් රටවලට වැය කිරීමෙන් මේ රටේ පොදු ජනතාවට සේවයක් කරන්න බැහැ. ගොවි ජනතාව නගා සිටුවනවාය, පොදු ජනතාව නගා සිටුවනවාය, රට ස්වයම් පෝෂිත කරනවාය පැරකුම් යුගයක් උදා කරනවාය කියා තමුන්නාන්සේලා ප්‍රචාරය කරනවා. රටින් හතරෙන් තුනක් පමණ ස්වයම්පෝෂිත කරනවාලු. තමුන්නාන්සේලාගේ ඔය බලාපොරොත්තු ඉටු කර ගැනීම සඳහා යොදන උපක්‍රමත් කරණාකර අපට කියන්න. තමුන්නාන්සේලාගේ අදහස් ක්‍රියාත්මක කරන ක්‍රමය අපට කියන්න. තමුන්නාන්සේලාගේ අදහස් වලට අදාළ වන විධියට වැඩ කටයුතු යොදා තිබෙනවාද කියා අපට කියා දෙන්න.

තමුන්නාන්සේලා කොයි විධියට කිව්වත් මහජනතාවට නම්, ගම්බද ජනතාවට නම්, කිසිම සැනසීමක් ලැබී නැහැ. ඒ අයට යම්කිසි සැනසීමක් තිබෙනවාය කියා තමුන්නාන්සේලාට හිතට එකඟව කියන්න පුළුවනි ද? ගිය අවුරුද්දේ අගෝස්තු මාසය වන විට ගම්බද ජනතාවට තිබුණු තත්ත්වයට වඩා නරක තත්ත්වයකුයි මේ අවුරුද්දේ අගෝස්තු මාසය වන විට ඔවුන්ට අත් වී තිබෙන්නේ. එදාට වඩා දුක්ඛිත තත්ත්වයකයි අද ඔවුන් සිටින්නෙ.

**ගරු ඩඩ්ලි සේනානායක**
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

ඇයි ඒ?

**එම්. තෙන්නකෝන් මයා.**
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)

වැය ශිෂීය වැඩි වීම නිසා. ඔවුන්ගේ ආදායම් මාගී අඩු වෙන අතර වැය මාර්ග වැඩි වෙනවා. මම තමුන්නාන්සේට කිව්වා, සමහර ගම් වැසියන්ට අයිතිව තිබුණ කුඹුරු අක්කර කාල, බාගය, ආදී ප්‍රමාණයත් දැන් ඔවුන්ට අහිමි වී තිබෙන බව. ඔවුන් රජයෙන් ලබාගත් ගොවි ණය ගෙවීම සඳහා තමන්ට හිමිව තිබුණ කුඹුරු කෑල්ල පවා උගස් කරන්න සිදු වුණා. එහෙම නම් තමුන්නාන්සේලාට කියන්න පුළුවන්ද, තමුන්නාන්සේලා අනුගමනය කරන ප්‍රතිපත්ති අනුව පොදු ජනතාවට සහනයක් ඇති වී තිබෙනවාය කියා? වී බුසල් කොයි තරම් ප්‍රමාණයක්ද නිෂ්පාදනය කර තිබෙනවාලු. වී නිෂ්පාදනය පන් කෝටි පනස් එක් ලක්ෂයකින් වැඩි වී තිබෙනවාලු. ගරු කථානායකතුමනි, කැවුමේ රස බලන්න නම් කන්න ඕනෑ. අන්න ඒ වගේ ඔය නිෂ්පාදනයේ ප්‍රතිඵලය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාරිභෝගිකයාගේ අතට එන්න ඕනෑ. සංඛ්‍යා ලේඛන මගින් පෙන්වූවාට ප්‍රමාණවත් වන්නේ නැහැ. පොත්පත්වලින් පුවත්පත්වලින් ප්‍රචාරය කළාට වැඩක් වන්නේ නැහැ . වී නිෂ්පාදනය වැඩි වී තිබෙනවා නම් මේ රටේ පාරිභෝගිකයාගේ හාල් සේරුවේ මිල ශතයකින් අඩු විය යුතු නේද? එවැනි අඩුවීමක් කෙරී තිබෙනවාද? වී නිෂ්පාදනය වැඩි වී තිබෙනවා කියා අද තමුන්නාන්සේලාට හිතට එකඟව සතුටු වෙන්න පුළුවනිද? පාරිභෝගිකයාට යම් සහනයක් ලැබී නැත්නම් තමුන්නාන්සේලාට සතුටු වෙන්න පුළුවන්ද?

ඒ නිසා අපට පැහැදිලිව පෙනී යනවා, තමුන්නාන්සේලා ගෙන යන මේ ප්‍රචාරයන් මහජනතාව මුළා කිරීමේ අදහසින් ගෙන යන ප්‍රචාර බව. මේ අනවශ්‍ය ප්‍රචාරවලින් මහජනතාව මුළා කරන්න සූදානම් වෙන්න එපා. තමුන්නාන්සේලා මහජනතාවට පෙන්වන මේ සංඛ්‍යා ලේඛනවල කිසිම සත්‍යයක් නැහැ. ඒ මගින් තමුන්නාන්සේලා බලාපොරොත්තු වන කරුණු ඉටු වී ඇත්තේ නැහැ. ඒ නිසා ගත යුතු පියවර ඉක්මණින්ම ගන්න. රටේ ගොවීතැන දියුණු කිරීම ගැන අපිත් සතුටුයි. ඒ සඳහා හැම අවස්ථාවකදීම අපගේ සහාය දෙන්න සූදානම්. මේ රටේ ගොවිතැන් කටයුතු දියුණු කිරීම සඳහා අවංකව පියවරක් ගන්නවා නම් අපි අපේ සම්පූර්ණ සහයෝගය දෙනවා. නමුත් තමුන්නාන්සේලා අතින් ඒ කාර්යය ඉටු නොවන බවයි අපට පෙනී ගොස් තිබෙන්නෙ. පාරිභෝගිකයාට, පොදු මහජනතාවට, අවහිරකම් කරමින් ආරක්ෂා කර ගන්න මුදල් වෙනත් විධියකින් තමුන්නාන්සේලා වියදම් කරනවා. ඒ නිසා ඔය ශේෂයේ අඩුවක් ඇති කරන්නට පුළුවන්කමක් නැහැ. හැමදාම ගෙවීම් ශේෂය වැඩි වෙනවා. නිපදවීම අඩුයි; පාරිභෝජනය වැඩියි. අඩුවෙන් නිපදවනවා; වැඩියෙන් කනවා. තත්ත්වය මෙසේ නම් මහජනයා තුළ පවතින අසහනය නැති කරන්නේ කෙසේද? අන්න ඒකයි, අද මුහුණ පාන්නට සිදු වී තිබෙන ප්‍රශ්නය. මේ රජය ගොවිකම් කටයුතු සම්බන්ධයෙන් ගෙන යන වැඩ පිළිවෙළින් අපට සෑහීමකට පත්වන්නට බැහැ. මා ඊයේ මතක් කළ පරිදි වාරිමාර්ග කටයුතු සාර්ථක වී නැහැ. ගම්බද ගොවියාගේ ඉඩම් ප්‍රශ්න සාර්ථක අන්දමින් විසඳී නැහැ. කොටින්ම ගම්බද මහජනයාගේ ආර්ථික තත්ත්වය දියුණු කිරීම පිණිස මේ රජය ගෙන ගොස් තිබෙන ක්‍රියා මාර්ග සාර්ථක වී නැහැ. මේ රජයේ ක්‍රියා මාර්ගවලින් ගම්බද මහජනයාට සෙතක් ලැබෙනවා නම් එය අපටත් සෙතක් වෙනවා. එහෙත් ඒ සෙත සැලසී නැහැ. ඒ නිසයි, මේ අවුරුද්දේ අයවැය ලේඛනයත් අපට මේ විධියට විවේචනය කරන්නට සිදු වී තිබෙන්නේ.

තවත් කාරණයක් දෙකක් ගැන පමණයි, මා මතක් කරන්නේ. අනවශ්‍ය වියදම් අඩු කිරීම සඳහා ස්ථිර ක්‍රියා මාර්ගයක් ගත යුතුව තිබෙනවා. අත්‍යවශ්‍ය දේවල් වැඩි පුර නිපදවීමට නියම අන්දමට මුදල් වැය නොකර අනවශ්‍ය වියදම් රාශියක් කරගෙන යනවා. කර්මාන්ත අංශයෙහි මේ අනවශ්‍ය වියදම් වැඩියෙන් සිදු වෙනවා. වයඹ පළාතට කිට්ටුව දැදිගම කොට්ඨාශයෙහි රෙදි විවීමේ විශාල කර්මාන්ත ශාලාවක් සෑදීමට දැන් කටයුතු කරගෙන යන බව අපට පේනවා. මේක ආසියාවේම තිබෙන විශාල රෙදි කර්මාන්ත ශාලාවලින් එකක්ලු. හොඳයි, මෙහිදී අප කල්පනා කර බැලිය යුතු කාරණයක් තිබෙනවා. 1956 සිට මේ වන තුරු මේ රටේ එක්තරා කර්මාන්ත ප්‍රතිපත්තියක් පවත්වාගෙන අවුත් තිබෙනවා. එහෙත් ඒ කර්මාන්ත ප්‍රතිපත්තියෙන් අපේ රටට සාර්ථක ප්‍රතිඵල ලැබී තිබෙනවාදැයි අප කල්පනා කර බලන්නට ඕනෑ. කර්මාන්ත ශාලා ආරම්භ කිරීම පිණිස විශාල වශයෙන් විදේශ විනිමය වැය කරනවා. කර්මාන්තවල මූලික කටයුතු සඳහා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැය කරතත් ඒ කර්මාන්ත මගින් ලැබිය යුතු ආදායම් ලබා ගැනීම පිණිස ක්‍රම සම්පාදනය කර නැහැ. අප මෙහි පිහිටු වන්නේ ලෝකයේ ම ලොකුම කර්මාන්ත ශාලායි. ලෝකයේ ලොකුම සීනි කර්මාන්ත ශාලාවක් මෙහි පිහිටෙව්වා. ලෝකයේ ලොකුම රෙදි කර්මාන්ත ශාලාවක් පිහිටවන්නට කටයුතු කරගෙන යනවා. අප කරන්නේ ලොකුම දේවල්. එහෙත් මේ රටේ ගොවීන් අද ඔළුව උස්සන්නට බැරි තත්ත්වයට පත් වෙලා. ලෝකයේම ලොකු රෙදි කර්මාන්ත ශාලාවක් මෙහි පිහිටුවන අතර කපු වැවීම සඳහා මේ වන විට කොතරම් දුරට කටයුතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

කර තිබෙනවාදැයි මා ගරු කෘෂිකම් ඇමතිතුමාගෙන් අහනවා. ඔය ලොකුම රෙදි කර්මාන්ත ශාලාව සඳහා අවශ්‍ය වන කපු වැවීම සඳහා මේ වන විට කොතරම් දුරට කටයුතු කර තිබෙනවාදැයි මා ගරු කෘෂිකම් ඇමතිතුමාගෙන් අහනවා. ඔය ලොකුම රෙදි කර්මාන්ත ශාලාව සඳහා අවශ්‍ය වන කපු නූල් ප්‍රමාණය ලබා ගැනීම පිණිස ඇති කරන ලද කපු වගාවේ කොතරම් ප්‍රගතියක් මේ වන විට පෙන්වන්නට පුළුවන්ද? කපු වගා කිරීම සඳහා අප මෙතෙක් ගෙන තිබෙන පියවරවල් මොනවාද? ඇත්තෙන්ම කර්මාන්ත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වියදම් කරන මුදල් හිස රදයක් වී තිබෙනවා මිස එයින් මේ දක්වා ඒ තරම් සහනයක් සැලසී නැහැ.

ගරු කථානායකතුමනි, අද මෙරට ජනතාව ආර්ථික අතින් පිරිහිලා. ඒ නිසා ආධ්‍යාත්මික අතිනුත් පිරිහිලා. මෙරට වැසියන්ට නියම ආර්ථික නිදහසක් ලබා දෙන්නට නම්, මෙරට වැසියන්ගේ ප්‍රශ්න නිරාකරණය කරන්නට වුවමනා නම්, මේ අසාර්ථක ආණ්ඩු ක්‍රමය නැති කොට ජනතා ප්‍රශ්න විසඳිය හැකි නියම වේදිකාවක් ලැබෙන ආණ්ඩු ක්‍රමයක් ඇති කිරීමට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. මේ පක්ෂග්‍රාහී පාර්ලිමේන්තු ක්‍රමයේ ප්‍රතිඵල අවුරුදු 21 ක් තිස්සේම අප දැක තිබෙනවා. වර්තමාන රාජ්‍ය ඇමතිතුමා, මුදල් ඇමතිවරයා වශයෙන් 1947 වර්ෂයේදී අයවැය ලේඛනය ඉදිරිපත් කර මීන් බලාපොරොත්තු වූ දේ මේ ආණ්ඩු ක්‍රමය යටතේ එතුමාට තවමත් ඉෂ්ට කරන්නට පුළුවන් වී නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி)*

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affaris)

තමුන්නාන්සෙත් මුදල් ඇමති ධුරය දැරුවා නේද?

**එම්. තෙන්නකෝන් මයා.**

*(திரு. எம். தென்னகோன்)*

(Mr. M. Tennakoon)

වෙන්න පුළුවනි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*

(The Hon. J. R. Jayewardene)

වෙන්න පුළුවනි නොවෙයි, වුණා.

**එම්. තෙන්නකෝන් මයා.**

*(திரு. எம். தென்னகோன்)*

(Mr. M. Tennakoon)

මම මුදල් ඇමති ධුරයේ වැඩ බැලුවා පමණයි. එපා කියලා හිතුණු හින්දා ඒක දමලා පිට වෙලා ගියා. කෙරෙන්නට තිබෙන දේවල් ඉටු කරන්නට, සාර්ථක ප්‍රතිඵල ලැබෙන ආකාරයට කරන්නට, මේ වැඩ පිළිවෙළ යටතේ බැරි බව පෙනී ගිය නිසා අත් හැර දමා ගියා. මගේ හිතට එකඟව වැඩ කරගෙන යෑමට මේ රාමුව යටතේ පුළුවන්කමක් නැති බව පෙනී ගිය නිසා ගිය බව කියන්නට ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. ඒ නිසා දැන් මා කියන්නේ මෙයයි. කරුණාකර මේ ආණ්ඩු ක්‍රමය සංශෝධනය කරන්න. අතනින් මෙතනින් පැලැස්තර ඇලවීමෙන් නම් නියම ප්‍රයෝජනයක් ගබාගන්නට අමාරුයි. එවැනි වැඩ පිළිවෙළකින් අපේ ඇවෙන ප්‍රශ්න විසඳන්නට බැරි බව ඔප්පු වෙලා අවසානයි. ජාතික ප්‍රශ්න, ජාතික ප්‍රශ්න හැටියට සලකා විඩිමත් විසඳුමක් සොයා ගත හැකි ක්‍රමයකට සකස් වූ ආණ්ඩු ක්‍රමයක් අපට දැන් වුවමනා කර තිබෙන බව මා කියනවා. අප හැම දෙනාටම එකම වේදිකාවකට පැමිණ අපේ ප්‍රශ්න විසඳීම සඳහා එකතු වන්නට පුළුවන් වන පරිදි ආණ්ඩු ක්‍රම සංශෝධනයක් ඇති කළොත් අපි බලාපොරොත්තු වන ජාතික දියුණුව, ජාතික සමගිය, ඇති කර ගන්නට පුළුවන් වෙතැයි මා තරයේ විශ්වාස කරන බව ප්‍රකාශ කරන අතර, වැඩිපුර මිනිත්තු පහළොවක් විස්සක් දීම ගැන තමුන්නාන්සේට මගේ අවංක ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරමි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 10.30

**එස්. බී. හේරත් මයා.** (හිරියාල)
(*திரு. எஸ். பி. ஹேரத்—ஹிரியால*)
(Mr. S. B. Herat—Hiriyala)

ගරු කථානායකතුමනි, වචන ස්වල්පයක් කථා කරන්නට මටත් අවස්ථාවක් දීම ගැන තමුන්නාන්සේට ප්‍රථමයෙන් මා ස්තුතිවන්ත වෙනවා. මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාශයට යාබදව තිබෙන ප්‍රදේශයක් නියෝජනය කරන නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා (එම්. තෙන්නකෝන් මයා.) කථා කළාට පසු මටත් කථා කරන්නට ඉඩ ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. ඒ අතරම, අපේ එක්සත් ජාතික පක්ෂයේ සහභාගිත්වයෙන් ඇති කරන ලද ජාතික ආණ්ඩුවේ ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද හතරවැනි අයවැය ලේඛනය පිළිබඳ විවාදයට සහභාගි වෙමින් වචන ස්වල්පයක් කථා කරන්නටයි මා දැන් සූදානම් වන්නේ.

ආරම්භයේදීම එක් කාරණයක් පැහැදිලි ලෙසම සඳහන් කරන්නට කැමතියි. විරුද්ධ පාර්ශ්වය බලයට පත් වී සිටි පසු ගිය කාලයේ මුදල් ඇමතිවරුන් අවුරුද්දෙන් හමාරෙන් මාරු වී ගිය බව තමුන්නාන්සේ දන්නවා. සුළු කාලයක් තුළ මුදල් ඇමතිවරුන් වශයෙන් කිප දෙනකු වැඩ කර තිබෙනවා. එහෙම වරින් වර සුළු කාලයක් ඇතුළත මුදල් ඇමතිවරුන් මාරු වන්නට හේතුව කුමක් ද? අයවැය පියවීම ඇතුළු නොයෙක් වැදගත් මෙන්ම විගකිවයුතු දේවල් කොහෙත්ම සතුටුදායක අන්දමට කරන්නට බැරි වූ නිසයි ඒ අය ඒ ආකාරයට අස් වී ගියේ. අපේ නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, වැඩ බලන මුදල් ඇමති නිලයේ සිටි කෙනෙක් පවා එය අත් හැර දමා පැනලා ගියේ නැද්ද? ඒ විධියට සිද්ධ වුණු බව අපි දන්නවා. ඒ ආණ්ඩුවට බය කියන ලද පරිදි යම් යම් අඩුපාඩුකම් තිබුණු නිසා නිසියාකාර අයවැය ලේඛනයක් සකස් කර ක්‍රියාත්මක කරන්නට බැරි වූ නිසයි අද මෙවැනි තත්ත්වයක් ඇති වුණේ. එක්සත් ජාතික පක්ෂයේ ගරු ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා හය වතාවක් පමණ අයවැය ලේඛන සකස් කර තිබෙනවායයි මා හිතනවා. අයවැය ලේඛණ 6ක් නැත්නම් 5ක් එතුමා ඉදිරිපත් කළා. එහෙත් එක් ආණ්ඩුවක කාල සීමාවේදී මුදල් ඇමතිවරුන් ගණනාවක් මාරුවෙන් මාරුවට වැඩ කර තිබෙන රටක, අපේ වර්තමාන මුදල් ඇමතිතුමා වන වන්නියේ නායකයාණන් වන වන්නි නායක මැතිතුමා හතරවැනි අයවැය ලේඛනයයි දැන් ඉදිරිපත් කර තිබෙන්නේ. එය සාර්ථක අන්දමටත් ඉදිරිපත් කර තිබීම ගැන මගේ සන්තෝෂයත්, හිරියාල මැතිවරණ කොට්ඨාශයේ ඡන්දදායකයන්ගේ මෙන්ම වයඹ පළාතේ මහජනයාගේත් සන්තෝෂය ආඩම්බරයෙන් මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ.

මට පෙර කථා කළ නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා කළ කථාවේ අඩුපාඩු දක්වන්නට මා උත්සාහ කරන්නේ නැහැ. එය මගේ බලාපොරොත්තුව නොවෙයි. එහෙත් එතුමාගේ කථාවෙන් කියවුණා, අපේ ජාතික ආණ්ඩුව නොයෙක් නොයෙක් විධියට පොහොසත් මිනිසාට දියුණු වන්නට ඉඩ සලසා තිබෙනවාය, දුප්පත් මිනිසාට සෙත සැලසෙන කිසිම දෙයක් කර නැහැ, යනාදි වශයෙන්. ඒ නිසා ඒ සම්බන්ධව වචනයක් කියන්නට ඕනෑ. ලොකු කුඩා වාරිමාර්ග ක්‍රම, වගා කිරීමේ යෝජනා ක්‍රම, ගම්බද පාරවල්, රථවාහන පහසුකම්, මේවා දුප්පත් ජනයාගේ යහපත සඳහා විශාල මුදල් ප්‍රමාණයක් යොදා ජාතික ආණ්ඩුව ඇති කළ බව කියන්නට ඕනෑ. "අද ජීවන වියදම ඉතා ඉහළ නැග තිබෙනවාය, දුප්පතාට කිසිම සහනයක් ලැබී නැත" යනුවෙන් විරුද්ධ පාර්ශ්විය රජයට චෝදනා කළ නිසා, ජීවන වියදම ගැනත් වචනයක් දෙකක් සඳහන් කරන්නට සිදු වී තිබෙනවා. අද ලෝකයේ නොයෙකුත් රටවල ඇති වී තිබෙන ආරාවුල්, අර්බුද නිසා, ලෝක වෙළඳ පොළේ ඒ ඒ ද්‍රව්‍යවල මිළ ඉතා ඉහළ ගිහින් තිබෙනවා. ඒ අනුව බලන විට, ජීවන වියදම ඉහළ ගියේ රුපියලේ අගය අඩු කිරීම නිසාම නොව, ලෝක වෙළඳ පොළේ මිළ ඉහළ යාම නිසා බව කියන්නට පුළුවනි.

අයවැය විවාදය ආරම්භ කරමින් විරුද්ධ පාර්ශ්වයෙන් මුලින්ම කථා කළ මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාගෙන් (මෛත්‍රීපාල සේනානායක මයා.) ඉතා වැදගත් විවේචනා එල්ල වේය, රට දියුණු කිරීම සම්බන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. බී. හේරත් මයා.]

ධයෙන් ඉතා වැදගත් කරුණු අඩංගු කථාවක් අහන්නට ලැබේය යන බලාපොරොත්තුවෙන්, මා එතුමාගේ කථාවට ඉතා ඕනෑකමින් ඇහුම්කන් දුන්නා. එහෙත් පොඩි ළමයෙක් කථා කරන අන්දමටයි, ඒ ගරු මන්ත්‍රීතුමා කථා කළේ. එතුමාගේ කථාවෙන් වැඩියක් කියැවුණේ, ජීවන වියදම ඉහළ යාම ගැනයි. පසුගිය රජයේ ඇමතිවරයකු වශයෙන් කටයුතු කළ එතුමාට, ජීවන වියදම ඉහළ යාම ගැනවත්, ආහාර හිඟයක් ගැනවත් කථා කරන්නට සාධාරණ අයිතියක් තිබෙනවා යයි මා නම් හිතන්නේ නැහැ. දැනට පවතින මිලෙන් භාගයක් පමණ වන මිළකට ලෝක වෙළඳපොළෙන් බඩු ගන්නට පුළුවන්කම තිබුණු ඒ කාලයේදී, ඒ හවුල් ආණ්ඩුව මහජනයාට සාධාරණ මිළකට බඩු සැපයූවේ නැහැ. ඒ නිසා තමයි, 1965 දී ඒ හවුල් ආණ්ඩුව පෙරළා දමා, මේ රජය බලයට පත් කරන්නට මහජනයා පෙළඹුණේ. එහෙත් ජාතික රජය පාලනය භාර ගෙන බලන විට, පසුගිය රජය විසින් භාණ්ඩාගාරයේ ඉතිරි කර තිබුණේ, සති දෙකකට පමණක් ආහාර ගෙන්වීමට ප්‍රමාණවත් මුදලක් පමණයි. ඒ බව මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාට දැන් අමතක වී තිබෙන හැඩයි. එපමණක් නොවෙයි. කොයි විධියකින් හෝ ඒ අය දිගටම ආණ්ඩු බලයේ හිටියා නම්, අද මෙතැන කථා කරන්නට අපට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. ඒ අනෙකක් නිසා නොවෙයි, අපට බඩගින්නේ මැරෙන්නට සිදුවන නිසායි.

මුල්කිරිගල ගරු මන්ත්‍රීතුමාගේ (ජෝර්ජ් රාජපක්ෂ මයා.) කථාවටත් මා ඇහුම්කන් දුන්නා. ඒ මන්ත්‍රීතුමා කථා කරගෙන යන අතරමග බල්ලන් සම්බන්ධ කෙරුවාවලුත් කියන්නට පටන් ගත්තා. මේ අවස්ථාවේදී ඒ ගරු මන්ත්‍රීතුමා මෙතැන නැතිවුණත්, බලු කථා මේ ගරු සභාව තුළ ඉදිරිපත් නොකරන ලෙස මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා. වී වගාව සම්බන්ධයෙන් රජයේ එක්තරා නිලධාරියකුට දොස් පවරන්නටත් එතුමා පෙළඹුණා. 1964 දී ලංකාවේ වී නිෂ්පාදනය බුසල් 5,50,000ක් බවත්, දැන් එය 5,05,000 දක්වා පහළ බැස තිබෙන බවත් එතුමා කීවා. එවැනි ගණන්-හිලව් ඉදිරිපත් කරමින් එතුමා පෙන්වා උත්සාහ කළේ, පසුගිය රජය පැවති කාලයේදී වී නිෂ්පාදනය පිළිබඳව දැනට වඩා දියුණුවක් තිබුණු බවයි. එහෙත් අපි රජය බාර ගත්තාට පසුව වී බුසල් 84 ලක්ෂයක් වැඩිපුර නිෂ්පාදනය කර තිබෙනවා. ඒ අනුව අපි වී නිෂ්පාදනය ඉතා දියුණු තත්ත්වයකට ගෙනගොස් තිබෙන බව පෙනී යනවා. නිලධාරීන්ට දොස් කියමින් ඒ ගණන් හිලව් වැරදියි කියා පෙන්වා දෙන්නට ඒ මන්ත්‍රීතුමා උත්සාහයක් දැරුවා. එහෙත් කුඹුරු තිබෙන ගම්බද ප්‍රදේශවලට ගොස් කුඹුරු දියුණු වී තිබෙන්නේ කොයි අන්දමටද කියා බැලුවොත් තමුන්නාන්සේලාටත් පෙනේවි එදා නටබුන් වී පුරන් වී තිබුණු කුඹුරු යායවල් අද කොයිතරම් ලක්ෂණට වගා කර දියුණු වී තිබෙනවාද කියා. ඒ නිසා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් මෙහි දී කරන ඔය විධියේ කථාවලට ගම්බද ගොවි මහත්වරුන් පැහැදේය කියා මා හිතන්නේ නැහැ. අපේ ගම්බද ගොවි මහත්වරුන් ඒ කථාවලට පැහැදෙන්නේ නැහැ. 1965 පැවති තත්ත්වයට වඩා අද ගොවිතැන දියුණු වී නැද්ද කියා මා ගොවි මහත්වරුන්ගෙන් අහන්න කැමතියි. එදා පැවති මඩ වගුරු අද සශ්‍රීක කුඹුරු බවට පරිවර්තනය වී තිබෙන අන්දම ගම් ප්‍රදේශවලට ගොස් බැලුවොත් තමුන්නාන්සේලාටත් පෙනෙනවා ඇති. ගම් ප්‍රදේශවලට ගොස් නොබැලුවත් කොළඹ ප්‍රදේශයේ එදා පැවැති මඩ වගුරු අද සශ්‍රීක කුඹුරු යායවල් බවට පත් වී තිබෙන හැටි තමුන්නාන්සේලාට පෙනෙනවා ඇති. රජයේ වගා ව්‍යාපාරය මේ අන්දමට විවේචනය කළත්, නිලධාරීන්ට බැන්නත්, ඒ කඩාකප්පල්කාරී අදහස් ගොවි ජනතාවත් කම්කරු ජනතාවටත් පිළිගන්නේ නැහැ. ඔවුන්ගේ මොළවලට ඔය අදහස් වද්දවන්නට පුළුවන්ය කියා මා නම් කල්පනා කරන්නේ නැහැ.

බණ්ඩාරගම ගරු මන්ත්‍රීතුමාගේ (සෝ. ඩී. ඩී. පෙරේරා මයා.) කථාව ගැනත් සඳහන් කරන්නට කැමතියි. එම ප්‍රදේශය ගැන මා හොඳින් දන්නවා. ඒ මන්ත්‍රීතුමා අරක්කු සම්බන්ධව කථා කරන්න පටන් ගත්තා. අරක්කු ගැන කථා කරන්න පටන් ගත් නිසා මොළේ ටිකක් නරක් වී කථා කළාද කියා මා දන්නේ නැහැ. ඉතා උනන්දුවෙන් වැඩ කරන හොඳ ගොවි ජනතාවක් ඒ ප්‍රදේශයේ සිටින බව දන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නවා. එමෙන්ම එම ගොවි මහත්වරුන්ට හොඳ ඉඩම් කට්ටි කීපයක් ලැබෙන්නට තිබුණු අවස්ථාවේදී ඒ මන්ත්‍රීතුමා කීවේ කුමක්ද? එම ඉඩම් දුප්පත් ඉඩම් නැති ගොවීන්ට නොදී එහි කර්මාන්ත ශාලා වක් හැදීමට බණ්ඩාරගම මන්ත්‍රීතුමා මේ ස්ථානයේදී යෝජනා කළා. ඒ නිසා විරුඬ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් ගොවි මහත් වරුන්ට විරුද්ධව පහර ගසනවා යයි මට පෙනී යනවා. ගොවි මහත්වරුන්ගේ අභි වෘද්ධියට කටයුතු කරනවා යයි මේ ගරු සභාවේදීත් වේදිකාවේදීත් කියන විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් ගම්බදට ගෙස් කියන්නේ තමන් බලයට පැමිණියොත් නැවතත් හාල් සේරු දෙකම ගෙනැවිත් දෙනවාය කියලයි. එය තමයි ගොවි ජනතා වට ගහන ලොකුම පහර. එසේ කළොත් වී නිෂ්පාදනයටම ලොකුම පහරක් වදි නවා. එසේ කළොත් අද රුපියල් 15ට හෝ 20ට විකුණනු ලබන වී බුසල රුපියල් 6කට හෝ 7කට වත් විකුණා ගන්නට පුළු වන් වේද කියන එකත් සැක සහිතයි. ඒ අන්දමේ යටින් ගින්දර ගෙනයන කථා බොහොම ලක්ෂණට කරන බව පෙනෙනවා. ගොවි ප්‍රදේශවලලින් පැමි ණෙන විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු ඉතා ලක්ෂණට ගොවීන්ට පහර ගැසීමට සූදානම් වී සිටිනවා.

ගරු කථානායකතුමනි, බණ්ඩාරගම කොට්ඨාශයේ කසිප්පු ව්‍යාපාරය ඉතා උනන්දුවෙන් කරගෙන යනවාය කියා බණ්ඩාරගම ගරු මන්ත්‍රීතුමා (කේ. ඩී. ඩී. පෙරේරා මයා.) කිව්වා. පොලිසියත් ඒකට සම්බන්ධය කියා එතුමා කිව්වා. ගරු මන්ත්‍රී තුමන්ලා කරන මෙවැනි විවේචන ගැන මට කණගාටුයි. තමන්ගේ වාසිය තකා රජයේ නිලධාරීන් විවේචනය කිරීම එත රම් සුදුසු නැහැ. එමනිසා තමන්ගෙන් ඉටු විය යුතු සේවය සාර්ථක අන්දමින් ඉටු කරන්නට ඉතා උනන්දුවෙන් කට යුතු කරන මෙන් මා ඒ ගරු මන්ත්‍රීවරුන් ගෙන් ඉල්ලා සිටිනවා. නිකම් බොරුවට විවේචනය නොකර, පොලිසියේ නිලධා රීන් හෝ වෙනත් රජයේ නිලධාරීන් හෝ විවේචනය නොකර මේ රටේ ගොවිතැන දියුණු කරන්නට උනන්දුවෙන් සහයෝ ගය දෙන මෙන් මා ඒ ගරු මන්ත්‍රීතුමන් ලාගෙන් ඉතා ආදරයෙන් හා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ලංකාවේ කෘෂිකර්මය දියුණු කිරීම පිණිස අප විශාල මුදලක් වියදම් කරගෙන යන බව මේ අයවැය ලේඛනයෙන් පෙනෙනවා. 1966 දී මෙන් නොවෙයි 1967 දී දළ ජාතික නිෂ්පාදිත මූර්ත වශයෙන් රුපියල් 761 කෝටි 30 ලක්ෂයෙහි සිට රුපියල් 793 කෝටි 20 ලක්ෂය දක්වා වැඩි වී තිබෙනවා. එය රුපියල් 31 කෝටි 90 ලක්ෂයක වැඩිවීමක්. 1966 වර්ෂයට වඩා 1967 වර්ෂයේදී අප සංවර්ධනය සඳහා වියදම් කර තිබෙනවා. මේ සංඛ්‍යා වලින් පෙන්වන්නේ 1965, 1966 වර්ෂයට වඩා 1967 වර්ෂයේදී අපේ රටේ ආර්ථික තත් වය කොයි තරම් දියුණු වුණාද යන්නයි. පසුගිය අවුරුදු තුන ඇතුළත අප කොයි තරම් දුරට මේ රටේ වගා ව්‍යාපාරය දියුණු කර ආර්ථික තත්ත්වය නගා සිටවුවාද යන්න මේ සංඛ්‍යාලිවන් විරුද්ධ පාර්ශ්ව යේ ගරු මන්ත්‍රීවරුන්ට අවබෝධ කර ගන්නට පුළුවනි.

ගරු කථානායකතුමනි, මා මුලින් කීවාක් මෙන් මේ රටේ වී ගොවිතැන අප දැන් ඉතා දියුණු තත්ත්වයකට ගෙනැ විත් තිබෙනවා. අවුරුදු තුනක් අප පාලන ය ගෙන ගොස් තිබුණත් බලයට පත්වී අවුරුදු එකහමාරක් දෙකක් ගත වන තෙක් අපට මේ කටයුතු ආරම්භ කර ප්‍රති ඵල ලබා ගන්නට බැරි වුණා. මක්නිසාද? එක රජයකින් එක ක්‍රමයකින් නටබුන් කළ සංවර්ධන ක්‍රමයක් නැවතත් නගා සිටුවීමට ලෙහෙසියෙන් කරන්නට බැරි දෙයක් නිසයි. ආහාර අමාත්‍යාංශයේත් ඒවාගේම ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල අමාත්‍යාංශයේත් වැඩ කටයුතු පෙරට වඩා උනන්දුවෙන් හා සාර්ථක අන්දමින් කරගෙන ගිය නිසයි අපට මේ ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන් වුණේ. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් 1965 ට ප්‍රථමයෙන් දැක්වූ උනන්දුවට වඩා ලොකු උනන්දුවක් ඇතිව පසුගිය වර්ෂ දෙක තුන තුළ කටයුතු කර තිබෙනවා. කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ වැඩ කටයුතුත් ඒවැනි උනන්දුවකින් කරගෙන ගොස් තිබෙනවා. එහි ප්‍රතිඵල තමයි අපට මේ දකින්නට ලැබෙන්නේ. ලබන අවුරුද්දේ [illegible] වැඩි උනන්දුවකින් යුක්තව කට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. බී. හේරත් මයා.]

යුතු කර ආහාර වගාවත් ආර්ථික තතත්ව යත් තවත් දියුණු කර ගැනීමට පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ.

ගරු කථානායකතුමනි, රටින් පිට කරන බඩුවල මිල ඉතා අඩු වී තිබෙන අවස්ථාවක දී, පිටරටින් මේ රටට ගෙන්වන ආහාර ද්‍රව්‍යවල සහ වෙනත් දේවල මිල දෙගුණයකින් පමණ වැඩි වී තිබෙන අවස්ථාවකදී මේ අන්දමේ තත්ත්වයක් තබා ගැනීම ලෙහෙසි වැඩක් නොවෙයි. එමනිසා දැනට පවත්වාගෙන යන ආර්ථික තත්ත්වය ගැන අප ගරු මුදල් ඇමතිතුමාටත්, රජයටත් ස්තුතිවන්ත විය යුතුයි.

ගොවි හමුදාවක් පිහිටුවා කටයුතු කර ගෙන යන බව තමුන්නාන්සේලා දන්නවා. ඒ සම්බන්ධ විරුද්ධ පාර්ශ්වයෙන් නොයෙකුත් විවේචන එල්ල කර තිබෙනවා. එසේම නොයෙක් විධියේ ළමයින් ඒ ගොවි හමුදාවට ඇතුළු කර නොයෙක් විධියේ කුමන්ත්‍රණ ඇති කර තිබෙනවා. ගොවි හමුදාව ඇති කළේ යුද්ධ කරන හමුදාවක් වශයෙන් නොවෙයි. කෘෂිකර්මය දියුණු කිරීම සඳහා ඉක්මන් වැඩ පිළිවෙළක් වශයෙනුයි, ගොවි හමුදාව ඇති කළේ. ඒ ක්‍රමය ඉතාමත් සාර්ථක අන්දමට ක්‍රියාත්මක වන බව ප්‍රකාශ කරන්නට ඕනෑ. ඒ ගොවි හමුදාවේ කට යුතු පුළුවන් ඉක්මණින් තව තවත් දියුණුවෙන් දියුණුවට පත් කිරීමට කටයුතු කරන ලෙස ඒ ගොවි හමුදාව භාර ගරු ඇමතිතුමාගෙනුත්, උප ඇමතිතුමාගෙනුත් මා ඉල්ලා සිටිනවා. අපේ ආසනවලින් ඒ ගොවි හමුදාවට බැඳුණු ළමයින් ඉතාමත් උනන්දුවෙන් කටයුතු කරනවා. එහෙත් සමහර ආසනවලින් ගිය ළමයින්ට කෑත්තේ උදැල්ලේ වැඩ හරියාකාර බැරි නිසා ඒ ළමයින් ආපසු ඇවිත් තිබෙනවා. ඒ නිසා කෑත්තේ උදැල්ලේ වැඩ කරන්නට පුළුවන් ළමයින්—ගොවි ප්‍රදේශවල ළමයින්—මේ ගොවි හමුදාවට බඳවා ගත්තොත් දැනට තියෙන අඩුපාඩුත් නැති කරන්නට පුළුවන් බව මා ප්‍රකාශ කරන්නට සතුටුයි.

තේ, රබර්, පොල් වැනි ගොඩ ගොවිතැන් සම්බන්ධයෙනුත් දැනට ලොකු දියුණුවක් දකින්නට තියෙනවා. ඒ ගොවිතැන් සම්බන්ධයෙන් මේ රජය වැඩ කරන්නට පටන් ගෙන දැනට අවුරුදු 3 ක් 3 1/2 ක් ගත වී ඇතත් එම ගොවිතැන්වල සතුටුදායක ප්‍රතිඵල ලැබෙන්නට පටන්ගෙන අවුරුද්දකට වඩා නැති බව මා දන්නවා. ගොවි ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු නිසා මට ඒ බව කියන්නට පුළුවන්. ඒ පළාතේ අක්කර 70,000 ක, 80,000 ක පමණ කැලෑව දැන් ගොඩ ගොවිතැන් සහ කුඹුරු ගොවිතැන් සඳහා යොදාගෙන තිබෙන නිසා ඒ බව මට පැහැදිලිව කියන්නට පුළුවන්.

ධීවර කාර්මික අංශයත් දැන් ඉතා හොඳින් දියුණු වී තිබෙනවා. ධීවර අංශය සඳහා ගිය අවුරුද්දේ කෝටි 8 ක වැඩිපුර මුදලක් වියදම් කර තිබෙනවා. මේ රජය ඒ සඳහා තවත් වියදම් කරන්නට සූදානම්. ලංකාව වටේම මුහුද තිබෙන නිසා ධීවර කර්මාන්තය දියුණු කළොත් ඒ මගින් අපේ ආර්ථික තත්ත්වය උසස් කර ගැනීමට පුළුවන් වෙනවා.

රැකීරක්ෂා සම්බන්ධවත් වචනයක් කියන්නට ඕනෑ. ගිය අවුරුද්දේ 28,000 කට පමණ රැකීරක්ෂා සැපයීමට අපේ රජයට පුළුවන් වී තිබෙනවා. රැකීරක්ෂා ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම විසඳීමට බැරි වී තිබෙන බව ඇත්තයි. මීට ප්‍රථම අවුරුදු 10ක් තිස්සේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමට උනන්දු නොවූ රජයක් තිබුණු නිසා, රැකීරක්ෂා නැති විශාල පිරිසක් ඒ කාලය තුළ දී ගොඩගැසුණු නිසා අවුරුදු දෙකකින්, තුනකින් මේ ප්‍රශ්නය විසඳීම ලෙහෙසි වැඩක්ය කියා මා සිතන්නේ නැහැ. රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීම සඳහා අපි දැන් ඉතාමත් උනන්දුවෙන් නොයෙකුත් කට යුතු හා ව්‍යාපාර කරගෙන යනවා. ඒ අනුව ඉතාමත් ඉක්මනින් රැකී රක්ෂා ප්‍රශ්නය විසඳන්නට අප බලාපොරොත්තු වෙනවා. කර්මාන්තශාලා වශයෙන්, සිමෙන්ති, පිඟන් ආදී කර්මාන්තවල ලොකු දියුණුවක් ඇති කර තිබෙනවා. මීට ප්‍රථම අවුරුදුවලට තිබුණාට වඩා විශාල දියුණුවවක් කර්මාන්ත අතින් පසු ගිය අවුරුද්දේ ඇති වී තිබෙන අතර, මේ අවුරුද්දේ ඊටත් වඩා වැඩි දියුණුවක් ලබා ගැනීමට පුළුවන් වෙනවා ඇති. තමුන්නාන්සේලා දන්නවා ඇති එදා අපට පිඟානක් කෝප්පයක් ලබා ගැනීමට තිබුණ අපහසුව. දැන් ලංකාවේ සාදනු ලබන පිඟන් කෝප්ප ඉතාමත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලෙහෙසියෙන් සහ පහසුවෙන් ලබා ගැනීමට අපට පුළුවන් වී තිබෙනවා. කඩදාසි ලිපි ද්‍රව්‍ය ආදී වශයෙන් බැලුවත් අද ඒවා ලංකාවේ නිෂ්පාදන කරමින් කඩදාසි කර්මාන්තය දියුණු තත්ත්වයකට පත් කර තිබෙනවා.

එපමණක් නොවෙයි, කථානායකතුමනි, විදුලිය, ප්‍රවාහණය, නිවාස ආදී දෙපාර්තමේන්තුවල වැඩ කටයුතු පසුගිය අවුරුද්ද ඇතුළත ඉතාමත් සාර්ථක අන්දමින් කෙරී තිබෙනවා. ඒවායේ වැඩ මේ අවුරුද්දේ ඊටත් වඩා සාර්ථක වේවිය කියා මා කල්පනා කරනවා. ඒ වාගේම සංචාරක දෙපාර්තමේන්තුවේත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේත් කටයුතුවල ලොකු දියුණුවක් ඇති වී තිබෙනවා. විශෙෂයෙන්ම දුෂ්කර ප්‍රදේශවල අවුරුදු 9 ක් 10 ක් තිස්සේ කරගන්නට බැරි වූ පාරවල් පළාත් පාලන අමාත්‍යාංශය මගින් පසු ගිය අවුරුදු තුන ඇතුළත සකස් කිරීම නිසා දැන් ගොවි ජනතාවට තමන්ගේ ගමන් බිමන් යාමටත් ගොවි නිෂ්පාදන වෙළ හෙළඳාම් කර ගැනීමටත් අවසථාව සැලසී තිබෙනවා.

තවද පසු ගිය අවුරුදු තුන ඇතුළත වාරිමාර්ග කටයුතු බොහෝ දුරට දියුණු වී තිබෙනවා. අධ්‍යාපන කටයුතු සහ සෞඛ්‍ය කටයුතු දියුණු වී තිබෙනවා. දැනට තව තවත් දියුණු කරගෙන යනවා. අධ්‍යාපන අංශය ගැන කල්පනා කරන විට එදා ගම්බද දරුවන්ට ලැබුණ අධ්‍යාපනය කුමක්ද? කලා අංශයේ ජ්‍යෙෂ්ඨ විභාග සහතිකය තමයි සෑම ළමයින්ටම ලැබුණේ. අද ඒ සහතිකය උප්පැන්න සහතිකයක තත්ත්වයට වැටිලයි තිබෙන්නේ. ඒ අධ්‍යාපනය උඩ කලා අංශයේ උපාධි ලත් උපාධිධාරීන් දහස් ගණනක් අද රැකීරක්ෂා නැතුව අතරමං වී සිටිනවා. මෙය අද ඊයේ කරන ලද දෙයක ප්‍රතිඵල නොවෙයි. අවුරුදු 9කට 10කට පෙර බාලාංශ පන්තියේ සිට පටන්ගත් දරුවාට ලැබුණ දුර්වල අධ්‍යාපනය නිසයි. එහෙත් මා ඉතාමත් සන්තෝෂයෙන් කියන්න කැමතියි අද ගම්බද පාසැල් විද්‍යාව අතින් විශාල දියුණුවක් ලබා තිබෙන බව. විද්‍යාගාර පිහිටුවා විද්‍යා අධ්‍යාපනය ලබා දෙන අතර, කෘෂිකර්ම හා වාණිජ අංශයෙනුත් අධ්‍යාපනය දියුණු කර රැකී රක්ෂා විරහිත ප්‍රශ්නයට මුහුණ පාන්නට සිදු නොවන පරිදි අද ළමයින් පුහුණු කරවාගෙන යනවා. ඒ නිසා මෙම ජාතික රජයටත් ගරු අගමැතිතුමාටත් අධ්‍යාපන ඇමතිතුමාටත් අපි ස්තුතිවන්ත වෙන්න ඕනැ.

මට කථා කිරීමට වෙන් කර ඇති කාලය දැන් අවසන් වීගෙන යනවා. මට තව ඇත්තේ මිනිත්තු 5 ක් පමණයි කියා කථානායකතුමාත් ඇඟවීමක් කළා. එහෙත්, මගේ කථාව අවසාන කරන්නට ප්‍රථම තවත් වචන ස්වල්පයක් කිව යුතුව තිබෙනවා. ආණ්ඩුවේ සේවය වඩාත් සාර්ථක අන්දමින් කරගෙන යෑම සඳහා මේ රජය පසුගිය අවුරුද්දේදී අලුතෙන් නිළධාරීන් 5,400 ක් බඳවාගෙන තිබෙනවා. එම නිළධාරීන් සඳහා පුහුණු වීමේ පන්ති ආදිය ආරම්භ කොට වඩා විධිමත් පියවරක් ගන්නට මේ ජාතික රජයට සිදු වුණේ ආණ්ඩුවේ නොයෙකුත් ආයතන පසුගිය කාලය තුළ බොහෝ දුරට දුර්වල වී තිබුණු නිසායි. දැන් රජයේ කටයුතු පෙරට වඩා සාර්ථක අන්දමින් සිදුවේගෙන යන අතර රජයේ සේවකයන්ගේ වැටුප් විසමතා සම්බන්ධව කටයුතු කිරීමට රජය විසින් කොමිටියක්ද පත් කර තිබෙනවා. ඒ මගින් රජයේ සේවකයන් හා නිලධාරීන් සන්තෝෂවන අන්දමේ වැටුප් ක්‍රම ආදිය සකස් කිරීමේ වැඩ පිළිවෙලක් දැන් ඇති කරගෙන යනවා. මේ විධියේ වැඩ කටයුතු කරගෙන යන විට, විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රිවරුන් දේශපාලන පක්ෂ භේද උඩ රජයේ සේවකයන් නොයෙක් අන්දමින් ඇවිස්සීමේ ව්‍යාපාර ගෙන යන බව රජයේ සේවයෙහි සිටි කෙනකු වශයෙන් මා හොඳහැටි දන්නවා. දේශපාලන නායකයන් වෘත්තිය සංගම්වලට සම්බන්ධ වී ඒවායේ සාමාජිකයන් වැඩවර්ජන ආදියට පොළඹවන බව මා දන්නවා. වෘත්තීය සමිතිවල ප්‍රශ්න ඒවායේ සාමාජිකයන්ටම නිරාකරණය කර ගන්නට ඉඩ දී වෘත්තීය සමිති කටයුතුවලට ඇඟිලි නොගසා සිටින ලෙස මා විරුද්ධ පක්ෂයේ නායකවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. එසේ සිටිතොත් රජයේ සේවය ඉතා උතුම් සේවයක් බවට පත් කර ගන්නට පුළුවන් වනවා ඇති.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. බී. හේරත් මයා.]

ජාතික ආණ්ඩුවේ 4 වැනි අය වැය කථාව සම්බන්ධව වචන ස්වල්පයක් කථා කරන්නට මට අවස්ථාවක් ලබා දීම ගැන ගරු කථානායකතුමාට මා විශේෂයෙන් ස්තුති වන්ත වන අතර, ගරු මුදල් ඇමතිතුමාගේ මේ අය වැය කථාවට ආණ්ඩු පක්ෂයේ පසුපස ආසනවල සිටින සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ සම්පූර්ණ සහයෝගය සෑම අවස්ථාවකදීම ලැබෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

පූ. භා. 11.02

**ප්‍රින්ස් ගුණසේකර මයා.**

(திரு. பிறின்ஸ் குணசேக்கர)

(Mr. Prins Gunasekera)

ගරු කථානායකතුමනි, මේ විවාදයේදී මන්ත්‍රීවරුන්ට කථා කරන්නට අවස්ථාව ලැබෙන්නේත් හාල් පොතට කොත්තමල්ලි දෙන අන්දමටයි. හාල් පොතක් අර ගෙන සමුපකාර කඩයට ගිය විට කොත්තමල්ලි ඇට 30 ක් 40 ක් ගැණලා දෙන්නාක් මෙන්, මන්ත්‍රීවරයකු කථා කරන්නට නැගිටින විටම වේලාව නියම කෙරෙනවා. හිරියාලේ ගරු මන්ත්‍රීතුමා කථා කරද්දී එතුමාගේ කාලයෙන් තව ඉතිරිව තිබෙන්නේ විනාඩි 5 ක් පමණක් බව පෙන්වා දෙන්නට තමුන්නාන්සේට සිදු වුණා. මේ කථා පාලනය කෙළවර වන්නේ කවදාදැයි මා දන්නේ නැහැ. මිට ඉස්සර අය වැය විවාදයකදී මාතර ගරු මන්ත්‍රීතුමාත් (බී. වයි. තුඩාවේ මයා.) මාත් කථා පාලනය කිරීමේ මේ සිරිතට විරුද්ධත්වය දක්වීමක් වශයෙන්, ලේඛනගත පාර්ලිමේන්තු විවාද ඉතිහාසයේ කෙටිතම කථා දෙක කර වාඩි වුණු හැටි මට මතකයි. අප එදා කළ කථාව මෙයයි. "ගරු කථානායකතුමනි, මගේ කථාව මෙතෙකින් සමාප්තයි." ඒ මෙයින් අවුරුදු දෙකකට පමණ පෙර සිදු වුණු දෙයක්. අදත් අපේ සථාවර අණපණත්වල තත්ත්වය එයමයි. ගරු කථානායකතුමනි, මේ ගරු මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරුන්ට තමතමන්ගේ ප්‍රදේශවල තිබෙන දුක්ගැනවිලි ගැන කීමට සහ දේශපාලන වශයෙන් අළුත් අදහස් උදහස් ඉදිරිපත් කිරීමට තමුන්නාන්සේගේ නායකත්වය යටතේ පවතින ඉදිරි කෙටි කාලය තුළදීවත් පියවරක් ගන්නවා ඇතැයි මා විශ්වාස කරනවා.

හිරියාලේ ගරු මන්ත්‍රීතුමා කථා කර නැගිට ගියා. එතුමාගේ කථාවට ඇහුම් කන් දීගෙන සිටින විට මට හිතුණා හිරියාල කිරියෙන් පැණියෙන් උතුරන්නාවූ කිසිම අගයක් හිඟයක් හෝ කිසිම අඩුවක් පාඩුවක් හෝ නැති බොහොම සෞභාග්‍ය සම්පන්න ප්‍රදේශයකැයි කියා. මගේ ආසනය කිට්ටුව වාඩි වී සිටින නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමාගෙන් (එම්. තෙන්නකෝන් මයා.) මා ඇසුවා, හිරියාල පළාතේ වැඩිපුර තිබෙන කර්මාන්ත නැතිනම් ගොවිතැන් මොනවාද කියා. එතුමා කීව්වා හිරියාලේ වැඩියෙන් තිබෙන්නේ දුම්කොළ බව. හිරියාල මන්ත්‍රීතුමාගේ කථාවත් හරියට වේලිච්ච දුම්කොළයක් වාගෙයි. ගරු මුදල් ඇමතිතුමාගේ අළුත් අයවැය ලේඛනයට මෙතරම් ප්‍රශංසා මුඛයෙන් කථා කළාට මොකද එම අයවැය ලේඛනයත් හඳුන්වන්නට තිබෙන්නේ හිරියාල මන්ත්‍රීවරයාගේ කථාව වාගේම වේලිච්ච දුම්කොළයක් හැටියටයි. මා එසේ කියන්නේ එය දුම්කොළ කන උදවියට විතරක් ප්‍රයෝජනයට ගතහැකි අයවැය කථාවක් නිසායි. හිරියාල ගරු මන්ත්‍රීතුමා තවත් හේතුවක් නිසා මෙම අයවැය ලේඛනයට මෙතරම් ප්‍රශංසා කරනවා ඇතැයි මා සිතනවා. මේ වර අය වැය ලේඛනය නිසා මිල වැඩි වුණු දේ අතර දුම්කොළවලට ප්‍රධාන තැනක් දෙන්නට පුළුවනි. දුම්කොළ සහ අරක්කු තමයි මිල වැඩිවුණු බඩු අතර ප්‍රමුඛස්ථානයෙහි ලා ගැනෙන්නේ. දුම්කොළ මිල වැඩි වීම නිසා එතුමාගේ පළාතේ ගොවීන්ට එක්තරා සහනයක් ලැබෙන්නට ඇති. එහෙත් මේ රටට වැළඳී ඇති ආර්ථික ව්‍යාධියට, ඒ කියන්නේ ගරු මුදල් ඇමතිතුමා මෙහෙය වන මේ රටේ ආර්ථික සංවර්ධන කටයුතුවලට වැළඳී ඇති ව්‍යාධියට හිරියාලේ ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රදේශයේ තිබෙන දුම්කොළවලින් ඒතරම් ප්‍රයෝජනයක් වේදැයන්නයි, මට සැකයට කාරණය.

මෙම අයවැය ලේඛනය නිසා එකපාරටම ඉහළ ගිය දෙයක් තමා රෙදි පිළි මිල. දුම්කොළ වාගේම රෙදි පිළි මිලත් ඉහළ ගියා. වැඩිපුර දුම්කොළ තිබෙන හිරියාල ආසනයේ මන්ත්‍රීතුමා නම් රෙදි පිළි නැතුවාට එතරම් බිය වන්නට වුවමනා නැහැ. අපේ රට මුහුණ පා තිබෙන මෙම ආර්ථික ව්‍යාධියට පිළියමක් වශයෙන් දුම්කොළ කළඹක් නැතිනම් දුම්කොළ මිටියක් ගරු මුදල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇමතිතුමාට තෑගි කරන හැටියට හිරියාලේ ගරු මන්ත්‍රීතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, ගරු මුදල් ඇමතිතුමාටත් මේ ආණ්ඩුවටත් වැළඳී තිබෙන මෙම ආර්ථික ව්‍යාධියට පිළියමක් කර ගන්නා හැටියට ඉල්ලමින්.

ලංකා පාර්ලිමේන්තුවේ අයවැය ලේඛන 4ක් ඉදිරිපත් කරන ලද දෙවන ගරු මුදල් ඇමතිවරයා හැටියට වන්නියේ නායක වන්නිනායක ගරු මුදල් ඇමතිතුමා ඉතිහාස ගත වෙනවා ඇති. එහෙත් මීට පෙර අයවැය ලේඛන හතරක් ඉදිරිපත් කිරීමෙන් ඉතිහාස ගත වෙච්ච අපේ හිටපු මුදල් ඇමතිතුමකු ආකාරයට එතුමා ඉතිහාසගත නොවේවා කියා මා ප්‍රාර්ථනය කරනවා. ගරු කථානායකතුමනි, 1956 බලයේ හිටපු මහජන එක්සත් පෙරමුණු රජයේ මුදල් ඇමතිතුමා මේ රටේ ආර්ථික සංවර්ධනය හා මුදල් පරිපාලනය පටන් ගත්තේ ලිච්ඡවි රජදරුවන්ගේ රාජ්‍ය පාලන තන්ත්‍රයෙන් එක්තරා කවියකුත් උපුටා දක්වමිනුයි. ඒ කවිය මෙසේයි :

"රොන් ඇරගෙන පෙමින්
යන බිඟු ලෙසින් කුසුමින්
ලොවට දුක් නො දෙමින්
ගනිති අය පඩුරු පෙර නියමින්"

එදා ඒ මුදල් ඇමතිතුමා තනි කණ්නාඩියක් දමාගෙන ඉංග්‍රීසි උච්ඡාරනයෙන් මේ සිංහල කවිය කියවන විට මට මතකයි, මේ මන්ත්‍රී මණ්ඩලයයෙහිත් එක්තරා විනෝදයක් ඇති වුණු බව. දෙවෙනි වරට හතරවෙනි අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීමෙන් ඉතිහාස ගතවන වර්තමාන මුදල් ඇමතිතුමාට එදා ඒ ඉතිහාස ගත වූ කාර්‍ය්‍ය කළ ස්ටැන්ලි ද සොයිසා මුදල් ඇමතිතුමාගේ මුදල් ඇමති කාල පරිච්ඡේදය කෙළවර වුණා වගේ ඉරණමක් අත් නොවේවා කියා මා ප්‍රාර්ථනා කරන්නේ—

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
**(The Hon. Wanninayake)**
කොහොම හරි කෙළවර වෙන්න එපායැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
**(Mr. Prins Gunasekera)**
ඔව්, කෙළවර වෙනව. එහෙත් ඒ විධියට නොවේවා. එතුමාට පාර්ලිමේන්තුවෙන් යන්ට සිද්ධ වුණේ ඉතා කනගාටුදායක පරිසරයකයි. මේ ඉතිහාස ගත වන දෙවෙනි මුදල් ඇමතිවරයාට ඒ අන්දමේ කෙළවරක් අවසානයක් උදා නොවේවා කියා ප්‍රාර්ථනා කරනවා. "රොන් අරගෙන සෙමින්, යන බිඟු ලෙසින් කුසුමින්" කියමින් පටන් ගත් ස්ටැන්ලි ද සොයිසා මුදල් ඇමතිතුමා පැදුරටත් නොකියා ඇමති පදවිය දමලා යන්නට ගියා. අපේ වර්තමාන මුදල් ඇමතිතුමා, දැන් එතුමා ළඟ වාඩි වී සිටින ආහාර ඇමතිතුමාගේ උපදෙස් අනුව එතුමාගේ හතරවෙනි අයවැය ලේඛනයෙන් ඉදිරිපත් කර තිබෙන යෝජනාවලින් ගොවීන්ට මුහුණපාන්නට සිදු වී තිබෙන අළුත් තත්ත්වය විස්තර කරන්නට අද ඒ කවිය වෙනස් කළ යුත්තෙ කොහොමද? ඒ කාලයේ මිනිසුන් බදු අය කළේ මලින් රොන් ගන්න මී මැස්සන් වගෙයි. අද ආහාර නිෂ්පාදන කටයුතු සඳහා මෙතරම් මහන්සි වී වැඩ කරන ගොවීන්ට තමුන්නාන්සේලා සලකන්නෙ කොහොමද? මලකින් රොන් අරන් යන්නට එන බමරෙක් මලට රිදවන්නෙ නැතිව රොන් අරන් යන්න වගේද තමුන්නාන්සේලාත් මේ ගොවීන්ට සලකන්නෙ? මහජන බැංකුවට මොනව වුණත් කමක් නැහැ, කියා මහජන බැංකුවෙන් පමණක් ගොවීන්ට ණය ලබා දීල ආපසු ණය මුදල නොගෙවන ගොවීන්ට තමුන්නාන්සේලා කරන්නෙ මොකක්ද? විදේශීය කිසිම බැංකුවකින් මේ ගොවි ජන සහනයට රුකුළක් ලැබෙන්නෙ නැහැ. ණය මුදල් ලබාගෙන ආපසු නොගෙවන ගොවීන්ට කරන්නෙ කුමක්ද? ණය ගත් ගොවියාගේ පමණක් නොවෙයි; ණය ගත් ගොවියාගේ භාර්‍ය්‍යාවගේ පමණක් නොවෙයි; ණය ගත් ගොවියාගේ මුළු පවුලම සතු හාල් පොත් ටික ඇඟට පතට නොදැනී පැහැරගෙන යෑම කොයි තරම් සාධාරණදැයි ඔබතුමන්ලා දෙදෙනාම කල්පනා කර බලන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
**(An hon. Member)**
ඒක නීති විරෝධි ක්‍රියාවක්.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கரா)*
**(Mr. Prins Gunasekera)**
ගරු කථානායකතුමනි, නීත්‍යානුකූල තත්ත්වය ගැන නොවෙයි මා මේ අවස්ථා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

වේදී සඳහන් කළේ. මෙය සාධාරණ ක්‍රියාවක්ද? මෙය මේ රටේ බලපවත්නා සාමාන්‍ය නීතියට එකහෙළාම විරුද්ධ බව මගේ අදහසයි. එහෙත් නීති ප්‍රශ්නය කටත් වඩා මානුෂික ප්‍රශ්නයක් හැටියට මේ දෙස බලන්න කියායි ගරු මුදල් ඇමති තුමාගෙනුත් ආහාර ඇමතිතුමාගෙනුත් මා ඉල්ලා සිටින්නෙ. මගේ කථාව අවසාන වෙන්නට කලින් මේ කාරණය ගැන තව දුරටත් කරුණු ඉදිරිපත් කරන්ට මා අදහස් කරනවා. මේ අවස්ථාවේදී යන්තමින් ඒ ගැන සඳහන් කළේ මුදල් ඇමතිතුමාගේ ඓතිහාසික කර්තව්‍යය ගැන සඳහන් කරන විට පරණ මුදල් ඇමතිවරයකුගේ කථාවක් සිහිපත් වූ නිසයි.

ගරු කථානායකතුමනි, වන්නිනායක ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ මේ අයවැය ලේඛන හැම එකකින්ම පසුගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාලනය ගැන දොස් පවරමින් යළි යළිත් අවධාරණයෙන්ම සඳහන් කළේ, මේ රට දියුණුව කරා ගෙන යෑමට නම් ආර්ථික සංවර්ධනය සඳහා හැම දෙනාම උර දී ක්‍රියා කළයුතු බවයි. චේතනාව බොහොම හරි. රෝගය තෝරා ගැනීම හරි. එහෙත් අවුරුදු හතරක කාලයක් තිස්සේ මෙම රෝගයට දෙන බෙහෙත අහන්නෙ නැත්තේ මොකද කියා තමුන්නාන්සේලා ටිකක්වත් කල්පනා කර බැලුවාද? අවුරුදු හතරක කාලයක් තිස්සේ එකම බෙහෙත නියම කරනවා, නමුත් රෝගය සුව වන පාටක් නැහැ. ඩිංගක් සොයා බැලුවාද, කාගෙන් වත් අසාවත් බැලුවාද, විශෙෂඥයකුගෙන් වත් උපදෙසක් ගත්තාද මේ රෝගයට බෙහෙත් අහන්නෙ නැත්තේ මොකද කියා?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
බේත් බොන්නෙ නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
අවුරුදු හතරක් තිස්සෙත් පොවන්න උත්සාහ කළා, නමුත් මහජනතාව බොන්නෙ නැති නම් බොන්නෙ නැත්තේ මන්ද කියා සොයා බැලුවාද?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
සීනි නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
තමුන්නාන්සේලා, බොන විධියට දෙන්න දන්නෙ නැහැ.

මේ ආණ්ඩුව දැනට අයවැය ලේඛන හතරක් ඉදිරිපත් කර තිබෙනවා. 1965-66 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ මුල් අයවැය කථාවේදී ගරු මුදල් ඇමතිතුමා මේ අන්දමට සඳහන් කර තිබෙනව.

"I am not now going to talk about the coffers being empty."

"While the main emphasis would be on economic development, the National Government would also take measures to replenish the country's external assets, to augment the flow of essential supplies and to stabilize prices and living costs as far as possible."

බොහොම හොඳ චේතනාවක්. එහෙත් මේ ආණ්ඩුව බලයට ආවාට පසු මුල් අවුරුද්ද තුළදී මේ ප්‍රාර්ථනාවන්ගෙන් කීයෙන් කොටසක් මුදුන්පත් කර ගැනීමට සමත් වුණාද? තමුන්නාන්සේලා බලයට පත් වූ හැටියේ ආර්ථික සංවර්ධනය ගැන කථා කරන්න පෙර, බලයෙන් පහව ගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවේ පාලනයට එක එල්ලේම දොස් නැඟුවා. එම රජය බලයෙන් පහ වන අවස්ථාවේදී ආහාර ද්‍රව්‍ය ලබාගැනීම සඳහා දවස් හතරකට සෑහෙන තරම්වත් මුදලක් භාණ්ඩාගාරයේ නොතිබුණු බව කියමින්, එම රජයේ අදක්ෂ පාලනය ගැන දොස් නැඟුවා. ඒ කතන්දරය දැන් ටිකක් වෙනස් වී ඇති බව පෙනී යනවා. ගරු මුදල් ඇමතිතුමා, මෙවර අයවැය වාර්තා වෙන් පසුගිය ආණ්ඩුවට දොස් පැවරීම තරමක් දුරට නතර කර ඇති බවක් පෙනෙනවා. මට මතකයි, රාජාසන කථා ස්තුති යෝජනා විවාදයේදී ගරු අගමැති තුමා සඳහන් කළා, ඒ කාරණය සම්පූර්ණයෙන්ම අමතක කර දමන්න අවස්ථාව පැමිණ ඇති බව. එපමණක් නොවෙයි, අද රට මුහුණ පා ඇති ආර්ථික දුර්වලතාවන්ට ප්‍රතිකර්ම යෙදීම විනා වෙනත් ආණ්ඩුවකට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දොස් පැවරීමෙන් වැඩක් නොවන බව එතුමා පැහැදිලි කර දුන්නා. බොහොම හරි. ප්‍රමාද වී හෝ මේ අන්දමේ නිරවද්‍ය ආර්ථික හා දේශපාලනමය විග්‍රහයකට එළඹීම ගැන ගරු අගමැතිතුමාට අප ස්තුතිවන්ත වෙනවා. තුන් අවුරුද්දක පමණ කාලයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවට බැන්නා. දැන් සත්‍යය අවබෝධ වී තිබෙනවා. සෑහෙන මුදලක් ඉතිරි කර ගියේ නැතැයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවට දොස් පැවරීමෙන් පමණක් අපේ ආර්ථික සංවර්ධනයක් ඇති කර ගන්න පුළුවන්කමක් නැහැ.

ගරු කථානායකතුමනි, 1968 ජූලි 21 වනදා රාජාසන කථා ස්තුති යෝජනාව පිළිබඳ අවසාන කථාව එතුමා කළේ බොහොම තැන්පත් අන්දමිනුයි. වෙනදා කලින් රජයට දොස් පවරමින් කථා කළත්, එදා එතුමා කථා කළේ මෙන්න මේ අන්දමටයි. 1968 ජූලි 21 වනදා හැන්සාඩ් වාර්තාවේ 1041 වන තීරුවේ මේ අන්දමට පළ වී තිබෙනවා:

"මා දැන් හිස් භාණ්ඩාගාරයක් ගැන සඳහන් කරන්න යන්නේ නැහැ."

අවුරුදු තුනක කාලයක් තිස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට දෝෂාරෝපණය කොට දැන් එහෙම කියනවා.

"We have argued and debated that point *ad nauseam.*"

මහජනතාවට එපා වන තෙක් මේ ඔන් කෙඳිරිල්ල කර තිබෙනවා. තොර තෝංචියක් නැතිව කියා තිබෙනවා.

මේ ගරු සභාවේදීත් රටේ හැම තැනකදීමත් ඔය කථාව කියා තිබෙනවා.

"—here and in the country at large. It is not necessary for me to repeat that in the Throne Speech Debate."

මේ විවාදයේදී ඔය ගැන සඳහන් කරන්න වුවමනා නැහැ.

"However, let us not consider this economic problem in terms of that party or this party, of that government or this government. It is not a creation of a few years back."

ගරු කථානායකතුමනි, මෙය තමයි එතුමාගෙ වැදගත්ම ප්‍රකාශය. අද අප මුහුණ පා තිබෙන ආර්ථික දුෂ්කරතාවට කිසිම ආණ්ඩුවකට—මීට පෙර තිබුණ කිසිම ආණ්ඩුවකට—දොස් කීමෙන් වැඩක් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවට දොස් පැවරීමෙන් වැඩක් නැහැ. මේ ආණ්ඩුවටත් ඇමති මණ්ඩලයටත් දොස් පැවරීමෙනුත් වැඩක් නැහැ. ඒ ගැන ගරු අගමැතිතුමා මොකක්ද කියන්නෙ? එතුමාගේ විග්‍රහය මෙන්න මෙහෙමයි:

"—It is an economic structure that came into being as a result of Ceylon being a subject country."

අපි අද මුහුණ පා තිබෙන මේ ආර්ථික දුෂ්කරතාවයට ප්‍රධාන හේතුව මේ රට යටත් විජිතයක් වශයෙන් තිබීමයි.

"It is a situation that has arisen because this was a colonial country. I need not refer to our economy after we became free.—[OFFICIAL REPORT, 21st July 1968, Vol. 79, c. 1040.]

ගරු කථානායකතුමනි, අද අප මුහුණ පා තිබෙන ආර්ථික දුෂ්කරතාවයට මූලික හේතුව අතීතයේදී අපේ රට යටත් විජිතයක් වශයෙන් තිබීමයි. ගරු අගමැතිතුමා මේ කාරණය බොහොම හොඳට විග්‍රහ කරනවා. යටත් විජිතවාදීන් විසින් මේ රටේ ආර්ථික විනාශ කර තිබෙන ආකාරය එතුමා පෙන්වා දෙනවා:

"Of course, it was the foreign conquerors who nationalized the land. We are aware of the manner in which, by public auction, an acre was sold at 50 cents or 25 cents, where only the foreign conquerors had the money to buy those lands and open those vast estates. So it is not surprising that when the energy of the country which was concentrated in the production of food and other necessities was diverted to a certain extent, not wholly, to the cultivation of other economic crops, paddy cultivation and food production should have languished."

ගරු කථානායකතුමනි, විදේශීය පාලකයන් දුප්පත් ගැමියන්ගේ ඉඩම් අක්කරය ශත 25 ට නැත්නම් 50 ට වෙන්දේසියෙන් අරගෙන විශාල තේ වතු, රබර් වතු, ඇති කළා. ඒ නිසා මේ රටේ කෘෂිකර්මය නැති නාස්තිවී ගියා. අපේ වර්තමාන තත්ත්වයට හේතුව එයයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

ගරු අගමැතිතුමා බොහෝම හොඳට මේ අදහස තේරුම් ගෙන එතුමාගේ තර්කය, මේ විධියට අවසන් කරනවා:

"But what I want to say is this: if we persist in this economy, the economy in which we export tea, rubber and coconut and, with our mouths open, wait for our rice, for our other foodstuffs, for our clthing, and for our industrial products, which we can manufacture in this country, we shall have a very bleak future indeed."—[OFFICIAL REPORT, 21st July 1968; Vol. 79 c. 1043.]

ගරු අගමැතිතුමා කියන්නේ මේ ආර්ථික ක්‍රමය යටත් විජිතවාදීන් විසින් අපට භාර දුන් බවයි. පිටරටින් හාල් ගෙන්වා ගනිමින් අපේ මේ මුදල් ඒ රට වලට යන්න ඉඩ හැර බලා සිටියොත් අපේ අනාගතය තව තවත් අන්ධකාරයට පත් වෙනවා. අවුරුදු 3 කට පසු ගරු අගමැතිතුමා මේ අදහස මේ ගරු සභාවේදී ඉදිරිපත් කළා. 1947 දී මේ අදහස මේ විධියට තේරුම් ගෙන කටයුතු කළා නම් කොයි තරම් හොඳද? අපට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් භාර දී ගොස් තිබෙන්නේ මේ සාරවත් පොළොවේ රොඩු ටික පමණයි. දැන්වත් අපේ පොළොව සාරවත් අතට හරවා ගැනීමට උත්සාහ කරන්න ඕනෑ. මේ විධියට සිතා එදා කටයුතු කළා නම් අද අපට මේ තරම් අමාරු තත්ත්වයක් ඇති වන්නේ නැහැ.

ලබන පෙබරවාරි මස 4 වැනිදාට නිදහස ලබා අවුරුදු 21 පිරෙනවා. නිදහසින් විසිවසක් ගත වන තුරු නියම තත්ත්වය අවබෝධ කර ගන්නට පුළුවන් වී නැහැ. ආණ්ඩු බලය ලබා ගත් හැටියේම කලින් සිටි පාලකයන්ට බණිමින් මේ ආර්ථික ක්‍රමය වෙනස් කරන්නට පුළුවන් යයි හිතුවත්, වචනවලින් කාටවත් දොස් පවරා මේ ප්‍රශ්නය විසඳන්නට බැරි බව දැන් අවබෝධ වී තිබෙනවා. මේ සඳහා අවශ්‍යයෙන්ම පියවර කීපයක් ගත යුතුයි. බටහිර අධිරාජ්‍ය වාදීන් විසින් පාලනය කරන ලද අනෙකුත් ආසියාතික හා අප්‍රිකානු රටවලටත් අපේ රටට වාගේම ආර්ථික දුෂ්කරතාවලට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. මේක ලංකාවට පමණක් විශේෂ වූ අමාරුකමක් නොවෙයි. යටත් විජිත වාදීන් විසින් සූරා ගනු ලැබූ හැම රටකටම මේ අමාරුකමට මුහුණ දෙන්නට සිදු වුවත් ඒ සමහර රටවල් නිදහස ලැබූ හැටියේම තමන්ගේ අතීතය දෙස බලා, වැළඳී තිබෙන රෝගය තෝරා බේරාගෙන නියම පිළියම් කරන්නට පටන් ගත්තා. එහෙත් අප ඒක කෙළේ නැහැ. නිදහස් ලංකාවේ ප්‍රථම අගමැතිවරයා වූයේ වර්තමාන අගමැතිතුමාගේ ආදරනීය පියායි. තමන්ගේ ආදරනීය පුත්‍රයා අද කියන කථාව ඒ පැරණි සේනානායක මහතාට එදා තේරුම්ගෙන අවශ්‍ය පියවර ගත්තා නම් සූරා කා තිබෙන අපේ ආර්ථිකය යළිත් පණ ගැන්වීමට පුළුවන් වීමෙන් සමහර විට අවුරුදු විස්සක් ගත වන විට අපට මීට වඩා සෞභාග්‍ය සම්පන්න ජාතියක් දකින්නට ලැබෙනවා ඇති. ගරු මුදල් ඇමතිතුමා 1965/66 වර්ෂයේ ඉදිරිපත් කළ අය වැය ලේඛනය මාර්ගයෙනුත්, 1966/67 වර්ෂයේ ඉදිරිපත් කළ අයවැය ලේඛනය මාර්ගයෙනුත් යළි යළිත් කීවේ මේ ආර්ථිකය සංවර්ධනය නොකර අපට කවදාවත් දියුණුව කරා පා නගන්නට නොලැබෙන බවයි. තමන් අවධාරණයෙන්ම සඳහන් කරන්නේ සංවර්ධනය ගැන යයි එතුමා කීවා. 1967/68 වර්ෂයේ අයවැය ලේඛනයෙහිත් ඒ ගැන යළි යළිත් කියා තිබෙනවා. එකම විධියට තුන් පොළක මේ කාරණය සඳහන් කර තිබෙනවා.

"The emphasis in the next year's Budget, therefore, as in that of the current year, is on economic development."—[OFFICIAL REPORT, 25th July 1967; Vol. 73, c. 56.]

ඊළඟට මෙසේ කියනවා.

"There is unemployed manpower on the one hand and unexploited resources on the other, indicating the need and scope for greater development activity. The pace of economic development depends largely on the rate of investment. It is with this idea in mind that the highest financial provision ever has been made in this Budget for capital expenditure."—[OFFICIAL REPORT, 25th July 1967; Vol. 73, c. 64.]

යළිත් වරක් මෙසේ කියනවා.

"I would like to make use of this occasion to appeal to them, on behalf of the Government, to address themselves to the task of food production, in particular, with a sense of urgency and assist the Government in its efforts to solve the problem of unemployment and to raise the standard of living."—[OFFICIAL REPORT, 25th July 1967; Vol. 73, c. 65.]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවුරුදු පතා මේ විධියට මහජනයාට ආයාචනා කරමින් ආර්ථික සංවර්ධනය සඳහා වඩ වඩා වෙහෙසෙන්නට යයි කියනවා. කොතරම් ආයාචනා කළත්, කොතරම් අරාධනා කළත් අද ඇති වී තිබෙන ප්‍රතිඵල මොනවාද? 1965/66 අයවැය කථාව කරන විටදී රැකිරක්ෂා විරහිත වූවන්ගේ සංඛ්‍යාව 1,99,655 යි. මේ රටේ වගා කරන්නට වුවමනා තරම් ඉඩම් තිබෙන බවත්, වුවමනා තරම් ස්වාභාවික ධන නිධාන තිබෙන බවත්, රක්ෂා නැති අය ඕනෑ තරම් සිටින බවත්, මේ ජාතික වස්තූන් එකතු කර සංවර්ධන කටයුතු කරන්නට උත්සාහ කිරීම අවශ්‍ය බවත් ගරු මුදල් ඇමතිතුමා එදා කීවා.

කලින් අවුරුද්දේ රැකිරක්ෂා විරහිත වූවන්ගේ සංඛ්‍යාව 1,99,655 ක් ප්‍රමාණය, ඊළඟ අවුරුද්දේ අයවැය කථාව කරන අවස්ථාව වන විට අඩු වුණාද? 1966 දී ඒ සංඛ්‍යාව 2,38,901 දක්වා වැඩි වුණා. මුදල් ඇමතිතුමා තමා ප්‍රථම අයවැය කථාවෙන් කියා සිටියේ, "රැකිරක්ෂා නැති අය විශාල සංඛ්‍යාවක් ඉන්නවා. වගා කිරීමට හැකි ඉඩකඩම් ඕනෑ තරම් තිබෙනවා, එම නිසා ඒ දෙක එක්කාසු කරන්නට ඕනෑ" කියායි. ඒ දෙගොල්ල එක්කාසු කර අවුරුද්දකට පසුව ප්‍රතිඵලය බැලුවාම, කලින් අවුරුද්දට වඩා 39,246 කින් රැකිරක්ෂා විරහිත වූවන්ගේ සංඛ්‍යාව ඉහළ ගොස් තිබෙන බව පෙනුණා.

පෙට්ටියකට යතුරු දමා මෙතැනට ගෙනැවිත් විවෘත කර කොළ කෑබැලි බලාගෙන, අවුරුදුපතා ජූලි හෝ අගෝස්තු මාසයේදී පවත්වන අයවැය කථාව 1966 දීත් සුපුරුදු පරිදිම කරමින් මුදල් ඇමතිතුමා අර ඉල්ලීම, ආයාචනය නැවතත් කළා. "රැකිරක්ෂා නැති අය අපේ රටේ ඕනෑ තරම් ඉන්නවා, වගා කිරීමට පුළුවන් ඉඩකඩම් අනන්තවත් තිබෙනවා, වැඩි වැඩියෙන් වගා කොට රට සංවර්ධනය කිරීම සඳහා හැම දෙනාගේම සහයෝගය අපට වුවමනා කරනවා" යනුවෙන් ආයාචනයක් කරන්නට, මුදල් ඇමතිතුමා ඒ වාරයේ දීත් අමතක කළේ නැහැ.

එහෙත්, එදා සහ අද අතර ඇති වෙනස මොකක්ද? 1965 අවුරුද්දේ රැකිරක්ෂා විරහිත වූවන්ගේ සංඛ්‍යාව 1,99,655 යි. 1966 දී එය 2,38,901 දක්වා වැඩි වුණා. 1967 දී එය තවත් 19,300 කින් ඉහළ යමින් 2,58,201 දක්වා වැඩි වුණා. මුදල් ඇමතිතුමාගේ චේතනාව නැත්නම් ප්‍රාර්ථනාව යහපත් වුණත්, හැඟීම සාධාරණ වුණත්, රෝගයට නියම කරනා බෙහෙත හොඳ වුණත්, රෝගය සුව නොවනා බව මෙයින් පෙනෙනවා නොවෙයිද? මේ ආර්ථික රෝගය එන්න එන්නම උග්‍ර වීම, අසාධ්‍ය වීම හේතුකොටගෙන රෝගියා මරණයට කිට්ටු වන බව පෙනෙනවා නොවෙයිද? එසේ වීමට හේතුව මොකක්දැයි ගරු මුදල් ඇමතිතුමාවත්, මේ රෝගය වැළඳුණේ කෙසේදැයි ප්‍රමාද වී හෝ දැන් වටහාගෙන තිබෙන ගරු අගමැතිතුමාවත්, මොළය තිබෙන වෙනත් ඇමතිවරයෙක්වත් ඕංගක් කල්පනා කර බැලුවාද? මා මීට මොහොතකට කලින් කීවා, මේ විරෝගය අප්‍රිකානු හා ආසියාතික ජාතීන් රාශියකටම වැළඳී තිබෙනවය, කියා. එන්න එන්නම උග්‍ර වන ආර්ථික පරිහානිය සම්බන්ධ මේ රෝගය ආසියා-අප්‍රිකා රටවලට බෝ කළේ. බටහිරදිග අධිරාජ්‍යවාදී ජාතීන් බවත් මා කීවා. ඒ අධිරාජ්‍යවාදී ජාතීන් ඒ ඒ රටවලින් ඇත් වී, ස්වදේශීය පිරිස්වලට පාලනය භාර දී ගියත්, ඔවුන් ඒ ඒ රටවල පැළපදියන් කළ ආර්ථික විෂ බීජ තවමත් රෝගය පතුරුවා හරින බවයි. රෝගය උග්‍ර වීමෙන් අපට පැහැදිලි වන්නේ. අධිරාජ්‍යවාදීන් ඒ ඒ රටවල් අල්ලාගෙන, ඒවා දියුණු කිරීම සඳහා ආහාර වගා කළේ නැති බව අප තේරුම් ගන්නට ඕනෑ. ඔවුන්ට වුවමනා කළේ, සුඛෝපභෝගී ජීවිත ගත කිරීම සඳහා, අර අහිංසක දුප්පත් රටවල තිබෙන හැම වස්තුවක්ම සූරාගෙන පුළුවන් තරම් ඉක්මණින් තමන්ගේ රටවලට ඇදගැනීමයි.

අද අප පෙළෙන මේ ආර්ථික රෝගය, මන්දපෝෂණය යනුවෙන් එක්තරා විධියකට විස්තර කරන්නට පුළුවනි. අප ජාතිය සතු, අප රටවැසියා සතු වස්තුව අපෙන් සූරාගෙන ඒ අධිරාජ්‍ය රටවලට ගෙන ගිය නිසා, අප දැන් කෙට්ටු වී, දුර්වල වී තිබෙනවා. අර පැරණි ආර්ථික වට්ටෝරුව ඒ විධියටම ක්‍රියාත්මක කරමින්, තේ පඳුරුවලට පොහොර දමමින්, රබර් ගස්වලට පොහොර දමමින් පොල් පැල වලට පොහොර දමමින් අපේ ආර්ථිකය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

මෝඩ බලාපොරොත්තුවක් ලෙස දක්වන් ශක්තිසම්පන්න කිරීමට උත්සාහ දැරීම නට පුළුවනි. මේ ක්‍රමයෙන් නම්, මේ රටේ පැරණි සෞභාග්‍යකරා කිසි කලෙකත් ළඟාවන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. අපේ පාලක පිරිස මෙන්න මේ සත්‍යය අවබෝධ කර ගත්තොත් සමහර විට පසුගිය අවුරුදු 20 තුළදී නොලත් දියුණුවක් ලබන අවුරුදු 10 තුළ දී ලබාගන්නට පුළුවන් වේවි. යටත් විජිත පාලනයෙන් මිදී නිදහස ලැබූ ජාතියක් විසින් පළමුවෙන්ම කළ යුත්තේ යටත් විජිත යුගයේ ඒ රටට බෝ කළ ආර්ථික, දේශපාලනමය හා සමාජයීය පිළිවෙත්වලින් තොර වීමයි. අවුරුදු 20 ක් ගතවෙලාත් අපට එය කරගන්නට බැරි වී තිබෙනවා. ඒ නිසයි මේ බෙහෙත අසන්නේ නැත්තේ. හැමදාමත් ගරු මුදල් ඇමතිතුමා විසින් පිටින් අලවන මේ පැලැස්තරය මේ ආර්ථික රෝගයට නාහන්නේ ඇයි? අර පරණ අධිරාජ්‍ය යුගයේ අපට බෝ කළ ඒ රෝගයට පිටින් පැලැස්තර දැම්මාට අහන්නේ නැහැ. ඒ ක්‍රමය සම්පූර්ණයෙන්ම වෙනස් කරන්නට ඕනෑ. ඒ පියවර ගත්තාවූ අනිකුත් අධිරාජ්‍ය බලයෙන් මිදුනු රටවල් දෙස බලා අපිත් ඔවුන්ගේ ඉතිහාසය ආදර්ශයට ගන්නට ඕනෑ. සමහර අප්‍රිකා රටවල්, කියුබාව වැනි ඇතැම් අමෙරිකා රටවල්, චීනය වැනි පෙරදිග රටවල් දෙස බලා අපි යමක් කමක් ඉගෙන ගන්නට ඕනෑ. චීනයේ වගේ හෝ කියුබාවේ වගේ විප්ලවයක් මේ රටට අවශ්‍යයයි මා කියන්නේ නැහැ. දකුණු වියට්නාමයේ අමෙරිකන් මිනිස් ඝාතනය වගේ අවි අරගෙන කටයුතු කරන්නට ඕනෑය කියා මා කියන්නේ නැහැ. එහෙත් ඒ රටවල් ගත් ඒ පියවරවල් නිසා ඔවුන් සුඛිත මුදිත වුණා. එහෙත් ඒ වෙනුවට අපි කරන්නේ කුමක්ද? මේ රටට නිදහස දුන්නාය කියා මේ රටේ පාලන බලය මෙහිම පිරිසකට පවරා, මේ රටින් ඈත් වී ගිය ඒ අධිරාජ්‍යවාදී පාලකයන්ගේ අදහස් ඒ විධියටම පිළිගෙන, ඔවුන් අඳින ඇඳුම් ඇඳගෙන, ඔවුන් කථා කරන භාෂාවෙන් කථා කරමින්, ඔවුන් ජීවත් වන විධියට ජීවත් වෙමින්, ඔවුන්ගේ ආර්ථික ක්‍රමය ඒ විධියටම ආරක්ෂා කරමින්—තේ, රබර් පොල් ආර්ථික ක්‍රමය එසේම තබා ගනිමින් —නිදහස් ජාතියක් වශයෙන් ජීවත්වීමට අපි උත්සාහ දරනවා. එයත් කරන්නට පුළුවන් වැඩක්ද? මේ රටේ තිබෙන ධනය සූරාගෙන එංගලන්තයට නැත්නම් බටහිර අධිරාජ්‍යයන්ට අරගෙන යෑමට සකස් කළ ආර්ථික ක්‍රමයකින් මේ රට සංවර්ධනය කරන්නට පුළුවන්ද? මේ මූලික ප්‍රශ්නය ගරු මුදල් ඇමතිතුමා තේරුම් ගෙන තිබෙන බවක් පසුගිය අය වැය කථාවෙන් මට පෙනී ගියා. එහෙනම් කළ යුත්තේ මේ ආර්ථික ක්‍රමය සම්පූර්ණයෙන්ම වෙනස් කිරීමයි. ඒ සඳහා අරගෙන ඇති පියවරවල් මොනවාද? පසුගිය දිනවල තේ වගාව සම්බන්ධ කොමිසමක් පත් කළා. දැන් වාර්තාව ලැහැස්ති කරගෙන යනවාලු. මේ තේ කොමිසමේ නිර්දේශයන් මොනවාද කියා මා දන්නේ නැහැ. [බාධාකිරීමක්] මේ ආර්ථික ක්‍රමය වෙනස් කිරීම සඳහා සෑහෙන නිර්දේශයන් මේ කොමිෂන් වාර්තාවෙන් ඉදිරිපත් වේද කියා මට නම් සැකයි. අධිරාජ්‍යවාදී යුගයේ අධිරාජ්‍යවාදීන්ගේ ආර්ථික දර්ශනය පිළිගෙන, අධිරාජ්‍යවාදීන්ගේ ආර්ථික විද්‍යායතනවලට ගොස් පුහුණු වී එහෙත් උපාධි ලබාගෙන ලංකාවට එන උපාධිධාරීන්ගෙන් උපදෙස් ලබාගෙන නම් කවදාවත් අප වැටී සිටින මේ ආර්ථික මඩ වගුරෙන් ගොඩ එන්න පුළුවන් වන්නේ නැහැ. අපට අවශ්‍ය වී තිබෙන්නේ ඊට වඩා වෙනස් ආර්ථික දර්ශනයක්. තේ, පොල්, රබර් ආර්ථිකයෙන් අපේ තිබෙන සෑම අඩුපාඩුවක්ම නැති කරගන්න පුළුවන්කමක් නැහැ. ආර්ථික දර්ශනය ගැන කථා කරන විට ගරු කථානායකතුමනි, ඉන්දුනීසියාවේ එක්තරා ආර්ථික දර්ශනවාදියකු විසින් කර ඇති එක්තරා ප්‍රකාශයක් ගැන තමුන්නාන්සේගේ සැලකිල්ල යොමු කිරීමට මට-මතක් වුණා. ඉන්දුනීසියාව අපේ ආර්ථික තත්ත්වයට ඉතාම කිට්ටු සම්බන්ධකමක් තිබෙන, ඊට බොහෝම කිට්ටුවෙන් සමාන කළ හැකි ආර්ථික දුෂ්කරතා රාශියකට මුහුණ පාන්නට සිදු වී තිබුණ රටක්. ඒ ආර්ථික විද්‍යාඥයා දර්ශන වාදියා කී කථාව කුමක්ද? යටත් විජිත තත්ත්වයෙන් මිදී අලුත නිදහස් වුණ රටවල්, තම තමන්ගේ රටවල් හැටියට ඒවා හඳුනාගන්න විට, තම තමන්ගේ රටවල් හැටියට ඒවා දියුණු කරන්නට උත්සාහ කරන විට, කිසිම සැකයක් නැතුව, කිසිම පැකිලීමක් නැතුව,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමහර විට ලෝකයේ අන් කිසිම රටක් විසින් මෙතෙක් නොගත් පියවරවල් ගැනි මට ඒ රටවලට සිදු වන බවයි.

ලංකාවේ නම් මම මේ දක්වා අසා නැහැ, එවැනි අදහසක් පළ කළ එවැනි උප දෙසක් දුන් ආර්ථික විශෙෂඥයෙක් ගැන. අපේ ආර්ථික විශෙෂඥයන් සෑමදම උප දෙස් දෙන්නේ, වැඩි පුර තේ නිපදව පල්ලා, වැඩිපුර තේ දළු කඩන්න පුළුවන් තේ වගී ගෙනැවිත් හිටුවපල්ලා, වැඩිපුර රබර් කිරි කපන්න පුළුවන් රබර් වගී ගෙනැවිත් හිටුවපල්ලා, පොල්වලට වැඩි වැඩියෙන් පොහොර දමා පොල් ප්‍රමාණය වැඩි කරගනිල්ලා, තාසිවානයෙන් යම් කිසි වී ජාතියක් ගෙනැවිත් දැන් තිබෙන ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා ගොවිතැන් කර පල්ලා, යන දී වශයෙනුයි. ඔය විධියට, කථානායකතුමනි, පැරණි රේල් පිලි උඩම දුවන විසඳුම්වලින් අපේ ආර්ථික ප්‍රශ්නය විසඳන්න බැරි බවයි මගේ පළමුවෙනි ප්‍රකාශය.

මා කියමින් සිටියේ ගරු කථානායක තුමනි, ඉන්දුනීසියාවේ දයා නමැති එක් තරා ආර්ථික දර්ශනවාදියකු විසින් කරන ලද ප්‍රකාශයක් ගැනයි. අධිරාජ්‍යවාදයෙන් මිදෙන විට කෙමියුනිස්ට් රටවලට එකතු නොවී නිදහස් රටවල් හැටියට ජීවත් වන්නට උත්සාහ කරන ජාතීන් රාශියක් අද ලෝකයේ ඉන්නවා. ඒ ජාතීන්ගේ අතීතයත් ඔවුන්ගේ අනාගතයත් ගැන කරුණු අඩංගුකර "තුන්වන ලෝකය"—The Third World—යන නමින් පීටර් වුල්ස්ලි නමැති ලේඛකයා විසින් ලියා ඇති පොතක් තිබෙ නවා. එම පොතේ 121 වෙනි පිටුවේ මෙන්න මෙහෙම දෙයක් සඳහන් වෙනවා:

"'Any Authentic ethic for the economy of Africa must be based on a new humanism..The economy..is only a means, an instrument for constructing society; the economy is a base only; it does not fulfil its role except in so far as it safeguards African culture. This is a new and essentially fertile idea in an epoch when the notion of material reward dominates everything and when geography is dehumanized to the point where everything is expressed in purely economic terms alone, assimilating social progress to statistical indices.'"

මෙයින් අදහස් කරන්නේ කථානායක තුමනි, සමාජයක ආර්ථික පදනම වෙනස් කිරීමේදී ටිකක් එඩිතරව ක්‍රියා කළ යුතු බවයි. පැරණි ක්‍රම අනුවම ගිහින්, පැරණි අදහස්ම අනුගමනය කරමින්, මේ තරම් උග්‍ර ලෙස එරී තිබෙන ආර්ථික ක්‍රමයක් යලිත් ගොඩගන්නට බැරි බවයි.

ගරු කථානායකතුමනි, මේ මූලික කරුණු ටික මේ විධියට කියන්නට මා අදහස් කළේ මුදල් ඇමතිතුමා අවුරුදු හතරක් තිස්සේ ඉදිරිපත් කරන ලද මේ බෙහෙත් වට්ටෝරුවෙන් අපේ රෝගය ටිකක්වත් සුව නොවී තිබෙන බව පහදා දී, මේ බෙහෙත්වලින් තුට්ටු දෙකකවත් ප්‍රයෝජනයක් ලබා ගැනීමට නම් මේ වට්ටෝරුව මීට වඩා වෙනස් විධියට ලිවිය යුතු බව පෙන්වා දීමටයි. අවුරුදුපතා අයවැය ලේඛනය හැටියට ඉදිරිපත් කරන මේ බෙහෙත් වට්ටෝරුවේ ලොකු අඩුපාඩුවක් තිබෙනවා. අද බලයේ සිටින තමුන්නාන්සේලා හෝ මතුවට බලයට පැමිණෙන කවුරුන් හෝ අන්න ඒ අඩුපාඩුව, ඒ මූලික සත්‍යය, කුමක්ද කියා අවබෝධ කර ගත් තොත් සමහර විට මේ රෝගයෙන් බේරෙන්නට අපට පුළුවන්කම ලැබේවි.

අද මේ විවාදයට භාජන වී තිබෙන මුදල් ඇමතිතුමාගේ අයවැය කථාවේ වැඩි කොට සක සඳහන් වන්නේ "terms of trade, balance of payment, gross national product, foreign exchange budget, foreign aid, FEECs, foreign investments, tax holiday, moratorium," යන වචනයි. මේ විධියට ධනවාදී බැංකු ආර්ථික ක්‍රමය යටතේ මුදල් හදල් එහා මෙහා කිරීමෙන් පමණක්, මුදල්වලට ගෙවන පොලිය අඩු කිරීමෙන් හෝ වැඩි කිරීමෙන් හෝ පමණක්, විදේශීය විනිමය වැඩිපුර මෙහාට ගෙන්වා ගැනීමෙන් පමණක් මේ ආර්ථික රෝගය සුව කර ගන්නට පුළුවන්ය යන විශ්වාසය ඇතිව සකස් කළ කථාවක් මේක. මේ අදහස්ම පදනම් කරගෙන මේ කථාව 1965-66 දීත් කළා; 1966-67 දීත් කළා; 1967-68 දීත් කළා; 1968-69 දීත් කළා. නමුත් තමුන්නාන්සේලා ඉදිරිපත් කරන මේ යෝජනා මහ ජනතාව අතරට යන්නේ නැහැ. ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය මහජන සහයෝගය තමුන්නාන්සේලාට ලැබෙන්නේ නැත්තේ මොකක්ද හේතුව? තමුන්නාන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා,]

සේලා යෝජනා කරන අදහස ඉදිරිපත් කරන අදහස්, මහජනතාවට හරියට අව බෝධ වන්නේ නැහැ. මේ රට තමුන්නාන් සේලාගේය, මේ රටේ තිබෙන වස්තුව තමුන්නාන්සේලාගේය, මේ රට දියුණු කිරීම තමුන්නාන්සේලා සතු වගකීමක්ය, යුතුකමක්ය, එම නිසා අප සියලු දෙනාම ඉදිරිපත් වී මේ රට සංවර්ධනය කළ යුතු ය යන කථාව කිති කැවෙන තැනට ඇඹිල්ල තබා මහජනතාවට කියන්නට තමුන්නාන් සේලාට තවම බැරි වී තිබෙනවා. මේ කතාව මහජනතාවට තේරෙන විධියට කියන්නට තමුන්නාන්සේලාට බැරිවී තිබෙනව. ප්‍රධාන හේතුව ඒකයි. තමුන්නාන්සේලා කථා කරන්නේ මහජනතාවට තේරෙන භාෂා වෙන් නොවෙයි. මේ වචෝරුව ඉදිරිපත් කරන්නේ මහජනතාවට තේරෙන භාෂා වෙන් නොවෙයි.

1965-66 වර්ෂයේ අයවැය කථාව ඉදිරි පත් කරන අවස්ථාවේදී මිනිසුන්ට තේරෙ න භාෂාවෙන් කථා කළේ පේළි 77 යි. ඊළඟට පැය 3 1/2 ක් තිස්සේ මහජනතා වට නොතේරෙන භාෂාවකින් කථා කළා. 1966-67 වර්ෂයේ අයවැය කථාව ඉදිරිපත් කරද්දීත් මිනිසුන්ට තේරෙන භාෂාවෙන් කථා කළේ පේළි 69 යි. ඊළඟට පැය 3 1/2 ක් තිස්සේ මිනිසුන්ට නොතේරෙන භාෂා වකින් කථා කළා. 1967-68 වර්ෂයේ මිනි සුන්ට තේරෙන භාෂාවෙන් කිව්වේ පේළි 76 යි. ඊට පසු පිලි පැන මිනිසුන්ට නො තේරෙන භාෂාවෙන් පැය 4 ක් තිස්සේ කථා කළා. 1968-69 වර්ෂයේ අයවැය කථා ව කරද්දී මිනිසුන්ට තේරෙන භාෂාවෙන් පේළි 124 ක් කථා කර තිබෙනවා. ලොකු දියුණුවක්. 1965-66 පේළි 77 යි ; 1968-69 දී එය පේළි 124 ක් වී තිබෙනවා. ඒ දියු ණුව ගැන අපි මුදල් ඇමතිතුමාට ප්‍රශංසා කරන්නට ඕනෑ. නමුත් ඊළඟට පැය 3 1/2 ක් තිස්සේ ජනතාවට නොතේරෙන භාෂා වකින් කථා කළා. මේ නිසා මිනිසුන් කිති කවා මිනිසුන් සංවර්ධනයට ඇදගන්නට තමුන්නාන්සේලාට බැහැ.

මගේ වේලාව අවසාන බව කියන්නට ගරු කථානායකතුමා ලෑස්ති වෙනවා වගෙයි. 12 ට මගේ කථාව අවසාන කරන් නට මහන්සි ගන්නම්.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

හැම දෙනාම මිනිත්තු දහයක් පහළො වක් වැඩියෙන් ගන්නට ගියොත් අමාරු වෙනවා. එහෙම කළාම අනික් මන්ත්‍රී වරුන්ට කාලය නැහැ. තව මිනිත්තු පහක් ගන්න.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**

*(திரு. பிறின்ஸ் குணசேக்கர)*

**(Mr. Prins Gunasekera)**

මගේ තර්කය හරියට ඉදිරිපත් කරන් නට නම් ටිකක් විවේකීව කරුණු ගෙන හැර දක්වන්නට ඕනෑ.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

කාරක සභා අවස්ථාවේදී ඒ ගැන කථා කරන්නට පුළුවනි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**

*(திரு. பிறின்ஸ் குணசேக்கர)*

**(Mr. Prins Gunasekera)**

12 ටවත් මගේ කථාව අවසාන කරන් නට බලන්නම්.

භාෂාව, ආර්ථික කරුණු කෙරෙහි කොයි තරම් දුරට බලපානවාද යන්න ගරු මැති ඇමතිවරු අවබෝධ කර ගන්නවා නම් මීට වඩා වේගයෙන්, මීට වඩා සාධාරණ සිද්ධි යට මේ ප්‍රශ්නය විසඳීමට අපට පුළුවන්ය කියා මා සිතනවා. දේශපාලනඥයන් අඳින ඇඳුම, කථා කරන භාෂාව, ඉගෙන ගන්නා ස්කෝලය, ඔවුන්ගේ ගති පැව තුම් හා චාරිත්‍ර වාරිත්‍ර ආර්ථික සංවර්ධනය කෙරෙහි මේ තරම් දුරට බලපවත්වන්නේ කෙසේද කියා කෙනකු සාවඥ විධියට ප්‍රශ්න කරන්නට පුළුවන්. මේ කාරණය ගැන මෑතදී ලියන ලද පොතකින් කරුණු දෙක තුනක් ඉදිරිපත් කරන්නට අවසර දෙන්න. සමහර විට ගරු රාජ්‍ය ඇමතිතුමා ගේ යහළුවකු වන්නට ඇති, මාර්ෂල් ආර්. සිංගර් නමැති ඇමෙරිකන් විශේෂඥයෙක් —පෙන්සිල්වේනියා විශ්ව විද්‍යාලයේ මහා චාර්ය වරයෙක්— පසුගිය අවුරුදු 3 ක කාල යක් තිස්සේ පර්යේෂණ කර ලංකාවේ දේශපාලනඥයන් ගැන ලිය පොතක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තියෙනවා. අළුතෙන් පිබිදීගෙන එන දේශ පාලන නායකයන් විග්‍රහ කරමින්, මේ මහාචාර්යවරයා ඉතාමත් වැදගත් නිගමනයන් රාශියකට බැස තිබෙනවා. විශේෂයෙන් ලංකාව ගැන කල්පනා කර ලියූ කරුණු දෙක තුනක් පමණක්, මගේ තර්කය සනාථ කිරීම සඳහා, කියවීමට මා අදහස් කරනවා. දේශපාලනයට බැස පාර්ලිමේන්තුවට එන මන්ත්‍රීවරුන් මොන භාෂාවෙන් කථා කළත් එහි ඇති වැරද්ද මොකක්ද කියා සමහරුන් බොහෝ විට මේ මන්ත්‍රී මණ්ඩලයේදීම ප්‍රශ්න කරනවා මට ඇසී තිබෙනවා. එහෙත් එහි එක්තරා ඓතිහාසික වැදගත්කමක් තිබෙනවා. ඒ මහාචාර්යවරයා කියන්නේ මේ විධියටයි :

"The Emerging Elite—A Study of Political Leadership in Ceylon

The question of the self-images of members of the political elite can, I submit, be analyzed by examination of three crucial variables : language, newspaper reading, and mode of dress.

*Language* "Language" says Howard Wriggings, 'is of profound significance to an individual. It is the person's mode of contact with his social world. ......An individual's values and life purposes are expressed through his language.' He might well have added that the very images one has of oneself are shaped by the language used to express those images."

කෙනකු තමන් ගැන හිතන පිළිවෙළත්, කෙනකු අදහස් කරන පිළිවෙළ සහ වැඩ කරන පිළිවෙළත්, ඔහු තමන්ගේ අදහස් අනුන්ට පළ කිරීම සඳහා පාවිච්චි කරන භාෂාව අනුව තීරණය කරන්නට පුළුවන් බවයි, මෙයින් කියන්නේ. මේ අය වැය කථාව ඉදිරිපත් කරන විට ගරු මුදල් ඇමතිතුමා මිනිත්තු 4 1/2 ක් පමණ සිංහලෙන් කථා කර ඊට පසු එක පාරටම පිලි පැන ඉංග්‍රීසියෙන් කථා කරන්නට පටන් ගත් වෙලාවේ මා විරුද්ධත්වය දක්වා නිශ්ශබ්දව නැගිට ගිය බව ඔබතුමා දකින්නට ඇති. මේක මා අවුරුදු පතා නිශ්ශබ්දව කරන දෙයක්. එක්තරා ප්‍රතිපත්තියක් අනුවයි, මා එසේ කරන්නේ. ඉංග්‍රීසියෙන් කථා කරණ, ඉංග්‍රීසියෙන් හිතන, ඉංග්‍රීසියෙන් අඳින පළඳින, ඉංග්‍රීසියෙන් ජීවත්වන වර්තමාන නායකයන්ට රටේ සිංහල හා දෙමළ සාමාන්‍ය පොදු ජනතාවගේ අවංක සම්පූර්ණ සහයෝගය ලබා ගන්නට කවදාවත් පුළුවන් වන්නේ නැ. ඒ කරුණ එම නායකයන්ට අවබෝධ වීම සඳහාත් ලෝකයට ප්‍රකාශ වීම සඳහාත් එදා මා නිශ්ශබ්දව විරුද්ධත්වය දක්වා නැගිට ගියා. ඒ කරුණු ටික කියැවුණේ භාෂාව සම්බන්ධවයි. ඊළඟට, කියවනු ලබන පුවත්පත් ගැන මෙම පොතේ 111 වන පිටුවෙහි මෙසේ සඳහන් වෙනවා :

"If it is true anywhere that the attitudes and images held by a man will be shaped by the sources of information to which he is exposed, it is especially true in Ceylon. Not only do newspaper-reading habits provide information on the type of bias to which one is exposed, but implicit in the choice of one newspaper over another is the identification of oneself with the values expressed in that newspaper. This is particularly true when there is a wide choice of newspapers available.

*Mode of dress.* While the clothes a man chooses to wear may be a good index of his self-image, this choice may also be an indication of the image of himself that he would like to project onto the public mind."

මේ විවාදයේදී දවසක් මුල්කිරිගල මන්ත්‍රීතුමා (ජෝර්ජ් රාජපක්ෂ මයා.) "සිළුමිණ" පත්තරයේ කතු වැකියක් කියවද්දී ඊට විරුද්ධත්වය දැක්වූ රාජ්‍ය ඇමතිතුමා කවදාවත් එය "සිළුමිණ" පත්තරයේ කතු වැකියක් නොවේයයි කී හැටි ඔබතුමාට මතක ඇති.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මා එහෙම කිව්වේ නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேகர)*
(Mr. Prins Gunasekera)
ඔබතුමා පුදුම වුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

මා කිව්වේ, වෙන්න බෑ කියායි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

එහෙත්, එය "සිළුමිණ" පත්තරයේ කතුවැකියක් බව දන් තමුන්නාන්සේ පිළිගන්නවා. සිංහල පත්තරයක එවැනි අදහසක් පළ වේයයි තමුන්නාන්සේට විශ්වාස කරන්නට බැහැ. ඉංග්‍රීසි පත්තර පමණක් කියවන මේ නායකයන් . . . .

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

මා සිංහල පත්තරත් කියවනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

කියවනවා නම්, එවැනි අදහස් සිංහල පත්තරයක පළ වී තිබෙන බව දුටු විට තමුන්නාන්සේ පුදුමයට පත් වන්නේ ඇයි ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ඒක මම පස්සේ කියන්නම්.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

මේ වගේ ද්විත්ව ජීවිත ගත කිරීම නිසා තමයි, මේ රටේ සාමාන්‍ය ජනතාවගේ අකලංක සහයෝගය දිනා ගන්නට තමුන්නාන්සේලාට බැරි වී තිබෙන්නේ. ඒ මිනිසුන්ට තේරෙන භාෂාවෙන් කථා නොකර, ඒ මිනිසුන්ගේ ජාතික හැඟීම් ඇවිස්සෙන තැන් කිතිකවා ඔවුන්ගේ සහයෝගය ජාතික සංවර්ධන කටයුතුවලට යොදවා ගන්නට තමුන්නාන්සේලාට පුළුවන්කමක් නැහැ. රාජ්‍ය ඇමතිතුමා හැර අනෙක් ඇමතිවරුන් බොහෝ දෙනෙක අඳින්නේ මේ රටේ සාමාන්‍ය මිනිහා අඳින ඇඳුම නොවෙයි. ඇමතිවරුන් කථා කරන්නේ සාමාන්‍ය මිනිහා කථා කරන භාෂාව නොවෙයි. ජීවත් වන්නේ සාමාන්‍ය මිනිහාගේ ජීවිත අනුව නොවෙයි. හිතන්නේ ඒ මිනිසුන්ගේ සිතුම් පැතුම් අනුව නොවෙයි. මෙ රට පුංචි එංගලන්තයක් කරන්නට ඕනෑයයි ලජ්ජා බය නැතිව එළි පහළියේ ප්‍රකාශ කළ පුද්ගලයකුගේ දේශපාලන දර්ශනයෙන් පැවත එන පිරිසක් විසිනුයි අද මේ රට ආණ්ඩු කෙරෙන්නේ. කලක සිට පෙම් කළ සුදු පෙම්වතියක සමග මේ පුද්ගලයා නොබෝදා විවාහ වුණු බව පත්තරවල පළ වුණා. ඔහුගේ දේශපාලන දර්ශනයෙන් පැවත එන මේ වර්තමාන රජයට කවදාවත් මේ රට සිංහල මිනිසුන්ගේ රටක් වශයෙන් සංවර්ධනය කරන්නට පුළුවන්කමක් නැහැ. මේ රටේ සුළු ජාතීන් කීපයක් ජීවත් වන බව හැබෑව. එහෙත් මෙය ඓතිහාසික වශයෙන් සිංහල මිනිසුන්ගේ රටක්. මෙහි සිටින සුළු ජාතීන් එළවා පළවා හරින්නට හෝ ඔවුන්ට වෙනස්කම් කරන්නට හෝ මා කවදාවත් කියන්නේ නැහැ. සිංහල මිනිහාට නොතේරෙන භාෂාවකින් කථා කරමින්, ඔවුන්ට වෙනස්කම් කරමින්, ඔවුන්ගේ සිතුම් පැතුම් අවබෝධ කර නොගෙන ඔවුන්ගේ සහයෝගය ලබා ගන්නට තමුන්නාන්සේලාට කවදාවත් ඉඩක් ලැබෙන්නේ නැහැ.

5 වැනි අයවැය කථාව කරන්නට මුදල් ඇමතිතුමාට අවස්ථාව ලැබේදැයි මා දන්නේ නැහැ. බොහෝ දේශපාලනඥයන්ගේ අදහස මේ රජයට එවැනි බලාපොරොත්තුවක් නැති බවයි. ප්‍රවෘත්ති පත්‍ර මේ අයවැය හඳුන්වා තිබෙන්නේ "Don't Rock the Boat Budget" යනුවෙනුයි. යන්තම් එහෙත් මෙහෙත් පැලැස්තර අලවා තිබෙන්නට හරිනවා මිස හොල්ලන්නට තරකයි. "නෝ හෙල්ලුම් බජට්" එකක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේක. "නෝ හෙල්ලුම් බජට්". ඒ නිසා යම්කිසි විධියකින් ලබන වාරයේදී බැරි වෙලාවත් වර්තමාන වන්නියේ නායක වන්නිනායක ගරු මුදල් ඇමතිතුමාට යළිත් වරක් අයවැය කථාවක් මෙම සභා වට ඉදිරිපත් කරන්නට අවස්ථාව ලැබු ණොත් මහජනයාට තේරෙන විධියට මහ ජනයාගේ බසින් පේලි 124 කට පමණක් එම කථාව සීමා නොකර අංග සම්පූර්ණ ලෙසම රාජ්‍ය භාෂාවෙන් එම කතාව ඉදිරි පත් කරන්නට එතුමාට ශක්තිය හා භාග්‍යය ලැබේවායි මා ප්‍රාර්ථනය කරනවා.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

I recognize the hon. Member for Nuwara Eliya. The Sitting is suspended till 2 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටවන ලදින් අ. භා. 2 ට නැවත පවත්වන ලදී.**

அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு, மீண்டும் பி. ப. 2 மணிக்கு ஆரம்பமாயிற்று.

*Sitting accordingly suspended till 2 P.M. and then resumed.*

* * * * *

**[ඉතිරි මැඩ කටයුතු මෙදින නිල වාර්තාවේ II වන කොටසින් බලාගත යුතුයි.]**

[நிகழ்ச்சித் தொடரை இன்றைய அதிகார அறிக்கை (பகுதி II) இல் பார்க்க.]

[*For continuation of Proceedings see* OFFICIAL REPORT *of this Day (Part II)*.]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org